

# අභිධර්මය

විද්වත් මකුටායමාන

වාගීශ්වර පඬිතුමන් විසින් සංගෘහිත

# අභිධර්මය

සම්පාදක :

ආචාර්ය්‍ය උහන්ඹිවිට සාසනතිලක

ස්ථවිරයන් වහන්සේ.

ප්‍රකාශක :

අධිනිතිඥ සිරි පෙරේරා මැතිතුමා.

1946

Sadhu Press.

විද්වත් මකුටායමාන

වාගීශ්වර පඬිතුමන් විසින් සංගෘහිත

# අභිධර්මය

සම්පාදක:

මාරපන ශාස්ත්‍රෝදය පිරිවෙන්හි

ආචාර්ය උහන්ඹිවිට සාසනතිලක

ස්ථවිරයන් වහන්සේ

ප්‍රකාශක:

අධිනිතිඥ සිරි පෙරේරා මැතිතුමා

මුද්‍රණය:-

සාධු මුද්‍රණාලය – මාලිගාකන්ද, මරදාන.

2490

1946

මිල රු. 3-00

# නි වෙ ද න ය.

---

සමස්ත ලෝකයාට එකම ශාන්ති පිණ්ඩයක් වැනිවූ ශාන්ති නායකයන් වහන්සේ විසින් සුදෙසිත පරමාර්ථ ධර්මය පිළිබඳ මේ වනතෙක් ලිඛිල් හෙළ බසින් ලියැවුණු ග්‍රන්ථයන් අතරෙන් ප්‍රමුඛස්ථානයෙහිලා ගිණිය හැකි මේ "අභිධර්මය" ගුණ පාඨකයාට අමුතු හැඳින්වීමෙක් උවමනා නොකෙරේ. පරමාර්ථ ධර්ම විශාරදයින්ගේ පවා ගෞරවාදරයට පාත්‍රවූ **විද්වත් මකුවාකමාන වාගීශ්වර පඬිතුමන්** විසින් සංගෘහිත මෙය විද්වතුන්ට මෙන්ම පරමාර්ථ ධර්මය හදාරණ ආධුනිකයින්ටද එසේම ප්‍රයෝජන ගතහැකි ශ්‍රේෂ්ඨ ග්‍රන්ථයකි. විශෙෂයෙන් විභාගාපෙක්ෂකයින්ටද, පිරිවෙන්වල සහ ඉරුදින පාඨශාලාවන්හි අභිධර්ම හදාරණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටද, සද්ධර්මයට සහ භාෂා සාහිත්‍යයටද මින් ලැබෙන ඉමහත් සේවය සැලකූ අප විසින් මුද්‍රණය අතින් සහ සාඩදුසි දුර්ලභත්වයෙන්ද අති දුෂ්කර භාවයද නොසලකා මෙය මුද්‍රණයෙන් ප්‍රචාරයට පමුණුවන ලදී.

මෙය මුද්‍රණයේදී විද්‍යෝදය පිරිවෙන්හි ආචාර්ය **පණ්ඩිත පනම්ගල ජිනරතන හිමිපානන් වහන්සේ** වෙතින් ලැබුණු උපකාරය කෘතඥතා පූර්වකව සගෞරවයෙන් යෙදී සිහිපත් කරණ අතර මෙය සොභන පරිදි ඉක්මණින් මුද්‍රණය කරදීම ගැණ සාධු මුද්‍රණාලයාධිකාරී **කේ. ඩී. පියසේන** මහතුන්ටද සතුති වන්ත වෙමු.

මේ ග්‍රන්ථයෙහි අයිතිය අපසතුව පවත්නා බැවින් අපෙන් අවසර නොමැතිව කිසිවෙකුට මෙය නැවත මුද්‍රණය කිරීමට බලයක් නොමැති බවද මෙයින් නිවේදනය කරම්හ.

මෙයට,

**උහන්ඔවිට සාසනතිලක ස්ථවිර**

"ශාසනෝදය පිරිවෙණ"
මාරපන-රත්නපුර,
1-11-1946.

# උ ප න්‍යා ස ය

**විද්‍යාව** හෙවත් ඥානය උතුම් ය යි වර්ණනා නො කරණ කිසි ම ශාස්ත්‍රවරයෙක් වත් කිසි ම ප්‍රඥාවන්තයෙක් වත් නැත්තේ ය. එ බැවින් සියල්ල විසින් එය සම්පාදනය කර ගත යුතු වුවත් එහි ඇති බොහෝ වූ භේදයන් සියල්ල ම අසර්වඥ වූ කිසිවෙකු විසින් නිශ්ශේෂ ව ලබාගැනීමක් නැත්තේ ය. එසේ හෙයින් විද්‍යාභේදයන්ගේ ලක්ෂණ මාත්‍රයක් සැකෙවින් දැන එයින් අවශ්‍ය වූවක් නිර්ධාරණය කොට යථා ශක්තිකව තමතමන් කෙරෙහි පිහිටුවාගැන්ම සියල්ලගේ ම කර්තව්‍යය වේ

**විද්‍යාව** වනාහි:- ඒකාන්තවිද්‍යා, ශාබ්දවිද්‍යා, කලාවිද්‍යා, ස්වාභාවිකවිද්‍යා, දර්ශනවිද්‍යාය යි ජාති වශයෙන් පඤ්චවිධ ද වෙයි. ඉන්:-

**ඒකාන්තවිද්‍යාව**:- සංඛ්‍යාගණිත, බීජගණිත, රේඛාමිණිත, කෝණමිණිතාදී වශයෙන් කතිපය ප්‍රභේදයක් ඇත්තී එකී සඞ්ඛ්‍යාදී ධර්මයන් සම්බන්ධ තත්ව ඥානයට පමුණුවමින් ඓහලෞකිකාර්ථය ගෙණ දෙන්නී වෙයි. පාරලෞකිකාර්ථ දායක විද්‍යාවට අනු බලවත් කල පමණක් ඊට සම්බන්ධ වෙයි.

**ශාබ්දවිද්‍යාව**:- සියලු භාෂාසම්බන්ධ නිඝණ්ඩු, ව්‍යාකරණ, ඡන්දස්, අලඞ්කාරාදී ප්‍රභේද කීපයක් ඇත්තී කථිත ලිඛිත සියල්ලෙහි සියලු ශබ්දශබ්දාර්ථකයන්ගේ ද, සමහර අර්ථ-විශේෂයන්හුගේ ද සදසද්විවේකය කෙරෙමින් සියලු ඓහිකාර්ථය ද ගෙණ දෙමින්, ආමුෂ්මිකාර්ථයට ද, ද්වාරමාත්‍රයක් වෙයි.

**කලාවිද්‍යාව**:- නෘත්‍ය, ගීත, වාදිත, කෘෂි, වණික්, චිත්‍ර, සෞධ, තක්ෂක, කර්මාර, නියාමක, වෛද්‍ය, ස්වප්න, නිමිත්ත, යන්ත්‍ර, මන්ත්‍ර, ආදර්ශප්‍රශ්න, නීති, වාදිත, හය, ගජ, රථ, ධනුර්ධර, ආයුධ, යුද්ධාදී අනේකප්‍රභේදගතවූවා, ඒ ඒ වෘත්ති සම්බන්ධ සම්ප්‍රාප්තිය ගෙණ දෙමින් ලෝකයාත්‍රාවට අත්‍ය-

නෙකොපකාර ව මෙලොව වැඩ ම සපයාමුත්, පරලොව අර්ථයකට සම්බන්ධ වෙතොත් අමුඛ්‍ය වශයෙන් කලාතුරකිනි. නුමුත් අනර්ථයට නම් බොහෝ විට සම්බන්ධ වේ මැ යි.

**ස්වාභාවිකවිද්‍යාව** ද:– තාරකා, ද්‍රව, ආලෝක, යන්ත්‍ර, වායු, තේජස්, ශබ්ද, විද්‍යුත්, රසායන ද්‍රව්‍ය, සත්ව, වෘක්ෂ, ඛනිජ, නාභස, අන්තර්භූමිකාදී ඒ ඒ ස්වාභාවික වස්තූන්ගේ වශයෙන් බොහෝ වූ ප්‍රභෙද ඇත්තී, යථොක්ත කලා විඥුවන්ගේ මාතෘස්ථානයෙහි සිටිමින්, මෙලොවට අයිති සියල්ලෙහි ආඥාචක්‍රය පිහිටවූවාක් මෙන්, එහි ම සියලු අර්ථයට මූලාධාර වෙමින්, තදන්‍යාර්ථයට ද සහාය වෙයි.

**දර්ශනවිද්‍යාව** වූ කලී:– ඍක්, යජුෂ්, සාමන්, අථර්වන්, යන සතර භේදයක් ඇති වේදයට අතිරේක වූ ඊපිට ම නගන ලද මීමාංසා වේදාන්ත යන දෙක ද; වේදයට ම සමහර අතකින් එකඟවූ හා සමහර අතකින් විරුද්ධවන්නා වූ වෛශෙෂික න්‍යාය දෙක ද; වේදයට අතිශයින් විරුද්ධවූ (අනීශ්වර) සාංඛ්‍ය මතය ද, එහි ධර්මයන් ම වේදයට එකඟ වන සේ පිළියෙල කාරණ ලද සේශ්වර සාංඛ්‍යමතයෙන් උපුටා යොදන ලද යොගදර්ශනය ද, මාධ්‍යමික, යොගාචාර, සෞත්‍රාන්තික, වෛභාෂික යන චතුර්භේද ගත වූ දර්ශනය ඇති උත්තර බෞද්ධ ප්‍රස්ථානයෝ ද යන මේ ආදි වශයෙන් සංස්කෘත භාෂාවෙන් බොහොමයක් හා මාගධී භාෂාවෙන් එක ම දක්ෂිණ බෞද්ධ සමය ද, චීන, ග්‍රීක්, ජර්මන් ආදී භාෂාවලින් තව තවත් බොහෝ වූ ද ප්‍රභෙද ඇත්තී, මෙහි නොකී චාර්වාක මතය වැනි කීපයක් හැර වැඩිපක්ෂයගේ වශයෙන් අප්‍රධාන වශයෙන් ඓහ ලෞකිකාර්ථය ද, ප්‍රධාන වශයෙන් පාරලෞකිකාර්ථය ද ප්‍රතිඥ කරයි.

එයින්, මෙලොව ශුභසිද්ධියට වඩා පරලොව ශුභසිද්ධිය කැමතිවිය යුතු බව යථොක්ත චාර්වාකාදී නාස්තික දෘෂ්ටිකයන් හැර සෙසු සියල්ලන් විසින් එකහෙලා පිළිගෙණ තිබෙන සත්‍යයක් බැවින් කිසිසේත් සම්පරායික නොවන්නා වූද, අමුඛ්‍ය වශයෙන් පමණක් සම්පරායික වන්නා වූ ද සියලු විඥුවන්ට වඩා දර්ශන විඥුව ම අවශ්‍යයෙන් සම්පාදනය කාට යුතු වන්නේ ය.

නමුත් යහපත යම් පමණ මහත් ද, එ පමණ ම මහත් වූ අයහපත ද ඊට ප්‍රතිභාගව සිටීම ලොකස්වභාවයකි. යම් කිසි දර්ශනයක් සත්‍ය වන කල, ඊට ප්‍රතිපක්ෂ වූ දර්ශන සියල්ල ම අසත්‍ය ද විය යුතු සි. එ බැවින් සත්‍ය වූ දර්ශනය හැඳින ගණ ම සෙසු සියල්ලෙන් වැළකී, ඒ මගින් අභිෂ්ට වූ නිඃශ්‍රෙයස හෙවත් උත්තමාර්ථය සැපයිය යුතු සි. ඒ සඳහා හැඳිනීම පිණිස ද, මතසංකර නිවාරණය පිණිස ද, ඒ ඒ දර්ශනයාගේ ලක්ෂණ මදක් විචාරණය කරණු ලැබේ.

**එකී දර්ශනයන් අතුරෙන්:-**

වේදය:- ඍෂීන් දශදෙනෙකු විසින් තම තමන්ගේ කාලවල වෙන වෙන කොටස් වශයෙන් උපදවන ලදුව ඔවුනොවුන්ගේ දරු මුනුබුරු ශිෂ්‍ය පරම්පරා වශයෙන් පැවත එන අතර නොයෙක් දෙන විසින් ව්‍යාඛ්‍යා භාෂ්‍යාදි වර්ණනා පොත්වලින් ද මනුසංහිතා වේදාඞ්ග ග්‍රන්ථාදියෙන් ද, පිරිවර සහිත කරණ ලද, කුලභෙදයට මූලාධාර වූ, අතිශයින් පුරාණ ය සි කියනලද දර්ශනය සි. එහි භෙද සතර අර්ථ වශයෙන් සතර පරිදි බැවින් එකඟ කිරීමට වෛදිකයෝ නොයෙක් උත්සාහ දරත් මුත්, සාඞ්ඛ්‍ය බෞද්ධමතයන් වේදයට එකඟ කිරීමට හා වෛදික දෙවියන්ගේ ප්‍රායාත උපායයන් කොට හඟවා කලකිරවන්ට ගත් උත්සාහය මෙන් ම මේ දක්වාත් නිෂ්ඵල වී ය සි දන්නෝ කියත්. වේදයෙන් පිට කිසි ගතයුත්තක් නැතැයි හඟවන්ට කැමති බ්‍රාහ්මණයෝ අන්කවුරුන් විසින් වුවත් උපදවන ලද ශාස්ත්‍රාදිය වේදයට ම ඇතුළත් වන ලෙස හෝ වේදයෙහි ප්‍රණෙත දෙවියෙක් ඍෂියෙක් අසුරයෙක් හෝ යම් අනිකෙක් විසින් උපායෙන් යම් කිසි අර්ථයක් ඉටු කර ගන්නා පිණිස උපදවන ලද බොරුවකැයි හැඟෙන ලෙස හෝ මෙබඳු අන් පරිද්දකින් හෝ හඟවමින් පුරාණ ය සි හෝ තන්ත්‍ර ය සි හෝ සංහිතා ය සි හෝ නා නා ප්‍රකාර පොත් කරත්. තමන්ගේ මූල්පොත් වල පූර්වාපර විරොධයන් ගැණ කියනු ම කවරේ ද? වේදයෙහි ඒ සියලු භෙද එකක් කොට සලකන කල එහි බොහෝ වූ දෙවිවරුන්ගේ වශයෙන් ප්‍රභෙද ගත වූ එක ම පරබ්‍රහ්මයා සියල්ලෙන් සියල්ලය, සියල්ල ම ඔහුගේ මැවිල්ල ය, ඔහුට හා ඒ ඒ

ප්‍රභෙදගත දෙවියන්ට තර්පණය වන පිණිස ගවයන් අශ්වයන් ආදී සතුන් මරාද, කිරි ගිතෙල් ආදී දෙය ද ගින්නෙන් දවා යාග හෝමාදිය කිරීමෙන් ද, ඔවුන් ස්තුති ගීතිකාදියෙන් සතුටු කිරීමෙන් ද, සිත්ගෙණ ඔවුන් ලවා සියලු යහපත සිද්ධ කරවා ගතයුතු ය යි ද උගන්වත් ලූ. ඒ ගැණ අපගේ දැනීම ඉතා ස්වල්ප බැවින් අනුශ්‍රවයෙන් මෙ සේ ලියූ.

1. **මීමාංසා දර්ශනය**: මෙය ජෛමිනි නම් ඍෂියෙකු විසින් සූත්‍ර 2762 කින් රචනාකරණ ලදුව, කෘෂ්ණ යජ්වන්, ගදාධර, භාස්කර, ලෞගාක්ෂි, ආපො දෙවාදී ටීකා දෙනෙකුන් විසින් විස්තර පොත් ලියා දියුණු කරණ ලද, ධර්ම මීමාංසා, පූර්ව මීමාංසා ය යි සවිශෙෂණ ව කීමෙන් වෙදාන්ත දර්ශන යෙන් වෙන් කරණු ලබන්නාවූ ශාස්ත්‍රය යි. එහි වේදයෙහි දක්වන ලද සතුන් මරා යාග හෝමාදිය කිරීමේ යුක්ති ආදිය ද, ඒවා නිසි ආකාර කිරීමේ උපදෙශාදිය ද, සමහර සමහර වෙද වාක්‍යයන් තේරුම් ගතයුතු අර්ථ විශෙෂ, විෂය නියමාදිය ද දක්වමින් ඒ සම්බන්ධ කර්මකාණ්ඩය ශාස්ත්‍රයක් කොට බැඳ තිබේ. වෙදය කෙරෙහි මෙන් ම මෙහි ද අපගේ දැනීම පිණ්ඩාර්ථය ම ප්‍රධාන කොට, නොහොත් අර්ථසාර සංග්‍රහ මාත්‍රයක් ම බැවින් දෘෂ්ටි සංසන්දනයෙහි පොහොණා පමණක් මුත් වැඩි විස්තරයට පොහොණා පමණ නො වේ. නමුත් කාරණානුසාරයෙන් සලකනකල වේදය දැනමෙන් මෝසෙස් විසින් කරණ ලද ලෙවී කථාදියෙහි පෙණෙන සත්වඝාතන යාගාදියට සන්:පාවුලු විසින් විදෙශීන්ට ලියනලද පත්‍රාදියෙහි දක්වා තිබෙන යුක්තීන් මේ මීමාංසාව දැන ම කරණ ලදැ යි සැලකිය හැකිතරමට ඒ දෙකක් සහ මේ දෙකේ සමානකම පෙණේ. මෙහි අධ්‍යර්ථවාදදී පදාර්ථ 12 සක් දක්වමින් ලෝකය සම්බන්ධ සියලු ශුභාශුභ පැවැත්ම කර්මය පිට ම පවතින බවත් එ ලෙස ම නිත්‍ය බවත් මුත් මොක්ෂවාදයක් නො පෙණේ. ප්‍රධාන කුසලකර්ම ය යි දක්වා තිබෙන්නේ ද යථොක්ත හරකුන් මරා යාග කිරීම් ආදිය යි.

2. **වෙදාන්ත දර්ශනය**:–මෙය ව්‍යාස නම් ඍෂියෙකු විසින් සූත්‍ර 554 කින් නිමවන ලදුව, ශංකරානන්දගේ වෘත්තිය ද, ශංකරරාමානුජ දෙදෙනාගේ භාෂ්‍ය දෙක ද, ආනන්දගිරි,

සුදර්ශන, ගොවින්දානන්දීන්ගේ ටීකා ද, එම ව්‍යාස හා පසු කාලක බලතර උත්සාහයෙන් එය ම දියුණු කළ ශංකරය, මධුසූදනය, යන මේ ආදීන්ගේ සංග්‍රහාදී නා නා ප්‍රකාර වෙනත් ප්‍රකරණයන් ද පිරිවර කොට ඇති, වේදය පිට ම උපදවන ලද ශාස්ත්‍රයකි මීට ශාරීරක මීමාංසා, උත්තරමීමාංසා යන නමුදු වෙති. එ හෙයින් ම ජෛමිනීගේ ශාස්ත්‍රයට පූර්වධර්ම යන ශබ්දවලින් විශේෂණ කරතත් අවිශිෂ්ට වූ මීමාංසා නාමයෙන් එය ම මිස මෙය නොහැඳේ. වේදයත් කෝටි ගණන් දෙවියන් සහිත ලෝකයත් සියල්ල ම ස්වප්නයෙන් මෙන් මායාව හේතු කොට ගෙණ එ ලෙස එ ලෙස වැටහෙනත්, ඒ සියල්ල ම මිථ්‍යාය, සත්‍යය නම් එක ම වූ පරබ්‍රහ්මයා ය යි ද; මීමාංසෝක්ත කර්මවාදය මැඩ පවත්වා සියල්ලන්ගේ හා ඒ බ්‍රහ්මයාගේ අභේදඥානය ඇති කර ගැණීමෙන් තමාත් ඒ බ්‍රහ්මයාට ම ඇතුලත්වී මෝක්ෂය ලබාය යි ද මෙහි උගන්වයි. චිත් අචිත් ය යි මෙහි පදාර්ථ දෙකකි. ඉන් පර–බ්‍රහ්මයා චිත්ස්වරූප ය යි ද සෙසු මායාමය සියල්ල අචිත් ස්වරූප ය යි ද කියති. අන්‍යසමයවාදීන් දුක් දී මරා විනාශ කර දැමීම සුචරිතයක් කොට වේදාන්තිකයෝ සලකත්.

වේදය මීවදයකට උපමා කළ හොත් ඉන් මිරිකා ගත් පැණිය වේදාන්තයට ද, ඉතිරි ඉටි ගෙණ තෙලන ලද වාත්තු කැටයම් මීමාංසාවට ද උපමාවන්නේ ය. එබැවින් මේ තුණ එකට ගත් කල එකක් ම නොවීමට යුක්ති ස්වල්පය යි පෙණේ.

3. **වෛශේෂික දර්ශනය:**– මෙය කණාද නම් ඍෂියෙකු විසින් සූත්‍ර 370 වකින් නිර්මිත කරණ ලදුව ජයනාරායනගේ වෘත්තියෙන් ද; ප්‍රශස්තපාද චන්ද්‍රකාන්ත දෙදෙනාගේ භාෂ්‍ය දෙකින් ද; උදයන ශ්‍රීධර දෙදෙනාගේ ටීකා දෙකින් ද, ශංකරමිශ්‍ර, ශිවාදිත්‍ය මාධවාදීන්ගේ සංග්‍රහාදී වෙනත් පොත් වලින් ද උපස්ථම්භිත වූ ශාස්ත්‍රයකි. මෙහි කණාද විසින් ද්‍රව්‍ය ගුණ, කර්ම, සාමාන්‍ය, විශේෂ, සමවාය, වශයෙන් සයක් ද, පශ්චමයන් විසින් ඊට එකතු කරණ ලද අභාවය දැ යි පදාර්ථ සතකින්, සතර මහා භූතයෝ පරමාණු රූප වශයෙන් නිත්‍ය වූ ද, ද්ව්‍යණුකාදී කාර්යරූප වශයෙන් අනිත්‍ය වූ ද,

ආකාශ, දිශා, කාල, ආත්ම, මනස්, යන පස ස්වභාවයෙන් නිත්‍ය වූ ද ද්‍රව්‍යයෝ ය යි ද; රූප, රස, ගන්ධ, ස්පර්ශ, සංඛ්‍යා, පරිමාණ, පෘථක්ත්ව, සංයොග, විභාග, පරත්ව, අපරත්ව, ගුරුත්ව, ද්‍රවත්ව, ස්නෙහ, ශබ්ද, බුද්ධි, සුඛ, දුඃඛ, ඉච්ඡා, ද්වෙෂ, ප්‍රයත්න, ධර්ම, අධර්ම, සංස්කාර යන සූවිස්සක් ගුණයෝ ය යි ද; උත්ක්ෂෙප, අවක්ෂෙප, ආකුඤ්චන, ප්‍රසාරණ, ගමන ය යි පසක් කර්මයෝ ය යි ද; පර අපර ය යි සාමාන්‍ය දෙකක් ද; අනන්තභෙද වූ විශෙෂයක් ද; එක ම සමවාය ද; ප්‍රාග්භාව ප්‍රධ්වංසාභාව, අත්‍යන්තාභාව, අන්‍යොන්‍යාභාව, ය යි සතර භෙද වූ අභාවයද උගන්වමින්, සත්වයා ගැණ: පටන් ගැන්මක් හෝ කෙළවර වීමක් නැති සියල්ල සම්බන්ධ ව පවත්නා වූ ද ඥනයට ආධාර වූ ද බොහෝ වූ ආත්ම ද්‍රව්‍ය ප්‍රභෙදව, ලින්, එක එක, එ සේ ම ආද්‍යන්ත රහිත වූ, සුව දුක් ආදිය දැනීමට හේතු වූ මනොද්‍රව්‍ය පරමාණුවලින් එක එක සමග නියතයෙන් ම බැඳිගණ භූතමය වූ ශරීරයන් කෙරෙහි වසමින් එකක් හරිණ කල අතිකකට මාරුවෙමින් පවතින ප්‍රවෘත්තියකැයි ද ආත්මයෙහි ම ප්‍රභෙදයක් වූ, එ නම් සුචරිතයෙන් පිරිසිදු කරණ ලද ආත්ම සියල්ල ම එකාවූ පරමාත්මය සුවදුක් රහිත ව නිත්‍ය ව පවතී ය යි ද දක්වයි.

4. **න්‍යාය දර්ශනය**:මෙය ගෞතම නම් ඍෂි කෙනෙකුන් විසින් සූත්‍ර 530 කින්; ප්‍රමාණ, ප්‍රමෙය, සංශය, ප්‍රයොජන දෘෂ්ටාන්ත, සිද්ධාන්ත, අවයව, තර්ක, නිර්ණය, වාද, ජල්ප, විතණ්ඩා, හෙත්වාභාස, ඡල, ජාති, නිග්‍රහස්ථාන යන සොළොස් පදාර්ථයක් නිර්දේශ කරමින්, කරණ ලද ප්‍රාචීන තර්ක ශාස්ත්‍ර යය. මීට ඇතිව පවත්නා බොහෝ වූ පිරිවර පොත් අතුරෙන්, විශ්වනාථගේ වෘත්තිය ද, වාත්ස්‍යායනගේ භාෂ්‍යය ද, වාචස්පතිගේ ටීකාව ද, භීමපශුපති, ජයන්ත, අන්නම්භට්ටාදීන්ගේ සංග්‍රහාදිය ද ප්‍රධාන වෙති. මේ ශාස්ත්‍රය කණාදගේ වෛශෙෂික ශාස්ත්‍රධර්මය ධාතු කොට ගෙණ ඒ පිට නගන ලද කැටයම් විශෙෂයක් මෙන් පෙණෙමින්, කල්පනා කර අර්ථ තෝරුම් ගන්නා පරිදි උපදෙශ කරයි. කිරන්නාගේ, මණින්නාගේ කිරීම මැණීම, හරි වුත් පඩි මිම්වල හරි වැරදි කමින් ප්‍රමිතයාගේ හරි වැරදි කම වන්නාක් මෙන් මෙහි ද ප්‍රමාණ

කරණ ලද දෙයෙහි තත්ත්වයෙන් ප්‍රමිත වූ ශාස්වත භාවාදිය හරිම විය යුතු බවට කරුණු නැත්තේ ය. එහෙත් වෛශෙෂික ධර්මයෙන් නිදහස් කොට ගන්නා ලද්දේ නම් එම තර්ක ශාස්ත්‍රය කො පමණ දුර සපිරදැයි කියන හොත්, සෙසු සියලු දර්ශන සමයයන් කෙරෙහි ම යෙදිය හැකි තරමට සාධාරණ වන්නේ ය.

මේ වෛශෙෂික න්‍යාය දර්ශන දෙකේ සම්බන්ධය සඳහා වෛශෙෂිකයාගේ අතේ එල්ලී ගත් නෛයායිකයා ය යි කවට වචනයක් ද පොත්වල පෙණේ. එ බැවින් අලයෙන් පැලවූ වැලක් මෙන් මේ දෙක එකතුව එක ම දර්ශනයකැයි කිය යුත්තේ ය

5. **සාංඛ්‍ය දර්ශනය**: වෘහත් කාපිල සූත්‍රය, සාංඛ්‍යප්‍රවචන දර්ශනය යන නම් වලින් කියනු ලබන සූත්‍ර 526 කින් ප්‍රකරණයක් ද, ලඝුකාපිල සූත්‍රය, ලඝුසාංඛ්‍ය දර්ශනය යන නම් ඇති සූත්‍ර 22 ක් වූ එහි ම සංක්ෂෙපයදැයි දෙකක් වූ මෙය කපිලවස්තුපුර භූමියෙහි විසූ ආදි පුරුෂ වූ ඍෂිහු ය යි සිතීමට බොහෝ යුතුකම් පෙණෙන කපිලනම් ඍෂියෙකු විසින් එකී සූත්‍ර 548 න් බඳින ලදුව මහාදෙව, මාධව, යන දෙදෙනෙකු විසින් වෘත්ති දෙකකින් ද, විඥාන භික්ෂු නමැත්තෙක් විසින් භාෂ්‍යයකින් ද, ඊශ්වරකෘෂ්ණ, නාරායනාදීන් විසින් වෙනත් පොත්වලින් ද පරිග්‍රහ කරණ ලද ශාස්ත්‍රයකි. මීට සෙශ්වර සාංඛ්‍යමතය යි කියනු ලබන පාතජලයොග ශාස්ත්‍රයෙන් වෙන් කරණ පිණිස අනීශ්වර සාංඛ්‍ය යන නම විශෙෂ වෙයි. එහි උගන්වන ධර්මය නම්: පටන් ගැන්මක් හෝ කෙළවර වීමක් හෝ ලිඞ්ගයක් හෝ නැති, සියල්ල කෙරෙහි පැතිර පවත්නා වූ, චෙතනා රහිත වූ, අව්‍යක්ත නම් වූ, ප්‍රධාන ප්‍රකෘතියක් වෙයි. ඒය එකක් ව ම තිබිය දී එය නිශ්‍රය කොට මතු පුරුෂ නාමයෙන් කියනු ලබන බොහෝ වූ ක්ෂෙත්‍රඥයෝ හෙවත් ජීවාත්මයෝ වෙති. ඒ ප්‍රකෘති පුරුෂ !දෙදෙනාගේ හෙවත් අව්‍යක්තය හා එකී එකී ක්ෂෙත්‍රඥයාගේ එක්වීමෙන් ඒ අව්‍යක්තය කෙරෙන් එ ම ලක්ෂණ ඇත්තා වූ මහත් තත්ත්වය උපදී. මහත්තත්ත්වය කෙරෙන් අහඞ්කාරය උපදී. ඒ අහඞ්කාරය වනාහි වෛකාරික, තෛජස, භූතාදි ය යි තුන්

ප්‍රභේදයක් ව ඒ වෛකාරිකයෙන් තෛජසය උපකාර කොට ඇතිව ශ්‍රොත්‍ර, ත්වක්, චක්ෂුස්, ජිහ්වා, ඝ්‍රාණ, වාක්, හස්ත, උපස්ථ, පායු, පාද, මනස් යන ඉන්ද්‍රිය එකොළොස ද; භූතාද්‍යහඞ්කාර යෙනුත් තෛජසය උපකාර කොට ඇති ව ශබ්ද තන්මාත්‍ර, ස්පර්ශතන්මාත්‍ර රූපතන්මාත්‍ර, රසතන්මාත්‍ර, ගන්ධ තන්මාත්‍ර ය යි කියන ලද ශබ්ද ස්පර්ශාදීන්ගේ භාව පසක් ද උපදි ත්. ශබ්ද ස්පර්ශාදි පස ඒ තන්මාත්‍ර හෙවත් භාව පසෙහි ම විශෙෂයෝ වෙති. ඒ ශබ්දස්පර්ශාදී පස කෙරෙන් ආකාශ. වායු, තෙජෝ, ආපො, පෘථිවි යන ධාතු පස උපදිති. මෙසින් අව්‍යක්තය, මහත්තත්වය, අහඞ්කාරය, තන්මාත්‍ර පසය, යන අට වැදෑරුම් රූපය ඇති ප්‍රකෘතිය ම, (එකොළොස් ඉන්ද්‍රියයන් හා භූත පස ද යි යන) විකාර සොළස හා එහි අනුභෙද වූ සියලු විශෙෂයන් ඇතුළත් මූළලෝකයාගේ උත්පත්තියට හේතු වෙයි. මේ ප්‍රකෘති අට හා විකාර සොළස, තත්ව සුවිස්ස ය යි කියනු ලැබේ. යට ක්ෂෙත්‍රඥ, ජීවාත්ම යන නම්වලින් සඳහන් කළ, ප්‍රකෘතිය මෙන් ම අනාදී, අනන්ත, අලිඞ්ග, සර්ව ගත පුරුෂයා වූ සචේතන වූයේ පස් විසි වැනි තත්වය යි. ඔහු භොජක යි. සෙසු සියල්ල ඔහුගේ භොග යි. මේ භොජක භොග දෙදෙනාගේ සම්බන්ධය ඇති තාක් ම දුක යි. තපස් භාවනායොග උපායෙන් සුවිසිතත්වය කෙරෙන් පුරුෂයාගේ මිදී තනිවීම මොක්ෂය යි – හෙවත් දුකින් මිදීම යි. අවිද්‍යමාන කිසිවක් නූපදී. එ හෙයින් ලොකයෙහි උපන්නාවූ වෙදය කලිනුත් විද්‍යමානව ම තිබුනා විය යුතුයි. එසේ වෙදය නිත්‍ය බැවින් ප්‍රමාණ කට යුතුයි යනාදිය යි. සාංඛ්‍යමතවාදීහු මේ අනතිමට කී වෙදය ප්‍රමාණ කරමින්මත් එහි කියන යාග හොමාදී විධානයන්ගෙන් තාවකාලිකව දුක් අඩුකිරීමක් මිස දුකින් අත්‍යන්ත විමොක්ෂයක් නො ලැබිය හැකි ය යි ද, සමහර වෙද කොටස් (අපරට මන්ත්‍ර ගැණි අදහස් කරන්නාක් මෙන්) ශබ්ද වශයෙන් ඒ ඒ ඵල සාධනයෙන් සාර්ථකවා මිස අර්ථ වශයෙන් ගතයුත්තක් නැතැයි ද, වෙදෛක්ත බොහෝ වූ දෙවියෝ පවා ශබ්දාත්මකවා මිස සවරූපයෙන් අර්ථාත්මක නො වෙතැයි ද කියත්. යථොක්ත පස් විසි තත්වය ම එහි උගන්වන පදාර්ථ පස්විස්ස යි.

6. **යොගදර්ශනය**: පාතඤ්ජල මතය, සේශ්වර සාංඛ්‍ය ය යන නම් වලිනුදු කියනු ලබන මෙය පතඤ්ජලී නම් ඍෂියෙකු විසින් සූත්‍ර 195 කින් නිමවන ලද ධ්‍යානසමාපත්ති අභිඥ වශීතාදීන් ප්‍රධාන කොට උගන්වන ශාස්ත්‍රය යි. සාංඛ්‍යයන්ගේ පස්විසි තත්ත්වය එ ලෙස ම ගෙණ වෙදාන්තිකයන්ගේ පරබ්‍රහ්මයා පරමෙශ්වර නමින් සවිසි වන තත්ත්වය කොට එකතු කර පදාර්ථ සවිස්සක් සම්පූර්ණ කර තිබේ සාංඛ්‍ය මතයෙහි හා මෙහි ඇති වෙනස නම් එකී පරමේශ්වරයා පමණක් නොව එහි මන්ත්‍රාත්මකවූ නාම මාත්‍රක දෙවියෝ ය යි කියන විෂ්ණු ඉන්ද්‍රාදීවෛදෙකත දෙවියන් ස්වරූපයෙන් විද්‍යමාන වූ අර්ථාත්මකයෝ ය යිද, අව්‍යක්තයෙන් අන්‍ය වූ සියලු තෙවිසි තත්ත්වය පුරුෂයාගේ ප්‍රයෝජනය පිණිස නිසර්ගයෙන් උපන්නෝ ය යි ඔවුන් කියද්දී අව්‍යක්තයත් සමග සියලු සූවිස්සම ඔහු පිණිස පරමෙශ්වරයා විසින් උපදවන ලදැයි ද මෙහි කියන ක්‍රම යි. ප්‍රකෘති සංයොගයෙන් පුරුෂයා වෙන් කිරීමට උපාය මේ ය යි යොගාවචර ධර්මය ඉගැන්වීම මෙහි ප්‍රධාන අදහස වේ.

සාංඛ්‍යයෙහි වෛදෙක්ත දෙවියන් ස්වරූපයෙන් නොපිළිගන්න නිසා ඒ ගැණ ගිනිදෙවියාගේ අවතාරය වූ කපිල ඍෂියා විසින් දෙවියන් තුරුස්සන අසුරයන්ටත් සැනසිල්ලක් ලැබේවා යි කරුණාවෙන් දෙවිවරුන් අහක් කොට ඔය ලෙස ඒ මතය (ප්‍රයොග වශයෙන්) ඉගැන්වූ බවත්, ඉන් පසු පර-බ්‍රහ්මාවතාර වූ අනික් කපිල නම් ඍෂියෙක් සියලු වෛදෙකත දෙවියන් ස්වරූපයෙන් ඇතුළත් කොට සෙශ්වර සාංඛ්‍යය ඉගැන්වූ බවත්, එය ම පතඤ්ජලී විසින් සූත්‍රා රොපණය කොට මේ යොගදර්ශනය නිර්මිත කළ බවත් වෙදාන්තවාදීන් විසින් මේ දෙක ගැණ ගොතා තිබෙන ප්‍රබන්ධයකි. එසින් ම මේ දෙකේ සමාන අසමානකම් සුව සේ හැඟෙත් වෙද, වෙදාන්තවාදීහු ඔ බඳු ප්‍රබන්ධ ගෙතීමෙහි දක්ෂ බැවින් ම බෞද්ධ මතය ගැණ පවා විෂ්ණු අවතාර ලත් බුදුන් අසුරයන් රවටා විනාශකිරීමට හා ඔවුන් විසින් ලැබිය හැකි යහපත වැලැක්වීමටත් වෙදයෙහි උගන්වන හරකුන් මැරීමට විරුද්ධව ඉපද වූ ධර්මයකැයි කියා තිබේ.

මෙ සේ මේ සාංඛ්‍ය පාතඤ්ජල මත දෙකත් එකක් කොට ගත් කල, වෙද මීමාංසා වෙදාන්ත වශයෙන් එකක් ද, න්‍යාය වෛශෙෂික වශයෙන් එකක් දැ යි ප්‍රධාන ශාස්වත දර්ශන තුණක් ව ම පෙණේ. වෙදය හැර මේ ඉතිරි සය ෂට්දර්ශන යන නමින් ප්‍රසිද්ධයි.

**චාර්වාකදර්ශනය:** නාස්තික දෘෂ්ටිය, ලොකායත විද්‍යාව, යන නම් වලිනුදු දන්නා ලද මෙය වෘහස්පතී නම් අයෙකු විසින් උපදවන ලදුව පරලොව අපෙක්ෂා නො කරණ කෛරාටික ජනයා විසින් වැළඳ ගෙණ පැවති කාලක් ඇතිවිය. නුමුත් එහි උගන්වන ධර්ම සියල්ලම වාගේ සෙසු සියලු ම දර්ශනයන්ට ඍජුව ම ප්‍රතිපක්ෂ බැවින් ඒ ඒ මතවාදීන් විසින් රජුන් පවා මෙහෙයා ඒ සම්බන්ධ පොත්පත් ද; උගතුන් ද නැති කර දමා තිබෙන බැවින් දැනට ප්‍රකරණ වශයෙන් යමක් දකින්ට නැතත් ඒ ඒ අන්‍යසමය වල විස්තර පොත්හි වාදයට යොදා අයුක්ති පෙන්වීම පිණිස ගන්නා ලද සමහර සමහර කොටස් දැනුදු විද්‍යමාන යි. ඒවායින් බලන කල එහි ඉගැන්වීම මෙලෙස යි. එනම්:–

මෙලොව ම මිස පරලොවක් නැත. එ හෙයින් ම කර්ම යක්, විපාකයක්, සුචරිතයක්, දුශ්චරිතයක්, ස්වර්ගයක්, අපායක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක්, සංසාරයක්, මොක්ෂයක් යන මෙ බඳු කිසිවක් නැත. වැලිදු අහිංසාව පරම ධර්ම ය යි කියා ද, තමාට පීඩා කරගැන්ම පාප යයි කියා ද, අභිමතය ඉෂ්ටවීම ස්වර්ග ය යි කියා ද, මියයාම මොක්ෂ ය යි කියා ද, දිළිඳුබව අපාය ය යි කියා ද, සියරට රජ ඊශ්වර ය යි කියා ද, පියා බ්‍රහ්මයා ය යි කියා ද, ආහාරය විෂ්ණු ය යි කියා ද, මෛථුනය පමණක් කර්ම ය යි කියා ද, පුත්‍රයා කර්ම විපාක ය යි හෝ පරලොව ය යි කියා ද, කියයුත්තේ ය. ධර්මමොක්ෂ දෙක හැර දමා අර්ථකාමදෙක පමණක් සැපයි ය යුත්තේය. අනුමාන උපමාන ශබ්දයන් හැර ප්‍රත්‍යක්ෂය පමණක් ප්‍රමාණ කටයුත්තේ ය. පෘථිවි, අපො, තෙජො, වායු යන සතරේ සංයොග විශෙෂයකින් මනස පහළ ව සත්වයා වෙයි. සුරා බීජ මධුර ද්‍රව්‍යයන්ගේ එක්වීමෙන් මත්කරවන ශක්තිය ඇති කරන්නාක් මෙනි. යම් හෙයකින් එය බිඳුනේ ද ඉන් ඔබ්බට ඒ මනස නො යයි. වෙදය වඤ්චකයන් විසින් ජීවිකාව

පිණිස උපදවා ගණ තිබෙන බොරුවක. සිල් තපස්රකින්නෝ අඥනයෝ ය. නීතිශාස්ත්‍ර, කාමශාස්ත්‍ර, ශිල්ප යන මෙ පමණක් උගන්වන්නෝ ශාස්තෘවරයෝ ය යන මේ ආදිය යි. මෙය උච්ඡේද වාදයකි.

බෞද්ධමතය: සෞගතවාදය යන නමින්ද ජම්බු ද්වීපයෙහි ප්‍රසිද්ධවූ මෙය, භගවත් ශාක්‍යමුනි ගෞතමයන් වහන්සේ විසින්, දෙශනා කරණ ලද බොහෝ දහස්ගණන් ධර්මස්කන්ධයන්ට ඇතුලත් වූ ධර්මය යි. එය ලොකයෙහි විද්‍යමාන වූ යථොක්ත දර්ශනයන් හෝ, යම්කිසි පයඝ්‍රීයකින් ඊට සම්බන්ධ වන සමහර කාරණයන් හෝ ඇසුරු කොට ඇති, පූරාණ වූ සයානුවක් ද මෑතක උපන් සවල්පයක් දූ සි සියයකින් වැඩියක් පාෂාණ්ඩයන් හා චතුර්වේදය යන සියල්ල ශාස්වතවාදීය උච්ඡේදවාදී ය යි දෙකොට්සකට බෙදෙන කල ඒ මධ්‍යවර්තීව ශාස්වතවාදී ද උච්ඡේදවාදී ද නො වෙමින්, ඒ කිසිවක් විසින් සහ ධාර්මික වාදාරොපණයකින් නො මඩින ලදුව ඒ සියල්ලමත් මැඩ ගෙණ අසහාය ව බබලයි.

ඒ ධර්මය ඊට අනුලොම් කොට දක්වන ලද ශ්‍රාවක භාෂිතාදියත් සමග එකට ගෙණ ධර්මස්කන්ධ සුවාසූ දහසකින් සංග්‍රහ කරණ ලදුව ධර්මය විනය ය යි ද්විප්‍රකාර කොට දන්නා ලදී. එයින් විනය නම් ඒ භාග්‍යවතුන් වහන්සේ හා සාජීව. යට පැමිණි භික්ෂූන්ගේ නිරාසව පැවැත්ම සඳහා ආඥ කරණ ලද පැවතුම් විශෙෂය අන්තර්ගත වූ, සුලුවග, මහවග, පාරාජිකා, පචිති, පරිවාර යන නම් ඇති ප්‍රකරණ පස යි. එය **විනයපිටක නමින් එකක් ව ම** තිබිය දී ධර්මය තෙම සූත්‍ර පිටකය, අභිධර්මපිටක ය යි දෙකක් වේ. එයින් දීඝ, මජ්ඣිම, සංයුත්තක, අංගුත්තර, ඛුද්දක, යන නිකාය පසකින් සංගෘහීතවූයේ **සූත්‍රපිටක** ය යි. මෙකී ඛුද්දකනිකාය වනාහී ඛුද්දකපාඨ, ධම්මපද, සුත්තනිපාතාදි සූත්‍රධර්මය අඩංගු සුලු පොත් රාශියකින් සංගෘහීත වෙතත්, මූලුවිනය පිටකය හා මුලු අභිධර්මපිටකය ද ඊට ඇතුලත්කොට සැලකීම එකී වචනයට විරුද්ධ නොවන කරුණු ඇත්තේය.

ධම්මසඞ්ගණී, විභඞ්ග, පුග්ගල, ධාතු, යමක, පට්ඨාන, යන ප්‍රධාන ප්‍රකරණ සය ද, පසුකලක යා කරණ ලද කථාවත්ථුප්පකරණය ද යි සප්තප්‍රකරණයකින් සංගෘහිතවූයේ **අභිධර්ම පිටක** ය යි.

එයින් - ඒ ඒ වෛනෙයජනයාගේ නා නා ප්‍රකාර ආශයානුශය ධර්මයන්ට ද නා නා ප්‍රකාර පාෂාණ්ඩ තීර්ථකයන්ගේ ඒ ඒ සමයයන් අනුව ද ඒ ඒ දෙශකාලාදියට අනුව ද පැවති ප්‍රඥප්තීන්ට ද එකඟ ව අර්ථ වැටහෙන සේ යොදන ලද ධර්මමාර්ගී දෙශනා විලාස පර්යායයන්ගේ නානාත්වයෙන් යුක්ත කොට - ඒ ඒ රොගියාගේ රොග දෙශකාලාදි සියල්ලට එකඟවන සේ යොදන ලද චිකිත්සා විශෙෂයක් සේ දෙශනා කරණ ලද ධර්මය සූත්‍රධර්මය යි. එ හෙයින් ම සූත්‍ර පිටකය වෛද්‍යයෙකුගේ චිකිත්සා යොගසංග්‍රහ (වෙදවට්ටෝරු) පොතකට සමාන වේ. සියලු වෛනෙයයන් කෙරෙහි යෙදිය යුතු ධර්ම විශෙෂයන් යමකාට එකඟවිය යුතු ද, නො හොත් මෙකින් උපුටා ගෙණ ඒ ඒ ලෙස සංස්කාර කොට ගත යුතු ද, එ බඳු වූ සියලු බුද්ධධර්මයට ආධාරයක් මෙන් සියල්ල අර්ථ වශයෙන් අන්තර්ගතවන සේ රචනා කරණ ලද ශාස්ත්‍රය - සියලු රෝගීන්ට සාධාරණවූ, අෂ්ටාඞ්ගායුර්වේද තන්ත්‍රය වැනිවූයේ - අභිධර්මය යි. එ හෙයින් ම සප්තප්‍රකරණාත්මක වූ අභිධර්මපිටකය, ස්ථාන කීපයෙන් සඞ්ගෘහිත වූ ආයුර්වේදතන්ත්‍රයට සමාන වේ මැ යි.

තවද සූත්‍රධර්මයෙහි පරසමයයන්ගේ ද ලෝකයාගේ ද ප්‍රඥප්තියට ප්‍රතිරූපක වූ අර්ථයෝ ද ධර්මයෝ ද භාෂාව ද බොහෝ විට ව්‍යවහාරයට ගෙණ තිබේ අභිධර්මයෙහි වූකලී, ශුද්ධවූ බෞද්ධාර්ථය ද බෞද්ධ ධර්මය ද, බෞද්ධ භාෂාව ද, විශෙෂ වශයෙන් යොදන ලදී. ඒ ලක්ෂණය කොපමණ සපිර ද යි කිවහොත් යම් සූත්‍රාර්ථයක් කියන කල එය අභිධර්මයට එකඟබව පෙණෙන තුරු හරියැටි තේරුම් ගෙණ තිබේ ය යි නොකිය හැක්කේ ය. එකඟ නැතහොත් ඒ අර්ථය ම අබෞද්ධ විය යුතු යි. එ හෙයින් ම අභිධර්මය කෙරෙහි පැවති බහුශ්‍රැතතාවෙහි ප්‍රමාණයෙන් ම බෞද්ධ ධර්මය දැනීමේ ප්‍රමාණය අනුමාන කටයුතු යි.

මේ පිටකත්‍රයට සාධාරණ වූ, මහාපච්චරියට්ඨ කථා, කුරුන්දියට්ඨ කථා, මහාට්ඨ කථා, යන සිංහල අටුවා තුණක් ද, අන්ධකට්ඨ කථා නම් තෙලිඟු අටුවාවක් ද, පුරාණ තෙරවරුන් විසින් කරණ ලදුව පැවත එන අතර, දකුණු ඉන්දියාවෙන් මෙහි පැමිණි බුද්ධඝොස නම් උගත් ස්ථවිර නමක් විසින් ඒ සියල්ල බලා තමා අයිති මහා විහාර වංශයට අභිමත වූ අර්ථ පමණක් ප්‍රමාණ කොට යොදමින් තුන් පිටකයට ම අයිති ප්‍රකරණ වැඩිකොටසකට පාලි භාෂාවෙන් ම වෙන වෙන අටුවා ලියා දී, යථොක්ත සතරට අභාවයට පැමිණෙන්ට මග සලස්වා සියරටට වැඩි ඉක්බිති එ සේ ම පැමිණි ධම්මපාල නම් අනික් ස්ථවිර නමක් විසින් ඉතිරි සියල්ලට ම වාගේ එසේ ම අටුවා ලියනලදී. ඉන් පසු ව ඒ සම්බන්ධ ව පොත් කළ බොහෝ දෙනා අතුරෙන් අනික් පිටක දෙක සම්බන්ධව කළ අතිශයින් වැඩි දෙනා හැර සූක්ෂ්මබුද්ධි විෂය වූ එක ම අභිධර්මපිටකය සම්බන්ධ ව, අට්ඨසාලිනී නම් ධම්ම සඞ්ගණී අටුවාව, සම්මෝහ විනොදනී නම් විභඞ්ග අටුවාව, පඤ්චප්පකරණට්ඨ කථා නම් ඉතිරි ප්‍රකරණ පසේ අටුවාව යන තුණට ම එකට ආනන්දවනරතන නම් තෙරණුවන් විසින් ටීකාවක් ද; ඒ ටීකාවට බදරතිත්ථ ධම්මපාල තෙරුන් විසින් අනුටීකාවක් ද කරණ ලදී. මේ අනුටීකාව ඇතිවූ තැන් පටන් වනරතන ටීකාව මූලටීකා නමින් ප්‍රකට විය. පෙළෙහි ම අර්ථ සංග්‍රහ කොට බුද්ධදත්ත නම් තෙර කෙනෙකුන් විසින් අභිධම්මාවතාර නම්වූ ද, අනුරුද්ධ නම් තෙර කෙනෙකුන් විසින් අභිධම්මත්ථ සංගහ නම්වූ ද, නාමරූප පරිච්ඡෙද නම්වූ ද, පරමත්ථ විනිච්ඡය නම් වූ ද, ධම්මපාල තෙරුන් විසින් ම රූපාරූප විභාග නම් වූ ද, උන්වහන්සේ විසින් ම නොහොත් සමහර කරුණු වලින් හැඟෙන ලෙස ආනන්ද තෙරුන් විසින් ම හෝ සච්චසංඛෙප නම් වූ ද, බුරුම තෙරවරුන් විසින් සුචිත්තාලඞ්කාර නම් වූ ද, පට්ඨානසාර දීපනී නම්වූ ද, යන මේ ආදී වෙන වෙන සංග්‍රහප්‍රකරණ රාශියක් ද, නොයෙක් දෙනා විසින් ඒ ඒ සංග්‍රහ සම්බන්ධ ටීකා, සිංහල සන්න, බුරුම සන්න, ගැටපද ආදි වෙනත් බොහෝ පොත් ද ලියා අර්ථය අතිශයින් ප්‍රකට කරණ ලදී. එපමණ තියුණු නොවන නුවණට පවා විෂය වන සෙසු පිටක දෙක සම්බන්ධ ව කියනු ම කවරේ ද?

තවද වෛශෙෂික මතය කෙරෙහි න්‍යාය දර්ශනය ද, වෙද යෙහි නම් සාංඛ්‍යය කෙරෙහි මීමාංසා දර්ශනය ද ඉපදවූවාක් මෙන් බෞද්ධාගම කෙරෙහි මහා කච්චායන ස්වාමීන් විසින් බෞද්ධ න්‍යාය ය යි ප්‍රසිද්ධ වූ නෙත්තිප්පකරණ නම් ශාස්ත්‍ර යක් ද, ඒ සම්බන්ධ වූ ම පෙටකොපදෙස නම් අනික් ප්‍රකරණ යක් ද කරණ ලදී.

මෙතෙක් දක්වන ලද්දේ ලංකා බුරුම සියම් දෙශවල දනට පවතිනා ස්වභාවයේ බෞද්ධ සමය සඳහා වෙයි. ඊට දකුණු බුද්ධාගම ය යි කියති. ඒ සම්බන්ධ පොත්වල පෙණෙනා දෙවෙනි තුන්වැනි ධර්ම සඞ්ගායනාවලින් පිට දමන වෛතුල්‍ය වාදයන් ඇසුරුකොට උපදවනලදැයි මේ දක්ෂිණාත්‍යයන් විසින් කියනු ලබන්නා වූ, නෙපාල, භොතාන, ටිබැට්, චීන, ජපන් දෙශවල නොයෙක් නොයෙක් ප්‍රභෙද ඇති ව උතුරු බුද්ධාගම නමින් සාකල්‍යයෙන් හෝ කොටස් වශයෙන් හෝ මේතාක් පවත්නා යටකී චතුර්විධ සමය සම්බන්ධ පොත් අතුරෙන් මාධ්‍යමිකාවෘත්ති, චතුෂ්පිටක සමාධිරාජ යනාදී ස්වල්පයක් අභිධර්ම ප්‍රතිරූපක ධර්මය නො වේ නම් විකලාභි ධර්මය අඩංගු වෙති. සෙසු වූ කාරණ්ඩව්‍යුහ, භූතචාමරාදිය වෙදවාදීන්ගේ පුරාණ ප්‍රකරණයන්ට හුඟක් දුර සමාන කළ හැකි දෙවකථා ප්‍රධාන ප්‍රබන්ධ විශෙෂයකි. සෙසු චීනාදී භාෂා සම්බන්ධ පොත් ගැණ ඍජුව කියන්ට නො දනිමු. ඒ වෛතුල්‍යවාද සංස්කෘත පොත් සමහරක් සිංහල රජුන් දවස නොයෙක් දෙන විසින් නොයෙක් වර මෙහි ගෙණවුත් පතල කරන්ට උත්සාහ කළ නමුත් ධර්මවාදී රජුන් හා උගතුන් විසින් නැවත නැවත නෙරපණ ලදුවත් ලඞ්කා ශාසනය අනාථ වූ මේ කල බලා සමහර අධර්මවාදීන් විසින් මේ අන්තිමවරට මාධ්‍යමිකාවෘත්තිය ගෙණවුත් පතල කරන්ට පටන් ගන්නා තුරු දඹදිවම පැවැත්තේ ය.

මෙ කී දර්ශනයන් අතුරෙන් බෞද්ධමතය ම සෙසු සියල් ලෙහි වාද නිරාකරණය කළ හැකි බැවින් හා ඒ කිසිවක් විසින් නිරාකරණය නො කළ හැකි බැවින් ශ්‍රෙෂ්ඨ ය යි ද, ඒ මගින් උත්තමාර්ථයට පැමිණියහැකිවීමට එයම යුක්තියබැවින් අර්ථ සංහිතයයිද,සෙසු සියල්ලම අර්ථසංහිත බවට එයමයුක්තිය

බැවින් මෙය ම සුලභ වන සේ ප්‍රකාශ කටයුතු ය යි ද, හගින් නාවූ අපි එහි සාරාර්ථය අඩංගු අභිධර්මය, සිංහල භාෂාව මිස ඉන් වැඩියක් නොදන්නා අව්‍යුත්පන්න ජනයාට පවා සුඛාව බෝධ වන සේ සිය බසින් පැහැදිලිකොට මහජනයා ඉදිරියෙහි තබන්ට අදහස් කළෙමු. ඒ සඳහා පොත් සුලභ කිරීමට පහසු වූ ද, අවබෝධ කරවීමට පහසු වූ ද ක්‍රමය කොට දැනට ලංකා බුරුම සියම් රාජ්‍යවල අභිධර්මය උගන්නා කැමැත්ත වුන් විසින් ඇසුරු කරණු ලබන්නාවූ ද ඉතා පැහැදිලි ක්‍රම අඩංගුවූ ද, අවිච්ඡින්න ආචාර්ය පරම්පරාගත වාචනා මාර්ගයෙන් අප විසින් උගන්නා වූ ද, අභිධම්මත්ථ සංගහ නම් ප්‍රකරණගත ක්‍රමය ම තෝරා ගෙණ එය ඇසුරුකොට මේ සඞ්ග්‍රහය ලියනු ලැබේ.

මෙය එ ම අභිධම්මත්ථ සංගහයෙහි භාව සන්නයකැයි සිතීමට පවා යුතුකම් ඇති වන තරමට ඊට එතඟ වන නමුත් අමුතු ම සංග්‍රහයක් බව වැඩිදුර පරීක්ෂාවෙන් පෙණී යනවා ඇති.

මෙහි ආධුනිකයන්ගේ සුඛාවබෝධය පිණිස භාෂාව හැකි පමණ ලිහිල් කොට බෙහෙවින් විස්තර ද කරණ ලද නමුත් තවත් ඇති වී තිබෙන දුර්බෝධතාව මේ ධර්මයාගේ ම ගැඹුරු බව හේතුකොටගෙණ වෙයි. උඳු මූං පමණට කඩා දියේ පොඟවා ගත් මුත් වාතයෙහි තදය දතට තැලෙන සේ බොලොක් නොවේ මැ යි. එහෙත් කිණිහිරි කුළුගෙඩි මෙන් වීර්‍ය්‍ය ප්‍රඥ දෙක ව්‍යවහාර කරණ කල මෙල්ල නො වන ගතියක් මෙහි නැත්තේ ය.

පරමාර්ථ ධර්මයන් කෙරෙහි ශ්‍රද්ධානුගත මෙ බඳු විනිශ්චය දැනීමක් නැති කිසිවෙක් බුද්ධාගමිකාරයෙකැයි කියා වත් සම්‍යක් දෘෂ්ටිකයෙකැ යි කියා වත් පිළිගතයුතු නො වන්නේ ය. එ බැවින් සිංහල බෞද්ධ ජනතාවට මේ පොත කොබඳුදැ යි කීම කර්තෘහට භාර නො වෙතත් සිතීම ලොකයාට භාර යි.

W. D. C. Wagiswara.

# අභිධර්මය

## නමඃස්සව්ඥය

**යඃ ක්ෂෙත්‍රඥොපලබ්ධිනා,**
**ප්‍රාබුවිශෞධව්‍යශශ්‍රීණෝ;**
**සිධානාසැවනමශ්ශාසෙත්‍ර**
**තා සමායද්වයවාදිනෙ.**

ස්වභාව වශයෙන් විද්‍යමාන වූ සියලු ධර්මයන් I. **චිත්තය**– II, **චෛතසිකය**– III. **රූපය**– IV, **නිර්වාණය** සි පරමාර්ථ හෙයින් සතර කොටසකට බෙදා එහි විශෙෂ විභාගයන් සම්බන්ධ ව උගන්වන ශාස්ත්‍රය **අභිධර්මය සි.**
එහි:–

I. චිත්තය නම්:– සත්ත්වයා සම්බන්ධ වූ වෙදනා සංඥා රාග ද්වෙෂ මොහාදී නොයෙක් අරූපි ධර්මයන්ට (වර්ණ ගන්ධ රසා–දීන්ට ද්‍රව්‍යය මෙන්) ආධාර වූ අරූපී ම වූ විඥාන ධර්මය සි.

II. **චෛතසිකය** නම්:– (ද්‍රව්‍යයෙහි වර්ණ ගන්ධ රසාදිය මෙන්) ඒ සිතේ පිහිටි වෙදනා සංඥා රාග ද්වෙෂාදි ධර්මයෝ සි.

III. **රූපය** නම්:– සත්ත්වයා සම්බන්ධ ද බාහිර ද වූ බහුල වශයෙන් ම පඤ්චෙන්ද්‍රිය විෂය වූ දෙය ප්‍රධාන කොට ඇති ඖදාරික හෙවත් ස්ථූල ව වැටහෙන කොටස සි.

IV. **නිර්වාණය** නම්:– ඒ ත්‍රිවිධ සංස්කාරයන්ට විපරීත වූ අසංඛත ධාතුව සි. මේ සතරින් පිටත් වූ යම් කිසිවක් ස්වභාව යෙන් ම නැත්තේ ය. එහෙයින් මේ විභාගය සියලු ධර්මයන් විෂය කොට පවතීමැයි.

1. එහි දක්වූ **චිත්තය** එක ම දුවත් තමා තුළ යෙදෙන චෛතසිකයන්ගේ ද, තමා එල්බී පවතින අරමුණුවල ද යන මේ ආදීන්ගේ වෙනස් කමින් i. **කාමාවචරය**– ii. **රූපාවචරය**– iii. **අරූපාවචරය** iv. **ලොකොත්තරය** සි භූමි හෝ ජාති වශයෙන් චතුර්විධ වේ. ඉන්:–

i. **කාමාවචර** චිත්තය වනාහි a. අකුසල 12 ක, b. අහේතුක 18 ක, c. සෝභන 24 කැයි තුන් ප්‍රකාරයකින් 54 ක් වේ. ඒ මේ සේ සි:-

a. **සෝමනස් සහගත වූ** (හෙවත් මානසික සැප වේදනාවෙන් යුක්ත වූ **දෘෂ්ටිගත සම්ප්‍රයුක්ත** වූ(හෙවත් ඇත්ත ඇති සේ නොව විපරීත වශයෙන් ගන්නා මිථ්‍යා දෘෂ්ටියෙන් යුක්තද වූ) අසංස්කාරික වූ (හෙවත් නිසි ඍතුවෙහි නිසි සාරවත් බිම නිරුපද්‍රවයෙන් එරුණා වූ පිටි පිරුණ අලයක් තම්බා ගත්තා සේ නොහොත් ආකරයෙන් උපුටා ගත් නිසි ඌරුව ඇති මැණිකක් සේ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ දුර්වලතාවයක් නැති ව බලවත් ව උපදනා වූ)එක් සිතක් හා;එ සේ ම( ඍතු භූමි විපත්‍යාදියෙන් නිසරු ව එරුණ අලයක් අමුතුවෙන් පිටි දමා පිසන ලද්දක් සේ නොහොත් අමුතුවෙන් සායම් පෙවූ ගලක් සේ යම්කිසි ප්‍රත්‍යයකින් ඇති කරණ ලද චිත්ත චෛතසික යන්ගේ දුර්වලතාවය තිබිය දී අතික් ප්‍රත්‍යයක් විසින් අනුබල දෙන ලදුව පළමු කී සිතේ නිපුණ ස්වභාවට ආසන්න ස්වභාව ඇති වූ සසංස්කාරික එක් සිතක් ද;සෝමනස්ස සහගත වූ දෘෂ්ටි විප්‍රයුක්ත වූ(හෙවත් යථෝක්ත මිථ්‍යාදෘෂ්ටිය නො යෙදුනා වූ සසංස්කාරික වූ එකක් හා අසංස්කාරික වූ එකක් ද;උපේක්ෂා සහගත වූ (හෙවත් යටකී මානසික සැපය නැති ව මධ්‍යස්ථ වේදනාවෙන් යුක්ත වූ දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික එකක් හා සසංස්කාරික එකක් ද;උපේක්ෂා සහගත වූ දෘෂ්ටි විප්‍රයුක්ත වූ අසංස්කාරික එකක් හා සසංස්කාරික එකක් දැයි මේ **8 ලෝභ මූලිකයෝය** යි කියා ද;

දෙම්නස් සහගත වූ(හෙවත් මානසික දුක් වෙදනාවෙන් යුක්ත වූ) ප්‍රතිඝ සම්ප්‍රයුක්ත(හෙවත් වෛරයෙන් ද යුක්ත) වූ යට කී සේ ම අසංස්කාරික එකක් හා සසංස්කාරික එකක් දැයි මේ **දෙක ද්වේෂ මූලිකයෝ** ය යි කියාද;

උපේක්ෂා සහගත වූ උද්ධච්චයෙන්(හෙවත් ඇවුස්සුනු අලු ගොඩක් අලුහුනු ගොඩක් කුහුඹු මූලක් සේ සිත නො සන්සිඳුනාවූ කලබල ගතියෙන්)යුක්ත වූ එක් සිතක් හා උපේක්ෂා සහගත වූ විචිකිච්ඡා* සහගත වූ (හෙවත් මංමුළාවූවෙක්හට

* මෙහි සමහර තැනක පාලි නාමය ද, සමහර තැනක සංස්කෘත නාමය ද ව්‍යවහාරයට ශොභන පරිදි බලා යොදනු ලැබේ.

දෙමංසන්ධියක් සමග වූ විට කොයි එකෙන් යායුතු දැ යි නිශ්චය කට නො පැමිණෙමින් දෙකෙහි ම සැක කරන්නා සේ එක් අරමුණක සිත ස්ථිර ව නො පිහිටන ශඞ්කා ගතියෙන් යුක්ත වූ) එක් සිතක් දැ යි මේ දෙක **මෝහ මූලිකයෝ ය යි** කියා ද එක්කොට ගත්කල මේ **දොළස අකුසල** චිත්තයෝ යි.

> “අට්ඨධා ලොභ මූලානි දොස මූලානි ච ද්විධා,
> මොහ මූලානි ච ද්වෙ ති ද්වාදසා කුසලා සියුං.”

(ලොභ මූලික සිත් 8 ක, ද්වේෂ මූල 2 ක, මෝහ මූල 2 කැයි අකුශල සිත් 12 ක් වෙති යනු මේ ගාථාවේ අර්ථ යි.) මෙසේ මතුද ඒ ඒ තන්හි ගණන් සිත්හි තබාගැනීමට පහසු වන පිණිස උද්දාන ගාථාවන් ද එ සේ ම කටපාඩමෙන් දැරීමට අවශ්‍ය වූ වෙනත් ගාථා ද යොදන්නෙමි.

b. 1. උපෙක්ෂා සහගතවූ චක්ඛු විඤ්ඤාණ සිතය. (හෙවත් ඇසින් රූපය දැකීම් මාත්‍රවූ සිතය,) එසේම උපෙක්ෂා සහගත වූ සොත විඤ්ඤාණ සිත ය, උපෙක්ෂා සහගත වූ ඝාණ විඤ්ඤාණ සිත ය; උපෙක්ෂා සහගත වූ ජිව්හා විඤ්ඤාණ සිත ය; දුක්ඛ සහගත වූ හෙවත් කායික දුක් වේදනාවෙන් යුත්) කාය විඤ්ඤාණ සිත ය; උපෙක්ෂා සහගත වූ සම්පටිච්ඡන (හෙවත් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ යන පස් අරමුණ පිළිගන්න) සිත ය, උපෙක්ෂා සහගත වූ සන්තීරණ (හෙවත් ලත් අරමුණ මෙනම් ය යි තීරණය කරණ) සිත ය යන මේ පෙර කළ පව්කමින් අනිෂ්ට වූ රූපාදී පස් අරමුණු විෂයයෙහි උපදින **සත අකුසල විපාක සිත්ය යි** කියා ද;

2. එසේ ම උපෙක්ෂා සහගත වූ චක්ඛු විඤ්ඤාණ සිතය; සොතවිඤ්ඤාණ සිතය, ඝාණවිඤ්ඤාණ සිතය, ජිව්හාවිඤ්ඤාණ සිත ය, සුඛ සහගත වූ (හෙවත් කායික සැප වේදනාවෙන් යුක්ත වූ කාය විඤ්ඤාණ සිත ය, උපෙක්ෂා සහගත වූ සම්පටිච්ඡන සිත ය,සොමනස්ස සහගත වූ අමුතු ම සන්තීරණ සිතකුත් සමග උපෙක්ෂා සහගත වූ සන්තීරණ සිත ය, යන පෙර කළ පින්කමින් ඉෂ්ට වූ රූපාදී පස් අරමුණු විෂයයෙහි උපදනා මේ **අට කුශල විපාක අහෙතුකය යි** කියා ද;

3. උපෙක්‍ෂා සහගත වූ පඤ්චද්වාරාවර්ජන (හෙවත් චක්‍ෂුරාදී ද්වාර පසින් යම් කිසිවක් අරමුණු ගන්නා පිණිස විවෘත කරන්නාක් මෙන් උපදනා) සිත ය, උපෙක්‍ෂා සහගතවූම මනොද්වාරාවර්ජනය(හෙවත් මනොද්වාරයෙන් යම් අරමුණක් ගැණීම පිණිස ඒ දොර විවෘතකරන්නාක් මෙන් ද පස්දොරින් සන්තීරණය කරණ ලදුව පැමිණි අරමුණ කෙරෙහි කුශලාකුශලාදී වශයෙන් පිළිපැදිය යුතු පරිද්ද ව්‍යවස්ථා කරමින් ද උපදනා වූ සිත ය,) සොම්නස් සහගත වූ හසිතුප්පාද(හෙවත් සෙසු සිනහ උපදවන සිත් මෙන් නො ව ලොභ අලොභාදී කිසි හෙතුවක් නැතිව ම රහතුන්ට විශෙෂ වශයෙන් පහළ වන සිනහව උපදවන) සිත ය, යන **තුන අහෙතුක ක්‍රියා සිත් ය** යි කියා ද එක් කොට ගත් කල මේ **18 අහෙතුක විඥානයෝ** යි.

"සත්තාකුසලපාකානි පුඤ්ඤපාකානි අට්ඨධා,
ක්‍රියා චිත්තානි තීණීති අට්ඨාරස අහෙතුකා."

(අකුසල විපාක 7 ක, කුසල විපාක 8 ක, ක්‍රියා සිත් 3 කැ යි අහෙතුක සිත් 18 ක් වෙති යනු එහි අර්ථ යි.)

මෙහි ලොභය ද්වෙෂය මොහය අලොභය අද්වෙෂය අමොහය (හෙවත් ප්‍රඥාව ය) යන සය හෙතුහු ය යි සලකා එයින් කිසිවක් මේ සිත්වල නැති හෙයින් මේවාට **අහෙතුකය** යි කියා ද, අකුසල සිත්වල ලොභ ද්වෙෂ මොහ වශයෙන් හා මතු මේ කාමාවචර කාණ්ඩයෙහි පමණක් නොව චිත්ත කාණ්ඩය නිම වන තුරු ම දක්වනු ලබන ''**ශොභන**''නම් ලත් ඉතිරි සියලු සිත්වල ම අලොභ අදොස අමොහ වශයෙන් ද යෙදෙන බැවින් ඒවාට **සහෙතුක** ය යි කියා ද, මෙකී අකුසල සිත් 12 ද අහෙතුක 18 ද යන 30 ට **ශොභනෙතරය** හෙවත් **අශොභනය** යි කියා ද කියනු ලැබේ.

c. 1. සොම්නස් සහගත වූ ඥාන සම්ප්‍රයුක්ත වූ(හෙවත් අමොහයෙන් යුක්ත වූ)අසංස්කාරික වූ එකක් යා සසංස්කාරික වූ එකක් ද,සොම්නස් සහගත වූ ඥාන විප්‍රයුක්ත වූ හෙවත්

අලෝභයෙන් යුක්ත නොවූ*) අසංස්කාරික එකක් හා සසංස් කාරික එකක් ද, උපෙක්ෂා සහගතවූ ඥාන සම්ප්‍රයුක්ත වූ අසංස්කාරික එකක් හා සසංස්කාරික එකක් ද, උපෙක්ෂා සහගත වූ ඥානවිප්‍රයුක්ත වූ අසංස්කාරික එකක් හා සසංස්කාරික එකක් දැයි මේ 8 කාමාවචර කුශලයෝ ය යි කියා ද;

2. මතු ඉදිරියෙහි ගන්නා සමහර කරුණු වලින් මිස මෙහි කී සියලු ලකුණු වලින් මේ 8 ටම සමානවූ 8 ක් සහේතුක කාමාවචර විපාකයෝ ය යි කියා ද;

3. එසේ ම 8 ක් සහේතුක කාමාවචර ක්‍රියා චිත්තයෝ යයි කියා ද එක් කොට ගත් කල මේ 24 සහේතුක කාමාවචර ශෝභන චිත්තයෝ යි. *

"වේදනා ඤාණ සඞ්ඛාර භෙදෙන චතුවීසති,
සහෙතු කාමාවචර පුඤ්ඤපාකක්‍රියා මතා."

(සෞමනස්‍ය උපෙක්ෂායන වේදනාභෙදය සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත යන ඥාන භෙදය, සසංස්කාර අසංස්කාර යන සංස්කාර භෙදය, යන මේ තුණින් භෙද වූ සහේතුක කාමාවචර කුසල විපාක ක්‍රියා සිත් 24 දන්නා ලද්දාහු ය යනු මෙහි අර්ථයි.)

මෙසේ කාමාවචර සිත් සිව් පණස කියා නිම කරණ ලදී.

---

"කාමෙ තෙවීසපාකානි පුඤ්ඤාපුඤ්ඤානි වීසති,
එකාදස ක්‍රියාචෙති චතුපඤ්ඤාස සබ්බථා."

(කාමාවචරයෙහි අකුසල 7 ය, අහේතුක කුසල විපාක 8 ය, සහේතුක කුසලවිපාක 8 ය යි විපාක 23 ක් ද; කුසල 8 ය අකුසල 12 ය යි කුසලාකුසල (කර්මසිත්) 20 ක් ද; අහේතුක ක්‍රියා 3 ය සහේතුක ක්‍රියා 8 ය යි ක්‍රියාසිත් 11 ක් දැ යි සර්ව ප්‍රකාරයෙන් ම 54 ක් වෙති යනු එහි අර්ථ යි.)

කාමාවචර චිත්ත පාදය යි

---

* මෙහි අලෝභයෙන් යුක්ත නු වූ ය යි කීකල ලෝභයෙන් යුක්ත දැයි ප්‍රශ්නයක් නැඟේ. නුමුත් අලෝභයා නො සිටියේ ය යි කී කල මනුෂ්‍යයෙක් සිටියේය යි නො හැඟෙන්නාක් මෙන් මෙහි ද යටකී දෘෂ්ටි විප්‍රයුක්ත භාවාදියෙහි ද මතුත් බොහෝ තැන්වල ද එක් ධර්මයෙක අභාවය කීම ප්‍රතිවිරුද්ධ ධර්මයාගේ ඇතිවීම කී බැව් නො වන පරිද්ද සැලකිය යුතු.

* මේ විපාක ක්‍රියා සිත් ගැණන් අනතුරු පාදයෙහි දක්වනු ලබන කරුණු බොහෝ සෙයින් එලෙස ම යි.

ii. **රූපාවචර සිත** කුසල 5 ය, විපාක 5 ය, ක්‍රියා 5 ය යි තුන් ප්‍රකාරයකින් 15 ක් වේ. ඒ මේ සේ යි:-

1. විතර්කය (හෙවත් අරමුණට නැගීම ය) විචාරය(හෙවත් අරමුණ පිට හැසිරීම ය) ප්‍රීතිය (හෙවත් පිණා ගිය ස්වභාවය) සුඛය (හෙවත් සොම්නස් වෙදනාව ය) එකාග්‍රතාව(හෙවත් ඒ ගත් එක ම අරමුණ මිස අන් අරමුණක් අපෙක්‍ෂා නො කිරීම ය) යන මේ චෛතසික ධර්ම පස ගත් අරමුණ කෙරෙහි ස්ථිර ව පිහිටීම විශෙෂ ලක්‍ෂණ කොට ඇති ව(මතුචෛතසික කාණ්ඩ යේදී විස්තර වශයෙන් දක්වනු ලබන තවත් බොහෝ චෛත සිකයන්ගෙනුත් යුක්ත ව)උපදනා **ප්‍රථමධ්‍යාන** කුසල සිතද; එකි ධ්‍යානාඞ්ග පසින් විතර්කය නැති ව ඉතිරි විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යන සතරින් යුක්ත ව එලෙසම උපදනා වූ **ද්විතීය ධ්‍යාන** කුසල සිත ද,-විතර්ක විචාර යන දෙක නැතිව ඉතිරි ප්‍රීති සුඛ එකාග්‍රතා යන තුණින් යුක්තව එසේම උපදනා **තෘතීයධ්‍යාන** කුසලසිත ද,-විතර්ක විචාර ප්‍රීති යන තුණ නැතිව ඉතිරි සුඛ එකාග්‍රතා යන දෙකින් යුක්තව එසේ ම උප දනා **චතුර්ථධ්‍යාන** කුසලසිත ද,-එම තුණ එලෙස ම නැති ව සුඛය හෙවත් සොම්නස් වේදනාව නොව ඒ වෙනුවට උපෙක්‍ෂා වෙදනාව ඇතිව එකාග්‍රතාව පමණක් එ ලෙස ම ඇති ව උප දනා **පඤ්චමධ්‍යාන** කුසලසිත ද, යන මේ ධ්‍යාන සිත් **පස, රූපාවචර කුසල සිත්** නම් වෙති.

2. එ ලෙස උපදින කුසලසිත් පගේ විපාක භාවයෙන් ඒ ඒ රූපාවචර භවයෙහි ප්‍රතිසන්ධි වශයෙන්ද භවයාගේ ශරීරය හෙවත් මද්‍ධ්‍යය වූ භවාඞ්ග වශයෙන් ද කෙලවර චුති වශ යෙන් ද ලැබෙන්නා වූ ඒ ඒ කුසලට ම සමාන ලක්‍ෂණ ඇති ප්‍රථමධ්‍යාන විපාක සිතය, ද්විතීයධ්‍යාන විපාක සිත ය, තෘතීය ධ්‍යාන විපාක සිතය, චතුර්ථධ්‍යාන විපාක සිත ය, පඤ්චමධ්‍යා න විපාක සිත ය යන **පස,රූපාවචර විපාක සිත්** නම් වෙති.

3. එ සේ ම මතු භවොත්පත්තියක් නැති රහතුන්ට කර්ම තාවය හෙවත් මතු විපාක උපදවන්ට හැකි බීජස්වභාව නැති සිත් මිස මතු භවයක් අපෙක්‍ෂා කරණ සිත් නූපදනා බැවින්

ඒ කර්මවශයෙන් හා මතු කියැවෙන සවල්පයකින් පමණක් මිස අතික් හැම අතින් ම කුසල පසට ම සමාන වූ ප්‍රථම ධ්‍යාන ක්‍රියා සිත ය යනාදී වූ **පස, රූපාවචර ක්‍රියා සිත්** නම් වෙති මෙසේ මේ 15 ස් වැදෑරුම් චිත්තය **රූපාවචර චිත්තය** සි කියනු ලැබේ.

"පඤ්චධා ඣානභෙදෙන රූපාවචර මානසං,
පුඤ්ඤපාකක්‍රියාභෙදා තංපඤ්චදසධා භවෙ."

(ඒ රූපාවචර සිත ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන භෙදයෙන් 5 ප්‍රභෙද වෙයි ඉන් එකක් එකක් ම කුසලය විපාකය ක්‍රියාවය යන භෙදයෙන් (තුන් තුන් භෙද වන බැවින්) 15 ස් වැදෑරුම් වේය යනු එහි අර්ථ යි.

**රූපාවචර චිත්තපාදය යි.**

iii. **අරූපාවචර චිත්තය** කුසල සතරක විපාක සතරක ක්‍රියා සතරකැ යි තුන් ප්‍රකාරයකින් දොළොස් ප්‍රභෙද වේ. ඒ මෙසේ යි.

1. පඤ්චමධ්‍යානසිතම අනන්තාකාශ අරමුණෙහි පිහිටීම් වශයෙන් උපදනා ආකාසානඤ්චායතන කුසල සිත ද, එම ආකාසානඤ්චායතන සිත්හි පැවතුන විඤ්ඤාණය අරමුණු කොට පිහිටීම් වශයෙන් උපදනා විඤ්ඤාණඤ්චායතන කුසල සිතද, එය උපන් කල පළමු තිබුන ආකාසානඤ්චායතන සිත නැති බව අරමුණු කොට උපදනා ආකිඤ්චඤ්ඤායතන කුසල සිතද ඒ කිසිත් නැත යන අරමුණේ පිහිටි සිතෙහි ඇති සංඥ වේ දුර්වල භාවය අරමුණුකොට පිහිටීම් වශයෙන් උපදනා නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලසිත ද යන මේ **4 අරූපාවචර කුසල සිත්** නම් වෙති.

2. ඒ ඒ කුසලකර්මයෙන් ලැබිය යුතු භවයෙහි ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් ලැබෙන්නාවූ ද ඒ ඒ කුසලට සමාන, ලක්ෂණ ඇත්තාවූ ද ආකාසානඤ්චායතන විපාක සිතය විඤ්ඤාණඤ්චායතන විපාක සිතය ආකිඤ්චඤ්ඤායතන විපාක සිත ය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක සිත ය, යන **4 අරූපාවචර විපාක චිත්තයෝ** නම් වෙති.

3. එසේ ම රූපාවචර පාදයෙහි කී ලෙස නාමිභාවාදියෙන් පමණක් වෙනස් ව කුසල ලක්‍ෂණයෙන් රහතුන්ට උපදනා **4 අරූපාවචර ක්‍රියා සිත්** නම් වෙති මෙසේ වේ 12 වැදෑරුම් චිත්තය **අරූපාවචර චිත්තය** යි කියනු ලැබේ.

"ආලම්බනප්පභෙදෙන චතුධාරුප්පමානසං,
පුඤ්ඤපාකක්‍රියාභෙද පුන ද්වාදසධා ඨිතං."

(එක ම පඤ්චමධ්‍යානය වුවත් ඒ සිතට ගත් අරමුණේ භෙදයෙන් 4 වැදෑරුම් වූ අරූපාවචර සිත එකක් එකක් ම-නැවත කුසල ය විපාක ය ක්‍රියාව ය යන භෙදයෙන් තුන් තුන්වැදෑරුම් වන බැවින් 12 වැදෑරුම් වේ යනු එහි අර්ථ යි.)

**අරූපාවචර චිත්ත පාදය යි.**

iv. **ලොකොත්තර** ය: කුසලසතරක විපාක සතරකැ යි ද්විප්‍රකාරයකින් අට වැදෑරුම් වේ. ඒ මෙසේ යි:-

1. දෘෂ්ටිය හෙවත් ඇතිසැටිය හැර වරදවා ගැන්ම ද විචිකිච්ඡාව හෙවත් මේ ඇතිසැටිය මේ විපරිතය යි විනිශ්චයකට නො නැමුණ දෙකොහිම සැක කිරීමද යන සංයොජන ධර්මයන් දෙදෙනා* මූලොච්ඡෙද වශයෙන් නසන්නා වූ සොතාපත්ති මාර්ග සිත ද කාමරාගය හෙවත් රූපාදීඅරමුණු පසෙහි ආලය ද ව්‍යාපාදය හෙවත් ද්වේෂය ද යන සංයොජන දෙදෙනා නැවත දියුණු නො වන පරිද්දෙන් තුනී කරන්නා වූ සකෘදාගාමි මාර්ග සිත ද,-එම සංයොජන දෙක මූලොච්ඡෙද වශයෙන් නසන්නා වූ අනාගාමි මාර්ග සිත ද,-තවත් ඉතිරි ව සිටි රූප රාග අරූප රාග මාන උද්ධච්ච අවිජ්ජා යන සියලු සංයොජනයන් ම මූලොච්ඡෙද වශයෙන් නසන්නා වූ අර්හත්තමාර්ග සිත ද යන මේ **4 ලොකොත්තර කුසලචිත්තයෝ** නම් වෙති.

2. ඒ ඒ මාර්ගසිතට අනතුරු ව ම ද ඒ ඒ කුසලයෙහි විපාක වශයෙන් ලැබෙන්නා වූ සොතාපත්ති ඵලය සකෘදාගාමි ඵලය අනාගාමි ඵලය අර්හත්ත ඵලය යි යන මේ **4 ලොකොත්තර විපාක චිත්තයෝ** නම් වෙති. මෙ සේ අටවැදෑරුම් චිත්තය **ලොකොත්තර චිත්තය** යි කියනු ලැබේ.

---

*මෙහි සීලබ්බතපරාමාසයත් දිට්ඨිවිශෙෂයක් බව නොදන "මේ දෙදෙනා" යන්නට දෙස්කියන්නෝ ඇති බැව් දනිමු. ඒ අභිධර්මය නො දන්නාන්ගෙන් කම්කිමිද? මේ අර්ථය මතු සමුච්චයසංග්‍රහයෙහි විස්තර වේ.

"චතුමග්ගප්පභෙදෙන චතුධා කුසලං තථා
පාකං තස්ස ඵලත්තාති'අට්ඨධානුත්තරං මතං."

(මාර්ග සතරේ ප්‍රභෙදයෙන් සිව් වැදෑරුම් වූ කුසලය ද, ඒ ඒ සිතෙහි ම ඵලය බැවින් එසේ ම 4 වැදෑරුම් විපාකය ද යි ලොකොත්තර සිත 8 වැදෑරුම් වේ යනු එහි අර්ථ යි.)

## මේ අට්ඨලොකුත්තරික නය යි

මේ ලොකොත්තරසිත් අටින් එක එකම පස් පස් ආකාර යෙන් පිහිට යි. ඒ මෙසේ යි:-විතර්ක විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යුක්ත වීම් වශයෙන් ප්‍රථමධ්‍යාන ලක්‍ෂණයෙන් ද; විචාර ප්‍රීති සුඛ එකාග්‍රතා යුක්තවීම් වශයෙන්ද්විතීයධ්‍යාන ලක්‍ෂණයෙන් ද, ප්‍රීති සුඛ එකාග්‍රතා යුක්ත වීම් වශයෙන් තෘතීයධ්‍යාන ලක්‍ෂණ යෙන් ද, සුඛ එකාග්‍රතා යුක්ත වීම් වශයෙන් චතුර්ථධ්‍යාන ලක්‍ෂණයෙන් ද, උපෙක්‍ෂා එකාග්‍රතා යුක්ත වීම් වශයෙන් පංච මධ්‍යාන ලක්‍ෂණයෙන් ද, යන මේ පස් ආකාරයෙනි. එවිට පඨමජ්ඣාන සොතාපත්තිමග්ග ය; දුතියජ්ඣාන සොතාපත්ති මග්ග ය, තතියජ්ඣාන සොතාපත්තිමග්ග ය, චතුත්ථජ්ඣාන සොතාපත්තිමග්ග ය, පඤ්චමජ්ඣාන සොතාපත්තිමග්ගය යි යන සෝවාන් මාර්ග 5 ද; එසේ ම පඨමජ්ඣාන සකදාගාමි මග්ග යන ආදි සකෘදාගාමි මාර්ග 5 ද; පඨමජ්ඣාන අනාගාමි මග්ග යනාදී අනාගාමි මාර්ග 5 ද, පඨමජ්ඣාන අරහත්ත මග්ග යනාදී අර්හත්මාර්ග 5 ද යි මාර්ග සිත් ම 20 ක් ද;-එසේ ම පඨමජ්ඣාන සොතාපත්ති ඵලය යනාදී වශයෙන් ඵලසිත් පස පස බැගින් 20 ක් දැයි **ලොකොත්තර සිත් 40 ක් වෙති.**

"ඣානඞ්ගයොගභෙදෙන කත්වෙකෙකන්තු පඤ්චධා,
වුච්චතානුත්තරං චිත්තං චත්තාළීස විධන්ති ච."

(විතර්කාදි ධ්‍යානාඞ්ගයන්ගේ යෙදීමේ වෙනස් කමින් ලොකොත්තර සිත් අටෙන් එක එක ම පස් පස් වැදෑරුම් කොට ලොකොත්තර චිත්ත ය 40 ක් වැදෑරුම් වේ ය යි කියනු ලැබේ යනු එහි අර්ථ යි.)

මේ සමචත්තාළීස ලොකුත්තරික නය යි.

**ලොකුත්තර චිත්තපාදය යි.**

මෙතැන් පටන් චිත්තයන්ගේ මිශ්‍රක විභාගයක් දක්වනු ලැබේ.

(අට්ඨලොකුත්තරික නයින්:–)

"ද්වාදසාකුසලානෙවං කුසලානෙකවීසති,
ඡත්තිංසෙව විපාකානි ක්‍රියාචිත්තානි වීසති."

(මෙතෙක් දක්වන ලද අනුසාරයෙන් ලොභමූලික 8 ද, ද්වෙෂමූලික 2 ද, මොහ මූලික 2 දූයි අකුසල් සිත් 12 ක් ද, කාමාවචර කුසල් 8 ද, රූපාවචර කුසල් 5 ද, අරූපාවචර කුසල් 4 ද, ලොකොත්තර කුසල් 4 දූ යි කුසල්සිත් 21 ක් ද; අකුසල විපාක 7 ද, කුසලවිපාකාහෙතුක 8 ද, සහෙතුක කාමාවචර විපාක 8 ද, රූපාවචර විපාක 5 ද, අරූපාවචර විපාක 4 ද, දූ යි විපාක සිත් 36 ක් ද; අහෙතුක ක්‍රියා 3 ද, සහෙතුක කාමාවචර ක්‍රියා 8 ද, රූපාවචර ක්‍රියා 5 ද, අරූපාවචර ක්‍රියා 4 දූ යි ක්‍රියා සිත් 20 ක් ද වෙති.)

"චතුපඤ්චඤ්සධා කාමෙ රූපෙ පණ්ණරසීරයෙ.
චිත්තානිද්වාදසාරූපෙප අට්ඨධානුත්තරෙ තථා."

(කාමාවචර වර්ගයෙහි "කාමෙ තෙවීසපාකානි" යනාදීන් දක්වූ 54 ක් ද,;රූපාවචරයෙහි"පඤ්චධාඣාන භෙදෙන"යනාදීන් දක්වූ 15 ක්ද–අරූපාවචර වර්ගයෙහි "ආලම්බනප්පභෙදෙන" යනාදීන් දක්වූ 12 ද, ලොකොත්තරවර්ගයෙහි "චතුමග්ගප්පභෙදෙන" යනාදීන් දක්වූ 8 ක් ද වෙති.

මේ එකූනනවුති චිත්ත විභාගය යි.

(සම චත්තාලීස ලොකුත්තරික නයින්–)

"ඉත්ථමෙකූන නවුතිප්පභෙදං පන මානසං
එක වීස සතං වාථ විභජන්ති විචක්ඛණා"

(අනතුරුවකී ක්‍රම දෙකින් ම පෙණීගිය සේ 89 වැදූරුම් වූ චිත්ත ය 121 වැදූරුම්කොට ද නුවනැත්තෝ බෙදති.)

"යථාච රූපාවචරං ගය්හතානුත්තරං තථා
පඨමාදි ඣානභෙදෙ ආරුප්පඤ්චාපි පඤ්චමෙ"

(රූපාවචර සිත ප්‍රථමධ්‍යානය ද්විතීයධ්‍යානය තෘතීය ධ්‍යානය යනාදී වශයෙන් ප්‍රථමාදී ධ්‍යාන භෙදයෙහි යොදා ගන්නාක් මෙන් එක එක ලොකොත්තර සිත ද එම ධ්‍යාන භෙද යෙහි යොදා ගනු ලැබේ. ධ්‍යානභෙදයෙන් සලකන කල 12 වැදෑරුම් වූ ම අරූපාවචර සිත පඤ්චමධ්‍යානයෙහි ගණන්ගණු ලැබේ.)

"එකාදසවිධං තස්මා පඨමාදිකම්රිතං
ඣානමේකෙකමන්තෙ තු තෙවිසතිවිධං භවෙ"

(එ බැවින් රූපාවචර අරූපාවචර ලොකොත්තර යන වර්ග තුණෙහිම වූ සිත් අතුරෙන් ප්‍රථමධ්‍යානාදී වූ චතුර්ථධ්‍යාන ය දක්වා එකඑක ධ්‍යානය රූපාවචර 3 ය, ලොකොත්තර 8 ය යි 11 ස් 11 ස් වැදෑරුම් වේ. පඤ්චමධ්‍යාන ය වනාහි එ ලෙසම 11 ස් වැදෑරුම් කොට අමුතුවෙන් පැමිණි අරූපා- වචර 12 ස් භෙදය ත් සමග 23 වැදෑරුම් වෙ යි.)

"සත්තතිංසවිධං පුඤ්ඤං ද්විපඤ්ඤාසවිධං තථා
පාකමිච්චාහු චිත්තානි එකවීසසතං බුධා"

(මෙසේ ලොකොත්තර සිත් 8, ධ්‍යානභෙදයෙහි විශෙෂ විභාගකොට සැලකූ කල යට "කුසලානෙකවීසති"යි කිතැන 21 පුරවන පිණිස ගත් ලොකොත්තර කුසල් හෙවත් මාර්ග 4 වෙනුවට මේ ලොකොත්තර කුසල් 20 යෙදීමෙන් කුසල් සිත 37 වැදෑරුම් වෙයි. "ඡත්තිංසෙව විපාකානි"යි කිතැන 36 පුරවන පිණිස ගත් ලොකොත්තර විපාක හෙවත් ඵල සිත් 4 වෙනුවට මේ ලොකොත්තර විපාක 20 යෙදීමෙන් විපාක සිත 52 වැදෑරුම් වෙයි. තො කී අකුසලයන්ගේ හා ක්‍රියාවන්ගේ ගණන් "ද්වාදසාකුසලානි" "ක්‍රියාචිත්තානි වීසති"යි කී ලෙස ම 12 ක් හා 20 ක් ම වන බැවින් සිත් සියල්ල ම එක්කළවිට 121 කැයි නුවනැත්තෝ කියති.)

## මේ එකවිස සත චිත්තක විභාග ය යි

මෙ තැන් පටන් අභිධර්ම පොත්පත්හි ඒ ඒ සඳහා ව්‍යව හාරකරණු ලබන සංඥාවන් දක්වී ම පිණිස දැරීමට පහසුවන පරිද්දෙන් අභිධර්මාර්ථ සංග්‍රහයෙන් උපුටාගන්නා ලද අන

තුරු ගාථාව ද – එතැන්පටන් මේ පරිච්ඡේදවසානය දක්වා අප විසින් ම ගොතන ලද වෙනත් ගාථාවන් ද භාවාර්ථ සහිත කොට යොදන්නෙමු.

"පාපාහේතුකමුත්තානි සොභනානීති වුච්චරෙ
එකූනසට්ඨි චිත්තානි අථෙකනවුතීපි වා"*

යට කී අකුසලසිත් 12 හා අහෙතුකසිත් 18 ද යන 30 හැර ඉතිරි වූ එකූනනවුතික විභාගයෙන් 59 ද එකවීසසතක විභාගයෙන් 91 ද ශෝභනචිත්තයෝ ය යි කියනු ලැබෙති.)

(1) කාමං හීනං පරිත්තං වා කාමාවචරමුච්චතෙ
පාපන්ත්වපුඤ්ඤකුසලං පුඤ්ඤන්තු කුසලං සුභං.

කාමාවචරසිත කාමය යි කියා ද හීනය යි කියාද පරිත්ත යයි කියා ද; අකුසලසිත පාපය යි ද අපුඤ්ඤය යි ද; කුසල සිත පුඤ්ඤය යි ද සුභය යිද කියනු ලැබේ.

(2) විපාකං වුච්චතෙ පාකං ක්‍රියා තු කිරියං ක්‍රියං
පටිඝං දෙසමූලංච මොමූහං මොහමූලිකං.

විපාකසිත පාකයයි ද ක්‍රියාසිත කිරිය ක්‍රිය යන නම් වලින් ද; දෙසමූලික සිත පටිඝ නමින් ද; මොහමූලික සිත මොමූහ නමින් ද කියනු ලැබේ.

(3) චක්ඛුසොතාදිවිඤ්ඤාණ පංචකංච ද්විධා දස
වුත්තං ද්විපඤ්චවිඤ්ඤාණං සොමනස්සං සුඛං කවචි.

චක්ඛු සොත ඝාණ ජිව්හා කාය යන විඤ්ඤාණ 5 අකුසල විපාක කුසලවිපාක වසයෙන් 10ක් වූවාහු ද්විපඤ්චවිඤ්ඤාණ නමින් ද, සුඛ සන්තිරණ දී සමහර තැනක සොම්නස ම ත් සුඛ නමින් ද කියනු ලැබේ. සුඛසහගත කායවිඤ්ඤාණ ග යනාදිය එ ලෙස කියනු නොලබන තැනි.

(4) සම්පටිච්ඡන චිත්තානි පඨමාවජ්ජනං තථා
මනොධාතුත්තිකං නාම වුච්චරෙ ක්වාපි එකතො.

* මේ ගාථාව අහෙතුක කාණ්ඩයේ අගට දක්වන ලද්දක් නමුත් එහි දී මේ ගණන් නො වැටහෙන බැවින් ද එයින් දක්වන සංඥාව මේ තාක් ව්‍යවහාරයට නො පැමිණි බැවින් ද අනතුරුව කී ක්‍රමදෙකම නිශ්‍රය කරගණ තිබෙන බැවින්ද මීට සුදුසු ස්ථානය මෙතනම බැව් පැහැදිලි යි එ බැවින් මෙය එහිදී නොදක්වා මෙහිදි දැක්වූ බැව් සැලකිය යුතු.

සම්පටිච්ඡන සිත් 2 හා පඤ්චද්වාරාවජ්ජ ය යන 3, සමහර තැනක එකට ගෙණ මනොධාතුත්‍රික ය යි කියනු ලැබේ.

(15) අහෙතුකා පටිසන්ධි සොපෙක්ඛා වුච්චරෙ දුවෙ
සන්තීරණානි හසිතුප්පාදෙ තු හසනං සිතං

උපෙක්ෂා සහගත සන්තීරණ සිත් 2, අහෙතුක ප්‍රතිසන්ධි 2 ය යි ද; හසිතොත්පාද සිත හසන යයි ද සිත යයි ද කියනු ලැබේ.

(6) දුතියාවජ්ජනං චාපි වොට්ඨපනන්ති වුච්චතෙ
විපාකක්‍රිය චිත්තානතු අබ්‍යාකත මීරිතං.

යටදැක්වූ පිළිවෙලින් දෙවැනි වූ මනොද්වාරාවර්ජන සිත සමහර තැනක දී වොට්ඨපනය යි ද සියලු විපාකසිත් හා ක්‍රියාසිත් අව්‍යාකෘත සිත්ය යි ද කියනු ලැබේ.

(7) රිතෙ ද්විපඤ්චවිඤ්ඤාණ මනොධාතූහි යං සිතං
මනො විඤ්ඤාණ ධාතූති තං සබ්බං සමුදීරිතං

ද්විපංචවිඥාණ ය මනොධාතුත්‍රික ය යන සිත් 13 හැර ඉතිරි ව සිටි එකූන නවුති විභාගයෙන් 76 හෝ එකවිස සතක විභාගයෙන් 108 හෝ මනොවිඤ්ඤාණධාතු ය යි දක්වන ලදී.

(8) මහාසද්දාදිනං වුත්තං කාමාවචර සොභනං
සුඛජ්ජවම්හි හෙමකාසං උක්කට්ඨමිතරොමකං.

මහාකුසල මහාවිපාක, මහාක්‍රියා ය යි මහා ශබ්ද ය මුල් කොට කියනු ලබන්නේ කාමාවචර සොභන සිත යි. ඒ කාමාවචර සොභනයන් අතුරෙහි ම සොම්නස් සහගත ජවනසිත උත්කෘෂ්ට ය යි කියා ද, අනික් උපෙක්ෂාසහගත ජවනසිත ඕමක ය යි කියා ද, සමහර ආචාර්‍ය්‍යකෙනෙකුන්ගේ මත ය යි.

(9) මහාජවංච අඤ්ඤසං භාවිතං බහුලී කතං
උක්කට්ඨ මොමකා පුඤ්ඤමාවුතං අපරිචිතං.

අන් සමහර ආචාර්‍ය්‍යයන් ගේ මතයෙ හි:- භාවිතා කරණ ලද බහුලකරණ ල ද එහෙයින් ම සවජාතිකයන් ම පිරිවරකොට ඇති මහා ජවනයෝ ම උත්කෘෂ්ටය යි කියා ද

අකුශලයන් පිරිවරකොට ඇති පුරුදු නො කරනලද ඒ මහා ජවනයෝ ම **ඕමකයයි** කියා ද වේ. (මින් මෙකී දෙවෙනි මතය අපට ද අභිමත යි.)

(10) රූපාවචර චිත්තානතු රූපනාමෙතමීරිතං
ආරූප්පං වා අරූපං වා අරූපාවචරං විදූං.

රූපාවචර සිත **රූප** යන නම පමණකින් ම ද, අරූපාවචර සිත **ආරූප්ප** ය යි හෝ **අරූප**ය යි ද දන්නා ලදී.

(11) උභයං මජ්ඣිමංවාහු රූපාරූපං මහග්ගතං
අප්පණානාමතො වුත්තං රූපාරූපමනුත්තරං.

(ඒ රූපාරූප යන දෙක ම එකටගෙණ **මජ්ඣිම**ය යි කියා ද **මහග්ගත** ය යි කියා ද කියති. රූපාවචර අරූපාවචර ලොකොත්තර යන තුන්වර්ගයෙ හි සිත් සියල්ල **අර්පණා** යන නමින් ද කියන ලදි.

(12) භාවනාභෙදතො භින්නං රූපාවචර පඤ්චමං
අභිඤ්ඤුනපපදංභිඤ්ඤ පාදකජ්ඣානතො විදූං

භාවනා භෙදයෙන් ප්‍රභෙද ගත වූ රූපාවචර පඤ්චම ධ්‍යානය **අභිඤ්ඤ** යන නම් නමින් ද, ඊට හෙතුවූ එම ධ්‍යානය **අභිඤ්ඤා පාදකජ්ඣාන** යන නමින් ද දනිති.

(13) මග්ගංඵලං වා අග්ගාදි අරහත්තභවං විදූං
සෙඛාතග්ගඵලා සබ්බෙ අසෙඛග්ගඵලා තථා.

අග්‍රමග්ගය අග්ගඵලය යි **අග්ගශබ්දදී** වූ මග්ගඵල ශබ්දයෝ අර්හත්වයෙහි වුවෝය යි ද, **සෙඛයෝ** නම් අග්‍රඵලය හැර ඉතිරි සියලු ම මාර්ගඵල සතය යි ද **අසෙඛ** නම් අග්‍රඵල ය යි ද දනිති.

(14) ලොකියං පරියාපන්නං ඉති තෙභූමිකං විදූං
ලොකුත්තරනත්වා පරියාපන්නද්විධ අනුත්තරං.

**ලොකිය** ය යිද **පරියාපන්න** යයි ද කාමරූපාරූප යන ත්‍රෛභූමික ධර්මය දනිති. **අපරියාපන්න** ය යි ද මේ අභිධර්ම යෙහි **අනුත්තර** යයි ද ලොකොත්තර ධර්මය දනිති. මෙහි "ඉධ" ශබ්දය හෙතුකොට ගෙණ "අනුත්තරං වා චිත්තං අනුත්තරං චිත්තන්ති පජානාති"-යනාදී සූත්‍රාන්ත දෙශනාවෙ හි මහග්ගතසිත් හැඟවීම මෙහි නො යෙදෙන බැව් හඟවන ලදී.

(15) චිත්තං තු මානසං චේතං මනොවිඤ්ඤාණ මුච්චතෙ
චිත්තුප්පාදො ස සම්භාරං කාලාචිත්තක්ඛණං තථා.

සාමාන්‍යයෙන් චිත්තය ම වනාහි මානසය, චේතය, මනය, විඤ්ඤාණ ය,යන නම් වලින් ද එය ම ඒ හා සම්ප්‍රයුක්ත වූ චෛතසිකයන් හා සහිත කොට චිත්තුප්පාදය යි ද පැවති කාල වශයෙන් චිත්තක්ඛණය යි ද දන්නා ලදී.

මෙ ලෙස ඒ ඒ සිත හෝ සිත්සමූහය අනික් සිතකින් හෝ සිත්සමූහයකින් වෙනස්වන කාරණා වසයෙන් ද, ඒ ඒ සිතේ හෝ සිත් සමූහයේ නම් වසයෙන් ද සි ලක්ෂණ නාම වසයෙන් ඇඳින ප්‍රගුණකර ගත්කල එය මතු කියනු ලබන චෛතසිකාදී සියලු විභාගයන්ට ම වාගේ භූමියක් වෙනවා ඇත. එබැවින් මතු මතු වඩවඩා උත්සාහය උපදිනවා ඇත. එසේ ප්‍රගුණතාව ක් නැතිවුව හොත් ඒ ඒ සියල්ල ම අවුලෙන් අවුලක්ව වැටහෙමින් ඉගෙණීමට තබා සිතන්ට වත් මැලිවන බව දැන පුරුදු ඇත්තෙමු.

මිශ්‍රක පාදය යි.

පළමු වැනි චිත්ත විභාගකාණ්ඩ ය නිමි.

---

මෙසේ චිත්ත චෛතසික රූප නිර්වාණ යන පරමාර්ථ සතරින් පළමු වැනි වූ චිත්තය විභාගකොට තිබවා මෙ තැන් පටන් දෙවැනි වූ චෛතසික විභාග කරණු ලැබේ.

11. **චෛතසික ය නම්**:–යටකි සේ ම චිත්තයෙහි ඇති වන්නාවූ ගති විශෙෂ යි.

ඒ වායේ සාධාරණ ලක්ෂණ ය මෙ ලෙස දක්වා තිබේ. එනම්:-

"එකුප්පාද නිරොධා ච එකාලම්බන වත්‍ථුකා
චෙතොයුත්තා ද්විපඤ්ඤාස ධම්මාචෙතසිකා මතා"

(සිත උපදනාකල් හි ඒ සමග ම ඉදිරිපසු නොව එකවිට ම උපදින්නාවූ ද, සිත නසිනකල ඒ හා එක විට ම නසින්නාවූ ද, සිත යමක් අරමුණුකොට හෙවත් යමක එල්ලිගණ උපදීද එය ම අරමුණුකොට හෙවත් එහි ම එල්ලිගණ උපදින්නාවූ ද, සිත ඇස් කන් ආදී යම් වස්තුවක හෙවත් ඉඩමක

උපදිද එහි ම උපදින්නාවූ ද, සිත කෙරෙහි කිසිසේත් වෙන් නො වන සේ යෙදී බැඳී පවත්නාවූ ද ධර්මයෝ හෙවත් විද්‍යමාන ස්වභාවයෝ 52, චෛතසිකයෝය යි දන්නා ලද්දාහු ය.) යනුයි. ඔවුන්ගේ මෙකී 4 ආකාර සම්ප්‍රයොග ලක්ෂණය සිත සමග යම්සේ ද ඔවුන් එකිනෙක සමගත් එලෙස ම බව දත යුතු යි.

ඒ චෛතසික යෝ කවරහු ද යත්?

1. **ඵස්සය** නම්:–හිරු රැස් බිම තැවරෙන්නාක් මෙන් අරමුණෙහි තැවරීම් ලක්ෂණයෙන් සිතෙහි උපදනා ගතිය ද;

2. **වේදනා** නම්:–සූපව්‍යඤ්ජනාදියෙහි කුළු ඇඹුල් ලුණු මිහිරි ආදී සියලු රසය ම විඳගන්නා දිවමෙන් අරමුණු රස විඳගන්නා ගතිය ද;

3. **සඤ්ඤා** නම්:–රන් රිදී තඹ ලෝහ ආදිය හරිව හෝ වැරදි ව හෝ යම්තමක් විශෙෂතාව හඳුනන ළදරුවෙකු මෙන් නීලපීතාදී රූපයන් ද අක්ෂරාදී ශබ්දයන් ද යහපත් අයහපත් ආදී ගන්ධයන්ද මධුරාම්ලාදී රසයන්ද මෘදු පරුෂාදි ස්පර්ශයන්ද ශුභාශුභාදී ධර්මයන්ද හඳුනන ගතිය හෙවත් අසවල් එකය යි සිතාගැනීම ද;

4. **චෙතනා** නම්:– ඒ ඒ අය ඒ ඒ ක්‍රියාවෙහි යොදා තමාත් යෙදෙමින් එය ඉෂ්ට කරවන කර්මනායකයෙක්. (බාස් කෙනෙක්) ශිෂ්‍ය ගුරුවරයෙක් මෙන් ලොභ දොස මොහ සද්ධා සති හිරි ආදී ඒ ඒ චෛතසිකයන් ඒ ඒ කෘත්‍යයෙහි යොදා ඉෂ්ටකරවන ක්‍රියාවෙහි මූලික ව පෙළෙඹන චිත්ත ගතිය ද;

5. **ඒකාග්‍රතා** නම්:–සියහිමියා මිස අන් හිමියන් අපෙක්ෂා නො කරණ පතිව්‍රතාවක් මෙන් ගත් අරමුණ මිස අනිකක් අපෙක්ෂා නො කරණ ගතිය ද;

6. **ජීවිතින්ද්‍රිය** නම්:–පහන් දැල්ලක ආයුෂය රකිනා තෙලක් මෙන් තමා හා සමග යෙදුනා වූ චිත්ත චෛතසිකයන්ගේ ආයුෂය රකින්නා වූ ගතියද;

7. **මනසිකාර** නම්:–යම්කිසි කර්මාන්තයක් උදෙසා ජනයන් පිටත්කොට යවන්නෙක් මෙන් තමා හා සමග යෙදුනාවූ

චිත්ත චෛතසිකයන් අරමුණුකරා යොමුකරවන ගතිය ද;

8. **විතක්කය** නම්:-යම්කිසි කර්මාන්තයක් උදෙසා පිටත් කරවූ ජනයන් කැටිව ගෙණගොස් කර්මාන්ත ශාලාවට ඇර ලන්නෙක් මෙන් තමා හා සමග යෙදුනාවූ චිත්ත චෛතසික යන් අරමුණ කෙරෙහි නගන්නාවූ ගතිය ද;

**විචාර** නම්:-යම්කිසි කර්මාන්තයක් උදෙසා ගොස් කර්මාන්ත ශාලාවෙහි බැසගත් ජනයන්ගේ එහිම ඔබ මොබ හැසිරී මක් මෙන් චිත්ත චෛතසිකයන්ගේ අරමුණෙහි හැසිරීම ලක්‍ෂණකොට ඇති ගතිය ද;

10. **අධිමොක්ඛ**:- නම් ගෙබිම් බෙදන වඩුවෙක් මෙන් අරමුණ කෙරෙහි පිළිපැදිය යුතු අන්දම නිශ්චය, එනම් සනිටු හන් කිරීම ද;

11. **විරිය** නම්:-බරපැට වූ ගැල අදින ගවයෙක් මෙන් ඒ ඒ අරමුණ කෙරෙහි චිත්ත චෛතසිකයන් විසින් කළයුතු ඒ ඒ කෘත්‍යය කිරීමට බලදෙන ගතිය ද;

12. **පීති** නම්:-දුගියෙක්හට මහත් නිධානයක් ලැබුනු කලක් මෙන් අරමුණ ලැබීමෙහි පිණායාම ද;

13. **ඡන්දය** නම්:-තමා කරණ ක්‍රියාවකට විරුද්ධ නොව අනුකූල වන්නා වූ මිත්‍රයෙක් මෙන් සෙසු චිත්ත චෛතසික යන්ගේ ඒ ඒ කෘත්‍යයට හෝ අරමුණ ගැන්මට අනුකූලවන හෙවත් කැමතිවන ගතිය ද;

14 **මොහය** නම්:-සණාන්ධකාරයක් ඇස් වසා බැඳි රෙදි කඩක් නො හොත් ඇසපටලයක් මෙන් අරමුණෙහි තත් වූ සවභාවය වසන්නාවූ ගතිය ද;

15. **අහිරිකය** නම්:-ගම්ඌරා අසුචියට පිළිකුල් නො වන්නාසේ පාප සමාපත්තියෙහි නොහොත් අකුසල චෛත සිකයන් හා එක්ව යෙදීමට පිළිකුල් නොවන ගතිය ද;

16. **අනොත්තප්පය** නම්:-ගිනිදැල්ලට භය නොව පණි න පලඟැටියෙක් මෙන් ද විෂ අනුභවකරණ රාජ උදහස් පැමිණියකු මෙන් ද, පාප සමාපත්තියෙහි නොහොත් අකුසල චෛතසිකයන් හා එක්ව යෙදීමෙහි භය නොවන ගතිය ද;

17. **උද්ධච්චය** නම්:–ගල්කැට පහරලත් අළු ගොඩක් හෝ මෙදබරයක් සේ සිත සන් නො සිඳී වික්ෂිප්ත ව පවත්නා ගතිය ද;

18. **ලෝභය** නම්:–තෙත් ලාටුවක් හෝ උණු ලාකඩක් මෙන් අරමුණෙහි ඇලෙන්නා වූ ගතිය ද;

19. **දිට්ඨිය** නම්:–මිරිඟුව කෙරෙහි දිය ය යි හැඟීමක් මෙන් ඇතිසැටිය හැර වරදවා ගැණී ම හෙවත් අරමුණෙහි තත්ත්වය හැර අන්පරිද්දෙකින් අවබෝධ කරණ ගතිය ද;

20. **මානය** නම්:–අන් කුකුළෙකු දුටු කුකුළෙක් හට මෙන් තමා අනුන් හා සංසන්දනය කිරීමෙන් මම ශ්‍රෙෂ්ඨ වෙමි යනාදී වසයෙන් උපදනා උඩඟු සවභාවය ද නොහොත් සංසන්දනයෙන් චේතස්කොට හැඟිම ද;

21. **දොසය** (වෛරය) නම්:– පහරලත් සර්පයකු සේ කිපීම් ලක්‍ෂණ වූ ගතිය ද;

22. **ඉස්සා** (එදිරිය) නම්:–රූප සම්පන්න ස්ත්‍රීන් කෙරෙහි මද රූ ඇති වෙසඟුන් සේ අනුන්ගේ සම්පත නො ඉවසීම් ලක්‍ෂණ ගතිය ද;

23. **මච්ඡරිය** නම්:– මීයකු අල්වාගත් බළලෙක් සේ තමාගේ සම්පත අනුන් විසින් ලබනු දකිනු තබා දැනීම් මාත්‍රයක් වත් නො වේවා යි සඟවන ගතිය ද;

24. **කුක්කුච්චය** (පසුතැවිල්ල) නම්:–අපරාධකළ අයෙක් රජහට අසු වූ පසු තමාගේ ක්‍රියාව ගැණ සිතන්නාක් මෙන් තමා කළ කී දේ නොකළා නම් යෙහෙක නොකළ නො කී දේ කළා නම් යෙහෙතැ යි ශොකකිරීම් ගතිය ද;

25. **ථීන ය** නම්:–ගින්නට ලන්කළ කල ඇකිලෙමින් පස්සට ඇදෙන ප්ජාපත් කෙශලොමාදිය මෙන් අරමුණු ගැන් මෙ හි හැකිලී පසුබස්නා සිතෙහි මැලි සවභාව ද;

2 . **මිද්ධය** නම්:–එබඳු වූ ම චෛතසිකයන්ගේ මැලි සවභාව ද;

27. **විචිකිච්ඡා** නම්:–මංමුලාවූවෙක් හට දෙමංසන්ධියක් හමු වූවාක් මෙන් එකක වත් ස්ථිර නොව දෙකෙහිම සැක කිරීම් ලක්‍ෂණ ගතිය ද;

28. **සද්ධා** නම්:–බොර දියෙ හි දැමූ ඉඟිනි ඇට කල්ක යක් මෙන් එක් ව යෙදුනා වූ චිත්තචෛතසික ධර්මයන් පහද වන්නා වූ ගතිය ද;

**සති** නම්:–හොඳහැටි පාඩම්කර ඉගෙණගත් පොතක කාරණයක් මෙන් අරමුණු සිහිකරවන ගතිය ද;

30. **හිරි** නම්:–අනුන්ගේ හෙළාදැක්ම ට ලජ්ජාවෙන් තමන් රූප සෞන්දර්ය්‍යය රක්නාවූ හෝ අනාචාරයෙන් වලක් නා වූ කුලස්ත්‍රියක මෙන් තමාගේ ගෞරවය උදෙසා පාප යෙන් වලකින ලජ්ජාව ද;

31. **ඔත්තප්ප** නම්:–අනුන්ගේ ආලය සිඳෙ යි ඉන් අලා භවෙ යි යන භය හෙතුකොට ගෙණ රූප සෞන්දර්ය්‍යය රක් නා වූ හෝ රජ දඬුවම ට බයින් බලාත්කාරකම් නො කරන් නා වූ වෙසඟනක මෙන් අනුන් ප්‍රධානකොට ගෙණ පාපයට භයවන ගතියද;

32. **අලෝභය** නම්:–නෙලුම් පතෙ හි දිය බිඳක් මෙන් හෝ අංතහි රස දිය බිඳක් මෙන් හෝ අරමුණෙහි නො ඇලෙන ගතිය ද;

33. **අදෝස ය** නම්:–තමාගේ අදහස ට එකඟ ක්‍රියා කර ණ මිත්‍රයෙක් මෙන් අරමුණ කෙරෙහි අවිරුද්ධව සිටීම් ලක්‍ෂණ වූ ගතිය ද,

34. **තත්‍රමජ්ඣත්තතා** නම්:–උදුනෙහි සමව පැවති ගිනි ඇතිකල නො පිඹ දිය නොඉස බලාහිඳිනා අරක්කැමියෙකු මෙන් ඒ ඒ සම්ප්‍රයුක්තධර්මයන්ගේ ස්වකීය ස්වකීය කෘත්‍යය කිරීමෙහි ද එ ලෙස ම අවිරුද්ධව සිටීම් ලක්‍ෂණ වූ ගතිය ද;

35. **කායපස්සද්ධි නම්**:–මධු පානය කින් වෙහෙසක්මෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාර යන ස්කන්ධත්‍රයෙණ් විඩාවවූ උද්ධච්චය ආදී විරුද්ධ ධර්මයන් සන්සිඳවන ගතිය ද;

36. **චිත්තපස්සද්ධි** නම්:–එසේ ම විඤ්ඤාණස්කන්ධයෙහි විඩාව සන්සිඳවන ගතිය ද;

37. **කාය ලහුතා** නම්: තෙත පුළුනක් වියලන්නා සේ යථොක්ත වෙදනාදි සක්ඛත්‍රයෙහි බරබව වූ ථීනමිද්ධාදී කෙලෙශයන් සංසිඳුව මින් සැහැල්ලු කරන්නා වූ ගතියද;

38. **චිත්ත ලහුතා** නම්:-විඤ්ඤාණසක්ඛන්ධයෙහි බර බව වූ එම කෙලෙශයන් සංසිඳුවමින් සැහැල්ලුකරන්නා වූ ගතියද;

39. **කාය මුදුතා** නම්:-දූඩි සමෙක්හි තෙල්ලන්නා සේ යථොක්ත වෙදනා දී සක්ඛත්‍රයෙ හි තදබව වූ දිට්ඨිමානාදීන් සංසිඳුවමින් මෘදුකරන්නා වූ ගතිය ද;

40. **චිත්තමුදිතා** නම්:-එසේ ම විඤ්ඤාණසක්ඛන්ධයෙ හි තදබව සංසිඳුවමින් මෘදුකරන්නා වූ ගතිය ද;

41. **කායකම්මඤ්ඤතා** නම්:- වානේ නම් ලෝහය තැලීම පිණිස ගින්නෙන් තවන්නා සේ වෙදනාදී සක්ඛත්‍රයයෙහි සුචරිත ධර්මයන්ට අයොග්‍යතාවවූ කාමච්ඡන්දාදීන් සන්සිඳුව මින් යොග්‍ය කරන්නාවූ ගතිය ද,

42. **චිත්තකම්මඤ්ඤතා** නම්:- විඥාන සක්ඛන්ධය එලෙස ම අයොග්‍යතාව සංසිඳුවමින් යොග්‍ය කරන්නාවූ ගතිය ද,.

43. **කායපාගුඤ්ඤතා** නම්:- රථ චක්‍ර නාභියෙහි තෙල් ලන්නා සේ වෙදනාදී සක්ඛත්‍රයයෙහි ගිලන් බව නම් වූ අශ්‍රද්ධාදී පාපයන් සංසිඳුවමින් ප්‍රගුණ බව ඇති කරණ ගතිය ද,

44. **චිත්තපාගුඤ්ඤතා** නම්:- විඥානසක්ඛන්ධයෙහි එම ගිලන් බව සංසිඳුවා ප්‍රගුණ බව ඇති කරණ ගතිය ද,

45. **කායුජ්ජුකතා** නම්:- තැවීම් ආදී උපක්‍රමයෙන් ඊදඬු ඇදහරින්නා සේ වෙදනාදී සක්ඛත්‍රයයෙහි වඞකභාවය වූ මායා සාඨෙය්‍යාදිය සංසිඳුවමින් සෘජු බව ඇති කරණ ගතිය ද,

46. **චිත්තුජ්ජුකතා** නම්:- විඥාන සක්ඛන්ධයෙහි එම වඞක බව සංසිඳුවා සෘජු කරණ ගතිය ද,

47. **සම්මාවාචා** නම්:- මුසාවාදදී වාග්දුශ්චරිතයෙන් වැලකීම ලක්ෂණ වූ ගතිය ද,

48. **සම්මාකම්මන්ත** නම්:- ප්‍රාණඝාතාදී වූ කාය දුශ්චරිතයෙන් වැලකීම් ලක්‍ෂණ වූ ගතිය ද,

49. **සම්මාආජීව** නම්:- මිථ්‍යාජීවිකාවෙන් වැලකීම් ලක්‍ෂණ ගතිය ද,

50. **කරුණා** නම්:- තම දරුවෙකුගේ රෝගයක් සුව කරණු කැමති මවක සේ අනුන්ගේ දුක් දුරලනු කැමති ගතිය ද,

51. **මුදිතා** නම්:- තම දරුවෙක්හට රාජකරුණාවක් ලත් කල එහි අනුමෝදන් වන මෑනියකගේ සේ අනුන්ගේ සැපයට විරුඩ නොව එකඟවීම ද,

52. **පඤ්ඤා** නම්:- රත්රන් ආදී ලෝහ භාණ්ඩයන්ගේ දැනීමෙහි ළදරුවෙක් මෙන් අරමුණු ගැණ යම්තම් හිතා ගැණීමක් ඇති සංඥව මෙන් ද නොව, ඒ ස්වර්ණාදිය විශෙෂ දැනුම් මාත්‍රයකින් දන්නා ගම්වැසි පුරුෂයෙක් මෙන් අරමුණු සම්බන්ධ විශෙෂ මාත්‍රයක් දන්නා විඤ්ඤාණය මෙන් ද නොව, ඒ ස්වර්ණාදියෙහි සියලු තත්වය දන්නා කම්මාරයෙක් (බඩාලෙක්) මෙන් අරමුණ සම්බන්ධ සියලු තත්වය දන්නාවූ ද; ඇසක් මෙන් තත්වාර්ථයන් දක්නා වූ ද; ආලෝකයක් මෙන් තත්වාර්ථයන් ප්‍රකට කරන්නා වූ ද; ශස්ත්‍රයක් මෙන් පදාර්ථයන් සිඳින්නා වූ ද; ශාස්ත්‍රයක් මෙන් තීක්‍ෂණාතිතීක්‍ෂණ වූත් ඥෙයාර්ථයන් උගන්වන්නා වූ ද; චිත්තගතිය ද යන මේ දෙපණස යි.

මතු කියැවෙන රූපයන්ගේ ජාති ජරා මරණයන් වෙන ම රූපයන් හැටියට නිර්දෙශ කල නමුත් සංසකාරස්කන්ධයට ඇතුලත් චෛතසිකයන් ම වූ මේ නාමයන්ගේ ජාතිජරා මරණයන් යටකී එකුප්පාද එක නිරොධාදී සම්ප්‍රයොග ලක්‍ෂණාදියට නොගැලපෙන හෙයින් මතු කියැවෙන පටිච්චසමුප්පාද ඵල සංක්‍ෂෙප දෙකෙහි මෙන් ඒ නාම ධර්මයන් හා සමග අන්‍යොන්‍යයාගේ ගැට මෙන් ම ගැණෙන්ට අදහස්කොට තබමින් වෙන ම නො දක්වන ලද්දහු ය. නාමයන්ගේ පරිච්ඡේද විඤ්ඤත්තිහු ද ස්වභාව හෙයින් නො ලැබෙන්නාහුය. එබැවින් චෛතසිකයෝ 52 ක් ම දක්වන ලද්දහු වෙති.

**සමුදෙදශ පාදය යි.**

මේ චෛතසිකයන් 52 න් (1–7). *ඵස්ස වේදනා සඤ්ඤා චේතනා ඒකග්ගතා ජීවිතින්ද්‍රිය මනසිකාර යන 7 සියලු ම සිත් වල උපදින බැවින් **සබ්බචිත්ත සාධාරණ** නම් වෙති.

(8–13). විතක්ක විචාර අධිමොක්ඛ විරිය පීති ඡන්ද යන මේ 6 යටකී සොභන අසොභන වසයෙන් හෝ කුසල අකුසල අව්‍යාකෘත වසයෙන් හෝ යන මේ ආදී වසයෙන් පක්‍ෂ නියමයකු ත් නැති ව සියල්ලෙහි ම යෙදීම් වසයෙන් පොදු ගතියකුත් නැති ව යෙදෙන බැවින් **පකිණ්ණක** නම් වෙති.

(1–13). මෙකී දෙවර්ගයට අයිති 13 සොභනයන් කෙරෙහි යෙදෙතැයි ඊට විරුඬ වූ අසොභනයන් කෙරෙහි නො යෙදීමක් වත් අසොභනයන් කෙරෙහි යෙදෙතැයි ඊට ප්‍රති විරුඬ සොභනයන් කෙරෙහි නොයෙදීමක් වත් එකිනෙකට අන්‍ය සවභාව ඇති කුශලා කුශල අව්‍යාකෘත යනාදීන් අතුරෙහි ද එක් පක්‍ෂයක යෙදෙතැයි අනිත් පක්‍ෂයක නොයෙදීමක් වත් නැති ව පක්‍ෂ ව්‍යවස්ථාව වැද්ද නො ගන්නා බැවින් **අඤ්ඤ සමානයෝ** නම් වෙති.

(14–27). මොහ අහිරික අනොත්තප්ප උද්ධච්ච ලොභ දිට්ඨි මාන දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච ථීනමිඬ විචිකිච්ඡා යන 14 අකුසල සිතක මිස අන් කිසිවක නූපදින බැවින් **අකුසල (චෛතසික) යෝ** ය යි නම් වෙති. එයින්–

(14–27). මොහ අහිරික අනොත්තප්ප උද්ධච්ච යන 4 කොයි ම අකුසල සිතක් වත් අත්නොහැර සියල්ලෙහි උපදින බැවින් **සබ්බාකුසල සාධාරණ** නම් වෙති.

(28–52). සද්ධා සති හිරි ඔත්තප්ප අලොභ අදෙස තත්‍රමජ්ඣත්තතා කායපස්සද්ධි චිත්තපස්සද්ධි කායලහුතා චිත්තලහුතා කායමුදුතා චිත්තමුදුතා කාය කම්මඤ්ඤතා චිත්ත කම්මඤ්ඤතා කාය පාගුඤ්ඤතා චිත්තපාගුඤ්ඤතා කායුජ්ජුකතා චිත්තුජ්ජුකතා සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව

---

* අසවල් අඞ්කයේ සිට අසවල් අඞ්කය දක්වා යන අර්ථය පිණිස මේ විධිය ව්‍යවහාර යි. මේ දක්වන අඞ්කයන් ඒ ඒ චෛතසිකයන්ට මුලින් දක්වූ අඞ්කයන් බව දත යුතු යි.

කරුණා මුදිතා පඤ්ඤා යන 25 ශ සොභන සිත්වල ම මිස අන් කිසිවක නො යෙදෙන බැවින් **සොභන (චෛතසික)** නම් වෙති. ඉනුත්–

(28–46). සද්ධාව පටන් චිත්තුජ්ජුකතාව දක්වා ඇති 12 ස. සොභන සිත් එකක් වත් නොහැර සියල්ලෙහි යෙදෙන බැවින් **සොභන සාධාරණ** නම් වෙති.

(47–49). සම්මාවාචා සම්මාකම්මන්ත සම්මා ආජීව යන 3 මිථ්‍යාවචන මිථ්‍යා කර්මාන්ත මිථ්‍යා ආජීව යන තුණෙන් වැලකීම් **ලක්‍ෂණ** වූ හෙයින් **විරති** නම් වෙති.

(50–51). කරුණා මුදිතා 2 සත්ත්වය යන ප්‍රඥප්තිය කෙරෙහි ම මිස වෙන යමක් කෙරෙහි නො පැවැත්විය හැකි හෙයින් අනන්ත අප්‍රමාණ සත්ත්වයන් කෙරෙහි පතුරුවනු ලබන කල අප්‍රමාණ ව පවතී නු යි **අප්පමඤ්ඤාවෝ** (හෙවත් අප්‍රමාණ්‍යයෝ) ය යි නම් වෙති.

> "තෙරසඤ්ඤ සමානාච–චුද්දසාකුසලා තථා,
> සොභනා පංචවීසාති–ද්විපඤ්ඤාස පවුච්චරෙ."

(ඵස්සාදී අඤ්ඤසමාන 13ද මොහාදි අකුසල 14ද සද්ධාදී සොභන 25දැයි චෛතසිකයෝ දෙපණසක් කියන ලද්දැහුය යනු භාව යි.)

**විභාගපාදය යි.**

මෙකී චෛතසිකයන්ගේ–A. සම්ප්‍රයෝගය–B. සංග්‍රහය යන දෙයාකාරයකින් විස්තරය දතයුතු වේ. ඒ දෙක පිළිවෙළින් දක්වන්නෙමු. එහි:–

A. **සම්ප්‍රයොගය** නම්:–එක එක චෛතසිකය යෙදෙන තරම් සියලු ම සිත් වෙන් කොට දැක්වීම යි. එහි සාමාන්‍ය නියමය මෙසේ යි.

> "සත්ත සබ්බත්ථ යුජ්ජන්ති–යථා යොගං පකිණ්ණකා,
> චුද්දසාකුසලෙසෙවව–සොභනෙසෙවව සොභනා"

(සබ්බචිත්තසාධාරණ 7 සියල්ලෙහි ම යෙදෙති; ප්‍රකිණ්ණක 6 යොග්‍ය වූ පරිද්දෙන් යෙදෙති; අකුසල 14 අකුසල සිත්වල ම යෙදෙති; සොභන 25 සොභන සිත්වල ම යෙදෙති යනු යි.) එහි විස්තර මෙසේ යි.

(1-7). සබ්බචිත්තසාධාරණ සතෙන් එක එක ම යට චිත්තකාණ්ඩයෙහි දක්වූ සියලු සිත්වලම එනම් 89 හි එක්කෝ *121 හි එකක්වත් නො හැර යෙදෙයි මෙවත් සියල්ල එක තුව සියල්ලෙහි යෙදෙති.

ප්‍රකීර්ණක සයෙන්:-

(12). විතර්කය ද්විපඤ්ච විඤ්ඤාණ ය යි දක්වූ සිත් 10 හැර ඉතුරු සියලු කාමාවචර සිත්වල (එනම් අකුසල සිත් 12 ද සම්පටිච්ඡන 2 හා සන්තීරණ 3 ද අහෙතුක ක්‍රියා 3 ද කාමාවචර සෝභන සිත් 24 ද යන 44 රෙහි)ද, (රූපාවචර ප්‍රථමධ්‍යාන 3ය එකවීස සතක නයින් ලෝකෝත්තර ප්‍රථම ධ්‍යාන 8ය යන) ප්‍රථමධ්‍යාන සිත් 11ද යන මෙකී සිත් 55හි උපදී.

(9) විචාරය:-විතර්කය උපදින සියලු ම සිත් 55ගේ සහ (එකවීසසතක නයින් ම) ද්විතීයධ්‍යාන සිත්.11 හිද යන 66 හි උපදී.

(10) අධිමොක්ෂය:-ද්විපංච විඤ්ඤාණය විචිකිච්ඡා සහගතසිතය යන 11 හැර ඉතිරි සිත් සියල්ලෙහි ම එනම් 78 වෙහි එක්කෝ 110යෙහි යෙදේ.

(11) විරියය:-පංචවාරාවජ්ජන ද්විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ යන සිත් 16 හැර ඉතිරි 73හි එක්කෝ 105හි උපදී.

(12). පීතිය:- දෞර්මනස් සහගත සිත් 2ද උපෙක්ෂා සහගත සිත් 55ද කායවිඤ්ඤාණ 2ද චතුර්ථධ්‍යාන සිත් (එකවීස සතක නයින්) 11 ද යන 70 හැර ඉතුරු 51හි උපදී.

(13). ඡන්දය:-අහෙතුක 18 සහ මෝහ සහගත සිත් 2ද යන 20 හැර ඉතිරි 69යෙහි එක්කෝ 101කේ උපදී.

''තෙ පන චිත්තුප්පාද යථාක්කමං:-

ඡසට්ඨිපඤ්චපඤ්ඤාස-එකාදසච සොළස,
සත්තතිවීසති චේව-පකිණ්ණක විවජ්ජිතා,
පඤ්චපඤ්ඤාස ඡසට්ඨී--ඨසත්තති තිසත්තති,
එකපඤ්ඤාස චෙකූන-සත්තති සපකිණ්ණකා.''

---

* එකූ නනවුතික එකවිසසතක යන විභාග දෙකින් දක්වන තැන්වල මෙසේ ගණන් දෙක අතරේ ''එක්කෝ'' යන්න යොදන්නෙමු.

(ඒ චිත්ත කාණ්ඩයෙහි දැක්වූ සිත් 66 ක් විතර්කය ද 55ක් විචාරය ද 11ක් අධිමොක්ඛය ද 16ක් විරිය ද 70ක් ප්‍රීතිය ද 20ක් ඡන්දය ද විසින් අත්හරිණ ලද්දේය.

55ක් විතර්කය ද 66ක් විචාරය ද 78ක් අධිමොක්ඛය ද 73ක් විරිය ද 51 ප්‍රීතිය ද 69 ක් ඡන්දය ද සහිත වූවෝ වෙති යනු භාව යි.

මෙහි විතර්කය විචාරය ප්‍රීතිය යන 3න ධ්‍යානාඞ්ග බැවින් එකවිස සතක විභාගයෙන් ද ඉතිරි 3 එකූන නවුතික විභාග යෙන් ද පමණක් ගණන් බලා තිබේ.)

මෙහි හරින සිත්ගණන ක්‍රම 2 ම සාධාරණ වෙයි. යෙ දෙන සිත් ගණන් පමණක් එසේ වෙනස් වෙයි–ධ්‍යානාඞ්ග සම්බන්ධ ව 89යේ ක්‍රමය ද නො යෙදෙ යි–එසේ හෙයින් එම කී සංකරය නොවන පිණිස පොදු එකවිස සතක නයින් පම ණක් යටකී ගණන් ගාථාවකින් මෙ සේ දක්වමු.

පංචකමථඡක්කං දසකඤ්ච
කාමතෙසා දසකානඵසුඛං
පංචසතං සෙකපපඤ්ඤසං
එකාසතඤ්ච පකිණ්ණකවජ්ජිතා.

එකොළොස් ගණන් සම්බන්ධ වූ පඤ්චකයක් ද ෂට්කයක් ද දශකයක් ද (එනම් 55, 66, 110ද) නැවත 105 ක්ද 51 ක්ද 101ක්ද ක්‍රමයෙන් ප්‍රකීර්ණක සහිතවූවෝ වෙති.

අකුසල 14රෙන්–

(14–17) **මෝහාදී අකුසල සාධාරණ** 4 සතර අකුසල් සිත් 12 හිම යෙදෙත්.

(18). **ලෝභය** ලෝභ සහගත සිත් 8හි පමණක් උපදී.

(19). **දිට්ඨිය** දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් 4රෙහි පමණක් උපදී.

(20). **මානය** දෘෂ්ටිවිප්‍රයුක්ත 4රෙහි පමණක් උපදී.*

(21–24). **දෙසය ඉස්සාව මච්ඡරියය කුක්කුච්චය** යන සතර ප්‍රතිඝ සම්ප්‍රයුක්ත සිත් 2හි යෙදෙති. *

---

* එම් තුන්පල සම්බන්ධවූ විස්තරයක් මේ සම්ප්‍රයොග කාණ්ඩයේ අගදී කියනු ලැබේ.

(25–26). **පීනම්ධ 2 සසංසකාරික සිත් පසෙහි යෙදෙති**

(27). **විචිකිච්ඡාව, විචිකිච්ඡා සහගත සිතේ ප්‍රමණක් යෙදේ.**

"සබ්බාපුඤ්ඤෙසු චත්තාරො – ලොභමූලෙ තයොගතා,
දොසමූලෙසු චත්තාරො – සසංඛාරෙ ද්වයං තථා.

විචිකිච්ඡා විචිකිච්ඡා – චිත්තෙචෙති චතුද්දස,
ද්වාදසා කුසලෙසෙවව – සම්පයුජ්ජන්ති පඤ්චධා"

(අකුසල් සිත් සියල්ලෙහි මොහාදි සතර 4 ද ලොභ මූලික සිත්හි ලොභාදී 3 ද දොසමූලික සිත්හි දොසාදී 4 ද සසංස්කාරික සිත්හි පීනම්ඩ 2 ද විචිකිච්ඡා සිතෙහි විචිකිච්ඡාව ද යි අකුසල චෛතසිකයෝ 14 අකුසල සිත් 12 සේ පමණක් මෙසේ පස් පරිද්දෙකින් යෙදෙති යනු භාව යි.)

සොභන 25 න්:–

(28–46). **සොභන සාධාරණයයි** නම් ලත් සද්ධාදී 19 ය සොභන සිත් 59 හි එක්කෝ 91 කෙහි නියතයෙන් ම යෙදෙති.

(47–49). **විරති** නම් ලත් සම්මාවාචාදී 3 සියලුම ලොකොත්තර සිත් 8 හි එක්කෝ 40 හි එක්ව ම ලැබෙති. තුමූත් කාමාවචර කුසල් සිත් 8 හි සමහර විටෙක යෙදෙති. අන් සමහර විටෙක නො යෙදෙති. යෙදෙන කල්හි ද තුනෙන් එකක් මිස දෙකක් හෝ තුන ම හෝ එක විට නො යෙදෙති.

(50–51). **කරුණා මුදිතා** 2 ක පඤ්චමධ්‍යානය හැර ඉතිරි රූපාවචර සිත් 12 හි ද මහාකුසල මහා ක්‍රියා 16 හිද යන 28 සිතෙහි සමහර විටෙක යෙදෙති. අන් සමහරවිටෙක නො යෙදෙති. යෙදෙන කල් හි ත් එකක් මිස දෙක ම එක විට නො යෙදෙති. උපෙක්ෂා සහගත සිත්හි මේ දෙක කිසි සේ ත් නොයෙදෙත් ම ය යි ද එසේ කල මහා කුසල මහා ක්‍රියා 16 න් උපෙක්ෂා සහගත 8 හැර ඉතිරි 8 ට යොදගැණීමෙන් 20 ක පමණක් යෙදෙතැ යි ද සමහර ආචාර්‍ය්‍ය වචනයෙකි. එය ද සැලකියයුත්තක් කොට දක්වා තිබේ.

(52). ප්‍රඥාව ඥානසම්ප්‍රයුක්ත කාමාවචර සෝභන සිත් 12 සේද සියලුම මහද්ගත 27 හේද ලොකොත්තර 8 වෙහි එක්කෝ 40 සෙහිද යන 47 හේ එක්කෝ 79 යේ නියත වශයෙන් යෙදේ.

"එකූන වීසතිධම්මා – ජායන්තෙකූනසට්ඨිසු,
තයො සොළස චිත්තෙසු – අට්ඨවීසතියං ද්වයං
පඤ්ඤා පකාසිතා සත්ත – චත්තාළීස විධෙසුපි,
සම්පයුත්තා චතුද්ධෙවං – සොභනෙස්වෙව සොභනා".

(එකූනනවුතික නයින් සොභනසාධාරණ 19 ය 59 සිත කද විරති 3 ණ 16 සිතක ද අප්‍රාමාණ්‍ය 2 ක 28 සිතකද ප්‍රඥාව 47 සිතකද යි හතර පරිද්දෙකින් සොභන චෛතසිකයෝ සොභන සිත් කෙරෙහි ම යෙදෙන්නාහු වෙති යනු භාව යි.)

මේ චෛතසිකයන්ගේ යෙදීම නියතයොගය අනියත යොගය සහයොගය නානායොග ය යි සතර ආකාර වේ. එයින්:–

**නියතයොගය** නම්:– යම් චෛතසිකයක් යම් සිතකට නියම ද එය නැති ව ඒ සිත උපදින්ට අභව්‍යවීම යි. (උදාහරණ විචිකිච්ඡාව නැති ව විචිකිච්ඡා සිත නූපදී.)

**අනියතයොගය** නම්:– යම් චෛතසිකයක් යම් සිතකට නියම ද එය ඇතිවත් නැතිවත් ඒ සිතට උපදින්ට අභව්‍ය කමක් නැතිබව යි. (උදාහරණ:– මානය සහිත වූ ද රහිත වූ ද දෘෂ්ටි විප්‍රයුක්ත සිත් ඇත්තේ ය.) මීට **කදාචියොග ය යි ද** නමක් වේ.

**සහයොගය** නම්:–යම් සිතකට නියම වූ චෛතසික දෙකක් හෝ වැඩි ගණනක් එකට මිස තනි තනිව එහි නො යෙදීම යි. (උදාහරණ:– ථීන මිද්ධ දෙකින්ම යුක්ත වූ ද වියුක්ත වූ ද සසංස්කාරික සිත් තිබෙන්නේ වී නමුත් එකකින් යුක්ත ව අනිකෙන් වියුක්ත වූ සිත් නැත්තේ ය.)

**නානායොගය** නම්:– යම් සිතකට නියම වූ චෛතසික කීපයකින් යම්කිසි එකක් මිස දෙකක් හෝ වැඩියක් හෝ එකවිට එහි නො යෙදීම යි. (උදාහරණ– ඉස්සා මච්ඡරිය

කුක්කුච්ච යන තුනෙන් එකකින් යුත් ප්‍රතිඝ සිත් ඇතිමුත් දෙකකින් හෝ තුනෙන් යුත් සිත් නැත්තේ ය.)

**නියතයෝගී අනියතයෝගී සහයෝගී නානායෝගී** යන නම්වලින් එසේ එසේ යෙදෙන චෛතසිකයෝ කියනු ලැබෙත්.

මෙයින් මානය යෙදේ ය යි නියම සියලු තැන ම අනියතයෝගී ද නානායෝගී ද වෙයි.

ථින මිද්ධ දෙක යෙදෙතැ යි නියම සියලු තැන ම අනියත යෝගී ද සහයෝගීද වෙති.

විරති තුණ ලොකොත්තර සිත්හි නියත යෝගී ද සහ-යෝගී ද මහාකුසල සිත්හි අනියත යෝගී ද නානා යෝගී ද වෙති.

අප්‍රාමාණ්‍ය දෙක යෙදෙත් ය යි නියම සියලු තැන ම අනියතයෝගී ද නානායෝගී ද වෙති.

ඉතිරි සියලු ම චෛතසික සතළිස්එක යෙදෙත් ය යි නියම සියලු තැන නියතයෝගී වෙති.

ඉනුත් සබ්බචිත්තසාධාරණ සබ්බාකුසලසාධාරණ සොභනසාධාරණයෝ ඒ ඒ තැන සහයෝගී ද වෙති.

මේ අප්‍රතිමට සාධාරණ චෛතසිකයන් ගැණ කී කාරණය හැර ඉතිරි අර්ථය ගාථාවකිනුත් දක්වා තිබේ. ඒ මෙසේයි:-

"ඉස්සාමච්ඡෙර කුක්කුච්ච – විරතී කරුණා දයො,
නානා කදාචි මානො ච – ථිනමිද්ධං තථා සහ,
යථාවුත්තානුසාරෙන – සෙසා නියතයොගිනො."

සම්ප්‍රයෝගපාදය යි.

B. එක එක සිතෙහි යෙදෙන චෛතසික ගණන එක් කොට දැක්වීම සඞ්ග්‍රහය යි.

එහි ඒ ඒ චිත්තවර්ගයෙහි යෙදෙන්ට හැකි ඉතා වැඩි ගණන් හෙවත් ඊජ්ට නියම ගණන් මෙසේ මාතෘකා වශයෙන් දක්වා තිබේ.

"ඡත්තිංසානුත්තරෙ ධම්මා – පඤ්චතිංස මහග්ගතෙ,
අට්ඨතිංසාපි ලබ්භන්ති – කාමාවචර සොභනෙ.
සත්තවීසත්‍ය පුඤ්ඤම්හි – ද්වාදසා හෙතුකෙති ච,
යථා සම්භවයොගෙන – පඤ්චධා තත්ථ සඞ්ගහො."

(ලොකොත්තර සිත්හි 36 ක් ද මහද්ගත සිත්හි 35 ක් ද කාමාවචර සොභනයෙහි 38 ක් ද අකුසලයෙහි 27 ක් ද අහෙතුකයෙහි 12 සක් දූ යි ලත් ලත් හැටියෙන් යොදු ගැණීම් වසයෙන් සඞ්ග්‍රහය පස් පරිද්දක් වේ යනුයි.) ඒ මෙ ලෙස යි.

**ලොකොත්තර සිත්** අතරෙන් ප්‍රථම ධ්‍යාන සිත් 8 වේ අඤ්ඤසමාන චෛතසික 13 ද අප්‍රාමාණ්‍ය 2 හැර ඉතිරි සොභන චෛතසික 23 ද යන 36 ය සඞ්ග්‍රහ වෙති.

ලොකොත්තර සිත්හි අනියතයොගී චෛතසිකයක් නැති බැවින් මේ 36 ය නියත වසයෙන් ම යෙදෙති

ද්විතීය ධ්‍යාන සිත් 8 මේ එයින් ම විතර්කය හැර ඉතිරි 35 යෙදෙති.

තෘතීය ධ්‍යාන සිත් 8 වේ විතර්ක විචාර දෙක හැර ඉතිරි 34 යෙදෙති.

චතුර්ථ ධ්‍යාන සිත් 8 වේ විතර්ක විචාර ප්‍රීති යන තුණ හැර ඉතිරි 33 යෙදෙති

පංචම ධ්‍යාන සිත් 8 වේ එම 33 ම යෙදෙමින් උපෙක්‍ෂා සහගත වේ.

මෙසේ ලොකොත්තර වර්ගයෙහි ම ධ්‍යාන පසේ භෙද යෙන් සඞ්ග්‍රහය පඤ්චප්‍රභෙද වේ.

"ඡත්තිංස පංචතිංසාථ – චතුත්තිංස යථාක්කමං,
තෙත්තිංසද්වයමිච්චෙවං – පංචධානුත්තරෙ ඨිතා."
අනුත්තරෙ ඣානධම්මා අප්පමඤ්ඤා ච මජ්ඣිමෙ,
විරති ඤාණ පීති ච පරිත්තෙසු විසෙසකා."

(ප්‍රථමාදී ධ්‍යාන පිළිවෙළින් 36 ක 35 ක 34 ක 33 ක නවත් 33 කැයි ලොකොත්තරයෙහි චෛතසික සඞ්ග්‍රහය පස් පරිද්දක් වේ යනු භාව යි.

**මහද්ගත සිත්** අතුරෙන් ප්‍රථමධ්‍යාන සිත් තුණෙහි අඤ්ඤසමාන චෛතසික 13 ද, විරති 3 හැර ඉතිරි සොභන චෛතසික 22 දැයි 35 ක් සංග්‍රහ වෙති. නමුත් අප්‍රාමාණ්‍ය දෙක නානායොගී කදාචි යොගී බැවින් 33 ක් හෝ 34 ක් මිස 35 ම එකවිට නො ලැබෙන බව දතයුතු යි.

ද්විතීයධ්‍යාන සිත් තුණේ එම ගණනින් විතර්කය හැර ඉතිරි 34 ද,

තෘතීයධ්‍යාන සිත් තුණේ විතර්ක විචාර දෙක හැර ඉතුරු 33 ද,

චතුර්ථධ්‍යාන සිත් තුණේ විතර්ක විචාර ප්‍රීති යන තුණ හැර ඉතිරි 32 ද සංග්‍රහ වෙති. (මේවායේ ද ප්‍රථම ධ්‍යානයට කීලෙස ම නානායොගී කදාචියොගීතාව පිණිස නිතර ම 2 ක් නොහොත් 1 ක් අපහරණ හැර යෙදෙන ගණන් දත යුතු යි.)

පංචමධ්‍යාන සිත් 15 සේ විතර්ක විචාර ප්‍රීති කරුණා මුදිතා යන 5 හැර ඉතිරි 30 යෙදෙමින් වෙදනාව උපෙක්‍ෂා සහගත වේ. මේ 30 ම නියත යොගී ද වෙති.

මෙසේ මහද්ගත වර්ගයෙහි ම ධ්‍යාන පසේ භෙදයෙන් සංග්‍රහය 5 ප්‍රභෙද වේ.

"පංචතිංස චතුත්තිංස – තෙත්තිංස ච යථාක්කමං,
ද්වත්තිංස චෙව තිංසෙති – පංචධාව මහග්ගතෙ."

(ප්‍රථමධ්‍යානාදී ධ්‍යාන පිළිවෙළින් 35 ක 34 ක 33 ක 32 ක 30 කැයි මහද්ගතයෙහි සංග්‍රහව 5 ප්‍රකාර වේ යනු භාව යි).

**කාමාවචර සොභන සිත් අතුරෙන්:–**

**කුසල් සිත්වල** පලමුවෙනි දෙකෙහි (එනම් සොම්නස් සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික සසංස්කාරික දෙකෙහි) අන්‍ය සමාන 13 ද සොභන 25 දැයි 38 ක් සංග්‍රහ වෙති. නුමුත් අප්‍රාමාණ්‍ය විරති යන 5 ම මෙහි කදාචියොගීනානා යොගී බැවින් ඔවුන් නො යෙදෙන කල 33 ක් ද යෙදෙන කල 33 ක් ම ද එකවිට ඇති වනු මිස ඉන් කිසි සේත් වැඩි නො වන බව දත යුතු යි. දෙවෙනි (ඊලඟ) දෙකෙහි එ ම ගණනින් ඥානය හැර ඉතුරු 37 ද තුන්වෙනි දෙකෙහි ප්‍රීතිය පමණක් හැර ඥානයත් සමග 37 ම ද සතරවෙනි දෙකෙහි ඥාණ ප්‍රීති 2 ම හැර ඉතුරු 36 ද යෙදෙති (අප්‍රාමාණ්‍ය විරතීන් අතුරෙන් කිසිත් නොයෙදීම හෝ එකක් යෙදීම හෝ මේ වායේ ද එලෙස ම යි).

**ක්‍රියාසිත්** යුගලවල ද විරති හැර ඉතුරු ගණන් එලෙස ම 35 ක් 34 ක් නැවත 34 ක් හා 33 ක් යන පිළිවෙළින් යෙදෙති. (එහි ද අප්‍රාමාණ්‍යයන්ගේ නො යෙදීම හෝ එකක් යෙදීම හෝ කී ලෙස ම යි).

**විපාකසිත්** යුගලවල අප්‍රාමාණ්‍ය විරති දෙවර්ගය ම හැර ඉතුරු 33 ක් 32 ක් නැවත 32 ක් හා 31 ක් යන පිළිවෙළින්

යෙදෙති. මෙසේ 24 කාමාවචර සොභන සිත්හි පිළිවෙළින් යුග වසයෙන් 12 පරිද්දකින් සංග්‍රහය වේ.

"අට්ඨතිංස සත්තතිංස – ද්වයං ඡත්තිංසකං සුභෙ
පඤ්චතිංස චතුත්තිංස ද්වයං තෙත්තිංසකං ක්‍රියෙ.
තෙත්තිංස පාකෙ ද්වත්තිංස – ද්වයෙක තිංසකං භවෙ
සහෙතු කාමාවචර – පුඤ්ඤ පාක ක්‍රියා මනෙ."

(සහෙතුක කාමාවචර කුසල විපාක ක්‍රියා සිත්හි මෙසේ සංග්‍රහ වේ. එනම්:– කුසලයෙහි: 38. 37. 37. 36.–ක්‍රියාවෙහි 35. 34. 34. 38.–විපාකයෙහි 33. 32. 32. 31 යන ගණන් වසයෙනි යනු භාව යි.)

මේ සොභන චෛතසිකයන්ගේ ප්‍රකීර්ණක විභාගයක් දක්වනු ලැබේ:– මුළු රාජ්‍යය ලද්දෙක් එයින් ම ගමක් හිමිකර ගැන්මෙහි උත්සාහ නො දරන්නාක් මෙන් ද, උතුම් වස්ත්‍රාභරණීන් සැරසී සිටින්නෙක් දුගී ජනයාගේ විලි වැසුම් කඩක් නො සොයන්නාක් මෙන් ද රහතුන්ට උපදිනා ක්‍රියා සිත් වල විරති යෙදීමක් නැත්තේ ය. නුමූත් වරද කිරීමට අභව්‍ය නො වන පෘථග්ජන ශෛක්‍ෂ දෙපක්‍ෂයට අයිති මහා කුසල සිත්හි ඒ වරද කිරීමට ප්‍රතිපක්‍ෂ භාවයෙන් ද ලොකොත්තර සිත්හි වරද පැවැත්මට වස්තු වූ පෘථග්ජනතාවට ප්‍රතිපක්‍ෂ වසයෙන් ද ලැබෙති. ධ්‍යානය ලැබීම් වසයෙන් චිත්ත ශුද්ධිය කරගන්ට මත්තෙන් ශීලශුද්ධියෙහි දී ම දුශ්චරිතයන් ගෙන් තුරන් ව සිටි හෙයින් ගෙය තුළදී කුඩය නො දරන්නාක් මෙන් මහද්ගත සිත්හි විරති නො යෙදෙති. ලොකොත්තර සිත් සියල්ලේ ම අරමුණ නිර්වාණය බැවින් සත්වයන් කෙරෙහි යොදන කරුණා මුදිතා දෙක නිවණ කෙරෙහි යෙදිය යුත්තක් නැත්තෙන් ලොකොත්තර සිත්වල අප්‍රාමාණ්‍ය යෝ නො යෙදෙති. මහා කුසල සිත් නිසා අතික් කලක ලැබෙන තිරුත් සාහයෙන් උපදින ඒ සවභාව ඇති සිත් හෙයින් මහාවිපාක සිත්හි විරති ද අප්‍රාමාණ්‍ය ද යන දෙවගීය ම නො යෙදෙති.

"නවිජ්ජන්තෙත්ථ විරති – ක්‍රියාසු ච මහග්ගතෙ,
අනුත්තරෙ අප්පමඤ්ඤා – කාමපාකෙ ද්වයං තථා"
(මෙහි භාවය කී අර්ථය ම යි.)

ලොකොත්තරයෙහි ධ්‍යානාඞ්ගයන් ද – මහද්ගතයෙහි ධ්‍යානාඞ්ගයන් හා අප්‍රාමාණ්‍යයන් ද, කාමාවචර සොභනයෙහි අප්‍රාමාණ්‍යයන් හා විරති සඞ්ඛ්‍යාත පීති යන මොවුන් ද, කාරණ කොට ගෙණ සිතකින් සිතක් වෙතස් වන බැවින් ඒ චෛතසිකයෝ ඒ ඒ වර්ගයන්ගේ විශෙෂකයෝ යි.

**අකුසල්සිත්** අතුරෙන් ලොභ මූලසිතෙහි පළමු වැනි අසංස්කාරිකයෙහි (එනම් – සොම්නස් සහගත දෘෂ්ටිසම්ප්‍රයුක්ත අසංස්කාරිකයෙහි) අඤ්ඤ සමාන 13 ද අකුසල සාධාරණ 4 ද යන 17 ලොභ දිට්ඨි 2 හ් සමග 19 ක් වී සංග්‍රහ වෙති. දෙවෙනි අසංස්කාරිකයෙහි එ ම 17 ලොභ මාන 2 හා 12 ක් ව ද, තුන්වැනි අසංස්කාරිකයෙහි එයින් ප්‍රීතිය හැර ඉතිරි 16 ලොභ දිට්ඨි දෙක හා 18 ක් ව ද, හතර වැනි අසංස්කාරිකයෙහි එ ම 16 ලොභ මාන දෙක හා 18 ක් ව ද, පස් වැනි වූ ප්‍රතිඝ සම්ප්‍රයුක්ත අසංස්කාරිකයෙහි එම 16 දෙස ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන 4 හා 20 ක් ව ද සංග්‍රහ වෙති. (තුමූත් මෙහි මානය අනියත යොගී බැවින් එය නො යෙදෙන කල දෙවෙනි අසංස්කාරික යෙහි 18 ක් හා සතර වැනි අසංස්කාරිකයෙහි 17 ක් ව ද, යෙදෙන කල ඒ දෙකෙහි 19 ක් හා 18 ක් ව ද පස් වැනි අසංස්කාරිකයෙහි ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන තුණ අනියත යොගී ද නානායොගී ද බැවින් නො යෙදෙන කල දෙසයත් සමග 17 ක් හෝ යෙදෙන කල ඒ එකත් සමග 18 ක් හෝ මිස ඉන් වැඩියක් නො යෙදෙන බව ද දත යුතු යි.) සසංස්කාරික පසෙහි ද එ සේ ම පිළිවෙළින් ථිනමිද්ධ 2 කත් වැඩිපුර එකතු කොට 31, 21, 20, 20, 22, යන මේ ගණන් පිළිවෙළින් සංග්‍රහ වෙති. (තමුත් ථිනමිද්ධ 2 කදචි යොගී ද සහයොගී ද බැවින් නො යෙදෙන කල ලොභසහගත 4 හි දෙවෙනි සතර වැනි සිත් වල මාන හෙදයත් සහිත ව අසංස්කාරිකයන්ට කී ගණන් ම ද යෙදෙන කල ඊට 2 ක් වැඩිව ද, ප්‍රතිඝ සම්ප්‍රයුක්ත සසංස්කාරිකයෙහි නො යෙදෙන කල ඉස්සාදීන්ගේ නො යෙදීමෙන් 17 ක් හෝ 18ක් ද යෙදෙන කල 19 ක් හෝ 20 ක් ද යෙදෙන බව දත යුතු යි.) උද්ධච්ච සහගත සිතෙහි ඡන්දපීති 2 ක හැර ඉතුරු අඤ්ඤසමාන 11 ද අකුසල සාධාරණ 4 ද යි 15 ක් ද විචිකිච්ඡා සහගත

සිතෙහි ඡන්ද පීති අධිමොක්ඛ 3 ණ හැර ඉතුරු අඤ්ඤසමාන 10 අකුසල සාධාරණ 4 හා විචිකිච්ඡාවත් සමග 15 ක් වී සංග්‍රහ වෙති.

මෙ සේ අකුසල් සිත් 12 කෙරෙහි වෙන වෙන ම යොදන ලද්දේ වී නමුත් ලැබෙන චෛතසික යන්ගේ මුලු ගණන් වස යෙන් 7 පරිද්දෙකින් සංග්‍රහ වෙති. එනම්:-

"එකූනවීසාට්ඨාරස - වීසෙකවීසවීසති
ද්වාවීසපණ්ණරසෙති - සත්තධාකුසලෙ ඨිතා."

(අකුසල් සිත් කෙරෙහි 19, 18, 20, 21, 20, 22, 15, යන මේ ගණන් චෛතසිකයෝ සංග්‍රහ වෙති යනු භාව යි.)

සබ්බාකුසල සාධාරණ 4 ද සබ්බ චිත්තසාධාරණ 7 ද විතක්ක විචාර විරිය යන ප්‍රකීර්ණක 3 ද යන 14 නො යෙදෙන අකුසල සිතක් නැත්තේ ය. එහෙයින් ඒ 14 ට සබ්බාකුසලයොගී යයි කියති.

මේ අර්ථය මෙසේ දක්වා තිබේ:-

"සාධාරණා ච චත්තාරො - සමානා ච දසාපරෙ,
චුද්දසෙතෙ පවුච්චන්ති - සබ්බාකුසල යොගිනො."

අහෙතුක සිත් අතුරෙන් හසිතොත්පාදක සිතෙහි ඡන්දය හැර ඉතුරු අඤ්ඤසමාන 12 ද, මනොද්වාරා වර්ජනයෙහි ඡන්දපීති 2 හැර ඉතුරු අඤ්ඤසමාන 11 ද, සොම්නස් සහගත සන්තීරණයෙහි ඡන්ද විරිය 2 හැර ඉතුරු 11 ද, පඤ්චද්වාරාවර්ජනය ද සම්පටිච්ඡන 2 ද උපෙක්ෂා සහගත සන්තීරණ 2 ද යන 5 සෙහි ඡන්ද පීති විරිය යන 3 හැර ඉතුරු 10 ද, ද්විපඤ්චවිඤ්ඤාණයෙහි සබ්බ චිත්තසාධාරණ 7 පමණක් ම ද සංග්‍රහ වෙති.

මෙසේ අහෙතුක සිත් 18 කෙරෙහි ත් ගණන් වසයෙන් 4 පරිද්ද කින් සංග්‍රහය වේ.

"ද්වාදසෙකාදස දස-සත්තචාති චතුබ්බිධො,
අට්ඨාරසාහෙතුකෙසු-චිත්තුප්පාදෙසු සඞ්ගහො."

(අහෙතුක සිත් 18 වෙහි 12 ය 11 ය 10 ය 7 යයි චෛතසික සංග්‍රහය 4 වැදෑරුම් වේ යනු භාව යි.)

මේ සියලු අහෙතුකයන්හි සබ්බචිත්තසාධාරණ 7 පමණක් සාමාන්‍ය ව ද ප්‍රකීර්ණක පසක් විසෙසක ව ද යෙදී තිබේ.

මෙතෙකින් සංග්‍රහ මාතෘකාවෙහි දැක්වූ 5 පරිද්දෙන් ලොකොත්තර වර්ගයෙහි 5 ක් ද මහද්ගත වර්ගයෙහි 5 ක් ද කාමාවචර සොභන වර්ගයෙහි 12 ක් ද අකුසල වර්ගයෙහි 4 ක් ද අහෙතුක වර්ගයෙහි 4 ක් දැයි තැවත ප්‍රභෙද වූ 33 වැදෑරුම් සංග්‍රහය විස්තර වශයෙන් කියා නිම වන ලදී.

මෙසේ මේ දක්වන ලද චෛතසික 52 ක හා විඤ්ඤාණය යන ධර්මයන් 53 ක් සභාග නාම ධර්මයන් කොට දතයුත්තේය

සංග්‍රහපාදය යි.

## දෙවෙනි චෛතසික කාණ්ඩය නිමි.

යථොක්ත චිත්ත චෛතසික 53 න් අනතුරු ව දැක්වූ ඒ ඒ නියම වූ පරිද්දෙන් එක් ව යෙදෙන්නා වූ එක එක සමූහයට චිත්තොත්පාද යන නම වෙයි. මෙහි ප්‍රථම කොට දැක්වූ සිත් 89 ය එක්කෝ 121 ම උපදින එක එක වාරයක් පාසා ම වෙන වෙන චිත්තොත්පාදයෝ වෙති. එක චිත්තොත්පාදයක ආයුෂය චිත්තක්ෂණය යි.

දැන් ඔවුන්ගේ 1. වෙදනා සංග්‍රහය, 2. හෙතු සඞ්ගහය, 3. කිච්ච සඞ්ගහය, 4. ද්වාර සඞ්ගහය, 5. ආලම්බන සඞ්ගහය, යන සය පරිද්දකින් ඒ ඒ සමුද්දෙස විභාගාදීන් සහිත වූ සංග්‍රහය දක්වනු ලැබේ. ඉන්:-

1. වෙදනා සංග්‍රහයෙහි සුඛ දුක්ඛ අදුක්ඛමසුඛය යි සුත්‍රාන්තික නයින් 3 වැදෑරුම් වූ ද සුඛ දුක්ඛ සොමනස්ස දෞමනස්ස උපෙක්ඛා ය යි ආභිධම්මික නයින් 5 වැදෑරුම් වූ ද වෙදනාව දත යුතු යි.

එහි දෙවෙනි නයෙහි සුඛ නම් කායික සැප විඳීම යි. දුක්ඛ නම් කායික දුක් විඳීම යි. සොමනස්ස නම් සිතෙහි වූ සැප විඳීම යි දෞමනස්ස නම් සිතෙහි වූ දුක් විඳීම යි. උපෙක්ඛා නම් සිතෙහි වූ සුව දුක් දෙකින් තුරන් විඳීම් සව භාව යි. නුමුත් පළමු වැනි නයෙහි සුඛය යනු එහි සුඛ සොම

නස්ස දෙකට සාධාරණ නමකි. දුක්ඛ යනු දුක්ඛ දෙම නස්ස දෙකට සාධාරණ නමකි. එසේ ම අදුක්ඛම සුඛ යනු උපෙක්ෂාවට නමි

"සුඛං දුක්ඛ මුපෙක්ඛාති-තිවිධා තත්‍ථ වෙදනා,
සොමනස්සං දොමනස්ස-මිති භෙදෙන පංචධා."

(කී අනුසාරයෙන් භාවය පැහැදිලි සි.)

වෙදනා සමුද්දෙස විභාගය යි,

ආභිධම්මික නයින්-

**සුඛ සහගත** සිත එකක් ම වේ. එනම්-කුසල විපාක කාය විඤ්ඤාණය යි.

**දුක්ඛසහගත** සිතද එකක් ම යි. එනම්-අකුසල විපාක කාය විඤ්ඤාණය යි.

**සොමනස්ස සහගත** සිත් 62 ක් වේ. එනම්-ලොභ මූලික සිත්වලින් මුල 4 ද, මහා කුසල් සිත් වලින් මුල 4 ද, මහා විපාක වලින් මුල 4 ද, මහා ක්‍රියාවලින් මුල 4 ද, කුසල විපාක සන්තීරණ දෙකින් මුල 1 ද, හසන සිත ද, යන කාමාවචර යෙන් 18 ක් සහ මහද්ගත ලොකොත්තර වලින් ප්‍රථමධ්‍යාන 11 ද, ද්විතීයධ්‍යාන 11 ද, තෘතීයධ්‍යාන 11 ද, චතුර්ථධ්‍යාන 11 ද යි (44 ක්) යන මොහු යි.

**දොමනස්ස සහගත** සිත් 2 ක් වේ. එනම්-ද්වෙෂ සහගත සිත් 2 යි.

**උපෙක්ඛා සහගත** සිත් 55 කි. එනම්-(යථොක්ත 4 කොටසට නො වැටී ඉතුරු සියල්ල යි. එනම්) ලොභ සහගත යන් ගෙන් අග 4 ද, මොමූහ සිත් 2 ද, චක්ඛු සොත ඝාණ ජිව්හා විඤ්ඤාණ 8 ද, සම්පටිච්ඡන 2 ද, සුඛ සන්තීරණය හැර ඉතුරු සන්තීරණ 2 ද, ආවජ්ජන 2 ද, මහාකුසල්වලින් අග 4 ද, මහා විපාක වලින් අග 4 ද, මහා ක්‍රියාවලින් අග 4 ද, මහද් ගත ලොකොත්තර පඤ්චමධ්‍යාන 23 ද, යන මොහු යි.

"සුඛමෙකත්‍ථ දුක්ඛං ච-දොමනස්සං ද්වයෙ ඨිතං,
ද්වාසට්ඨිසු සොමනස්සං-පඤ්චපඤ්ඤාසකෙ තරා."

(සුඛය 1 සිතක ද දුක්ඛයත් 1 සිතක ද දෞර්මනස 2 කාද සෞමනස 62 ක ද ඉතුරු උපෙක්‍ෂාව 55 ක ද සිටියේ ය යනු භාව යි.)

සූත්‍රාන්තික නයින්:-

සුඛ සහගත සිත් 63 කි. එනම්:-අනතුරු නයින් කී සුඛ සහගත 1 සහ සොම්නස් සහගත 62 යි.

දුක්ඛසහගත සිත් 3 කි. එනම්:-දුක්ඛ සහගත 1 සහ දෞමනස්ස සහගත 2 යි.

අදුක්ඛමසුඛ සහගත 55 යි. එනම්:-උපෙක්‍ෂා නමින් කී සිත් මැ යි. මේ අර්ථය ගාථාවකින් දක්වන්නෙමු ,

සුඛා තෙ සට්ඨියං තිස්‍ස–දුක්ඛා සුත්තන්තිකෙ නයෙ,
අදුක්ඛමසුඛා පඤ්ච–පඤ්ඤාසායං ච වෙදනා.

වෙදනා සම්ප්‍රයොගය යි.

**වෙදනා සංග්‍රහ පාදය යි.**

2 **හෙතුසංග්‍රහ**යෙහි ලොභය, ද්වෙෂය, මොහය, අලොභය, අද්වෙෂය, අමොහයයි හෙතු 6 ක් දතයුතු යි. එහි **අමොහ** යනු ප්‍රඥාව යි. ඉතිරි 5 චෛතසික කාණ්ඩයේ දී කී සැටි ම යි. මෙයින් ප්‍රථම 3 **අකුසල හෙතූහු** වෙති. **ඉතිරි 3 කුසල හෙතූහු ද අව්‍යාකෘත හෙතූහු ද** වෙති. නුමුත් අහෙතුක සිත් සියල්ල ම ත් රූපය හා නිර්වාණයත් අව්‍යාකෘත වූ නමුත් එහි හෙතු නො යෙදෙන බැවින් අව්‍යාකෘත හෙතු යනු සියල්ල විෂය කොට පවත්නා ව්‍යාපක නියමයෙන් කරණ ලද නමක් නොව ඒ විෂයයෙහි පවත්නා බැවින් වෛශයික නියමයෙන් කරණ ලද්දකි. අකුසල හෙතු කුසල හෙතු යනු ව්‍යාපක නියමයෙන් ම කරණලද්දහු ය.

"ලොභො දොසො ච මොහො ච– හෙතු අකුසලා තයො
අලොභා දොසා මොහො ච–කුසලාව්‍යාකතා තථා"

(කී අනුසාරයෙන් භාවය පැහැදිලි යි.)

හෙතු සමුද්දෙස විභාගය යි.

මේ හෙතු විෂයෙහි චිත්තොත්පාදයෝ අහෙතුකය සහෙතුක ය යි දෙවගීයකට බෙදෙති. ඉන්:-

**අහේතුකයෝ** නම්; එකී හෙතුන් ගෙන් කිසිවක් නො යෙදෙන පඤ්චද්වාරාවජ්ජන ද්විපඤ්චවිඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන හසන යන මොහු 18 බව යට කියන ලදී.

ඉතිරි සියලු 71 එක්කෝ 103 **සහේතුකයෝ** යි. එනම්:- යථොක්ත හෙතුන් ගෙන් යම් කිසි එකක් හෝ දෙකක් හෝ තුනක් ම හෝ යෙදීම් වසයෙන් හෙතු සහිත වන්නෝ ය.

මෙ සේ යෙදෙන හේතුන්ගේ ගණනේ හැටියෙන් එක හෙතුක ය ද්විහෙතුක ය තිහෙතුක ය යි සහෙතුක යෝ ම තුන් කොටසක් වෙති. ඉන් ද:-

**එකහෙතුකයෝ** නම්, මොහ හෙතුව පමණක් යෙදෙන මොමූහ සිත් 2 යි.

**ද්විහෙතුක** සිත් 22 කි. එනම්:-ලොභ මොහ වසයෙන් ද්විහෙතුක වූ ලොභ සහගත සිත් 8 ද, දොස මොහ වසයෙන් ද්විහෙතුක වූ ද්වෙෂ සහගත 2 ද, අලොභ අදොස වසයෙන් ද්විහෙතුක වූ ඤාණවිප්පයුත්ත කාමාවචර සොභන 12 ද යන මොහු යි.

**තිහෙතුක** 47 කි. එක්කෝ 79 කි. එනම්:-අලොභ අදොස අමොහ වසයෙන් තිහෙතුක වූ (යට පඤ්ඤ චෛතසිකය යෙදේ ය යි දක්වූ සියල්ල යි. එනම්:-) ඤාණ සම්පයුත්ත කාමාවචර සොභන 12 සමග මහද්ගත ලොකොත්තර 35 එක්කෝ 67 යි.

“අහෙතුකාට්ඨාරසෙක–හෙතුකා ද්වෙ දුවීසති,
ද්විහෙතුකා මතා සත්ත–චත්තාළීස තිහෙතුකා.”

(එකූන නවුතික නයින් අහෙතුක 18 කි. එක හෙතුක 2 කි, ද්විහෙතුක 22 කි, ත්‍රිහෙතුක 47 කි; යනු භාව යි.)

හෙතු සම්පයොගය යි.

හෙතුසංග්‍රහ පාදය යි.

3. **කිච්චසංගහයෙහි** කිච්ච 14 ක් හා ඨාන 10 ක් ද දත යුතු යි. එහි 1. පටිසන්ධිකිච්චය, 2. භවඞ්ගකිච්චය, 3. ආවජ්ජන කිච්චය, 4. දස්සනකිච්චය, 5. සවන කිච්චය, 6.

ඝායන කිච්චය, 7. සායන කිච්චය, 8. ඵුසන කිච්චය, 9. සම්පටිච්ඡන කිච්චය, 10. සන්තීරණ කිච්චය, 11. වොත්ථපන කිච්චය, 12. ජවන කිච්චය, 13. තදාලම්බන කිච්චය, 14. චුති කිච්ච ය යි යන තුදුස චිත්තොත්පාදයන් විසින් කරණ කෘත්‍යයෝ යි. මෙසේ :

1. **පටිසන්ධිකිච්චය** නම්:-භවයකට භවයක් ගැලපීම යි. හෙවත් එක් භවයකින් ගිලිහුන ඉක්බිති අන් භවයක් පටන් ගැන්ම යි. තිඹිගත යන හුලකින් අන් හුලක් ඇවිලීම මෙනි.

2 **භවඞ්ගකිච්චය** නම්:- එසේ ප්‍රතිසන්ධි දුන් භවයෙහි පැවැත්ම යි. ඇවුලුන හුල ඇවිලීගණ යන්නාක් මෙනි.(මෙ ගැණ විස්තර මතු කියැවේ).

3. **ආවජ්ජනකිච්චය** නම්:-අරමුණු වැද්දගැන්මට ඇස් කන් ආදී මනස සවැනි කොට ඇති ද්වාරයන් ගෙන් යම් කිසි වක් විවෘත කරන්නාක් මෙන් පිරිනැමීම හෝ ඒ ඒ අරමුණ අරබයා විශෙෂ චිත්තොත්පාදයන් සම්බන්ධ චිත්තචෛතසික යන්ගේ උත්පත්තියට මග සැලසීම යි. අමුත්තන්ට දොර හැරීමක් මෙනි.

4–8. **දස්සන, සවන, ඝායන, සායන, ඵුසන කිච්චයෝ** නම්:-පිළිවෙළින් රූපය දැකීම,ශබ්දය ඇසීම,ගන්ධය ආඝ්‍රාණය කිරීම, රසය දැනීම, ස්පර්ශය දැනීම, යන මොහු වෙති. මේවා ප්‍රසිද්ධ යි.

9. **සම්පටිච්ඡනකිච්චය** නම්:- අරමුණ පිළිගැණීම යි. අනුභවකළයුත්තක් අතට ගැණීමක් මෙනි.

10. **සන්තීරණකිච්චය** නම්:-කිනම් කෙබඳු අරමුණක් දැයි සෝදිසිකිරීම යි. ඔබා බැලීම් තට්ටු කර බැලීම් ආදියක් මෙනි.

11. **වොත්ථපන කිච්චය** නම්:-අරමුණ පඤ්චවිඤ්ඤාණ ධාතු සම්බන්ධතාවෙන් වෙන් කොට මනො විඤ්ඤාණ ධාතුව කරා පැමිණවීම යි. හෙවත් සෝදිසියෙන් තත්වය දැන ගත් අරමුණ කෙරෙහි පිළිපැද්ද යුතු අන්දම ව්‍යවස්ථා කිරීම යි. එනම්, ආලය කළ යුතු ද වෛර විය යුතු මූලා විය යුතු ද කුශලාදී වශයෙන් පිළිපැදිය යුතු ද යනු බේරුම් කිරීම යි.

ඔබා බැලීම් ආදියෙන් පරීක්‍ෂා කල දෙය කෑ යුතු ද දැමිය යුතු ද තබා ගත යුතු ද යනාදි වශයෙන් බේරුම් කිරීමක් මෙනි.

12. **ජවනකිච්චය** නම්:-අරමුණ කෙරෙහි මනො විඤ්ඤාණයාගේ කුශලාකුශලාදි වශයෙන් දිවීම හෙවත් වෑවස්ථ, සාරගත් අන්දමින් පිළිපෑදීම යි. බේරුම් කරගත් අන්දමින් කෑම දැමීම තබාගැණීම් ආදියක් කිරීම මෙනි.

(1). පටිසන්ධිට්ඨානය, (2). භවඞ්ගඨානය, (3). ආවජ්ජනට්ඨානය, (4). පඤ්චවිඤ්ඤාණට්ඨානය, (5). සම්පටිච්ඡනට්ඨානය, (6). සන්තීරණට්ඨානය, (7). වොත්ථපනට්ඨානය (8). ජවනට්ඨානය, (9). තදාලම්බනට්ඨානය, (10). චුතිට්ඨානයයි යන 10 ය චිත්තොත්පාදයන් විසින් ඒ ඒ කෘත්‍යයන් කරණ ස්ථානයෝ යි. මෙසේ:-

1. **පටිසන්ධිට්ඨානය** නම්:-චුතිඨානයට හා භවඞ්ගට්ඨානයට අතර යි. අසඤ්ඤසත්ත භවයෙන් චුතවූවාහට-ඒ භවයෙහි සිත් පැවැත්මක් නැති බැවින්, ඊට පූර්වභවයෙහි චුතිය හා ඊට දෙවෙනි භවයෙහි භවාඞ්ගය යන දෙකට අතර සැලකිමත් චිත්තොත්පාද සම්බන්ධ ප්‍රස්තාව හෙයින් විරුද්ධ නො වේ. (එය එසේ ම පට්ඨානප්‍රකරණයෙහි ද පෙණේ)"චුතියට අනතුරු වූ ස්ථානය ප්‍රතිසන්ධිස්ථානය යි". මෙ පමණක් කී කල පිරිනිවන් පාන රහතුන් සඳහා විරුද්ධ වේ. එබැවින් අපරසීමාව කොට භවාඞ්ගය යොදා කියයුතු ම ය.

2. **භවඞ්ගට්ඨානය** 6 වැදෑරුම් වේ. එනම්, පටිසන්ධි ආවජ්ජන දෙකට අතර ද- තදාලම්බන ආවජ්ජන දෙකට අතර ද-ජවනාවජ්ජන දෙකට අතරද-වොත්ථපනාවජ්ජන දෙකට අතර ද- තදාලම්බන චුති දෙකට අතර ද-ජවන චුති දෙකට අතරද යන මේ යි. මතු විථිකාණ්ඩයෙහි කියැවෙන ආචාර්‍ය්‍ය මතයක හැටියට තදාලම්බන නො වන සන්තීරණාවජ්ජන දෙකට අතර ද එබඳු ම සන්තීරණ චුති දෙකට අතරදැ යි අමුතු 2 කුත් සමඟ 8 වැදෑරුම් බවක් මෙන් පෙණේ. එහෙත් ඒ සන්තීරණය භවඞ්ග කෘත්‍යය කරමින් උපදී ය යි කියා

තිබෙන හෙයින් ඒ ස්ථානය සන්තීරණස්ථානයක් නොවන් නෙත් මෙහි දී ගිණිය යුතු නො වේ. මෙ සේ පූර්ව සීමාව කොට පටිසන්ධි වොත්ථපන ජවන තදාලම්බන යන සතරින් එකක් ද අපරසීමාව කොට ආවජ්ජන චුති යන 2 න් ' ක් ඇත්තේය. *

3. **ආවජ්ජනට්ඨානය**–2 වැදෑරුම්. එනම් භවඞ්ග පඤ්චවිඤ්ඤාණ හෝ භවඞ්ග ජවන යන මොවුන්ගේ අතර යි.

4. **පඤ්චවිඤ්ඤාණට්ඨානය** නම්:–ආවජ්ජන සම්පටිච්ඡන යන දෙකේ අතර යි.

5. **සම්පටිච්ඡනට්ඨානය** නම්:–පංච විඤ්ඤාණ සන්තීර, ණය යන මොවුන්ගේ අතර යි:

6. **සන්තීරණට්ඨානය** නම්:– සම්පටිච්ඡන වොත්ථපන යන දෙකට අතර යි.

7. **වොත්ථපනට්ඨානය** 2 වැදෑරුම්. එනම්:– සන්තීරණ ජවන දෙකට අතර හෝ සන්තීරණ භවඞ්ග යන දෙකට අතර හෝ යි.

8. **ජවනට්ඨානය** 6 වැදෑරුම්. එනම්:– ආවජ්ජන තදාලම්බන හෝ, ආවජ්ජන භවඞ්ග හෝ, ආවජ්ජන චුති හෝ වොත්ථපන තදාලම්බන හෝ, වොත්ථපන භවඞ්ග හෝ, වොත්ථපන චුති හෝ යන මොවුන්ගේ අතර යි. මෙහි පූර්ව සීමාව කොට ආවජ්ජන වොත්ථපන දෙක ද අපරසීමාව කොට තදාලම්බන භවඞ්ග චුති යන තුන ද යන මින් එකක් ඇත්තේ ය.

9, **තදාලම්බනට්ඨානය** 2 වැදෑරුම්, එනම් ජවන භවඞ්ග හෝ ජවන චුති හෝ දෙකේ අතර යි,

---

* මේ ස්ථානසීමා නියමය කිච්ච නියමයෙන් ම කරණ ලදී. එබැවින් සමාන කෘත්‍ය ඇතිවන භවඞ්ග වොත්ථපන ජවන තදාලම්බන යන චිත්තෝත්පාදයන් එක එක ස්ථානයෙක්හි අනේකව අනේකව උපදිනත් මීට විරුඬ නො වේ. චිත්තොත්පාද නියමයෙන් නම් එබඳු සිතකට එම සිතක් ම පූර්වසීමාව හෝ අපර සීමාව හෝ (තදාලම්බනය හැර) එබඳු සිත් දෙකක් ම උභය සීමාව හෝ විය හැකි යි.

10. **චුතිට්ඨානය** නම් සාමාන්‍යයෙන් 3 වැදෑරුම් එනම්:- ජවන, පටිසන්ධි හෝ, තදාලම්බන, පටිසන්ධි හෝ භවඞ්ග පටිසන්ධි හෝ, යන මොවුන්ගේ අතර යි, නුමුත් රහතුන්ගේ පිරිනිවීම සඳහා අපර සීමාව කොට නිරොධය ගත යුතු යි. අසඤ්ඤසත්ත පටිසන්ධිකයන් සඳහා යට කී කිච්ච නසින් ම උපචාර වශයෙන් සීමා නියම කට යුතු යි. එනම්:- එහි ප්‍රතිසන්ධි වශයෙන් පහළ වන රූපයට ප්‍රතිසන්ධි ය යි කිය යුතු කල භවයාගේ අඞ්ග වශයෙන් ලැබෙන ප්‍රවෘත්ති රූපයට භවාඞ්ග ය යි කිම අයුතු නො වේ. චුති ය ත් එලෙස ම යි. එවිට සාමාන්‍යයෙන් කී සථ්‍ථාන සීමා නියමය ත් එ ලෙස ම ගත හැකි වේ, එ හෙයින් ති භවඞ්ග දෙකේ අතර ප්‍රතිසන්ධි ය ම යි, එ මෙන් භවඞ්ග පටිසන්ධි දෙකේ අතර චුති ය යි ද කිය යුතු යි. නමුත් පටිසන්ධි චුති දෙකේ අතර භවඞ්ග ය යි කියා අන් තැනක නැති සීමා නියමයක් කාරණවා මිස විථි සම්බන්ධ සථ්‍ථානයක් සීමා නො වේ.

පටිසන්ධාදයො නාම–කිච්චභෙදෙන චුද්දස.
දසධා ඨාන භෙදෙන–චිත්තුප්පාද පකාසිතා';

(යථොක්තානු සාරයෙන් මෙහි ද භාවය පැහැදිලියි)

**කිච්චාසාන සමුද්දෙසය යි**

යථොක්ත කිච්චයන් අතුරෙන්:-

1. **පටිසන්ධි කිච්චය** කරණ සිත්නම්:-උපෙක්ෂා සහගත සන්තීරණ 2 ද මහා විපාක 8 ද රූපා රූප විපාක 9 ද යන 19 යි.

2. **භවඞ්ගකිච්චය** කරණ සිත්නම්:-පටිසන්ධි කිච්ච යට කී 19 ම යි.

3. **ආවජ්ජන කිච්චය** කරණ සිත් නම්:- පඤ්චද්වාරාවජ්ජන මනොද්වාරාවජ්ජන යන සිත් 2 යි.

4. **දස්සන කිච්චය** කරණ සිත් නම්:-චක්ඛු විඤ්ඤාණ 2 යි.

5. **සවන කිච්චය** කරන සිත්නම්:-සොතවිඤ්ඤාණ 2 යි.

6. **ඝායන කිච්චය** කරණ සිත්නම්:-ඝාණ විඤ්ඤාණ 2 යි.

7. **ඝායන කිච්චය** කරණ සිත් නම්:-ජිව්හා විඤ්ඤාණ 2 යි.

8. **ඵුසන කිච්චය** කරණ සිත්නම්:-කාය විඤ්ඤාණ 2 යි.

9. **සම්පටිච්ඡන කිච්චය** කරණ සිත්නම්:-සම්පටිච්ඡන සිත් 2 යි.

10. **සන්තීරණ කිච්චය** කරණ සිත්නම්:-සන්තීරණ සිත් 3 යි.

11. **වොත්ථපන කිච්චය** කරණ එක ම සිත නම්:-මනොද්වාරාවජ්ජන සිත යි

12. **ජවන කිච්චය** කරණ සිත් නම්:-ආවජ්ජන 2 ක හැර ඉතිරි සියලුම කුසලා කුසල ඵල ක්‍රියා සිත් 55 හ,එක්කෝ 87 යි.

13. **තදාලම්බන කිච්චය** කරණ සිත් නම්:-සන්තීරණ 3 හා මහා විපාක 8 ය යන 11 යි.

14. **චුති කිච්චය** කරණ සිත් නම්:-ප්‍රති සන්ධියට කී 19 මයි.

මේ දක්වූයේ සිත් ගැණ පමණ යි. එහෙයින් අසඤ්ඤ සත්තයන්ගේ පටිසන්ධි පවත්ති චුති යන තුන්තැන ලැබෙන රූපය නො කියන ලදී. චිපි, චිපි මුත්ත කාණ්ඩයන් හා රූප කාණ්ඩය දැනගත් පසු එය තමා ම වැටහේ.

කිච්චනියමය යි.

මෙසේ ඒ ඒ කෘත්‍යයට නියමකළ චිත්තයන් අතුරෙන් උපෙක්ෂා සහගත සන්තීරණ 2 පටිසන්ධි භවඞ්ග චුති සන්තීරණ තදාලම්බන වශයෙන් **කෘත්‍ය 5 ක් ඇත්තාහු** වෙති.

මහා විපාක 8 ට පටිසන්ධි භවඞ්ග චුති තදාලම්බන යන **කෘත්‍ය 4 ක් ඇත්තාහු** වෙති.

මහද්ගත විපාක 9 ය පටිසන්ධි භවාඞ්ග චුති යන **කෘත්‍ය 3 ක් ඇත්තාහු** වෙති.

සුඛ සන්තීරණය, සන්තීරණ තදාලම්බන වශයෙන් ද, මනොද්වාරාවජ්ජනය, ආවජ්ජන වොත්ථපන වශයෙන් ද **කෘත්‍ය දෙක දෙක ඇත්තාහු** වෙති.

ජවන 55 හ එක්කෝ 87 ජවන වශයෙන් ද පංචද්වාරාවජ්ජනය ආවජ්ජන වශයෙන් ද සම්පටිච්ඡන 2 සම්පටිච්ඡන වශයෙන් ද චක්ඛු සොත ඝාන ජිව්හා කාය විඤ්ඤාණ 2 ක දස්සන සවන ඝායන සායන ඵුසන වශයෙන් දසි 68 ක් එක්කෝ 100 ක් එක එක කෘත්‍ය ඇත්තාහු වෙති.

මේ සියලු තැන ම ඒ ඒ කෘත්‍ය ඇති සිතට වෙන වෙන ඒ ඒ කිච්චට්ඨානයක් ඇතිබව ද දස්සන සවන ඝායන සායන ඵුසන යන කිච්ච 5 ට ම එක ම පංච විඤ්ඤාණට්ඨානය බව ද මෙතෙහි කළ යුතු.

'අට්ඨ සට්ඨි තථා ද්වෙ ච–නවට්ඨ ද්වෙ යථාක්කමං,
එක ද්වෙ ති චතු පඤ්ච–කිච්චට්ඨානානි නිද්දිසෙ."

(කෘත්‍ය 1 , 2, 3, 4, 5 බැගින් ඇති චිත්තයෝ පිළිවෙළින් එක නවුතික විභාගයෙන් 68 ද 2 ද 9 ද 8 ද 2, වෙති යනු භාවයි)

කෘත්‍යසංග්‍රහය යි.

**කෘත්‍ය සංග්‍රහ පාදය යි.**

4. **ද්වාරසංග්‍රහයෙහි** චක්ඛුද්වාර සොතද්වාර ඝාණද්වාර ජිව්හාද්වාර කායද්වාර මනොද්වාර ය යි ද්වාර 6 ක් දත යුතු. එහි:–

ඇසම චිත්තචෛතසිකයන්ගේ පැවැත්මට දොරටුවක් වැනි අර්ථයෙන් චක්ඛුද්වාර නම් වේ. එසේ ම කණ නාසය දිව කය යන මොහු දු පිළිවෙළින් **සොතාදී ද්වාරයෝ** වෙති භවාඞග සිත **මනොද්වාරයයි** කියනු ලැබේ. (එසේ හෙයින් භවාඞගයකින් පරවූ ම එය විවෘත කරන්නාක් මෙන් ධර්මාරම්මණ ගැණීමට සලස්වන හෙවත් ආවර්ජනා කරණ සිතට ම මනොද්වාරාවජ්ජන නම නියත බව ද ඉන් අන්‍යවූ සන්තීරණයට අනතුරුව උපදින එම ලක්ෂණ ඇති සිතට වොත්ථපනය යන අනික් නමක් ඇති බව ද සැලකිය යුතු යි.

ද්වාර සමුද්දෙසය යි.

**චක්ඛුද්වාරයෙහි** පංචද්වාරාවජ්ජනය චක්ඛු විඤ්ඤාණ 2 සම්පටිච්ඡන 2 ය සන්තීරණ 3 ය වොත්ථපනය කාමාවචර ජවන 29 ය තදාලම්බන 11ය යන **ගණන්** වශයෙන් පෙණෙන

40 සෙත් සන්තීරණ තදාලම්බන වශයෙන් ස්ථාන දෙකෙහි ක්‍රියා දෙකක් කරතත් එකම සන්තීරණ සිත් 3 බැවින් 6 කට නොව 3 කට පමණක් ගණන් ගත්කල පෙණෙන 46 උපදිති

**සොතද්වාර ඝාණද්වාර** ජිව්හාද්වාර **කායද්වාරයන්** හිද චක්ඛුවිඤ්ඤාණ 2 වෙනුවට පිළිවෙළින් සොත විඤ්ඤාණ 2 ඝාණ විඤ්ඤාණ 2 යනාදී වශයෙන් අමුතුකොට එලෙස ම අතික් සියල්ල ගත් කල පෙණෙන 46 බැගින් ම උපදිති.

එවිට ඇතිතාක් කාමාවචර සිත් 54 ද්වාර ෂසෙහි උපදින බව පැහැදිලි සි.

**මනොද්වාරයෙහි** මනොද්වාරාවජ්ජනය සියලු ම ජවන 55 එක්කෝ 87 ය තදාලම්බන 17 යන 67 එක්කෝ 99 උපදිති ආවජ්ජන මාර්ගයෙන් නොව ප්‍රතිසන්ධි භවඞ්ග චුතිකෘත්‍ය කිරීම් වසයෙන් උපදින 19 ද්වාර විමුක්ත හෙවත් කිසි ද්වාරයකින් නොවන්නෝ සි.

ද්වාර නියමය යි.

ද්විපඤ්ච විඤ්ඤාණයෝ චක්ඛාදී ඒ ඒ ද්වාර වස යෙන් ද මහද්ගත ලොකොත්තර ජවන 26 එක්කෝ 58 ඒ ඒ එක එක වාරයෙහි උපදින බැවින් **එක ද්වාරිකයෝ** යි.

මනොධාතු ත්‍රිකය චක්ඛාදි පඤ්චද්වාරයෙහි ම සම ව උපදින බැවින් **පඤ්චද්වාරිකා යි.**

සුඛ සන්තීරණය වොට්ඨපණය කාමාවචර ජවන 29 යන 31 ද්වාරසයෙහි ම සම ව උපදින බැවින් **ඡද්වාරිකයෝ යි.**

උපෙක්ඛා සහගත සන්තිරණ 2 හා මහාවිපාක 8 ය, යන 10 තදාලම්බන කෘත්‍ය වසයෙන් ද්වාර සයෙහි ම ද (සන්තී රණ කෘත්‍ය කිරීමත් එහි කොටසක් වූ ද්වාර පසේ ම යි) පටි සන්ධි භවඞ්ග චුති වසයෙන් ද්වාරයන් ගෙන් තුරන් ව ද උප දින හෙයින් **ඡද්වාරිකද**, ද්වාරවිමුක්ත ද වෙති.

මහද්ගත විපාක 2 ය ප්‍රතිසන්ධි භවඞ්ග චුති කෘත්‍යයන් කිරීම් වසයෙන් ද්වාරයන් ගෙන් තුරන් ව උපදිනු මිස අන් පරිද්දකින් නූපදනා බැවින් ඒකාන්ත වසයෙන් ද්වාරවිමුක් තයෝ වෙති.

"එකද්වාරික චිත්තානි-පඤ්චද්වාරිකානි ච,
ඡද්වාරික විමුත්තානි-විමුත්තානි ච සබ්බථා:
ඡත්තිංසති තථා තීණි-එකතිංස යථාක්කමං,
දසධා නවධා චෙති-පඤ්චධා පරිදීපයෙ."

(එකද්වාරික පඤ්චද්වාරික ඡද්වාරික හා ද්වාරවිමුක්ත නියතයෙන් ම ද්වාර විමුක්ත යන මේ 5 ස් කොටසෙහි පිළිවෙළින් සිත් 36 ක් ද 3 ක් ද 31 ක් ද 10 ක් ද 9 ක් ද එකුන නවුතික නයින් වෙති.)

ද්වාරික සංග්‍රහය යි.

**ද්වාර සංග්‍රහ පාදය යි.**

5. **ආලම්බන සංග්‍රහයෙහි** රූපාලම්බනය සද්දාලම්බනය ගන්ධාලම්බනය රසාලම්බනය ඵොට්ඨබ්බාලම්බනය ධම්මාලම්බන යි 6 ය වැදෑරුම් වූ **අරමුණ** දතයුත්තේ ය. මෙහි ආලම්බනය නම් යමක එල්ලී සිත උපදීද ඒ පදාර්ථ ය යි. එසින්:–

ඇසින් දතයුතු අරමුණ වූ රූපය ට **රූපාලම්බන** ය යි සොත ඝාණ ජිව්හා කාය යන මොවුන් ගෙන් පිළිවෙළින් දත යුතු වූ අරමුණු වන ශබ්ද ගන්ධාදිහු ම **සද්දාලම්බන ගන්ධාලම්බන රසාලම්බන ඵොට්ඨබ්බාලම්බනයෝ** වෙති. **ධම්මාලම්බනය** නම් (මුලදී දක්වූ) චිත්තය චෛතසිකය (මතු විස්තර වෙන්ට තිබෙන) පසාද රූප සුඛුමරූප නිබ්බාණ පඤ්ඤත්ති යන මොහු සිතකට අරමුණුවූවාහු වෙති.

එසින් අනතුරු ද්වාර සංග්‍රහයෙහි කී සියලු ම චක්ඛුද්වාරික සිත් 46ට වර්තමාන වූ රූපාලම්බනය පමණක් අරමුණු වේ. සොතද්වාරිකාදි ඒ ඒ චිත්තයන්ට ද එලෙස ම වර්තමාන වූ ඒ ඒ ශබ්දාලම්බනාදි එක එක ම පමණක් පිළිවෙළින් අරමුණු වෙති.

මනොද්වාරික චිත්තයන් ට වර්තමාන වූ ද අතීත වූ ද අනාගත වූ ද කාලභෙදයෙන් නො සැලකිය යුතු හෙයින් කාලවිමුක්ත වූ ද යථොක්ත 6 වැදෑරුම් වූ ම අරමුණ සුදුසු සේ ගොචර වේ.

ප්‍රතිසන්ධි භවාඞ්ග චුති වසයෙන් ද්වාර විමුක්තයන්ට ද බහුල වසයෙන් අනතුරු පූර්ව භවයෙහි මරණාසන්න වීථි නම් ය යි මතු දක්වනු ලබන සිත් පරම්පරාවෙන් සදොරින් යම් කිසිවකින් ගන්නාලද්දුව කර්ම කර්ම නිමිත්තය ගති නිමිත්තය යන නම් වලින් ව්‍යවහාර වන (අනාගතය හැර ඉතුරු) වර්තමාන අතීත හෝ කාල විමුක්ත වූ සය වැදෑරුම් වූ ම අරමුණ ලත් ලත් පරිද්දෙන් ගොචර වේ.

ආලම්බන නියමය යි.

එහි චක්ඛුවිඤ්ඤාණාදි යුග 5 හ රූපාදී එක එක අරමුණ ගන්නාහු ය. මනො ධාතු 3 රූපාදී අරමුණු 5 ම ගන්නේ ය. ඉතුරු සන්තීරණ මහා විපාක හසන යන 12ස් සිත කාමාවචර වසයෙන් පමණක් අරමුණු 6 ම ගන්නේය. අකුසල්සිත් 12 ද ඤාණ විප්‍රයුක්ත ජවන හෙවත් කුසල ක්‍රියා සිත් 8 ය යන 20 ලොකොත්තරය හැර අවශෙෂ කාමාවචර මහග්ගත පඤ්ඤත්ති වසයෙන් පැවැති අරමුණු 6 ම ගන්නේය. ඤාණ සම්ප්‍රයුක්ත කුසල් 4 හා අභිඤ්ඤා වශයෙන් වඩන ලද පඤ්චම ධ්‍යාන කුසල යද යන 5 ස් සිත අර්හත් මාර්ග ඵලයන් හැර ඉතුරු කාමාවචර මහග්ගත ලොකොත්තර පඤ්ඤත්ති වසයෙන් පැවති අරමුණු 6ම ගන්නේය. ඤාණසම්ප්‍රයුක්ත කාමාවචර ක්‍රියා 4 ද අභිඤ්ඤාපඤ්චමධ්‍යාන ක්‍රියාව ද වොත්ථපන සිත ද යන 6 ය සිත් සියලු ආකාරයෙන් ම පැවති අරමුණු 6 ම ගන්නෝය. ඒ සිත් 6 ය එනම්, සියල්ලම අරමුණු කරණ චිත්තයෝ යි. (බුදුන්ගේ සර්වඥතාඥානය ද මේ විෂය කොට ගෙණ පවතී මැ යි.) අරූපාවචරයෙහි දෙවෙනි සතරවැනි හෙවත් විඤ්ඤාණඤ්චායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසල විපාක ක්‍රියා චිත්තයෝ 6 දෙන ම තමහට පූර්වවූ ආකාසානඤ්චායතන ආකිඤ්චඤ්ඤායතනයන අරූප සිත්ම අරමුණු කරණ බැවින් මහග්ගතාලම්බනය පමණක් ගණිති. ඉතුරු සියලු ම රූපාවචර අරූපාවචර චිත්ත 21 ක (මතු කියනු ලබන) කසිනාදි ප්‍රඥප්ති ධර්මයක් ම අරමුණු කරණ බැවින් පඤ්ඤත්තාලම්බන නමින් ධම්මාලම්බනය පමණක් ගණී. සියලුම ලොකොත්තර 8 එක්කෝ 40 නිර්වාණය පමණක් අරමුණු කරණ බැවින් නිබ්බාණාලම්මන වසයෙන් ධම්මාලම්බනය පමණක් ගණී.

"පඤ්චවීස පරිත්තම්හි-ඡච්චිත්තානි මහග්ගතෙ,
එකවීසති වොහාරෙ-අට්ඨනිබ්බාණ ගොචරෙ;
වීසානුත්තර මුත්තම්හි-අග්ගමග්ගඵලුජ්ඣිතෙ,
පඤ්ච සබ්බත්ථ ඡච්චෙති-සත්තධා තත්ථ සඞ්ගහො"

(කාමාවචර අරමුණෙහි සිත් 25 ක ද, මහද්ගත අරමුණෙහි 6 ක්ද, ප්‍රඥප්ත්‍යාලම්බනයෙහි 1 ක් ද, නිර්වාණ අරමුණෙහි එකුන තවුතිසා නයින් 8 ක්ද, ලොකොත්තරය හැර ඉතුරු සියලු අරමුණෙහි 20 ක්ද, අර්හත් මාර්ගඵලය හැර ඉතුරු සියලු අරමුණෙහි 5 ක්ද, සර්වප්‍රකාරයෙන් සියලු අරමුණෙහි 6 ක් දැ යි අරමුණු විෂයයෙහි සිත් සංග්‍රහවීම සය පරිද්දකින් වේ යනු භාව යි.)

අලම්බනීක සංග්‍රහය යි.

ආලම්බන සංගහ පාදය යි.

6. වත්‍ථු සංගහයෙහි චක්ඛුවත්‍ථු සොත වත්‍ථු ඝාණවත්‍ථු ජිව්හා වත්‍ථු කාය වත්‍ථු හදයවත්‍ථු ය යි වස්තුහු 6 දෙනෙක් දත යුත්තාහු ය. වස්තූහු නම් චිත්ත චෛතසිකයන්ගේ උත්පත්තියට භූමි වූ රූපයෝ ය යි මෙහි අභිප්‍රායකරණ ලද්දහුය එහි:–

චක්ඛු සොතාදි වත්‍ථුහු නම් ඇස කණ ආදිහු ම යි. හදය වත්‍ථුව නම් (මතු රූප කාණ්ඩයේදී විස්තර කොට දක්වනු ලබන) මනොධාතු මනො විඥාන ධාතු දෙකට හා ඒ හා සම්ප්‍රයුක්ත ධර්මයන් ට ද නිශ්‍රය වූ ශරීරය සම්බන්ධ එක්තරා රූප විශෙෂයකි. එතකලට එය පිළිකුල් භාවනාවෙහි අඬංගුවූ "හදයං" යන්නෙන් අදහස් කරණ ලද්දවූ කයෙහි ලේ දුවවන යන්ත්‍රය වූ මස් පිඩ නොවන බව සිත්හි තබාගත යුතු යි.

වත්‍ථු සමුද්දෙසය යි.

කාමලොකයෙහි මේ වත්‍ථු 6 ම ලැබෙති. රූපලොකයෙහි චක්ඛු සොත හදය යන 3 පමණක් ලැබෙති. අරූපලොකයෙහි කිසිවක් නො ලැබෙති.

වත්‍ථුනියමය යි.

මෙහි දී චක්ඛුවිඤ්ඤාණධාතු ය සොතවිඤ්ඤාණ ධාතු ය ඝාණවිඤ්ඤාණ ධාතු ය ජිව්හාවිඤ්ඤාණධාතු ය කායවිඤ්ඤාණ ධාතු ය යි ද්විපඤ්චවිඤ්ඤාණයට ද, මනො ධාතුත්‍රිකය මනොධාතුවට ද, ඉතිරි සියළුම සිත් මනොවිඤ්ඤාණ ධාතුවට ද යි සියලුම චිත්තොත්පාදයෝ ධාතු 7 ට බෙදනු ලැබෙති. එයින් පඤ්චවිඤ්ඤාණ ධාතුහු එකාන්තයෙන් ම චක්ඛාදී ප්‍රසාද වස්තු පස නිසා ම පවතිත්. මනොධාතුව හෘදයවස්තුව නිසා ම පවතී. ඉතිරි මනොවිඤ්ඤාණධාතුවට අන්තර්ගත සිත් අතුරෙන් සන්තීරණ තුණ මහාවිපාක 8 ට ප්‍රතිඝ 2 එකම සොවාන්මාර්ගය එක්කෝ 5 හසනය රූපාවචර 15 යන මේ 30 එක් කෝ 34 හෘදය නිසා ම පවතිත්. ඉතිරි කුසල අකුසල- ක්‍රියා ලොකොත්තර යන 42 ක එක්කෝ 70 ච හෘදය ඇති භවයෙහි හෘදය නිසා ද නැති භව යෙහි වස්තු විමුක්තව ම ද උපදිති. අරූපාවචර විපාක 4 වස්තු විමුක්ත ව ම උපදිත්.

"ඡවත්ථුං නිස්සිතා කාමෙ–සත්ත රූපෙ චතුබ්බිධා,
තිවත්ථුංනිස්සිතාරූප්පෙ–ධාත්වෙකානිස්සිතා මතා."

(කාමලොකයෙහි චක්ඛු සොත ඝාණ ජිව්හා කාය හදය යන වස්තු 6 ම නිශ්‍රය කොට ගෙණ චක්ඛු විඤ්ඤාණ සොත- විඤ්ඤාණ ඝාණවිඤ්ඤාණ ජිව්හාවිඤ්ඤාණ කාය විඤ්ඤාණ මනොවිඤ්ඤාණ යන ධාතු 7 ක් පවතිත්; රූපලොක යෙහි චක්ඛු සොත හදය යන වස්තු 3 නිශ්‍රය කොට චක්ඛු විඤ්ඤාණ සොතවිඤ්ඤාණ මනොවිඤ්ඤාණ යන ධාතු 4ක් පවතිත්. අරූප ලොකයෙහි එක ම මනො විඤ්ඤාණ ධාතුව කිසි ද වස්තුවක් නිශ්‍රය නො කොට පවතී යනු භාව යි.)

"තෙචත්තාලීස නිස්සාය–ෙච චත්තාලීස ජායරෙ,
නිස්සාය ච අනිස්සාය–පාකාරූප්පා අනිස්සිතා."

(යම් කිසිවස්තුවක් නිශ්‍රය කොට ගෙණ පවත්නා සිත් 43 ක් ද එසේ නිශ්‍රයකොට හෝ නො කොට හෝ ලත්ලත් පරිද්දෙන් උපදින සිත් 42ක්ද ආරූප්ප විපාක 4ර ඒකාන්ත යෙන් යම්කිසි වස්තුවක් නිශ්‍රය නොකොට ම ද උපදිති යනු භාව යි).

සවත්ථුකාවත්ථුක විභාගය යි.

**වස්තුසංග්‍රහපාදය යි.**

මෙසේ චිත්තොත්පාදයන්ගේ ඇතුළත අවයව වූ චෛතසිකයන්ද පිටතින් සම්බන්ධ වන අරමුණු වස්තු යන මොවුන්ද කෘත්‍යවූ ප්‍රතිසන්ධ්‍යාදිය ද ඇසුරු කොට සමානකම් දක්වමින් සංග්‍රහ කොට, මෙතැන් පටන් කාමාවචරාදී භූමිභෙදය ද අහෙතුකාදී පුද්ගල භෙදය ද ඇසුරු කොට භවයන්ගේ ආරම්භය වූ ප්‍රතිසන්ධියය ඉන් මතු පැවැත්මය යන දෙක කෙරෙහි චිත්තොත්පාදයන්ගේ (මුලින් මෙය යෙදෙයි අගින් මෙය යෙදෙයි යන) ඉදිරිපසු නියමය දක්වීම් වශයෙන් ප්‍රවෘත්ති සංග්‍රහය දක්වනු ලැබේ.

එහි ද චුතියට සම්බන්ධ නො කොට ප්‍රතිසන්ධිය ද, ප්‍රවෘත්තියට සම්බන්ධ නො කොට චුතිය ද දක්වීම දුෂ්කර නිසා ප්‍රතිසන්ධිය මුල්කොට දක්විය යුතුව පැමිණියේ වී නමුත් එය පසු කොට ප්‍රවෘත්තිය ම මුල්කොට දක්වීම පිණිස මෙතැන් පටන් වීථිසංග්‍රහය වේ.

එහි (1) වස්තු 6ය, (2) ද්වාර 6ය, (3) ආලම්බන 6ය, (4) විඤ්ඤාණ 6ය, (5) වීථි 6ය, (6) සපරිදිවූ අරමුණු පැවැත්ම ය යි සයේ රාශි 6ක් නොහොත් කාරණා 36ක් දතයුතුයි. එයින්:–

1, 2, 3. වස්තුද්වාරාලම්බන යන මේ 18 ට ප්‍රකීර්ණක සඞ්ග්‍රහ යෙහි කීලෙස ම යි.

4. විඤ්ඤාණ 6 නම්:–චක්ඛු, සොත, ඝාණ, ජිව්හා, කාය යන දෙක දෙක වශයෙන් අහෙතුක සිත් අතුරෙහි ද මනො විඤ්ඤාණය වස්තුසංග්‍රහයෙහි ද කී ලෙස ම යි.

5. වීථි 6 නම්:–චක්ඛුද්වාර වීථි, සොතද්වාර වීථි, ඝාණද්වාර වීථි, කායද්වාර වීථි, මනොද්වාර වීථි ය යි කියා ද්වාර 6යෙහි නමින් හෝ; චක්ඛු විඤ්ඤාණ වීථි, සොත විඤ්ඤාණ වීථි, ඝාණ විඤ්ඤාණ වීථි, ජිව්හා විඤ්ඤාණ වීථි, මනො විඤ්ඤාණ වීථි ය යි කියා විඤ්ඤාණ සයෙහි නමින් හෝ ව්‍යවහාර කරනු ලබන සඳෙරෙහි පැවති සිත් පෙලවල් 6යි. (ඒවා තුළ යෙදෙන ජවනයන්ගේ සවභාවය සලකා පරිත්තජවන වීථි, යනාදී වශ

යෙන් ද; අර්පණාජවනයන්ගේ අවස්ථාභෙදය සලකා ආදි කාර්මික වීථි, අභිඥ වීථි, මාර්ග වීථි, සමාපත්ති වීථි වශයෙන් ද; අරමුණුවල ස්වභාව සලකා රූපාලම්බන වීථි, ආදී වශයෙන් ද, අරමුණුවල ආසුෂ්‍ම හා ප්‍රකට අප්‍රකට භාවය සලකා අතිමහන්තාරම්මණ වීථි ආදි වශයෙන් දූ යි මේ ආදී නොයෙක් ප්‍රකාරවලින් ද ඒවාට වෙන වෙන නම් කරණු ලැබෙති.

6. සපරිදි වූ අරමුණු පැවැත්ම නම්:– පඤ්චද්වාරයෙහි අතිමහන්තය, මහන්තය, පරිත්තකය, * අතිපරිත්තක ය යි කියා 4පරිද්දෙකින් ද; මනොද්වාරයෙහි පරිත්තජවන වීථි කෙරෙහි විභූතය අවිභූත ය යි දෙපරිද්දකින් ද; අර්පණා ජවන වීථි කෙරෙහිත් විභූත වශයෙන් ම දූයි අරමුණු චිත්තොත්පාද යන දෙපක්‍ෂයෙහි සම්බන්ධයෙන් වූ පෙළ පැවතීමේ ප්‍රකාර සය යි.

අර්පණාජවන ද්වාරයෙහි විභූත අවිභූත භෙදයක් ද තදාලම්බනොත්පත්තියක් ද නැතැයි කියා තිබෙන වචනයේ අදහස උභයවිමුක්තක ආකාරයකින් වේය යි තේරුම් නො ගත යුතු යි. එසේ ගතහොත් සවැදෑරුම් නො ව සත් වැදෑරුම් අරමුණු පැවැත්ම ය යි නොකී එක වරදක් ව පෙණේ. තේරුම් ගත යුතු අන්දම නම් තදාලම්බනයන්ගේ ඇති නැති බැවින් හැඳිනෙන විභූතා විභූත භෙද දෙක නැති හෙයින් ඒවා නැතිබව නිසා සැලකිය යුතු අවිභූත ය යි නො ව අමුතු ස්වභාවක විභූත වශයෙන් ම ය යනු යි.

ඒ සයේ වශයෙන් පැවති වීථි සය මෙසේ යි:–චිත්තොත් පාදයක් ඉපදී පැවතී නැසී යන මුලුකාලයට චිත්තක්‍ෂණ ය යි කියත්. එය ක්‍ෂණ තුනකින් සෑදී තිබේ. එනම්:–උපදනා උප්පාදක්ඛණ ය පැවතී සිටින ඨිතික්ඛණ ය, නසින භඞ්ගක්ඛණ ය යි. මේ ක්‍ෂණ තුනක් ම එකතු වී සෑදී තිබෙන චිත්ත ක්‍ෂණයක ප්‍රමාණ ය පැය කා විනාඩිය කා තත්පරය කා කොට සක් වශයෙන් නියම කොට දක්විය නො හැකි තරම් සියුම් වේ. "චි" යන මේ එක අක්‍ෂරයෙන් යුත් පදය කීමට පසු ඇසි එහි අර්ථය වූ ධාත්‍ය වර්ගය තේරුම් ගන්න කොට වීථි

* පරිත්ත යනු කාමාවචර පර්‍යාපන්න ජවනයින් සංස්කාර නොවක පිණි මෙසේ කයන්තක් එකතු කෙළෙමු

චිත්තක්ෂණ 68 ක් සග භවාඞ්ග චිත්තක්ෂණ අතියමින් බොහෝ ගණනක් ඉකුත් වෙන බව ද; කිණිහිරය පිට සිටින මැස්සා ට කුළු ගෙඩි පහරක් වැදුනාට පසු මැරෙන්ට මත්තෙන් චිත්තක්ෂණ 14 ක් පමණ වූ මරණාසන්න වීථිය උපදින බව ද දක්වා තිබේ. එබඳු චිත්තක්ෂණ 17 ක් පමණ කලක් මතු කියැවෙන රූපයන් වැඩි කොටසකගේ ආයුෂය වේ. ඊට වෙනස් ආයුෂ ඇති ස්වල්පය රූප කාණ්ඩයේ දී දක්වනු ලැබේ. පඤ්චවිඤ්ඤාණයන්ට අරමුණු වන රූප සද්ද ගන්ධ රස ඵොට්ඨබ්බ යන පස ද. එහි දී ම දක්වනු ලබන සේ රූප යෝ වෙති. එහෙයින් ඒවායේ ආයුෂ ය ද එපමණ (චිත්තක්ෂණ 16) ම වේ. එසින් යම්කිසි අරමුණක් ඊට අයිති ද්වාර යට වැද්ද දෙන කල එම ආයුෂයාගේ චිත්තක්ෂණ ගණනින් එකක් හෝ වැඩිගණනක් හෝ ඉකුත් වෙලා ම මිස මුලු ආයුෂ ගණන ඉදිරියට තිබිය දී වැද්ද නො ගැණේ.

එ හෙයින් යම් විටක හැකිතරම් අඩු ගණනේ එක චිත්තක්ෂණයක් පමණක් අතීත වූ (ඉකුත් වූ) රූපාලම්බන යක් චක්ෂුද්වාරයට වැටුණේ නම්, එතැන් පටන් ඒ අරමුණ සඳහා සිත් ඉපදීගෙණ යන ක්‍රමය දැනගැණීම පිණිස මේ පොතේ පස්වැනි කාණ්ඩයේදී විස්තර කරනු ලබන භවාඞ්ග සිත් පෙළ මෙතනදී සංක්ෂෙපයෙන් සිත ට ගත යුතු යි.

එ මෙසේයි:–

උත්පත්තියේ පටන් මරණය දක්වා මුලු භවයක් එක් කර්මයක විපාකය කී. එය පොලු පහරකින් කැඩී ගසක මුදුණෙන් සිට බිම දක්වා වැටෙන ගෙඩියක් මෙනි. ඒ ගෙඩිය කිසිවක නො ගැටී නිදහසේ වැටේ නම් ගමනේ කිසි වෙන සක් නැතිව බිමට ම වැටේ. එමෙන් ප්‍රතිසන්ධිය පටන් අන් අරමුණක නො ගැටී විපාක ය ම පවතින්ට ලැබේ නම් මර ණය දක්වා එ ලෙස පැවතිය යුතු වාක් මෙන් පෙණේ. නුමුත් ඒ ගෙඩිය ගිලී හුණු තැනදී ම සුලඟෙහි ද මගදී අතු පතර කටු කණු ආදියෙහි ද, බිමලඟ දී තණ පත් වල ද ගැටී හැරුම් පෙරළුම් ලිස්සුම් පැතුම් තැලුම් එබුම් පැලුම් ආදියෙන් ගමන ද වෙනස් වන්නාක් මෙන් ප්‍රති සන්ධිය ලඟදී ම ශබ්ද රමමණයෙහි ගැටී භව නිකාන්තිය (භවආලය)ද රූප භවාංගා

දියෙහි ගැටී ආලය ද්වේෂය මෝහය කුසලය යනාදි යද උපදවමින් මරණාසන්නයේ දී මතු ඉපදිය යුතු වය ට පිහිට භවන කර්මයෙහි ගැටී චුතවීම් වශයෙන් යා යුතු විපාක ගමන වෙනස් වෙයි. යටත් පිරිසෙයින් ගැබ තුළ ප්‍රති සන්ධිය දුන් නො බෝකලකින් ම මිය යන සත්ත්වයෙකු ට වුවත් මෙම ති භව නිකන්ති සිත් පෙළ හා මරණාසන්නයෙ හි සිත් පෙළ ද උපදී මැ යි. එය ගෙඩියට කී සුළඟෙහි හා බිම තෘණාදියෙහි හැපීම් පමණක් වන් ඇති වියයුතුවූවාක් මෙනි. ගෙඩි යේ එක එක ගැටිමකින් වූ විකාරයෙන් බේරී අතින් අතික් ගැටීමක් දක්වා ප්‍රකෘති පහත බසින ගමතින් එන්නාක් මෙන් එක් එක් අරමුණ කින්ද උපන් වීථි ගත සිත් පෙළක් නිම වූ තැන් පටන් අතික් අරමුණක් වැද්ද ගන්න තුරු ප්‍රකෘති විපාක ගමතින් පවතී. ඒ විපාක සිත් පෙළට භවාඞ්ග සිත් පෙළය. භවාඞ්ග සන්තතිය, භවාඞ්ග පරම්පරාව යනාදී නම් කියනු ලැබෙත්. ඇස ආදි ද්වාරයන් ගෙන් රූපාදීඅරමුණු ගැණීම ට ආරම්භය මේ භවාඞ්ග සිත් පෙළ පවත්නා කල්හි වේ. රූප අරමුණක් ද්වාරයක ට වැටීම නම් අරමුණු රූපය හා ද්වාර රූප ය යන දෙක එකට ගැටීම යි. හෙවත් හැපීම යි. එසේ අර කීවාවූ රූපාරම්මණ ය චක්ෂු ද්වාරයට වැටෙන කොට ම පැවතීගණ ආ භවාඞ්ග පෙළ එක පාරට ම කඩා ගන්ට බැරි ව තව ත් චිත්තක්ෂණ 1 ක් භවාඞ්ග වලින් ම ගත වෙයි. මේ දෙක බිඳෙන් ට යන භාජන යක් හෝ කැඩෙන්ට යන දණ්ඩක් හෝ දෙදරුම් කන්නා සේ චලනාකාරයකින් උපදිති යි සලකා භවාඞ්ග චලන සිත් යයි සාමාන්‍යයෙන් හා පළමු වෙනි එකට භවාඞ්ග චලන ය යි ද අතික ට භවාඞ්ග පෙළ කඩකරණ හෙයින් භවංගුපච්ඡේදක්‍ය යි ද, විශේෂ වශයෙනුත් නම් කර තිබේ. අරමුණ වැටෙන්ට පත්තෙන් එහි ආයුෂ ගණනින් ඉකුත්වූ චිත්තක්ෂණ එක හෝ වැඩි ගණන අතීතයෝ නම් වෙති.

මෙසේ අරමුණේ අයුෂයෙන් ඉතා ම අඩුගණනෙන් චිත්තක්ෂණ තුනක් ඉකුත් වූවාට පසු ඒ රූපාලම්බන ය ආවර්ජන කරන්නා වූ පඤ්චද්වාරාවජ්ජන සිත ද, පිළිගන්නා වූ සම්පටිච්ඡන සිත ද, විමසීම කරන්නා වූ සන්තීරණ සිත ද, නට-යුත්ත ව්‍යවස්ථා කරන්නා වූ වොට්ඨපන සිත ද, ක්‍රමයෙන්

එක් එක් වර ඉපි ද නිරුද්ධවූ වා ට පසු යට කී කාමාවචර ජවන 29 ය අතුරෙන් ලැබුන ප්‍රත්‍යයන්ගේ හැටියෙන් නියම වූ යම් කිසි එකක් ජවන කෘත්‍යය කිරීම් වශයෙන් බහුල වශයෙන් සත් වරක් උපදී. (7 වරින් අඩුව උපදින තැන් සවල්පය මතු කිය වේ.)

මේ අදහස් කළ ප්‍රත්‍යය නම් කුසල ජවන සඳහා සත් පුරුෂ සේවන සද්ධර්ම ශ්‍රවණ යෝනිසෝ මනසිකාරාදිය යි. අකුසල ජවන සඳහා නම් එකී ප්‍රත්‍යයන් නො ලැබීම හෝ විරුද්ධ පක්ෂය ලැබීම යනාදිය යි. ක්‍රියා ජවනයන් ට නම් රහත් බවත් සමග ඒ ඒ අරමුණුවල සවභාවාදිය යි.

මේ ජවන සිත් ලඟට ජවන පසු පස්සේ ම ගමන් කාරණ සුලු වූ තදාලම්බන විපාක සිත් 11 සින් (ලබන ලද ප්‍රත්‍යයේ හැටිය ට නියම) එකක් දෙ වරක් ම උප දී. (එහි සන්තීරණ සිත් තදාලම්බනවීම ට අකුසලෙහි පුරුද්ද ද මහා විපාක සිත් තදාලම්බනවීම ට කුසලෙ හි පුරුද්ද ද වැදගත් ප්‍රත්‍යයි.) ඒ ලඟට ඒ ආවර්ජනය පටන් දෙවැනි තදාලම්බනය දක්වා චිත් තොත්පාද 14 රට ගතවූ චිත්තක්ෂණ 14 ද භවඞ්ග චලන භවඞ්ගෝපච්ඡේදක යන 2 ට ගතවූ චිත්තක්ෂණ 2 ද, මුලදීම අතීත වූ එක චිත්තක්ෂණය ද යි 17 ගත වී මෙන් අරමුණු රූපය නසිනවා හා සමගම සිතට නැවත ඉඩ ලැබී භවාඞ්ග වශයෙන් පළමු ලෙසම පවතින්ට පටන් ගෙණ නැවත ත් අරමුණක ගැටෙන තුරු ය යි. සද්දාරම්මණාදියෙහිත් මෙසේම යි

මේ එක් චිත්තක්ෂණයක් අතීතව වැට ගෙණ පස් අරමුණට අති මහන්තාරම්මණය යි කියා ද, ප්‍රතිසන්ධි සිතට ගත් අරමුණ ම ගෙණ පවත්නා මතු කියවෙන භවාඞ්ග පෙළවල් මිස අන් යම්කිසි අරමුණක් අරබයා මෙසේ පවතින සිත් පේළිවලට විථි ය යි කියා ද, තදා ලම්බන වලින් නිම වන වීථි ද්වාරවල ට තදාලම්බන වාර ය යි කියා ද, කියත්.

මේ දක්වනලද කාමාවචර සත්වයන්ගේ රූපාරම්මණයෙහි සාමාන්‍ය චක්ඛුද්වාරික වූ අති මහන්තාරම්මණ වීථියෙ හි තදාරම්මණ වාරය 1 වෙති වින්‍යාසයෙන් දතයුතු යි.

## 1 වැනි විත්‍යාසය

### තදාරම්මණවාර අතිමහන්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.

### පච්චුප්පන්නරූපාරම්මණ.

| කා: | කි: | | ගි: | | | | | | | | | | | | | | | පා. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ති | න | ද | ප | ච | සං | ර | වු | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | ද | ද | භ |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

මෙහි මේ රූපය චිත්තෝත්පාදයක් හෝ චිත්තක්ෂණයක්ද, "භ" භවාඞ්ගය, "ති" අතීත භවාඞ්ගය, "න" භවඞ්ග චලනය, "ද" භවඞ්ගොපච්ඡේදනය, "ප" පඤ්චද්වාරාවජ්ජනය, "ච" චක්ඛුවිඤ්ඤාණය, ."සං' සම්පටිච්ඡනය,. "ර" සංතීරණය, "වු" වොට්ඨපන ය, "ජ" ජවන ය, "ද" තදාලම්බය, "කා" කම්මාලම්බන ය, "කි" කම්ම නිමිත්තාලම්බන ය, "ගි" ගති නිමිත්තාලම්බන ය, "." හෝ යන අක්‍ෂිය, "පා" පටිසන්ධාරම්මණය හෙවත් 'කා: කි: ගි:' යන්නෙන් අදහස් කළ අක්‍ෂිය සුළුවට, උඩින් හරහට අඳින ලද ඉරි අරමුණ, හිටි ඉර ඒවිත්ත ආරම්මණ දෙකේ සම්බන්ධ කම්, යටින් අඳින ලද ඉර වස්තු රූපය යන මේ වා අදහස් කොට යොදන ලදී. වස්තු රූපය මේ චක්ඛුද්වාර වීථිවල දී චක්ඛුප්‍රසාද රූපය යි. මතු විත්‍යාසවලත් මේ වා මේ ලෙසම යි. වෙනස පමණක් ඒ ඒ තැන දක්වනු ලැබේ.

සොතද්වාරවීථි, ඝාණද්වාරවීථි, ජිව්හාද්වාරවීථි; කායද්වාරවීථි; යන සතරේද, අතිමහන්තාරම්මණ තදාරම්මණ ද්වාරයේ මෙ බඳු ම යි. වෙනස නම් පඤ්චද්වාරාවජ්ජනයට අනතුරු චිත්තක්ෂණයේ "ච"යන්න වෙනුවට සොතවිඤ්ඤාණය, ඝාණ විඤ්ඤාණ ය, ජිව්හා විඤ්ඤාණ ය, කාය විඤ්ඤාණ ය යන සතර අදහස්කොට ක්‍රමයෙන් "සො" "ඝා" "ජි" "කා" යන අකුරු සතර ද; මුදුනේ හරස් ඉරට උඩින් "රූපා ' යන කොටස වෙනුවට එම ක්‍රමයෙන් "සද්ද" "ගන්ධා' "රසා" 'ඵොට්ඨබ්බා" යන සතර ද යෙදීම පමණයි. වස්තු රූපය සොතාදී ඒ ඒ ද්වාරික වීථිවලට ඒ ඒ පසාද රූපය බව ද සැලකියයුතු යි. මතු දක්වන වීථිවලත් මේ වෙනස මෙසේ යි. මේ ගැන මතු ද කිය වේ.

රූපාවචර බ්‍රහ්මයන් ට තදාරම්මණ නො ලැබෙන හෙයින් අති මහන්තා රම්මණ වීථියෙහි තදාරම්මණ ස්ථාන යෙහි තදාරම්මණ නිපද ඒ චිත්තක්ෂණ දෙකත් භවාඞ්ග දෙකකින් පිරී භවාඞ්ග පෙළ පවතී. එසේ ජවනයන්ගෙන් අවසාන වන වීථි ද්වාර වල ට ජවන ද්වාරයෝ යයි කියත්. මෙසේ අති මහන්තාලම්බන වීථිය තදාලම්බන වාර ජවන වාර වශයෙන් දෙපරිදිව පෙණෙතත් අරමුණෙහි ආයු ගිනතාවයෙන් නොවන මේ ස්ථානයෙ හි අප්‍රධාන වශයෙන් ම ජවන වාරය වේ. එය දෙවෙනි වින්‍යාසයෙන් දතයුතු යි.

## 2 වෙනි වින්‍යාසය.

ජවන වාර අති මහන්තාරම්මණ චක්ඛු ද්වාර වීථිය.

පච්චුප්පන්නාරූපාරම්මණ.

| කා: කි: ශි: | | | | | | | | | | | | | | | | | | | කා: කි: ශි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ | භ |
| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

චිත්තක්ෂණ දෙකක් අතීතව වැද්දදුන් අරමුණේ දී අර ලෙස ම සියල්ල පැවතී. තදාලම්බන දෙකින් එකකට ඉඩ මදි වෙයි. දෙකට ඉඩ නැත්නම් එකක් වත් නොඉපද ම ඔවුන්ගේ ධර්මතාවයක් නිසා තිබෙන අවකාශය ත් භවාඞ්ගයකට දී අර මුණ නසියි. එසේ අරමුණෙහි ආයුෂ මදි කාමින් තදාලම්බන නොලැබී ජවන වලින් අවසාන වන වීථිය **මහන්තාරම්බන වීථි** නම් ද, එහි ලැබෙන වීථි වාර දෙක මුඛ්‍යවශයෙන් ම **ජවන වාරයෝ** නම් ද වෙති. ඒවා 3 වෙනි 4 වෙනි වින්‍යාස වලින් දත යුතු යි.

## 3 වැනි වින්‍යාසය.

(පඨම ජවන වාර) එක චිත්තක්ඛණායුශේෂ මහන්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.

පච්චුප්පන්න රූපාරම්මණ.

| කා: කි: ශි: | | | | | | | | | | | | | | | | | පා. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | ති | ති | න | ද | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ජ | භ | භ |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

## 4 වැනි වින්‍යාසය.

### (දුතිය ජවන වාර) අනායුසෙස මහන්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.

### පච්චුප්පන්න රූපාරම්මණ.

| කා: කි: ශි: | | | | | | | | | | | | | | | | | | පා. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ ··· | තී ··· | තී ··· | තී ··· | න ··· | පං ··· | ච ··· | ස ··· | සං ··· | වො ··· | ජ ··· | ජ ··· | ජ ··· | ජ ··· | ජ ··· | ජ ··· | ජ ··· | ··· ජ | භ ··· |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 | |

යට සඳහන් කළ ජවන 7 ට අඩු වී උපදින ප්‍රස්තාවන් හැර සාමාන්‍ය ප්‍රස්තාවලදී ජවන සත ම ඉපදීමට අවකාශ නැතිවන තරම් අතීත වීමෙන් එනම්–චිත්තක්ෂණ 4 රේ පටන් 9 ය අව සන් කොට ඉකුත් ව වැද්දදුන් අරමුණ කෙරෙහි එලෙස ම සන්තීරණ ය දක්වා සිත් උපදිමින් අවුත් වොත්ථපනස්ථාන යෙහි දෙවරක් හෝ තුන් වරක් වොත්ථපන සිත ම ඉපිද ජවන කිසිත් නො ඉපද අගින් ඉතුරු වන්නට යෙදෙන,චිත්තක්ෂණ භවාඞ්ග වී යති.

මෙහි ජවන 7 තෙන් අඩුවත් උපදින්ට හැකි බවක් තිබෙ න නිසා 7 ට ඉඩ නැති තැන 6 යත්, 6 ට ඉඩනැති තැන 5 ත් 5 ට ඉඩ නැති තැන 4 ත් උපදිනවා ය යි තේරුම් නොගත යුතුයි. සත උපදින්ට සුදුසු තැන 7 ට ඉඩ නැත්නම් එකක් වත් නූපදී. 4 ර උපදින්ට සුදුසු තැන වඩා ඉඩ තිබුනෝය යි වැඩිය නොඉපදම තදාලම්බනත් ඉපිද තවත් ඉඩ තිබේ නම් ඒවා භවාඞ්ග වී යති. සය පස ගැණත් මෙසේ ම යි. ඒ නිසා මේ දක්වාගත යන්නේ සාමාන්‍ය ක්‍රමය යි.

මෙසේ වොත්ථපන වලින් නිමවන අරමුණ පරිත්තකා රම්මණ නම් ද,ඒ වීථි වාර හය වොත්ථපනවාර නම් ද වෙති. ඒ වා 5 වෙති වින්‍යාසයේ පටන් 10 වෙති දක්වා වින්‍යාස වලින් දතයුතු යි.

## 5 වැනි වින්‍යාසය.

### පඨම (වොත්ථපන වාර) පරිත්තකාරම්මණ චක්ඛුද්වාර වීථිය.

### පච්චුප්පන්න රූපාරම්මණ.

| කා: කි: ශි: | | | | | | | | | | | | | | කා: කි: ශි: | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ ··· | තී ··· | තී ··· | තී ··· | තී ··· | න ··· | පං ··· | ච ··· | ස ··· | සං ··· | වො ··· | වො ··· | වො ··· | වො ··· | භ ··· | භ ··· | භ ··· | භ ··· |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

## 6 වැනි වින්‍යාසය.

ද්විතීය (වොත්ථපනවාර) පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.




## 7 වැනි වින්‍යාසය.

තතිය (වොත්ථපනවාර) පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.




## 8 වැනි වින්‍යාසය.

චතුත්ථ (වොත්ථපනවාර) පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.




## 9 වැනි වින්‍යාසය.

පඤ්චම (වොත්ථපන වාර) පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ



## 10 වැනි වින්‍යාසය.

ජඨ (වොත්ථපන වාර) පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.

කා: සි: භි: ප්‍රා.

| | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | භ | භ | භ | භ | භ | භ | භ | භ | භ | න | ද | පං | ච | සං | ණ | වො | වො |
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 | 17 |

මේ වීථිද එක එක අතීතය වැඩිවෙමින් යන බව ද, ඉන් අග එකේ පමණක් නොව මුල පසෙත් වොත්ථපන දෙකක් යෙදී ඉතුරු චිත්තක්ෂණ භවාඞ්ගයක් වෙන්ට ත් පුළුවන් බවද සැලකිය යුතුයි.

ජවනයක මුලින් නොයෙදෙන වොත්ථපනය දෙතුන්වරක් ම මුත් එක් වරක් පමණක් නූපදින්නා වූ ද, වොත්ථපන දෙකක් උපදින් ට ඉඩ නැති තරම් වෘඩවූ අරමුණක් ගැණ සෙසු වීථි සිත්තබා ආවර්ජනය පමණක් වත් නූපදින්නාවූ හෙවත් භවාඞ්ග පෙළ නොසිඳෙන්නාවූ ද ධර්මතාවක් ඇති හෙයින් චිත්තක්ෂණ 10 පටන් 15 දක්වා අතීත වී වැටහුන අරමුණ අරබයා කිසිම වීථි සිතක් නො ඉපදී භවාඞ්ග චලනයට අනතුරු සිත භවාඞ්ගොපච්ඡේදක යන නම පවා නො ලබා භවාංග චලන නමින් ම ඉපිද භවාඞ්ග සන්තතිය නො සිඳී මතුත් පවතී.

මෙසේ තමා වැටහීත් විථිසිත් ඉපදවීමට ශක්ති නැති අරමුණ අති පරිත්තාලම්බනයයි ද මේ වාර හය වීථි සිත් වලින් පාලු හෙයින් මොඝ වාරයයි ද නම් වෙති. මේවාට "වීථි" යන නම පවා උපචාර වශයෙන් මිස මුඛ්‍ය වශයෙන් නො යෙදේ. ඒ වා 11 වැන්න පටන් 16 වැන්න දක්වා ඇති වින්‍යාසවලින් බලා ගත යුතු යි.

## 11 වැනි වින්‍යාසය

පඨම (මොඝවාර) අතිපරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



## 12 වැනි වින්‍යාසය

දුතිය (මොඝ වාර) අති පරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



## 13 වැනි වින්‍යාසය

තතිය (මොඝ වාර) අතිපරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



## 14 වැනි වින්‍යාසය

චතුත්ථ (මොඝවාර) අතිපරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



## 15 වැනි වින්‍යාසය

පඤ්චම (මොඝ වාර) අතිපරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



## 16 වැනි වින්‍යාසය

ඡට්ඨ (මොඝවාර) අතිපරිත්තාරම්මණ චක්ඛුද්වාර වීථිය.
පච්චුප්පන්න රූපාරම්මණ.



මේවායේත් අතීත වැඩිවෙමින් යන සැටි ද, "ද" යන්නෙන් හඟවමින් ආ භවංගොපච්ඡෙදය නිසි තැනටත් "න" යන්න යෙදූ බව ද, සැලකිය යුතු යි.

චිත්තක්ෂණ 16 ක් අතීත ව එකක් පමණක් ආයුෂ තිබිය දී අරමුණ වැදගැන්මක් ම නැති බවත් 17 ක අතීත වූ කල අරමුණ ම නැති බවත්, දත යුතු.

මෙතාක් විස්තරකරන්ට යෙදුණේ චක්ෂුර්ද්වාරයෙහි රූපාලම්බනය වැටහීම සම්බන්ධ ව යි. සෝතාදී සෙසු ද්වාර සතර කෙරෙහි ශබ්දාදී සෙසු අරමුණු සතර වැටහීම සම්බන්ධ වත් මෙලෙස ම යි.

එ සේ කල මුලු පඤ්චද්වාරයෙහි ම තදාලම්බනවාර ජවනවාර වොට්ඨපනවාර මොඝවාර යන වාර සතරම අරමුණු

වීථී ප්‍රභේදයෙන් අරමුණු පැවැත්මේ සතර ප්‍රකාරය ක්‍රම යෙන් අතිමහන්ත මහන්ත පරිත්ත අතිපරිත්ත ය යි නම් කරණ ලදී.

"වීථිචිත්තානි සත්තේව-චිත්තුප්පාද චතුද්දස,
චතුපඤ්ඤාස විත්ථාරා-පඤ්චද්වාරෙ යථාරහං."

(පංචද්වාරයෙහි එකි එකී වීථි වශයෙන් පඤ්චද්වාරා වජ්ජනය, පඤ්ච විඤ්ඤාණයන්ගෙන් යම් කිසිවක, සම්පටිච්ඡනය, සන්තීරණය, වොට්ඨපනය, ජවනය, තදාලම්බනය යි උත්කෘෂ්ට පරිච්ඡේදයෙන් වීථි සිත් 7 ක් ම ද, චිත්තොත්පාදයෝ පඤ්චද්වාරාවජ්ජනය පටන් දෙවන තදාලම්බනය දක්වා 14 ක් ද, විස්තර වශයෙන් සියලු කාමාවචර සිත් 54 ද වෙති යනු භාව සි.)

පඤ්චද්වාරයෙහි වීථි සිත් පවත්නා ක්‍රමය සි.

මනොද්වාරයෙහි වර්තමාන වූ රූපශබ්දාදී රූපධර්ම අරමුණක් වැදගැන්මේදී වුවත් ඒ අරමුණ සම්බන්ධ ආයුෂයෙන් චිත්තක්ෂණ ගෙවතස්වීමක් (පඤ්චද්වාරයෙහි මෙන්) නො වේ. අතීත අනාගත රූප, ත්‍රෛකාලික අරූපධර්මයන් සම්බන්ධව කියනු ම කවරේ ද? එ සේ ද වුවත් මතු කියැවන ආරම්මණ පුරෙජාත ප්‍රත්‍යය සඳහා රූපධර්ම අරමුණු ආයුෂයෙන් ක්ෂණ ගණනක් අතීත විය යුතු ම වේ. අරූප ධර්ම අරමුණුවල එබන් දක් නැත්තේය. එහෙයින්:-

මනොද්වාරයෙහි විභූත (ප්‍රකට) ධම්මාරම්මණයක් වැද ගත් කල සුදුසුයේ අතීතය ඇතිව හෝ නැතිව හෝ භවංග චලන භවංගොපච්ඡේදක සිත් ද, ආවර්ජනස්ථානයෙහි මනො ද්වාරාවර්ජන ද, ජවන සත හා තදාලම්බන දෙක ද, ක්‍රමයෙන් ඉපිද, නිමවී භවාඞ්ගයට වැටේ. එය 17 වෙති 18 වෙති චිත්ත්‍යා සවලින් බලා ගත යුතු සි.

## 17 වෙනි වින්‍යාසය.

### කාමාවචරයන්ගේ පච්චුප්පන්නාරූපාදී පචවිභූතාරම්මණ - මනොද්වාර වීථිය.

පච්චුප්පන්න රූපාදී පඤ්චාරම්මණ




## 18 වෙනි වින්‍යාසය.

### කාමාවචරයන්ගේ අතීතානාගත පඤ්ච: තෛකාලික කාමාවචර ධම්ම: ආරම්මණයන්හි විභූතාරම්මණමනොද්වාර වීථිය.

“අතීතානාගත පඤ්ච ආ:: තෛකාලික කාමාවචර ධම්ම ‘ආ:”




මෙහි “ම” මනොද්වාරාවජ්ජනය–තිත් රැල් කෑලි දෙක අරමුණේ චිත්තක්ෂණ 17 පටන් ගන්න තැනක් හෝ නිමවන තැනක් හෝ නියම නැති බව හඟවයි. අරමුණෙහි චිත්ත ක්ෂණ ගණනින් ගෙවෙන ආයු නියමයක් නැති හෙයින් ‘ති’ ‘න’ ‘ද’ යන මේවා අත්හැර 10 ය ගණන් කරණ ලදී.

පසාදාදී වර්තමාන ධර්මාලම්බනය අරමුණු කරණකල ඒ අරමුණෙහි ආයුෂ වූ පරිද්දෙන් චිත්තක්ෂණ ගණන් නියම කල හැකි බවක් පෙණෙන්නේ වී නමුත් එක ම චිත්තක්ෂණායුෂය ඇති චිත්ත චෛතසිකයන් ද ඉතුත් තුණෙන් කොට සක් වූ ක්ෂණමාත්‍රායුෂ ඇති උපචය සන්තති අනිච්චතාවන් ද වර්තමාන ව ගන්නා කල එ සේ නො කල හැකි බැවින් ද

එ බඳු වර්තමාන අරමුණ උපදින කල් හෝ ඉපද මෙ පමණ ඉකුත්කල හෝ අපාථගත වෙයි කියා නියමයක් නැති හෙයින් ද එ බඳු ව්‍යවස්ථාවක් නැති බව සැලකිය යුතු යි.

අරමුණ සම්බන්ධව ක්‍ෂණයක් වත් අල්වාගෙණ ආවර්ජනා කරන්ට යෙදුනි නම් එය ම වර්තමාන වශයෙන් සලකනු මිස අන්පරිද්දක් එහි නැත් මැ යි.

රූපාවචර ලොකොත්තර සිත් ආදි අකාමාවචරාලම්බනයන් අරමුණු කොට පවත්නා ප්‍රත්‍යවේක්‍ෂාදියෙහි පැවති විභූතාලම්බන වීථියෙහින් රූපාවචර බ්‍රහ්මයන්ගේ විභූතාලම්බන වීථියෙහිත් තදාලම්බන නූපදී. සියල්ලට ම අවිභූත (අප්‍රකට) අරමුණක් මනොද්වාරයෙහි වැද්ද දුන් කලත් එ සේ ම සිත් පැවති ජවන කෙළවර තදාලම්බන නො ඉපදී භවාංග වේ. එය 19 වැනි 20 වැනි වින්‍යාසවලින් දත යුතු.

## 19 වැනි වින්‍යාසය

කාමාවචරයන්ගේ පච්චුප්පන්න පඤ්චඅවිභූතාරම්මණයෙහි හෝ රූපාවචරයන්ගේ පච්චුප්පන්න රූප සද්ද විභූතාවිභූතා රම්මණයන්හි හෝ–මනොද්වාර වීථිය.

පච්චුප්පන්න පඤ්චාරම්මණ.




## 20 වැනි වින්‍යාසය

කාමාවචරයන්ගේ අතීතානාගත පඤ්ච අවිභූතාරම්මණයෙහි හෝ–තෙකාලික කාලවිමුත්ත (අකාමාවචර) ධම්මවිභූතාරම්මණයෙහි හෝ–රූපාවචරයන්ගේ අතීතානාගත රූප සද්ද තෙකාලික කාලවිමුත්ත ධම්ම විභූතාවිභූතාරම්මණයන්හි හෝ–අරූපාවචරයන්ගේ ද තෙකාලික කාලවිමුත්ත ධම්ම විභූතාවිභූතාරම්මණයන්හි හෝ මනොද්වාර වීථිය.

අතීතානාගත පඤ්චාරම්මණ: තෛකාලික කාලවිමුක්ත
ධම්මාරම්මණ.




මෙහි කැලි රූල කාමාවචර රූපාවචරයන්ගේ හෘදය වස්තුවෙහි උපදින බව ද අරූපාවචරයන්ගේ කිසි වස්තුවක නූපදින බවද හැඟවීමට යි. මතුත් මෙ බඳු තැනට මේ අර්ථය දත යුතු යි.

මෙ සේ මනොද්වාරික පරිත්ත ජවන වීථි සම්බන්ධ ආලම්බනය විභූත් අවිභූත වශයෙන් දෙවැදෑරුම් කොට දත යුතු යි.

"වීථිචිත්තානි තීණෙව-චිත්තුප්පාදා දසේරිතා,
විත්ථාරෙන පනෙත්ථේක-චත්තාළීස විභාවයෙ."

(මනොද්වාරික පරිත්තජවන වාරයෙහි උත්කෘෂ්ට වශයෙන් මනොද්වාරාවජ්ජන ජවන තදාලම්බන වශයෙන් වීථි සිත් 3 ක් ද, චිත්තොත්පාද 10 ක් ද, විස්තර වශයෙන් පංචද්වාරාවජ්ජන, ද්විපඤ්චවිඤ්ඤාණ, සම්පටිච්ඡන දෙක යන මේ 13 හැර ඉතුරු කාමාවචර සිත් 41 යෙදෙන් යනු භාව යි.)

මනොද්වාරයෙහි පරිත්තජවන වාරගත
වීථි සිත් පවත්නා ක්‍රමය යි.

පරිත්ත ජවන වීථිවිභාගය යි.

නියතයෙන් මනොද්වාරිකවූ අපීණා ජවනවාරයෙහි විභූත අවිභූත යන ද්විභෙදයක් නැති ව යටකීසේ තදාලම්බන රහිත වුවත් නති විභූතාකාරයෙන් ම අරමුණු පවතිත්. එහි සිත් පවතින ක්‍රමය නම්:—යට ආලම්බන සංග්‍රහයෙහි කී ලෙස රූපාවචර අරූපාවචර ලෝකොත්තර අපීණාවන්ට නියම වූ ඒ ඒ අරමුණු මනොද්වාරයට වැද්ද දුන් කා භවංග චලන භවඞ්ගුපච්ඡේදක මනොද්වාරාවජ්ජනයත් පැවති ඉක්බිති

ඥානසම්ප්‍රයුක්ත කාමාවචර ජවනයන් 8 අතුරෙන් ප්‍රත්‍යය වූ පරිද්දෙන් නියතඑක **පරිකම්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ** නො හොත් **වොදාන** යන නම් වලින් මඳනුවණ ඇති පුද්ගලයන්ට 4 ක් හෝ, තියුණුනුවණ ඇති පුද්ගලයන්ට මුල් පරිකම්ම නම් වාරය නැති ව ඉතිරි 3 වාරය හෝ ඉපිද නැසුනාට පසු (4 වර උපන්තැන) පස්වැනි ව හෝ (3 වර උපන් තැන) සතරවැනි ව හෝ රූපාවචර අරූපාවචර ලොකොත්තර ජවන 26 අතුරෙන් ලැබුනු ප්‍රත්‍යයවල හැටියට නියම වූ යම් කිසි එකක් තමාගේ ඉපදීමෙන් (එතාක් ම කාමාවචරමය වූ) ඒ වීථිය **අර්පණාවීථියක්** කරයි. එය මතු විස්තර වන සේ නියම වාරගණන පැවැත්තාට පසු භවාඞ්ග පාත වේ. ලොකොත්තර මාර්ගවීථිවලදී මාර්ග සිතට අනතුරු ව ඵලසිත් ද ලැබී භවාඞ්ග වේ. එහි ද ගොත්‍රභූ නමින් ලැබෙන සිත ශ්‍රොතාපත්ති මාර්ගයට මුලින් යෙදෙන කල පමණක් එනම් වේ. සෙසු මාර්ග තුණට ම මුලින් යෙදෙන කල වොදාන නම් වේ. පරිකර්මාදී 4 ම ඵලසමාපත්ති වීථිවල එක ම අනුලෝම යන නමින් සතරවර හෝ තුන්වර පවතිත්.

## 21 වැනි වින්‍යාසය.

මන්දපඤ්ඤ පුග්ගල රූපාවචර අරූපාවචර ආදිකම්මික වීථිය පඤ්ඤත්ති මහග්ගතාරම්මණ,

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උ; ඨි; භ; | | | | | | | | | | | | | උ; ඨි; භ; | | | | | |
| භ ... | භ ... | භ ... | භ ... | භ ... | න ... | ද ... | ම ... | ප ... | උ ... | අ ... | ගෝ ... | ඣා ... | භ ... | භ ... | භ ... | භ ... | භ ... | භ ... |

ඇති හෝ නැති හදය වත්ථු රූප.

## 22 වැනි වින්‍යාසය.

තික්ඛපඤ්ඤපුග්ගල රූපාවචර අරූපාවචර සමාපත්ති වීථිය පඤ්ඤත්තිමහග්ගතාරම්මණ.

| | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| උ; ඨි; භ; | | | | | | | | | | | | | උ; ඨි; භ; | | | | | |
| භ ... | භ ... | භ ... | භ ... | භ ... | භ ... | න ... | ද ... | ම ... | උ ... | අ ... | ගෝ ... | ඣා ... | භ ... | භ ... | භ ... | භ ... | භ ... | භ ... |

ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 23 වැනි වින්‍යාසය.

මන්දපඤ්ඤපුග්ගල රූපාවචර අරූපාවචර සමාපත්ති වීථිය
පඤ්ඤත්තිමහග්ගතාරම්මණ.



ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 24 වැනි වින්‍යාසය.

තික්ඛපඤ්ඤපුග්ගල රූපාවචර අරූපාවචර සමාපත්ති වීථිය.
පඤ්ඤත්ති මහග්ගතාරම්මණ.



ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 25 වැනි වින්‍යාසය.

මන්දපඤ්ඤපුග්ගල සෝතාපත්තිමග්ග වීථිය.
තෙභූමකසංඛාර ආ: නිබ්බාණ ආ:



හදයවත්ථුරූප.

## 26 වැනි වින්‍යාසය.

තික්ඛපඤ්ඤපුග්ගල සෝතාපත්තිමග්ග වීථිය.
තෙභූමකසංඛාර ආ: නිබ්බාණ ආ :



හදයවත්ථුරූප.

## 27 වැනි වින්‍යාසය.

මන්දපඤ්ඤපුග්ගල සකදාගාමි අනාගාමි අරහත්තමග්ග වීථිය.

තෙභූමකසංඛාර ආ: නිබ්බාණ ආ:




ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 28 වැනි වින්‍යාසය.

තික්ඛපඤ්ඤපුග්ගල සකදාගාමි අනාගාමි අරහත්තමග්ග වීථිය.

තෙභූමකසංඛාර ආ: නිබ්බාණ ආ:




ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 29 වැනි වින්‍යාසය.

මන්දපඤ්ඤපුග්ගල ඵලසමාපත්ති වීථි.

තෙභූමකසංඛාර ආ: නිබ්බාණාරම්මණ.




ඇති හෝ නැති හදයවත්ථුරූප.

## 30 වැනි වින්‍යාසය.

තික්ඛපඤ්ඤපුග්ගල ඵලසමාපත්ති වීථි.

තෙභූමකසංඛාර ආ: නිබ්බාණාරම්මණ.




ඇති හෝ නැති හදයවත්ථු රූප

මේ වීථිවල "රි" පරිකර්මය, "උ" උපචාරය, "අ" අනුලෝමය, "ගො" ගොත්‍රභූ, "ඣා" ඣානය, "ගග" මගගය, "ඵ" ඵලය, "වො" වොදානය, "ආ" ආරම්මණය, යන මේවා ද, තිත් රූල් කැබැල්ල සහිත පතුලේ "භ" කාර පෙළ ඒ අතරදී හෝ ඉන් ඉදිරියටත් එ සේ ම පැවති යම්කිසි තැනකදී හෝ අධිෂ්ඨාන වූ පරිද්දෙන් ඒ ඒ සමාපත්තියෙන් නැගී සිටින තුරු ඒ ඒ ඣාන ඵල සිත් පැවති එතැන් පටන් භවාංග වන බව ද හැඟවීම පිණිස යි.

මෙකී ඒ ඒ කාමාවචර ජවනයන්ට අනතුරු ව ලැබෙන අර්පණා නියමය මෙ සේ යි:

කාමාවචර ජවනය සොම්නස් සහගත නම් ඉන් පරව ලැබෙන අර්පණයත් සොම්නස් සහගත යි. උපෙක්ෂා සහගත නම් උපෙක්ෂා සහගත යි. කුසල ජවනයක් නම් අර්පණායත් කුසල ජවනයක් හෝ සෝවාන් ආදී ශෛක්ෂඵල තුන හෝ වෙති. ක්‍රියා ජවනයක් නම් ක්‍රියාර්පණයක් හෝ අර්හත් ඵලය හෝ වේ.

"බත්තිංස සුඛපුඤ්ඤම්හා-ද්වාදසොපෙක්ඛකාපරං
සුඛිතක්‍රියතො අට්ඨ-ඡ සම්භොන්ති උපෙක්ඛකා.
පුථුජ්ජනානසෙක්ඛානං-කාමපුඤ්ඤතිහෙතුතො,
තිහෙතු කාමක්‍රියතො-වීතරාගානමප්පණා."

(සොම්නස් සහගත ඥාන සම්පයුත්ත වූ මහා කුසල සිත් දෙක කෙරෙන් පර ව අර්හත් ඵලය හැර සෙසු මාර්ග ඵලයන් 7 ද රූපාවචර කුසලද යන අට තැනෙහි ප්‍රථම ද්විතීය තෘතීය චතුර්ථ යන ධ්‍යාන සතර වශයෙන් අර්පණා 32 ක් වෙති. උපෙක්ෂා සහගත ම එ බඳු මහා කුසල සිත් දෙක කෙරෙන් එම 8 තැනෙහි පඤ්චමධ්‍යාන 8 ට හා අරූපාවචර කුසල 4 ද යන 12 ස වෙති. සොම්නස් සහගත එ බඳු ම ක්‍රියා සිත් දෙක කෙරෙන් අර්හත් ඵලය ද රූපාවචර ක්‍රියාව ද යන දෙ තැනෙහි ප්‍රථමාදී ධ්‍යාන සතර වශයෙන් 8 ක් වෙති. උපෙක්ෂා සහගත එ බඳු ම ක්‍රියාසිත් දෙක කෙරෙන් එම දෙතැනෙහි පඤ්චමධ්‍යාන 2 ක හා අරූපාවචර ක්‍රියා සිත් සතරද යන 6 වෙති. පෘථග්ජනයන්ට හා ඵලස්ථ ශෛ

ක්‍ෂ තුන්දෙනාටත් ත්‍රිහෙතුක කාමාවචර කුසල් සිත් සතර කෙරෙන් ද රහතුන්ට එම ක්‍රියා සිත් සතර කෙරෙන් ද අපිණාවෝ වෙති.)

(මෙහි දැක්වූ "බත්තිංස" යනාදී ගාථාවට සෙතහඞ්-සුදුඇත් ගාථාවය යන නමක් වේ. බුරුම රට එක්තරා රජෙකු විසින් අභිධර්මය ඉගෙණ මේ ගාථාවේ අර්ථයෙහි විසිතුරු සියුම්කම ගැන පැහැදී එහි අර්ථය ගුරු මුඛයකින් අසා නොම ගෙණ පොත් බලා ස්වකීය ඥාණශක්තියෙන් අව බොධ කර ගෙණ ඒ බව ඔප්පු කල කාට නමුත් ඒ රටෙහි දුන් පවා අගය නිම නැතිකොට සලකන සුදු ඇතෙක් තෑගී කොට දෙන බව ප්‍රසිද්ධකල නමුත් කිසිවෙක් ඒ තෑග්ග නො ලැබූ බව ද එතැන් පටන් මේ නම ඊට ව්‍යවහාරවූ බව ද ගුරුමුඛයෙන් දැනගතිමු)

මනොද්වාරයෙහි අපිණා ජවන වාරගත
වීථිසිත් පවත්නා ක්‍රමය යි.

**ජජ්ඣක සමුද්දෙස පාදය යි.**

මේ දැක්වූ වීථි කෙරෙහි අනිෂ්ට අරමුණක් වූ කල ලැබෙන සියලු අහෙතුක විපාකයෝ-එනම්, පඤ්ච විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ තදලම්බනයෝ අකුසල විපාකයෝ වෙති. ඉෂ්ට අරමුණෙහි අකුසල විපාකයෝ වෙති. අති ඉෂ්ට අරමුණෙහි සන්තීරණ තදලම්බනයෝ කුසල විපාක වනු පමණක් නො ව සොම්නස් සහගත ද වෙති.

(මෙහි ඒ ඒ භවානුකූලව පමින් ලැබිය යුතු අරමුණ අනිෂ්ට යි. මීයාට බළලා මෙනි. එ සේ ම පිණින් ලැබිය යුතු අරමුණ ඉෂ්ට යි. බළලාට මීයා මෙනි. බලවත් පිණින් ලැබිය යුත්ත අති ඉෂ්ට යි. දුගියෙක්හට මග තිබී සම්භ වූ මාහැඟි මැණිකක් මෙනි. ඒ ඒ භවානුකූල ව ය යි කිවේ සර්වසාධාරණ ඉෂ්ටානිෂ්ට බවක් නැති බව සඳහා යි. මිනී කුණපයක් මනුෂ්‍යභවය සඳහා අනිෂ්ටවුවත් බලු කවුඩු ගිජුලිහිණි ආදී භවයන් සඳහා ඉෂ්ට නම් වෙයි.-පිණින් ම ලැබිය යුතු යි.)

එහින් ජවනය සොම්නස් ක්‍රියාවක් නම් ඉන් පර තදාලම්බනය සොම්නස් සහගත ම වේ. උපෙක්‍ෂා ක්‍රියාවක් නම් උපෙක්‍ෂා සහගත ම වේ. එ සේ එහාග නියමය ක්‍රියාජවන සඳහා පමණකි. ඊට හෙතුව නම් රහතුන්ගේ විපර්යාස නැති බව යි. සෙසු පුද්ගලයන්ට ලැබෙන සොම්නස් සහගත හෝ උපෙක්‍ෂා සහගත හෝ අකුසල් හෝ කුසල් හෝ ජවන කෙරෙන් අනිෂ්ට හෝ ඉෂ්ට හෝ අරමුණෙහි උපෙක්‍ෂා සහගතවූ ම තදාලම්බනය වෙයි. අතිඉෂ්ටාලම්බන යෙහි පමණක් සොම්නස් තදාලම්බනය වේ. නුමුත් දොම්නස් සහගත ජවනය කෙරෙන් අතිමහන්ත විභූතාලම්බන වීථිවල අගින් ලැබෙන තදාලම්බන වීථිවල භවඞ්ග හෝ උපෙක්‍ෂා සහගත ම විය යුතු යි.

මේ භවාඞ්ගවල සොම්නස් සහගත බව අමුතුවෙන් ඇති වන එකක් නො ව ප්‍රතිසන්ධි දුන් විපාකයේ ස්වභාව ම වේ. ඒ හෙයින් සොම්නස් විපාකයකින් පිළිසිඳ ගත්තෙකු හට දොමනස්ස ජවන වීථියක තදාලම්බන ලැබෙන්ට වී නම් ඒවා උපෙක්‍ෂා සහගතවීමෙන් එම කී නීතිය ඉතට විය හැකි. නුමුත් තදාලම්බන නො ලැබෙන්ට කරුණු පැමිණියොත් සොම්නස් භවාඞ්ගයට වැටෙන්ටත් අභව්‍ය කොට කුමක් වේ දැයි සැලකූ ආචාර්‍ය්‍යවරයන් විසින් උපෙක්‍ෂා සහගත සන්තිරණ සිතක් තදාලම්බන කෘත්‍යයෙන් නොව ආගන්තුක වශයෙන් පෙර යම් පුරුදුකාමාවචර අරමුණක එල්බී භවාඞ්ග කෘත්‍යයෙන් වරක් ඉපිද පාඩුව පිරිමසා ප්‍රකෘති භවාඞ්ගයට ඉඩ දෙයි කියා ද, මේ ආවර්ජන මාර්ගයෙන් නො ආ අරමුණු ගැන්ම නිරොධ සමාපත්තියෙන් නැගී සිටින පුද්ගලයාගේ ඵලසිතෙන් ආවර්ජන මාර්ගයෙන් නො ආ අරමුණු ගැන්ම නිරොධ සමාපත්තියෙන් නැගී සිටින පුද්ගලයාගේ ඵල සිතෙන් ආවර්ජන නො කළාම වූ නිවන් අරමුණු කිරීමට සමාන බැවින් අවිරුද්ධ ය යි ද, දක්වා තිබේ. මෙය 31 වෙනි 32 වෙනි ව්‍යාඛ්‍යාසවලින් දතයුතු යි.

## 31 වැනි වින්‍යාසය

### සොමනස්ස පටිසන්ධිකයාගේ දෙමනස්ස ජවනවාර මහන්තාරම්මණ වීථිය.

රූ. 5 ආරම්මණ.




## 32 වැනි වින්‍යාසය

### සොමනස්ස පටිසන්ධිකයාගේ දෙමනස්ස ජවනන්ත අවිභූතා රම්මණ වීථිය.

ජාරම්මණ.




මෙහි "*" සොමනස්ස සහගත, "ච 5" චක්ඛු විඤ්ඤාණාදී පසෙන් එකක්, "රූ 5." වර්තමාන රූපාදී පසින් එකක්, "× දෙම්නස්ස සහගත, "ආර" ආගන්තුක උපෙක්ඛා සන්තීරණ භවාංගය, "චි" පරිචිත කාමාවචර අරමුණක්, පතුලේ "තී" මේ චිත්තක්ෂණය(න්) අතීතයක් ව වීථිය පටන්ගන්ට ද හැකි බව, පතුලේ "ආ.ර." මුලඑක නො වේ නම් මේක ඒ ආගන්තුකයා වෙන්ට පුළුවන් බව, වෙනුවට යොදන ලදී.

තවත් මෙහි ආචාර්‍ය්‍යමතයක් නම් කාමාවචර විපාක සිතකින් ම පිළිසිඳ ගත් සත්ත්වයෙක් හට කාමාවචර අරමුණක් ම අරබයා කාමාවචර ජවනයන්ට ම අනතුරුව විභූත අතිමහන්ත වීථිවල ම තදාලම්බන ලැබෙනවා මිස මේ අඞ්ගසතරින් එකක් වත් අඩුවුනොත් නො ලැබෙන බව යි. එම අර්ථය ගාථාවකින්:-

> "කාමෙ ජවනසත්තාලම්බනානං නියමෙ සති,
> විභූතෙති මහන්තෙච–තදාලම්බනමීරිතං;"

**තදාලම්බන නියම පාදය යි.**

ජවන අතුරෙහි ද පරිත්ත (කාමාවචර) ජවනවීථියෙහි කාමාවචර ජවනයෝ සාමාන්‍යයෙන් සත් වරක් ද, මරණ කාලයෙහි අතිශයින් දුර්වල වූ හෘදය වස්තුව ඇති හෙයින් මදව පවත්නා කල්හි පස්වරක් ම ද, ඍද්ධි ප්‍රාතිහාර්‍ය්‍යාදියෙහි මුලදී මහතෙරනුවන් ආදීන්ට වීථින් සැහැල්ලු කොට පැවැත්වීමෙහි අධිෂ්ඨාන ආවර්ජන ප්‍රත්‍ය වෙක්ෂණ ජවන පසක් හෝ සතරක් ද යමකප්‍රාතිහාර්‍ය්‍යාදියෙහි භාග්‍ය වතුන් වහන්සේට බොහෝ කොට ම එම ජවන සතරක් ද ලැබෙති. එය 33 වෙනි 47 වෙනි 48 වෙනි වින්‍යාසවල අනුසාරයෙන් දත යුතු යි.

### 33 වැනි වින්‍යාසය.

පරමවසි ප්‍රාප්තයන්ගේ ඣානාවජ්ජන අධිඨාන පච්චවෙක්ඛණ වීථි

ඣානඞ්ගාදි ධම්ම අා:

| චි; | | | | | | චි; | |
|---|---|---|---|---|---|---|---|
| ති | භ | ම | ජ | ජ | ජ | ති | භ |
| ... | ... | ... | ... | ... | ... | ... | ... |

මෙහි ම වසීතාවය අඩුවෙන්ට වෙන්ට ජවන වැඩිවෙමින් ගොස් වසීතා නැත්තාහට සතක් ම ලැබෙන බව ද, අකාමාවචර අරමුණ බැවින් තදාලම්බන නැතිබව ද, පරම වසී ප්‍රාප්ත යන්ට මුලිනුත් අගිනුත් "න" "ද" දෙකින් පමණක් අතර ඇති මතුදක්වන සේ වෙන වීථි දෙකක් ලැබෙන කල ශුද්ධ භවාඞ්ග නැතිහෙයින් "භ" නො යොද කොට කළ නුමුත් අතීත් කාලවල ලැබෙන බවද දත යුතුයි.

මුලින් උපදවන තැනදී (එනම් ආදිකම්මික වීථි වල) යටකී පරිකම්මාදී කාමාවචර ජවන සතරට හෝ තුණට අනතුරුව සාමාන්‍ය මහද්ගත ජවනා හා සියලු කල ම අභිඤ්ඤා ජවනත් එක්වරක් පමණක් පැවත භවාඞ්ග වේ. 21 වෙනි 24 වෙනි වින්‍යාස බලනු.

මග්ගවීථිවල එසේම ඒ ඒ මාර්ගසිත එක් එක් වරද ඉන් පරව ඒ ඒ ඵලසිත දෙතුන්වරක් ද ඉපිද භවාඞ්ග වේ. 25 වැන්නේ පටන් 28 වැන්න දක්වා වින්‍යාස බලනු.

නිරෝධ සමාපත්ති කාලයෙහි අනාගාමි රහත් පුද්ගල යන්ට සුදුසුසේ එසේම නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල් හෝ ක්‍රියා සිත දෙවරක් ඉපිද බිඳුනාට පසු සඤ්ඤා වෙදයිත නිරොධය ලැබ නැවත නැගීසිටින කාලයෙහි තම තමන්ගේ ඵලසිත එක් වරක් ඉපිද භවාඞ්ගවේ. එය 34 වෙනි වින්‍යාසයෙන් බලා ගතයුතු සි.

## 34 වෙනි වින්‍යාසය

### නිකඛපඤ්ඤනි නිරොධ සමාපත්ති වීථිය.

| ආකිඤ්චඤ්ඤායතන ආ: | | | | | | | | | නි. | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පි. | | | | | | | | | | පි | |
| න ... | ප ... | ම ... | උ ... | අ ... | ශ්‍රී ... | ශ්‍රී ... | ශ්‍රී ... | . | ඵ ... | භ ... | භ ... |

මෙහි අතර හිස් අවකාශය චිත්තචෛසික නිරොධයට ද, "නි" නිබ්බාණාරම්මණයට ද, යටරූල් කම්මජ උතුජ ආහාරජ රූප පැවැත්වීමට ද ලකුණුයි. මන්දපඤ්ඤපුද්ගල වීථියෙහි "රි" සහිතව මෙය ලැබේ.

සියලු ම ධ්‍යාන සමාපත්ති ඵල සමාපත්ති කාලවල එසේ ම ඒ ඒ ධ්‍යාන සිත හෝ ඵල සිත කිපවාරය පටන් අතියමින් බොහෝ වාර ගණනක් උපදී. රූදවලක් මුලුල්ලෙහි පවා සමාපත්තියට සමවැද වෙසෙත් මය. 23, 24 වෙනි 29, 30 වෙනි වින්‍යාස බලනු.

මෙම කී අර්ථයෙහි සාමාන්‍ය කොටස් පමණක් ගාථාවකි නුත් මෙ සේ දක්වා තිබේ.

"සත්තක්ඛත්තුං පරිත්තානි–මග්ගාභිඤ්ඤා සකිං මතා,
අවසෙසානි ලබ්භන්ති=ජවනානි බහූනිපි."

කාමාවචර ජවන් සත්වරක් ද, මග්ගජවන අභිඤ්ඤා ජවන එක්වරක් ද සෙසු ජවන් බොහෝ වර ද ලැබෙත්.

(ශුඞ මනොද්වාරිකවීථි සම්බන්ධ කුසලාකුසල ජවනයන් ගේ චෙතනාවෝ අන්‍ය වීථිගත එ බඳු චෙතනාවන්ගෙන් දියුණු කරණ ලදුව හෝ නැතුව හෝ ඍජුව ම ප්‍රතිසන්ධිජනක කර්මයෝ වෙති. පඤ්චද්වාරික වීථිවල එබඳු චෙතනාවෝ

මනොද්වාරික කර්මයන් මූකරවීමට උපනිශ්‍රය වෙත් මුත් තමා ම ප්‍රතිසන්ධිජනකාදී බලවත් කර්මයෝ නො වෙති. යලි ප්‍රවෘත්ති විපාක මාත්‍රයක් දෙන්ට පොහොනා දුර්වලයෝ වෙති. රූපාදී යම්කිසිවක් අරබයා යම්කිසි පඤ්චද්වාරික වීථියක් පැවැත් තාට පසු ඒ අරමුණ කුමක්ද සි අතීත වශයෙන් අරමුණු කරණ මනොද්වාරික වීථියක්ද, එහි වර්ණාදි විශෙෂය දැනගන්න දෙවෙනි මනොද්වාරික වීථියක් ද පැවත නිරුද්ධවූවාට පසු එහි අර්ථය දැනැගණිමින් පවතින තුන්වන මනොද්වාරික වීථිය සම්බන්ධ වූ ම ජවන චෙතනාවෝ මූකල කර්මබීජයෝ වෙති. ඒ වීථි පරම්පරාව 35 වෙනි වින්‍යාසයෙන් බලාගත යුතු සි.)

### 35 වැනි වින්‍යාසය.

රූපශබ්දාදියෙන් අර්ථයට බැසගන්නා වීථි පරම්පරාව.

භ. (1: 2: 3: 4:) භ. 20. භ. 20. භ. 20. භ.
1. II. III. IV.

මෙහි මේ ":" ලකුණ 'හෝ' යන අර්ථය ද, ඉලක්කම් ඒ ඒ ගණන දරණ වින්‍යාසය එහි යෙදිය යුතු බව ද, "භ" යන අතියමින් යම් කිසි භවංග ගණනක් ද, මේ "( )" ලකුණ චක්ඛුද්වාරික පමණක් නො ව සියලු පඤ්චද්වාරික වීථින්ගෙන් එකක් සඳහා උපලක්ෂණ බව ද, I. ප්‍රථම පඤ්චද්වාරික වීථිය ද II. දෙවෙනි වූ අතීතරූපාදී සාමාන්‍යය| අරමුණුකරන්නාවූ ද III. තුන්වැනි වූ වර්ණාදි විශෙෂය අරමුණුකරන්නාවූ ද, IV. සතරවැනි වූ අර්ථය අරමුණුකරන්නාවූ ද මනොද්වාරික වීථින් ද හඟවති.

### ජවන නියම පාදය සි.

මේ වීථි සම්බන්ධව ද්විහෙතුක අහෙතුකයන්ට රහත් නො විය හැකි බැවින් ක්‍රියා ජවන ද, ධ්‍යානාදිය ඉපදවිය නො හැකි බැවින් අර්පණා ජවන ද සාමාන්‍යයෙන් නො ලැබෙත්. විශෙෂ වශයෙන් දුහෙතුකයාට සහ කාමසුගතියෙහි වන අහෙතුකයාට ඥාන සම්ප්‍රයුක්ත විපාක ද, දුගතියෙහි වන අහෙතුකයාට මහාවිපාක මුළුමනින් ම ද නො ලැබෙත්. ත්‍රිහෙතුක වූ නොයෙක් පුද්ගලයන් අතුරෙන් රහතුන්ට කුසල ජවන හා අකුසල ජවන ද; රහතුන්ට ම මිස අනෙක්

ශෛක්‍ෂ නම් ලත් ආයඞ් සත්දෙනාට හා පෘථග්ජන යන්ටත් ක්‍රියා ජවන ද; ශෛක්‍ෂයන්ට දිට්ඨිගතසම්ප්‍රයුක්ත ජවන හා විචිකිච්ඡා ජවන ද නො ලැබෙත්. ලොකොත්තරජවනයන් ගෙන් ඒ ඒ එක ඒ ඒ ආයඞ්යාහට ම උපදී. මාර්ගපුද්ගලයන් සතරදෙනාට ඒ ඒ මාර්ග සිත පමණක් මිස අන්කිසි ම සිතක් නූපදී.

"අසෙක්ඛානං චතු චත්තා–ළීසසෙක්ඛාන මුද්දිසෙ,
ඡප්පඤ්ඤාසාවසෙසානං–චතුපඤ්ඤාස සම්භවා."

(මේ වීථි සම්බන්ධ ප්‍රස්තාවෙහි වීථි සිත් වශයෙන් නො ලැබෙන මහද්ගත විපාක නවය හැර ඉතුරු අසූවෙන් රහ තුන්ට සෝවාන් ආදී ඵල තුණ හැර ඉතුරු සියලු ම විපාක හා ක්‍රියා 44 ද; ශෛක්‍ෂයන්ට පොදුවේ හා බෙදී ගැණෙන පිණිස දිට්ඨි විචිකිච්ඡාසහගත නො වූ අකුසල් 7 ද; ආවර්ජන 2 ද, අර්හත්ඵලය හැර සියලු ම විපාක 26 ද සියලු ම කුසල් 21 දූ සි 56 ද සෙසු පුද්ගලයන්ට එ සේ ම ගැණෙන පිණිස සියලු අකුසල් 12 ද, මාර්ග සතර හැර සියලු කුසල් 17 ද, ඵල සතර හැර සියලු විපාක 23 ද, ආවර්ජන 2 ද යන 54 ද; වීථි සිත් වශයෙන් ලැබෙති. නුමුත් එකවිසසතික නසින් ඒ ගණන් තුණ ක්‍රමයෙන් 48 ද, 54 ම ද, වෙති. ඒ හැරීමට හෝ ගැණීමට එක ලොකොත්තර සිතක් පහක් වශයෙන් සැලකීම අමතක නො කළ යුතු.)

එය ම ඒ ඒ පුද්ගලයන්ට විශෙෂ කොට මෙ සේ දත යුතු සි. රහතුන්ට කි 44 ද, අනාගාමීන්ට 48 ක් ද. සකෘද ගාමීන්ට 50 ද, සොතාපන්නයන්ට 50 ක් ද, ඒ ඒ මාර්ගස්ථයාට 1 ක් ද, ත්‍රිහෙතුක පෘථග්ජනයන්ට 54 ක් ද, ද්විහෙතුකයන්ට 41 ක් ද, සුගති අහෙතුකයන්ටත් 41 ක් ද, දුගති අහෙතුක යාට 37 ක් ද ලැබෙති. අසඤ්ඤී අහෙතුකයාට එකකුත් නැත්තේ ය.

ලොකොත්තරසිත් ලැබෙන කල අටෙන් වුවත් සතළිසෙන් වුවත් එකි එකි මාර්ගස්ථයාට එකක් එකක් ම ලැබෙන බැවින් ඔවුන් සඳහා නො ගෙණ ඵලස්ථයන්ට සමාපත්තියෙහිදී අටෙන් එකක් සඳහා සතළිසෙන් 5 ක් 5 ක් ම ලැබෙන බැවින් ඒ එක එක වෙනුවට පස සප යොදා ගත් කල ඒ ගණන් ලැ. බි

පුද්ගලභෙද පාදය සි.

කාමාවචර භූමියෙහි සියලු ම වීථිසිත් සුදුසු පරිද්දෙන් ලැබෙති. රූපාවචරභූමියෙහි ප්‍රතිඝ ජවන තදාලම්බන හැර ඉතිරිවා ලැබෙති. අරූපාවචරභූමියෙහි සොතාපත්ති මග්ග, හසන, රූපාවචර සිත් හැර ඉතිරිවා ලැබෙති මේ සියලුතැන ම ඒ ඒ ප්‍රසාද නැති පුද්ගලයන්ට ඒ ඒ ද්වාරිකවූ ද අසඤ්ඤ සත්තයන්ට මනොද්වාරික වූ පවා කිසි ද සිත් පැවැත්මක් නැත්තේ ම ය. එහෙයින් කාමාවචරයෙහි අඳ බිහිරි ආදීන් ගේ චක්ඛුසොතාදී ද්වාරික වූ ද, රූපාවචරයෙහි ඝාණ ජිව්හා කායද්වාරික වූ ද, අසඤ්ඤසත්තයන්ගේ සියලු ම ද්වාරික වූ ද අරූපයෙහි පඤ්චද්වාරික වූ ද යනාදී වශයෙන් සිත් නො ලැබීම දත යුතු.

"අසීති වීථිචිත්තානි-කාමෙ රූපෙ යථාරහං"
චතුසට්ඨි තථා රූපෙ-ද්වෙචත්තාළීස ලබ්භරෙ."

(වීථි සිත් නො වන මහද්ගත විපාක නවය හැර කාමාවචරයෙහි සියලු ම වීථිසිත් 80 ද, රූපාවචරයෙහි ඝාණ ජිහ්වා කාය විඤ්ඤාණ මහාවිපාක ප්‍රතිඝ සිත් යන 16 ඒ අසුවෙන් හැර ඉතුරු 64 ද, අරූපාවචරයෙහි ඉතුත් පඤ්චද්වාරාවජ්ජන චක්ඛු සොත විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ හසන රූපාවචර සොතාපත්තිමග්ග යන 22 හැර ඉතුරු 42 ද ලැබෙති. තුමූත් එකවීසසතික නයින් මේ ගණන් තුණ ක්‍රමයෙන් 112 ද, 96 ද, 70 ද වෙති. අනන්තිම අපහරණය එනම් අඩුකළ 22 ක වෙනුවට 26 වේ.)

### භූමිවිභාග පාදය යි.

මෙ සේ භවාඞ්ග මැඩ ගෙණ වීථි ද වීථි කෙළවර භවාඞ්ග ද යි අතරතුර භවාඞ්ග ඇති ව සදෙරෙහි පැවති වීථිචිත්ත පරම්පරාව භවයාගේ කෙළවර දක්වා පවතී. 36 වැනි වින්‍යාසය ද බැලිය යුතු යි.

### 36 වෙනි වින්‍යාස ය.

### භවයක් තුළ චිත්ත පරම්පරාව.

පි. භ. වී. (භ. වී,--පෙ--) වී: භ. චු.
1 2 3 4

මෙහි "පි."-පටිසන්ධි "භ 1"-ප්‍රථම භවඞ්ග සොළස. "වි 2" භවනිකාන්ති ලොභජවන වීථිය. "(භ. වී.-පෙ-) 3"-අනියත භවාංග ගණනක් ලහට අනියත වීථියක්ද එතැන් පටනුත් මහා කල්ප 84000 කින් මෙ පිට කොපමණ කලක් වුවත් කො පමණ වාර ගණනක් වුවත් එබඳු ම කූට්ටම් නැවත නැවත ලැබීම. "වි: භ. 4"-භවාඞ්ග ගණනක් අගට ඇතිව හෝ නැතිව මරණාසන්න වීථිය.-"චු" චුතිය යි.

## සතරවන වීථිකාණ්ඩය යි.

මේ තිම කල පරිච්ඡෙදයෙන් දක්වන ලද්දේ වීථි සිත් වශයෙන් සිත් පැවැත්ම යි. දැන් ඊට ඉඩ ගැණීමට කල් තැබූ ප්‍රතිසන්ධි විෂයෙහි වීථිමුක්තක වශයෙන් සිත් පැවැත්ම දක්වනු ලැබේ. එහි-

1. **භූමිසතරය, 2. සතර වැදෑරුම් ප්‍රතිසන්ධිය:** 3. **කර්ම සතරය,** 4. **සතර ප්‍රකාර මරණොත්පත්තිය,** 5. **තුන් වැදෑරුම් අරමුණු පැවැත්මය** යන චතුෂ්ක සතරක් හා ත්‍රිකයත්, එ නම් කාරණා එකුන් විස්සක් දත යුතු ය.- එහි.-

1. **භූමි සතර නම්:**-A. අපාය භූමිය, B. කාමසුගති භූමිය, C. රූපාවචර භූමිය, D. අරූපාවචර භූමිය, යනු යි. එහි:-

A. **අපාය භූමිය**-නිරය, තිරච්ඡානයොනිය, පෙතතිවිසය, අසුරනිකාය යී සිව් වැදෑරුම් වේ.

B. **කාමසුගති භූමිය**-මනුස්සලොකය, චාතුම්මහාරාජිකය, තාවතිංසය, යාමය, තුසිතය, නිම්මාණ රතිය, පර නිම්මිත වසවත්තිය යී සත් වැදෑරුම්.

C. **රූපාවචර භූමිය**-a. පඨමජ්ඣානභූමිය, b. දුතිය ජ්ඣාන භූමිය, c. තතියජ්ඣාන භූමිය, d. චතුත්ථජ්ඣාන භූමිය යී සිව් වැදෑරුම්.

a **පඨමජ්ඣාන භූමිය**- බ්‍රහ්මපාරිසජ්ජය, බ්‍රහ්මපුරොහිතය, මහා බ්‍රහ්මය යී ත්‍රිවිධ වේ.

b. **දුතියජ්ඣාන භූමිය**-පරිත්තාභය, අප්පමාණාභය, ආභස්සරය යී ත්‍රිවිධ වේ.

c. තතියජ්ඣාන භූමිය-පරිත්තසුභය, අප්පමාණසුභය සුභකිණ්ණය යි ත්‍රිවිධ වේ.

d. චතුත්ථජ්ඣාන භූමිය-වෙහප්ඵලය, අසඤ්ඤ සත්තය සුද්ධාවාස භූමිය යී ත්‍රිවිධ වේ. ඒ:-

ශුද්ධාවාස භූමිය:-අවිහය, අතප්පය, සුදස්සය, සුදස්සිය අකනිට්ඨය යි පඤ්ච වේ.

D. අරූපාවචර භූමිය:-ආකාසානඤ්චායතනය, විඤ්ඤාණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤායතනය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතනය යි සිව් වැදෑරූම් වේ.

එහි භූමි කෙරෙහි පුද්ගල නියමය නම්:-

"පුථුජ්ජනා න ලබ්භන්ති-සුද්ධාවාසෙසු සබ්බථා,
සොතාපන්නා ච සකදා-ගාමිනො චාපි පුග්ගලා.

අරියා'නොපලබ්භන්ති-අසඤ්ඤාපාය භූමිසු,
සෙසට්ඨානෙසු ලබ්භන්ති-අරියානරියා පිච"

(සුද්ධවාස භූමියෙහි පෘථග්ජනයෝ ද සොවාන් සකෘද ගාමි ආර්‍යයෝ ද, අසඤ්ඤසත්ත ලොකයෙහි හා අපායෙහි සියලු ආර්‍යයෝ ද කිසි සේත් නො ලැබෙති. සෙසු තැන්වල ආර්‍යයෝ ද පෘථග්ජනයෝ ද යන දෙපක්ෂය ම ලැබෙති යනු භාව යි.)

භූමිචතුෂ්කපාදය යි.

2-A. අපාය පටිසන්ධිය, B. කාමසුගති පටිසන්ධිය, C. රූපා වචරපටිසන්ධිය, D. අරූපාවචරපටිසන්ධිය යි සිව් වැදෑරූම් ප්‍රති සන්ධියක් වේ. එහි -

A. අකුසල් විපාක සන්තීරණය අපායභූමියෙහි ප්‍රතිසන්ධි ගන්නා ක්ෂණයෙහි ප්‍රතිසන්ධිචිත්තය වශයෙන් ද ඉන් පසු භවාඞ්ග ස්ථානවල දී භවාඞ්ග සිත වශයෙන් ද,භව කෙළවර චුති ස්ථානයෙහි චුතිචිත්තය වශයෙන් ද පැවතී සිඳී යයි. මේ එක ම අපායප්‍රතිසන්ධිය යි. මෙය දුගිති අහෙතුක ප්‍රති සන්ධිය නම් ද වේ.

B. කුසල්විපාකොපෙක්ඛා සහගත සන්තීරණය මනුෂ්‍ය ලොකයෙහි ජාත්‍යන්ධාදී හීන සත්ත්වයන්ගේ ද චාතුර්මහාරාජික

යට අයත් ව පවතිත අපායට ඇතුලත් නැති භූමි නිශ්‍රිත හීන දෙවයොනිකයන්ගේ ද එ සේ ම ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති වශයෙන් පවතී. මෙය **සුගති අහෙතුක ප්‍රතිසන්ධි** නම්.

මහාවිපාකඅට කාමසුගතියෙහි සියලුතැන ම පටිසන්ධි භවඞ්ග චුති වශයෙන් පවතිත්. ඉන් ඤාණවිප්පයුත්ත විපාක සතරින් දෙන ප්‍රතිසන්ධි **ද්විහෙතුකප්‍රතිසන්ධි** යි. ඉතුරු සතර ද මතු කියවෙන අසඤ්ඤ සත්තය හැර ඉතුරු රූපාවචර අරූපාවචර සියල්ලද **ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි** නම්. අසඤ්ඤසත්ත ප්‍රතිසන්ධියත් අහෙතුක ප්‍රතිසන්ධියකි. මේ කුසලවිපාකාහෙතුක සන්තීරණය මහාවිපාක අටය යන නවයෙන් දෙන ප්‍රතිසන්ධි නවය **කාමසුගති ප්‍රතිසන්ධි** නම් වෙති.

මේ අපායපටිසන්ධිය කාමසුගති පටිසන්ධි නවය යන දසය **කාමාවචරප්‍රතිසන්ධි** යන නමින් ද කියනු ලැබෙත්.

මේ භවයන් අතුරෙන් වෙන වෙන භවයට වෙන වෙන ආයුෂ ගණන් නියම ව ඇතත් සාමාන්‍යයෙන් සතර අපායට ද මනුෂ්‍ය ලොකයට ද විනිපාතික අසුර නිකායට ද ආයුප්‍රමාණ ගණනකින් නියමයක් නැත්තේ ය.

සදිව්‍යලොකයෙහි දෙවියන්ගේ ආයුෂය මෙ ලෙස වේ එ නම්:-

මිනිස් අවුරුදු 50ක් එක් දිනක් වශයෙන් ඒ දින 360 ක්වූ චාතුර්මහාරාජික අවුරුදු 500ක් එහි ආයුෂයි. ඊට මිනිස් අවුරුදු 9000000කි. ඊට දෙගුණ වූ දිනෙන් ගත් තව්තිසා අවුරුදු ඒ වාගේ දෙගුණයක් එ නම්:-1000ක් එහි ආයුෂයයි ඊට මිනිස් අවුරුදු 36000000කි. මෙ සේ දවස දෙගුණ කිරීමෙන් ද ආයුෂය දෙගුණ කිරීමෙන් ද සතර ගුණ වූ ගණන් වශයෙන් යාමයට මිනිස් අවුරුදු 144000000ක් ද, තුසිතයට 576000000ක් ද, නිම්මාණරතියට 2304000000 ක් ද, පරනිම්මිත වසවත්තියට 9216000000ද වෙති.

C. ප්‍රථමධ්‍යාන විපාකය ප්‍රථමධ්‍යාන භූමියෙහි ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් පවතී. එ සේ ම පඤ්චක නයින් ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන විපාක දෙක ද්විතීයධ්‍යාන භූමියෙහි ද චතුර්ථධ්‍යාන විපාකය තෘතීයධ්‍යාන භූමි

යෙහි ද පංචමධ්‍යාන විපාකය චතුර්ථධ්‍යාන භූමියෙහි ද ප්‍රතිසන්ධි භවඞ්ග චුති වශයෙන් පවතිත්. (මේ සියලුතැන ම භූමි නාමය චතුෂ්ක නයින් වේ.) සඤ්ඤාවිරාග වශයෙන් වැඩූ පඤ්චමධ්‍යානයෙන් අසඤ්ඤසත්තයෙහි පිළිසිඳගන්නවුන්ට විපාක සිතක් නැතිව ම රූපය පමණක් ප්‍රතිසන්ධි භාවයෙන් පහළ වේ. ඉන් පසු ප්‍රවෘත්තියෙහි හා චුති කාලයෙහි ද රූපය ම පැවතී නිරුද්ධ වෙයි. මෙ සේ ධ්‍යාන විපාක පසින් හා රූප මාත්‍රයෙන්ය යි මේ සය රූපාවචර ප්‍රතිසන්ධීහු වෙති

එහි බ්‍රහ්මපාරිසජ්ජය පටන් අකනිට්ඨය දක්වා ආයුෂ ප්‍රමාණය කල්පයෙන් තුනෙන් කොටසය, ($\frac{1}{3}$)ය, දෙකෙන් කොටසය, ($\frac{1}{2}$)ය, කල්ප 1ය, 2ය, 4ය, 8ය, 16ය, 32ය, 64ය, 500ය,500ය,1000ය, 2000ය, 4000ය, 8000ය, 16000 යයි පිළිවෙළින් වෙති.

D. ආකාසානඤ්චායතන විපාකය ආකාශානඤ්චායතන භූමියෙහි ද, විඤ්ඤාණඤ්චායතන විපාකය විඤ්ඤාණඤ්චායතන භූමියෙහිද, ආකිඤ්චඤ්ඤායතන විපාකය ආකිඤ්චඤ්ඤායතන භූමියෙහි ද නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාකය නෙවසඤ්ඤා නාසඤ්ඤායතන භූමියෙහි ද ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති වශයෙන් පවතිත්. මේ සතර අරූපාවචර ප්‍රතිසන්ධීහු වෙති.

එහි පිළිවෙළින් කල්ප 20000ද, 40000ද 60000ද 84000ද ආයු ප්‍රමාණය වේ.

මෙ සේ එක භවයෙක්හි ප්‍රතිසන්ධි සිත ද භවාඞ්ග සිත ද චුති සිත ද වශයෙන් පවතින්නේ එක ම විපාක සිතකි. ඒ තුන්තැන දීම ඊට ඇතිවන අරමුණ නම් මතු කියනු ලබන සේ බොහෝ සෙයින් ම ඊට පූර්වභවයෙහි මරණාසන්න වීථියෙන් ගත් එක ම අරමුණ වේ.

යට "පුථුජ්ජනා න ලබ්භන්ති,, යනාදීන් දක්වූ පුද්ගල නියමය අත් නො හැර ම මෙහිදී දක්විය යුතු ව පැමිණි ප්‍රතිසන්ධිභෙදය අනුව පැවති පුද්ගල නියමය මෙ සේ යි.

නාදිද්වීකාමසුගතිං–රිතෙ අත්ථි දුහෙතුකො
තඤ්චාසඤ්ඤිරපායානි–රිතෙන ච අහෙතුකො.

තිහෙතුකො අසඤ්ඤිස්මිං–අපායෙ ච න ලබ්භති
පඨමාරියමග්ගට්ඨො–සබ්බාරුප්ප විවජ්ජිතො.

(මිනිස් ලොව චාතුර්මහාරාජිකය යන මූල් කාම සුගති දෙකෙහි මස අන්කිසි භවයක දුහෙතුක පුද්ගලයා ද; එම කාම සුගති දෙක හා අසඤ්ඤසත්ත ලොව සතර අපාය යන සත් තැන මිස අන් කිසි තැනක අහේතුක පුද්ගලයා ද; අසඤ්ඤසත්තය සතර අපාය යන පස් තැන ත්‍රිහෙතුක පෘථග්ජනයා ද නැත්තේය යනු භාවයි.)

මෙහි චාතුර්මහාරාජික නමින් ඊට අයිතිව පවත්නා දෙව යොනි විශෙෂයන් අදහස් කරණ ලද බව ද, ත්‍රිහෙතුක නමින් පෘථග්ජනයා කිවේ "අරියානොපලබ්භන්ති" යනාදී ගාථාර්ථය සඳහා බව ද දත යුතුයි.

අපායඤුවාදී සුගති–සෙස කාමාදි රූපිසු,
අසඤ්ඤි සුද්ධාවාසෙසු–ආරුප්පෙසු යථාක්කමං
එක එකා දසනව–නවෙකත්‍යට්ඨ පුග්ගලෙ,
සමානානං ගණෙනෙත්ථ–පච්චෙකම්පි විභාවයෙ.

(අපායෙහි එකම අහෙතුකයා ද;මනුෂ්‍ය චාතුම්මහාරාජික යන ප්‍රථම සුගති දෙකෙහි අහෙතුක දුහෙතුක පෘථජ්ජන ත්‍රිහෙතුක අටආර්‍ය්‍ය යන පුද්ගලයන් 11 ද, සෙසු කාමසුගති වල අහෙතුක ද්විහෙතුකයන් හැර|ඉතුරු නවදෙන ද, මූල් රූපාවචර දසයෙන් එම නව දෙන ද; අසඤ්ඤසත්තයෙහි එකම අහෙතුකයා ද; සුද්ධාවාස පසේ අනාගාමිඵල අරහත්ත මග්ගඵලට්ඨ අටදෙන ද,අරූපාවචරයෙහි සෝවාන්මාර්ගිකයා හැර ඉතුරු ආර්‍ය්‍ය සත් දෙනා හා පෘථග්ජන ත්‍රිහෙතුකයා ද යන අටදෙනද වෙති. සමූහයකට කී ගණන වෙන වෙන මත් යෙදෙන නිසා වෙන වෙන භව වශයෙනුත් දතහැක යනු භාව යි.)

**ප්‍රතිසන්ධිචතුෂ්ක පාදය යි.**

3. **කර්ම සතර** නම්:– (ප්‍රතිසන්ධිය දෙන) **ජනකකම්මය** (ඊට අනුබල දෙන) **උපත්ථම්භක කම්මය** (ජනක කර්මයට විරුද්ධපක්ෂයේ සිට පීඩා කරණ) **උපපීළක කම්මය**, (ජනක කර්මය නසා ඒ භවයෙන් චුතකරවන)' **උපඝාතක** හෙවත්

**උපජ්ජවෙදනීය කම්මය** යි කෘත්‍ය වශයෙන් ද; (ආනන්තරිය ආදී පව් හා නොපිරිහුණු ධ්‍යාන කුසල්ය යනාදී) **ගරු කම්මය**, (මරණ කාලයට) **ආසන්න කම්මය** (බහුලව පුරුදුකරගණ ආ) **ආචිණ්ණකම්මය**, (මේ භවයෙහි හෝ පූර්‍ව භවයක කරණ ලදුව අතියමින් පැමිණි) **කටත්තා කම්මය** යි විපාකදානපර්‍යායයෙන් හෙවත් අනතුරුභවයෙහි විපාක දීමට පැමිණීමේ අවසර පිළිවෙළින් ද; (ඉහාත්ම යෙහි ම කරණ ලදුව ඉහාත්මයෙහි ම උපත්ථම්භක උපපීළක උපඝාතක වශයෙන් විපාක දෙන) **දිට්ඨධම්ම වෙදනීය කම්මය** (ඉහාත්මයෙහි කරණ ලදුව අනතුරු ආත්මයෙහි ජනක වශයෙන් විපාක දෙන` **උපපජ්ජවෙදනීය කම්මය**, (අතියමින් යම් කිසි භවයක කරණ ලදුව අතියමින් ම කවද, නමුත් ජනකාදී සතර ආකාරයෙන් ම විපාක දෙන) **අපරාපරියවෙදනීය කම්මය**, (විපාක දෙන්ට ඉඩ නො ලැබී නියත කාලය ඉක්ම පුහු වී හෙවත් යල් පැණ ගිය) **අහෝසි කම්මය** සි. විපාක දෙන කාලය වශයෙන් ද; A අකුසලය, B. කාමාවචර කුසලය, C. රූපාවචර කුසලය, D. අරූපාවචර කුසලය යි විපාක දෙන ස්ථාන වසයෙන්ද යි යන මේ එක එක පර්‍යායකින් ම (කර්‍ම සතර) වෙති.

A එහි මේ අනතිමට කී විපාකස්ථාන පර්‍යායයෙහි a. කායකම්ම ය, b. වචීකම්ම ය, c. මනොකම්ම ය යි කර්‍මද්වාර වශයෙන් අකුසලය තුන් වැදෑරුම් වේ. ඒ මෙ සේ ය.

a. ප්‍රාණඝාත ය, අදත්තාදාන ය, (අනුලෝම් වූ මද්‍ය පානයත් ඇතුලත්) කාමමිථ්‍යාචාරය යන තුණ කාය විඤ්ඤත්ති නම් වූ කායද්වාරයෙහි බහුල ව පවත්නා හෙයින් **කායකම්ම** නම් වෙති.

b. මුසාවාද, පිසුනාවාච, ඵරුසාවාච, සම්ඵප්පලාප යන සතර වචීවිඤ්ඤත්ති නම් වූ වාග් ද්වාරයෙහි බහුලව පවත්නා හෙයින් **වචීකම්ම** නම් වෙති.

c. අභිජ්ඣා, ව්‍යාපාද, මිථ්‍යාදෘෂ්ටි ය යන තුන විඤ්ඤත්ති යෙන් පිටත් වූ සිතෙහි ම බහුල ව පවත්නා හෙයින් **මනො කම්ම** නම් වෙති.

(මෙහි බහුල ව පවත්නා හෙයිනැ යි කීවේ, තමාගේ කයින් නො කොට වචනයෙන් කියා මැරවීම් ආදිය ද; වචනයෙන් නො කියා අත හිස වැනීම් ආදියෙන් හෝ ලිවීමෙන් හෝ බොරු ආදිය හැඟවීම ද; සොළනිලීම් ගමන් උපක්‍රම යෙදීම් හිනා ඇඹුම් දත්මිටි කෑම් වැළඳුම් පිදුම් වචනයෙන් කීම් ආදියෙහි දී අභිජ්ඣාදිය තනි සිතින් පමණක් නොව කාය චිත්ත වාචාචිත්ත කායවාචාචිත්ත වශයෙන් විඤ්ඤත්ති සම්බන්ධවත් සිදුවන තැන් සඳහා අවකාශ තබන පිණිස යි.)

ඒ පාපයන් අතුරෙන් ප්‍රාණඝාත ය, ඵරුසාවාච ය, ව්‍යාපාද ය යන තුණ ද්වෙෂය මූල් කොට ඇති වෙති. මද්‍යපාන යත් ඇතුළත් කාමමිථ්‍යාචාර ය, අභිධ්‍යාව, මිථ්‍යාදෘෂ්ටිය, යන තුණ ලොභය මූල් කොට ඇති වෙති. අනිත් සතරට ලොභ දෙස මොහ යන කොයිකක් වුවත් මූල් විය හැක්කේ ය. සියලු ප්‍රකාරයෙන් ම සිටි මේ අකුසලය චිත්තොත්පාද වශයෙන් යටකී සේ දෙළොස් වැදෑරුම් වේ.

B. **කාමාවචරකුසලය** ද පවත්නා ද්වාරයෙහි හැටියෙන් කායකම්මය, වචීකම්මය, මනොකම්මය යි තුන් ප්‍රකාර වේ. එ සේ ම දාන, සීල, භාවනා වශයෙන් ද තුන් ප්‍රකාර වේ. දාන, සීල, භාවනා, අපචායන, වෙය්‍යාවච්ච, පත්තිදාන, පත්තානුමොදනා, ධම්මසවණ, ධම්මදෙශනා, දිඨ්ඨිජ්ජුකම්ම වශයෙන් දස වැදෑරුම් ද චිත්තොත්පාද වශයෙන් අට වැදෑරුම් ද වේ.

චිත්තොත්පාද වශයෙන් මෙ කී අකුසල් දෙළොසය, කාමාවචර කුසල් අටය යන විසි වැදෑරුම් වූ කර්මය **කාමාවචර කර්මය** යි සංග්‍රහ වේ.

C. **රූපාවචරකුසලය** වනාහි භාවනාවෙන් ම සිද්ධ වූ අර්පණාවෙන් පැමිණියාවූ කිසි විඤ්ඤත්තියක් හා සම්බන්ධ නැති මනොකර්මය ම වේ. එය ධ්‍යානභෙදයෙන් හෙවත් ධ්‍යානාඞ්ගයන්ගේ යෙදීම් භෙදයෙන් පස් වැදෑරුම්.

D. එසේ ම **අරූපාවචර කුසලයත්** භාවනාමයවූ අර්පණා ප්‍රාප්ත වූ විඤ්ඤත්ති හා අමිශ්‍ර මනොකර්ම වූයේ ආරම්මණ භෙදයෙන් සිව් වැදෑරුම් වේ.

විපාක ද. අසංස්කාරික කුසලය විසින් සසංස්කාරික විපාක ද නො දෙන බව යි. ඒ මතයේ හැටියට ත්‍රිහේතුක උත්කෘෂ්ට කුසලින් ප්‍රවෘත්තිවිපාක සොළසය වෙනුවට දොළසක් ද, එම ඔමකද්විහේතුක උක්කට්ඨ යන දෙකින් ම දොළස වෙනුවට දසයක්ද ද්විහේතුක ඔමකයෙන් අටක් ම ද වෙති. මේ මතය නිසි කරුණු පෙන්වා ප්‍රතිබාහනය නො කරණ ලද වුවත් බහුලවශයෙන් පිළිගෙණ නැත්තේ ය.

C. **රූපාවචරකුසල්** වලින් ප්‍රථමධ්‍යානය ස්වල්ප ව වඩා බ්‍රහ්මපාරිසද්‍යයෙහි ද, එය ම මධ්‍යම ව වඩා බ්‍රහ්ම පුරෝහිත යෙහි ද; ද්විතීයධ්‍යානය සාමාන්‍යයෙන් හා තෘතීයධ්‍යානය ස්වල්ප ව ද වඩා පරිත්තාභයෙහි ද; මධ්‍යම ව වඩා අප්පමාණාභයෙහි ද, ප්‍රණීත ව වඩා ආභස්සරයෙහි ද, චතුර්ථධ්‍යානය ස්වල්ප ව වඩා පරිත්තසුභයෙහි ද, මධ්‍යම ව වඩා අප්පමාණ සුභයෙහි ද, ප්‍රණීත ව වඩා සුභ කිණ්හයෙහි ද, පංචමධ්‍යානය පෘථග්ජන සෝවාන් සකෘදාගාමි පුද්ගලයෝ සාමාන්‍යයෙන් වඩා වෙහපඵලයෙහි ද, එය ම ,පෘථග්ජනයෝ පමණක් සඤ්ඤා විරාග වශයෙන් වඩා අසඤ්ඤසත්තයෙහි අහේතුක භාවයෙන් ද, එය ම අනාගාමීහු සාමාන්‍යයෙන් වඩා සුද්ධාවාස පහේ ද උපදිත්.

**මෙහි කී ස්වල්පව වැඩීම** නම්: උපදවා ගත් පමණ මිස වසීතාවයන් ගෙන් දියුණු නො කිරීම යි. **මධ්‍යමව වැඩීම** නම්: පමණක් දුර වසීතාවයන් ගෙන් දියුණුකර ගැණීම යි– **ප්‍රණීත ව වැඩීම** නම්:–සම්පූර්ණ වශයෙන් වසීතාවයන්ගෙන් දියුණුකර ගැණීම යි. මේ තුණට ක්‍රමයෙන් හෝඩිය පමණක් උගත් ළදරුවාගේ පොත්කීම ද, මදක්දුර උගත් ළමයෙකුගේ පොත්කීම ද, ඉතා උගතෙකුගේ පොත්කීම ද උපමා වෙයි. අවිතර්ක ව විචාරයාගේ පැවැත්ම උගහට බැවින් ද්විතීය ධ්‍යානය අවස්ථාභෙදගත නො වේ.

**සත්‍රිහු** මේ කොයි ධ්‍යානය වුවත් අරූපාවචර සිත් වුවත් කොයි ප්‍රකාරයෙන් වැඩුවත් ප්‍රථමධ්‍යාන කුසලින් බ්‍රහ්මපාරිසද්‍යයෙහි ම උපදිත්යයි ද, පුරුදුවූ මතු ධ්‍යානා

දිය එහිදී නැවත උපදවා අතිත් උසස්භව නැවත ලබති යි ද ආචාර්‍යමත යි.

D. **අරූපාවචර කුසල්** සතර ද ක්‍රමයෙන් වඩා අරූප ලොක සතරෙහි උපත්.

මේ දැක්වූ විපාකස්ථානපර්‍යාය විස්තරය ආශ්‍රය කොට ඉක්මවා ආ පර්‍යාය තුෂ්ණහි ද කර්මවිස්තරය සැලකිය යුතුය. එය සංක්ෂෙපයෙන් මෙ සේ යි: මෙහි සියලුතැන ම ප්‍රතිසන්ධි දායක වශයෙන් දක්වන ලද කර්මය **ජනක** යි. ප්‍රවෘත්තිවිපාක දායක වශයෙන් දක්වන ලද කර්ම **උපස්ථම්භක** ද, **උප පීලක** ද වෙති. මතු උපච්ඡේදක නමින් මරණයට හේතු කොට දක්වනු ලබන්නේ **උපඝාතක** යි. මාතෘඝාතකාදීන් හෝ ධ්‍යානසමාපත්ති වශයෙන් හෝ කල භවයට අනතුරු භවයෙහි නියතයෙන් ම ජනක වියයුතු කර්මය **ගරුක** යි. එබඳු කර්ම කීපයක් ඇති කල එකක් ම පල දෙයි. අනික්වාවත් නියත වූ ඒ අනතුරු භවය ඉඩගන්ට නො ලැබුන බැවින් කිසි විපාකයක් නො දී වඳ වෙති. පිරිහුන ධ්‍යාන සමාපත්ති එකක්වත් පල නොදී වඳ වෙති. මෙබඳු ගරුකර්මයක් නැති කල **ආසන්න කර්මය** ද, ඒත් **නැත්නම් ආචිණ්ණ කර්මය** ද, ඒත් නැත්නම් **කටත්තාකම්මය**ද, අනතුරු ආත්මයෙහි ජනක වේ. මේ අවශෙෂ කර්මයන් යටපත්කරමින් ජනකවීමට ඉදිරියට එන ශක්තියේ ප්‍රමාණයෙන් පමණක් එකිනෙකට වෙනස් වනු මිස ඒ තුළෙ වෙන අමුත්තක් නැත්තේ ය. ඒ දෙවෙනි ආත්මයට ජනකවන්නට නො යෙදුන හොත් අනිත් දෙකත් කටත්තාකම්ම රැසට ම එකතු වේ.

**දිට්ඨධම්මවෙදනීයකම්මය** කල භවයේ දී ම ජනකාදී සතර ආකාරයෙන් ජනක නො ව අන් යම් කිසි අන්දමකට පල දිය යුතු යි. නැතහොත් වඳ වෙයි. **උපපජ්ජවෙදනීය කම්මය** කල භවයට අනතුරු භවයෙහි එම සතරාකාරයෙන් ම පල දිය යුතු යි. නැතහොත් වඳ යි. **අපරාපරියවෙදනීය කම්මය** කවදා වුවත් අවකාශ ලත් තැනක දී එ ලෙස ම පල දිය යුතු යි. රහත්වන තුරු ජනක වන ශක්තිය ද, පිරිනිවන්

පාන තුරු ඉතිරි තුන් ශක්තිය ද, ලොවුතුරා බුදුන්ට වුවත්, පවතින බැවින් විඳත් නො වෙයි. (මිට මේ ටීකාදියෙහි ව්‍යව හාර නමට වඩා දෙශනාවට එකඟ වූ **අපරපරියායවෙදනීය** යන නම මැනවැයි සිතමි.) ඒ ඒ නියත කාලය හෝ භවය ඉක්මීමෙන් ද, රහත්වීමෙන් ද, පිරිනිවීමෙන් ද, විඳ වී ගිය දිට්ඨධම්මවෙදනීයාදී සියලු කර්ම **අහොසිකර්ම** යි.

මේ පර්‍ය්‍යාය සතරින් ජනකාදී සතරට මේ අහොසිකම්ම නමින් අදහස් කරණ ලද කොටස අතිරේකයි. සෙසු පර්‍ය්‍යා තුණ ම සර්වසංග්‍රාහක යි.

**කර්මචතුෂ්ක පාදය යි.**

4. A. ආයුෂය ක්‍ෂයවීමෙන් ද B. කර්මය ක්‍ෂයවීමෙන් ද C. ඒ දෙක ම එක විට ක්‍ෂයවීමෙන් ද D. උපච්ඡෙදක කර්ම යෙන් ද යි **මරණොත්පත්තිය** හෙවත් චුති සිත පහළවීම සතර වැදෑරුම් වේ.

A. **එහි ආයුඃක්‍ෂය මරණය** නම්–තෙල් ඉතිරි ව තිබි යදී වැටිය නිම වී පාන නිවීයාමක් මෙන් කර්ම ශක්තිය ඉතිරිව තිබිය දී භවයට නියම ආයුෂය නිමවී මිය යාම යි.

B. **කර්මක්‍ෂය මරණය** නම්:–පාන් වැටිය තව තිබිය දී තෙල් නිම වී පාන නිවෙන්නාක් මෙන් භවායුෂය ඉතිරිව තිබිය දී කර්ම ශක්තිය නිම වී නැසීයාම යි.

C. **උභයක්‍ෂය මරණය** නම්:–තෙල් හා පාන් වැටිය එකවිට නිම වී පාන නිවෙන්නාක් මෙන් ආයුෂ කර්ම දෙක එකවිට නිම වී නැසී යාම යි.

D. උපච්ඡෙදක කර්මයෙන් මරණය නම්:–තෙල් හා පාන් වැටිය ඉතිරිව තිබිය දී හුලඟ ආදී බාහිර හෙතුවකින් පාන නිවෙන්නාක් මෙන් ආයුෂ කර්ම දෙකේ ම ශක්තිය ඉතිරි ව තිබිය දී යට උපඝාතකය යි දැක්වූ යම් කිසි අමුතු කර්මයකින් නැසීයාම යි.

එ සේ මැරෙන්නවුන්ගේ මරණ කාලයෙහි සුදුසු පරිද් දෙන් ඉදිරියට පැමිණියාවූ අන්භවයෙහි ප්‍රතිසන්ධිය උපදවන

කර්‍ම කිරීම් ලක්ෂණයෙන් ම හෝ ඒ කර්‍මය කරණ කාල යෙහි උපකරණ වශයෙන් ලැබුවාවූ රූපාදී යම්කිසි කර්‍ම නිමිත්තක් හෝ, ඒ කර්‍මයෙන් උපදවන අනතුරු භවයෙහි උපභොග වශයෙන් ලැබිය යුතු යම් කිසි ගති නිමිත්තක් හෝ, කර්‍මබලයෙන් සදොරින් යම් කිසිවකට සුදුසු සේ වැට හෙයි. ඉන් පසුව එ සේ එළඹ සිටි ඒ අරමුණ ම අරබයා ඒ විපාක දෙන්ට යන කර්‍මයේ හැටිහැටියට කුසල් වූ චිත්ත පරම්පරාව උපදින්ට යන භවයට යොග්‍ය සේ ඊට නැමී ගත් තාක් මෙන් බොහෝ විට ද පවතී. හදිස්සි මරණවලදී එක් වීථිවාරය පටන් චුන්දසූකරිකාදීන්ට මෙන් සත් දිනක් පමණ කාලය දක්වා මේ මරණාසන්න කාලය නොයෙක් ප්‍රමාණ වේ. ජනකවන්නට යන පූර්‍ව කර්‍මය ම හෝ අලුතෙන් කරන්නාක් මෙන් ද්වාරයන්හි පවතින්නේ වේ. මරණයට ඉතා ආසන්න වූ ඔහුගේ ජවන වාර තදාලම්බන වාර වීථි කෙළවර *. හෝ භවාංගයන්ට ඔබ්බෙහි හෝ චුතවීම් වශයෙන් වර්‍තමාන

A එයින් උද්ධච්චසහගත සිත ප්‍රතිසන්ධියක් ගෙණ දෙන්නට අපොහොසත් හෙයින් එය හැර ඉතුරු අකුසලකර්‍ම 11 අපායභූමියෙහි දුග්ගති අහෙතුක ප්‍රතිසන්ධිය උපදව යි. ප්‍රවෘත්තියෙහිදී උද්ධච්චසිත උපත්ථම්භකාදී වශයෙන් ද සෙසුවා ජනකාදී සියලු විධියෙන්දැයි සියලු දොළොස් අකුසල කර්‍මය ම පල දෙයි. එනම් අකුසල විපාකසිත් සත උපදවයි. එ සේ ප්‍රතිසන්ධි විපාකය අපායෙහි ම දෙතත් ප්‍රවෘත්ති විපාකය සියලු කාමලොකයෙහි ද, අසඤ්ඤ භවය හැර ඉතිරි සියලු රූපලොකයෙහි ද සුදුසු සේ දෙති. (මේ සුදුසු සේ ය යි කියනලද්දේ ඒ ඒ ප්‍රසාද නැත්තවුන්ට ඒ ඒ ද්වාරික වශයෙන් වූ විපාක නැති බව සඳහා යි.)

---

* මෙහි මරණාසන්න වීථිය අතිමහන්ත විභූතාරම්මණ වශයෙන් ම මිස අනික් සතරාකාරයෙන් නො ලැබෙන බව ද එ හෙයින් ම අතීත භවංගයන් ලැබිය යුතු තැන එකකට වැඩියක් නො ලැබෙන බව ද, සමහර විටක තදාලම්බන නො ලැබී ම චුතිචිත්තයාගේ හරස්වීම් ආදිය නිසා මුත් ආයු ම[illegible]ම්කින් වත් අවිභූත තාවක් නිසාවත් නො වනබවද ආචාර්‍ය්‍යන්ට අභිමත යි. වින්‍යාස 37-44 බලනු.

B. අට වැදෑරුම් **කාමාවචර කුසලය** කාමසුගතියෙහි ම සුගති අහෙතුක, ද්‍විහෙතුක, කාම තිහෙතුක ප්‍රතිසන්ධි විපාක ද, ප්‍රවෘත්ති විපාක වශයෙන් ඒ කාම සුගතියෙහි ම මහාවිපාක අට ද, එහි පමණක් නොව අපාය රූපාවචරලෝකයන්හි පවා කුසලවිපාකා හෙතුක අට ද,සාමාන්‍යයෙන් සුද්‍රුසුසේ ම උපද වයි.

මෙතැන දී මහාකුසල මහාවිපාකයන්ගේ ලක්‍ෂණ සමාන කම නිසා රූපාවචර ලොකොත්තරයන්හි මෙන් ඒ ඒ කුසල යෙහි ඒ ඒ විපාකය යි කියා තෝරුම් නො ගත යුතු යි: යලි ත්‍රිහෙතුක උත්කෘෂ්ට කුසල්හතරපමණක් ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි සතර ද ප්‍රවෘත්තියෙහි සහෙතුකාහෙතුක කුසලවිපාක සොළ සද දෙති. ඒ සතරම|ඔමක වී නම් ද්‍විහෙතුක උත්කෘෂ්ට සතර මෙන් ම ද්‍විහෙතුක ප්‍රතිසන්ධි සතර පමණක් ද, ප්‍රවෘත්තියෙහි ද්‍විහෙතුකාහෙතුක කුසලවිපාක දොළස ද දෙති. ද්‍විහෙතුක කුසල් හතර ඔමක වුවහොත් සුගති අහෙතුක ප්‍රතිසන්ධිය හා ප්‍රවෘත්තියෙහි අහෙතුක කුසල විපාක අට පමණක් මිස ද්‍විහෙ තුකයක් වත් නො දෙති.

මෙහි **උත්කෘෂ්ටතාවය** නම් යට කී සේ අගින් මුලින් කුසලචිපි ඇතිවීමෙන් හා බොහෝ කල් නැවත නැවත ඉපද වීමෙනුත් දියුණුවට පත් බව යි. **ඔමකතාවය** නම් එ සේ ම අකුසලචිපි ඇති වීමෙන් හා බහුල නො වීමෙනුත් පහත්බැව්හි සිටීම යි.

මේ කාරණයෙහි සමහර ආචාර්‍ය්‍යවරයන්ගේ අමුතු මත යක් තිබේ. එනම්, සසංසකාරික කුසලය විසින් අසංසකාරික අවසාන සිත වූ චුතිචිත්තය ඉපද නිරුද්ධ වේ. එය නිරුද්ධවූ ඉක්බිති ඊට අනතුරු ව ම ඒ මරණාසන්න වීථිය විසින් ගන්නාලද අරමුණ අරභයා අවිද්‍යානුශයෙන් වටලන ලද තෘෂ්ණානුෂය මූල් කොට ඇති කර්මාභිසංස්කාරය විසින් උපදවන ලද්දවූ, සම්ප්‍රයුක්ත ධර්මයන් විසින් පරිග්‍රහ කරණ ලද්ද වූ, ප්‍රතිසන්ධි සංඛ්‍යාත සිත ඒ ඒ භවානුකූල ව වසතු සහිතව හෝ රහිත ව අන්‍ය භවය හා ගැළපීම් වශ යෙන් උපදින්නේම භවාන්තරයෙහි පිහිටුව යි.

මේ මරණාසන්න වීථියෙහි වස්තු ශක්තිය මඳ හෙයින් මඳව පවත්නා වූ ජවන පඤ්චකට වැඩියක් නූපදින බව යට කියන ලදී. එ හෙයින් වර්තමාන අරමුණු පසෙන් එකක් වැද දී ද එය පවත්නා කල්හි ම හෙවත් එහි චිත්තක්ෂණ දහ සත් ආයුෂය ගත වී භවාඞ්ගවන්නට මත්තෙන් චුතිසිත උපදී ද එ සේ කල ඊට අනතුරු ප්‍රතිසන්ධි භවාඞ්ගයන්ට ද වර්තමාන අරමුණු ලැබෙන්ට පුළුවන් බව සැලකීමෙන් කාමාවචර ප්‍රතිසන්ධියට සදෙරින් ගන්නාලද කම්මාලම්බනය අතීත වශයෙන් පමණක් ද ලැබෙන බව දතයුතුයි. මේ කම්මාදී තුන්වැදෑරුම් වූ ද රූපාදී සයවැදෑරුම්වූ ද කාමාවචර ප්‍රතිසන්ධිය සම්බන්ධ අරමුණු සියල්ල ම කාමාවචර අරමුණු ම බව නියතයි.

රූපාවචර ප්‍රතිසන්ධියට කසිනාදි පඤ්ඤත්තිමය වූ ම කම්මනිමිත්ත අරමුණු වේ.

එ සේම අරූපාවචර ප්‍රතිසන්ධියට යට ආලම්බන සංග්‍රහයෙහි කී ලෙස පඤ්ඤත්තිමයවූ හෝ මහද්ගතවූ හෝ කම්මනිමිත්තම සුදුසු සේ අරමුණු වේ. අසඤ්ඤසත්තයන්ට මතු කියන ජීවිත නවක රූපයම ප්‍රතිසන්ධි වශයෙන් පහළ වේ. එහෙයින් ඔවුහු කිසි අරමුණක් නොගන්නා රූපප්‍රතිසන්ධිකයෝ නම් වෙති. ආරූප්‍යයෝ අරූප ප්‍රතිසන්ධිකයෝයි, ඉතුරු සියල්ල රූපාරූප ප්‍රතිසන්ධිකයෝයි.

“ආරුප්පචුතියා හොන්ති–හෙට්ඨිමාරුප්පවජ්ජිතා,
පරමාරුප්පසන්ධී ච–තථා කාමෙ තිහෙතුකා.

රූපාවචර චුතියා–අහෙතුරහිතා සියුං,
සබ්බාකාම තිහෙතුම්හා–කාමෙස්වෙව පනෙතරා.”

(අරූපාවචර ලෝකයෙන් චුතවූවන්ට ඒ චුතියට අනතුරුව ඒ චුත වූ ලෝකයට පහත් ආරූප්ප ප්‍රති සන්ධි හැර ඊට උසස් ආරූප්ප ප්‍රතිසන්ධි ද, කාම සුගතියෙහි ත්‍රිහෙතුක ප්‍රතිසන්ධි ද යන මෙ පමණක් ලැබෙති. රූපාවචර ලෝකයෙන් චුතවූවන්ට අහෙතුක ප්‍රතිසන්ධි හැර අනික් සියල්ල ලැබේ. කාමාවචර ත්‍රිහෙතුක චුතවූවන්ට අහෙතුකයෙහි පටන් අරූපාවචරය දක්වා සියලු ම ප්‍රතිසන්ධි ලැබෙත්. අන්‍ය වූ දුහෙතුක අහෙතුක චුතිවලින් චුතවූවන්ට කාම ලෝකයෙහි පමණක් සියලු ම ප්‍රතිසන්ධි ලැබෙති.)

චුති ප්‍රතිසන්ධි ක්‍රමය යි.

මෙසේ ගන්නා ලද ප්‍රතිසන්ධිය ඇත්තවුන්ගේ ඒ ප්‍රතිසන්ධි සිත භවංග වූ තැන් පටන් එම අරමුණ අරබයා එම සිත ම (චුති වශයෙන් උපදින අන්තිම වාරය දක්වා) වීථි චිත්තොත්පාදයක් නැති සියලු කල ම නැවත නැවත වෙන වෙන චිත්තොත්පාද වශයෙන් උපදිමින් භවයාගේ ශරීර භාවයෙන් සැලකිය යුතු හෙයින් භවාඞ්ග නාමය ලැබ ගඞ්ගා ජලප්‍රවාහයක් මෙන් පෙල නො සිඳ පැවතී අන්තිමවාරට ච්‍යුති කෘත්‍යය කරමින් චුතිනමින් ඉපිද නිරුද්ධ වෙයි. ඉන් පසුව අතීක් භවයෙහිත් ප්‍රතිසන්ධ්‍යාදිය එලෙස ම රථ චක්‍රයක් මෙන් පෙරළෙමින් මතු මතු ගමන් කෙරේ.

මෙහි කී මරණාසන්න වීථිය, චුතිය, පටිසන්ධිය, අභිනව භවයෙහි මුල්කොටස යන මේ සියල්ල 37 වැන්න පටන් 46 වැන්න දක්වා වින්‍යාසවලින් බලා ගත යුතු යි.

## 37 වැනි වින්‍යාසය

තදාලම්බන භවංග චුතික්‍රමය ලැබෙන මරණාසන්න
අතිමහන්තාරම්මණ වීථිය.

පච්චුප්පන්න කම්මනිමිත්ත පඤ්චාරම්මණ. /

| ක: | කි: | ගි: | | | | | | | | | | | | | | පි. | | අනී. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | න | උ | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | චු | ප | භ |

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

## 38 වැනි වින්‍යාසය

තදාලම්බන චුතික්‍රමය ලැබෙන මරණාසන්න
අතිමහන්තාරම්මණ වීථිය.

පච්චුප්පන්න කම්මනිමිත්ත පඤ්චාරම්මණ /

| ක: | කි: | ගි: | | | | | | | | | | | | | | පි. | | අනී. | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | තී | න | උ | පං | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | චු | ප | භ | භ |

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

## 39 වැනි වින්‍යාසය

ජවන භවංග චුතික්‍රමය ලැබෙන මරණාසන්න
අතිමහන්තාරම්මණ වීථිය.
පච්චුප්පන්න කම්මනිමිත්ත පඤ්චාරම්මණ.

| ක: | කි: | ශි: | | | | | | | | | | | | | වි. | | | අකි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | න | ද | ප | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | භ | චු | ප | භ | භ |

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

## 40 වැනි වින්‍යාසය

ජවන චුතික්‍රමය ලැබෙන මරණාසන්න
අතිමහන්තාරම්මණ වීථිය.
පච්චුප්පන්න කම්මනිමිත්ත පඤ්චාරම්මණ

| ක: | කි: | ශි: | | | | | | | | | | | | | වි. | | | අකි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ති | න | ද | ප | ප | ච | සං | ණ | වො | ජ | ජ | ජ | ජ | ජ | චු | ප | භ | භ | භ |

1 2 3 4 5 6 7 8 9 10 11 12 13 14 15 16 17

## 41 වැනි වින්‍යාසය

තදාරම්මණ භවංග චුතික්‍රමය ලැබෙන විභූත පච්චුප්පන්න
රූපධම්මාරම්මණ මරණාසන්න වීථිය.
පච්චුප්පන්න ගතිනිමිත්තාරම්මණ

| ක; | කි; | ශි; | | | | | | | | | | | | වි: | | | | | අශි. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | භ | චු | ප | භ | භ | භ | භ | භ |

## 42 වැනි වින්‍යාසය

තදාරම්මණ චුතික්‍රමය ලැබෙන විභූත පච්චුප්පන්න රූපධම්මා
රම්මණ මරණාසන්න වීථිය.
පච්චුප්පන්න ගතිනිමිත්තාරම්මණ.

| ක: | කි: | ශි: | | | | | | | | | | වි | | | | | | | අශි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| භ | ති | න | ද | ම | ජ | ජ | ජ | ජ | ජ | ත | ත | චු | ප | භ | භ | භ | භ | භ | භ |

## 43 වැනි වින්‍යාසය

තදාරම්මණ භවංග චුතික්‍රමය ලැබෙන විභූත වත්තමානාතීත අරූප අතීත රූපධම්මාරම්මණ මරණාසන්න වීථිය.



## 44 වැනි වින්‍යාසය

තදාරම්මණ චුතික්‍රමය ලැබෙන විභූත වත්තමානාතීත අරූප, අතීත රූපධම්මාරම්මණ මරණාසන්න වීථිය.



## 45 වැනි වින්‍යාසය

ප්‍රතිසන්ධිචිත්තය පටන් භවංග සොළසකින් ආවජ්ජනයවන භවනිකන්ති (ලොභ) ජවනවාර අවිභූතාරම්මණ වීථිය.



## 46 වැනි වින්‍යාසය

ආද්‍යන්ත සීමාසහිත අසඤ්ඤසත්ත භවය.



මේ වීථිවල "අ කා: අ. කාලවිමුත්ත කි: ආ." අතීත කම්ම හෝ අතීත කාලවිමුත්ත කම්මනිමිත්ත හෝ ආරම්මණය යන්න වෙනුවටද, "අ ගි." අතීත බවට පැමිණි ගතිනිමිත්ත යන්න වෙනුවටදැ යි මේ සේ "අ" අතීත යන්නද, "පටි" පටිසන්ධි චිත්තුප්පාදයද: " " (දෙපොලේ මේදෙක එකතුව) මේ මරණාසන්නවීථියෙන් ගත් අරමුණම ඉම් පටිසන්ධියේ පටන් මුලු අළුත් භයට භවංග අරමුණැයි ද; "+" 45 වැනි විත්‍යාසය මෙතන යොදා සැලකිය යුතු අර්ථයක් ඇත්තේය යිද; "++" 37 වැනි විත්‍යාසයේ පටන් මේ තාක් දක්වූ වීථිවලම පටි සන්ධියෙන් මතු භවංග භයක් පැවති තැනට මෙය සම්බන්ධවන බව ද; "——" මෙ සේ අරමුණු රූලකට යටින් එන අරමුණු රූලකම තිත්රූල් කැබැල්ල පරණ භවයේ මරණාසන්න වීථියෙන් ගත් වර්තමාන අරමුණ අළුත් භවයෙහිත් වර්තමාන වශයෙන් ම අරමුණු කරණ සිත්ගණන ද; චිත්තුප්පාදයන්ට යටින් එන තිත්රූල් කැබැල්ල අභිනව භවයේ කොටස ද; "පටි රූ" පටිසන්ධි වශයෙන් පහළ වූ රූපය ද; "චු. රූ." චුති වශයෙන් නිරුද්ධවන රූපය ද; අදහස් කොට ලියන ලදි.

39 වැනි 41 වැනි 43 වැනි විත්‍යාසවල ජවනචුති, තදාලම්බනචුති, අතර භවංග එකට වැඩිවෙන්වත්; 41 වැනි සහ 42 වැනිවූ ද; 43 වෙනි සහ 44 වැනි වූ ද විත්‍යාස යුග්ම දෙකේ චුතියට ආසන්නව අංවර්ජනය විම, අකාමාවචර අරමුණ හෝ සත්වයාවීම, යනාදී හෙතුන් හුදුසු සේ ලැබී තදාලම්බන නූපන් කල 39 වැනි 40 වැනි විත්‍යාසවලට ප්‍රතිභාග වූ ඒ ඒ මනොද්වාරික වීථි වශයෙන් අත්‍ය යුග්ම දෙකක් වෙන් වත් පුළුවන් බව පතුලේ "භ භ" යන ලකුණෙන් හඟවන ලදී.

### චතුර්විධ මරණොත්පත්ති පාදය යි.

"පටිසන්ධි භවඞ්ග වීථියො,
චුතිචෙවහ තථා භවන්තරෙ,
පුන සන්ධි භවංගම්චචයං,
පරිවත්තති චිත්තසන්තති.

පටිසන්‍ධායපතෙතමඞ්ගුවං,
අධිගන්තෙපදමචවුතං බුධා,
සුසමුච්ජින්නා සිනෙහබන්ධනා,
සමමෙස්සන්ති චිරාය සුබ්බතා"

(ප්‍රතිසන්ධි ය, භවාඞ්ගයෝ ය, වීථිහු ය, චුති ය, යන මොහු මෙකී ලෙස වර්තමාන භවයෙහි ද; නැවත එ සේ ම අන්‍ය භවයෙහිත් ප්‍රතිසන්ධිය, භවඞ්ගය යන පිළිවෙළින්දු යී මේ චිත්තපරම්පරාව චක්‍රයක් මෙන් පෙරලෙමින් පවතී.

මේ අනිත්‍ය වූ ප්‍රත්‍යය වූ පරිද්දෙන් පැවති ධාතු රාසීන් ගේ පරම්පරාව පැවතීම් සඞ්ඛ්‍යාත සසර නො හොත් චිත්ත චෛතසික සඞ්ඛ්‍යාත නාමධර්මය නුවණැත් තෝ ප්‍රත්‍යවෙක්‍ෂා කොට යහපත් ව්‍රත ඇති ව කලක්වියයී වඩා නිවණ ප්‍රත්‍යක්‍ෂ කිරීම් වශයෙන් ලැබ ගෙණ තෘෂ්ණාබැම්ම සිඳ නිරුපධිශෙෂ නිවණින් සියලු සංස්කාරයන්ගේ සමථය සිද්ධකොරෙත්.)

## පස්වන වීථිමුක්තක සංග්‍රහකාණ්ඩය යි.

මෙතෙක් දක් වූ පරිච්ඡෙද පසින් ම චිත්ත චෛතසික පරමාර්ථ ෙදක නොයෙක් නයින් සංග්‍රහ කරණ ලදුව මේ පරිච්ඡේදයෙහි තුන්වන පරමාර්ථය වූ රූපය සංග්‍රහ කරණ ලැබේ.

III. රූපය නම්:. යට කී සේ ආධ්‍යාත්මික බාහිර වූ ඖදරික ධර්මය යි.

ඒ රූපයාගේ සංග්‍රහය A. සමුද්දස B. විභාග, C. සමුට්ඨාන, D. කලාප, E ප්‍රවෘත්තික්‍රම, යන පස්පරිද්දකින් වේ. එහි:–

A. රූප 28ක් වෙති. එ නම්;–

පඨවිධාතු– නම්: සත්ව වෘක්‍ෂ ලතා ගල් පස් ආදි ඝණ ද්‍රව වායු යන ත්‍රිවිධරූපයෙන් ම සිටින වස්තූන්ගේ දැඩි මෘදු රළු සිලුටු දළ සිහින් මොට තියුණු බර සැහැල්ලු සමතල වළ ගොඩලි උකු දියාරු යන මේ ආදී ගති විශෙෂ යි. මේ නානා ප්‍රකාරයෙන් වැටහෙන ස්වභාවයෝ කර්කශභාවයාගේ හෙවත් බර භාවයාගේ විශෙෂයෝ යි.

**2. ආපෝධාතු**– නම්: එකී සියලු කොටස් අන්‍යෝන්‍යයා කෙරේ බැඳී පවත්නාවූ ද ඒ් වස්තූන් අන්‍යෝන්‍යයා කෙරෙහි ඇදී පවත්නාවූ ද ගතිවිශෙෂ යි.

**3. තෙජෝධාතුඃ**– නම්; එම කී සියලු වස්තූන්ගේ ම උෂ්ණ ශීතාදී ලක්‍ෂණයෙන් වැටහෙන ගති විශෙෂ යි.

මෙහි ස්පර්ශ කරණ කායෙන්ද්‍රිය සම්බන්ධ වූ තෙජෝ ස්‍ඵුට ය්ට වැඩි ස්‍ඵුට සියල්ල ම උෂ්ණ වශයෙන් ද, අඩු සියල්ල ශීතල වශයෙන් ද ස්පර්ශ කරනු ලැබේ. මේ ස්‍ඵුටය ත් පුද්–ගලයෙක් පාසා නානා ප්‍රකාරයෙන් වෙනස් වේ. එ හෙයින් කෙණෙකුට උෂ්ණ වූ දෙශගුණාදියක් අනිකෙකුට ශීතල ද වියහැකි. මෙසින් ම "අප්සු ශිතතා" (අපොධාතුවෙහි ශීතත්ව ය වෙයි.) "ශිතස්පර්ශී වාතාපඃ" (ශීතස්පර්ශය ඇත්තේ ආපො ධාතුව යි) යන මිථ්‍යාදෘෂ්ටීන්ගේ වචනය කීදී සුගතවචනය පිහිටයි.

**4. වායොධාතුඃ**– නම්: එම කී සියලු වස්තූන්ගේ සියලු සුලු මහත් කොටස්වල ද මුලු වස්තූන්ගේ ම ද සැලීම, පෙරලීම, වෙව්ලීම, පැදීම, දෙදරුම්කෑම, පිපීම, හැකිලීම, ගමනය යනාදී නානාප්‍රකාරයෙන් වැටහෙන අතිශචලතා වෙහි ගති විශෙෂ යි.

**5. චක්ඛු**– නම්: සතර මහා භූතයන් නිසා පවත්නා ප්‍රසාද සංඛ්‍යාත වූ රූප දැක්මට අතිශයින් උපකාර වූ චක්ඛු පිණ්ඩය තුළ පිහිටියා වූ චක්ඛුවිඥ්ඥාණයට වස්තු වූ රූපය යි.

**6. ශොත**– නම්: සතර මහා භූතයන් නිසා පවත්නා ප්‍රසාද සංඛ්‍යාත වූ ශබ්ද ඇසීමට අතිශයින් උපකාර වූ කන් සිදුර තුළ පිහිටියා වූ සොතවිඥ්ඥාණයට වස්තු වූ රූපය යි.

**7. ඝාණ**– නම්: සතර මහා භූතයන් නිසා පවත්නා ප්‍රසාද සංඛ්‍යාත වූ ගන්ධාඝ්‍රාණයට අතිශයින් උපකාර වූ නාස්සිදුර තුළ පිහිටියා වූ ඝාණවිඥ්ඥාණයට වස්තුවූ රූපය යි.

**8. ජිව්හා**– නම්: සතර මහා භූතයන් නිසා පවත්නා ප්‍රසාද සංඛ්‍යාත වූ රස සායනයට අතිශයින් උපකාර වූ දිව හා උඩුතල්ලේ මෘදු කොටසෙහි පිහිටි ජිව්හාවිඥ්ඥාණයට වස්තු වූ රූපය යි.

9. **කාය**– නම්: සතර මහා භූතයන් නිසා පවත්නා ප්‍රසාද සංඛ්‍යාත වූ ස්ප්‍රෂ්ටව්‍ය ස්පර්ශයට අතිශයින් උපකාරවූ උපාදින්න කයෙහි පිහිටියා වූ කායවිඤ්ඤාණයට වස්තු වූ රූපය යි.

10. **රූප** (ආයතන)– නම්: යටකී වස්තූන්ගේ ම නීලපීතාදීවූ ද වට සතරැස් ආදි වූ ද ඇසින් දක්ක යුතු වූ චක්ඛුවිඤ්ඤාණයට අරමුණු වූ සතර මහා භූතයන් නිසා පවත්නා වර්ණය යි.

11. **සද්ද**– නම්: යටකී වස්තූන්ගේ ම බෙරහඬ, කට හඬ, ගැටෙනහඬ, බිඳෙනහඬ ආදී වූ කණින් ඇසිය යුතු සෝතවිඤ්ඤාණයට අරමුණු වූ සතර මහා භූතයන් නිසා පවත්නා වූ ශබ්දය යි.

12. **ගන්ධ**– නම්: යට කී වස්තූන්ගේ ම සුවඳ දුගඳ යනාදී වූ නාසයෙන් ආඝ්‍රාණය කළ යුතු වූ ඝාණ විඤ්ඤාණයට අරමුණු වන සතර මහා භූතයන් නිසා පවත්නා ගන්ධය යි.

13. **රස**– නම්: යටකී වස්තූන්ගේ ම ලුණු ඇඹුල් යනාදී වූ දිවෙන් සායනය කළ යුතු වූ ජිව්හා විඤ්ඤාණයට අරමුණු වන සතර මහා භූතයන් නිසා පවත්නා රසය යි.

14. **ඉත්ථින්ද්‍රිය**– නම්: ස්ත්‍රී ජාතික සත්ත්වයන්ගේ කයෙහි කෙස් ලොම් සම් මස් ඇට නහර කලා ආශයාදී සියලු ශාරීරයන් සම්බන්ධ ව මුලුකයෙහි පැතිර ස්ත්‍රී සජාතිකයන්ට සාධාරණ ව පුරුෂ ජාතිකයන් ගෙන් වෙනස් ව ඇතිවන්නා වූ ස්ත්‍රී භාවරූපය යි.

15 **පුරිසින්ද්‍රිය**– නම්: පුරිස ජාතික සත්ත්වයන්ගේ කයෙහි කෙස් ලොම් සම් මස් ඇට නහර කලා ආශයාදි සියලු ශරීර යන් සම්බන්ධව මුලු කයෙහි පැතිර පුරුෂසජාතිකයන්ට සාධාරණ ව ස්ත්‍රීජාතිකයන්ගෙන් වෙනස් ව ඇති වන්නා වූ පුරුෂ භාවරූපය යි.

16. **හදය**– නම්: මුලු සත්ත්වකය පිළිබඳ ව පවත්නා වූ මනොධාතු හා රූපීන්ගේ මනො විඤ්ඤාණ ධාතු යන මොවුන්ට වස්තු වූ රූපය යි.

අභිධර්මයට අයිති මීට මේ "හදය" යන නාමය බුදුන් විසින් වදාරණ ලද්දක් නො ව ආචාර්‍ය්‍යවරයන් විසින් හෘදය

පිණ්ඩය වෙන්ට ඇතැ යි සිතාගෙණ යොදන ලද්දකි. රුසී වශයෙන් ඒ නම ම ව්‍යවහාර කරමින් මත් එහි සවභාව දැන සිටිය යුතු වේ. පිළිකුල් භාවනාවේ අඹංගු හෘදය පිණ්ඩය මේ රූපය යි කියා සමහරු ද, මොළය මේ රූපය යි කියා සමහරු ද, ඒ දෙකේ සාමාග්‍රිය (එකඟතාවය)යි ද සමහරු කියති. ඒ හෘදය පිණ්ඩ මතය ඇත්තෝ හෘදය පිණ්ඩය වත් හරිහැටි නො දනිති. ඒ මෙසේ යි:–එහි තුළ සිදුරක් තිබේ ය යි ඔව්හු කියති නුමුත් එකක් නො ව ගැබි සතරක් තිබෙත්. මේ කාරණය අප වචනයෙන් නො ව ප්‍රස්තාව ලැබුනු විටක තමාට ම සියැසින් බලා අදහා ගත හැක්කකි. සිතේ හැටියට නොයෙක් වර්ණවත් වන්නාවූ අඹපතක් පමණ ලෙයක් එහි නැවතී සිටී ය යි ඔවුන් කියතත් මුළුශරීර ගත සියලු ලෙය ම එයි තුළින් යන්ත්‍ර (පොම්ප) කරණු ලබමින් මොහොතක් වත් රැඳී නො සිටියි. එ සේ වුව හොත් එවලේම මරණය සිදු වේ. මුලු කයෙහි සැරිසරා ආ දූෂ්ට ලෙස කිළුටු වර්ණයෙන් ගැබි දෙකක් තුළින් පෙණපපුවට ද, පෙණපපුවෙහිදී ශ්වාසවාතාශ්‍රයෙන් ශුද්ධවී ආ ලෙය දීප්තිමත් ඉන්ද්‍ර ගෝපක වර්ණයෙන් අනික් ගැබිදෙකතුළින් ඇහට ද යන්ත්‍රනය (පොම්ප) වන අතර නිතර ම ඒ ලෙය මෙකී දෙවර්ණයෙන් වෙන වෙන ම ගලායයි. මෙය ද සියැසින් දුටු වෙදුන්ගෙන් අසා දැන ගත හැකි කාරණයකි. නුවණැතියන්ට පිපී තිබේ ය යි ද අඥානයන්ට හැකිලී තිබේ ය යි ද කියතත් නුවණ ඇති නැති සියල්ලන්ට සම ව නිතර ම (ඉන්ඩියාරබර් පොම්ප) යන්ත්‍රයක් මිරිකමින් පිණිදිය විදින්නාසේ ද, (එම) වස්ති යන්ත්‍රයක් මිරිකමින් බෙහෙත් විදින්නාක් මෙන් ද, හැකිලී හැකිලී පිංපමින් හෘදය පවතී. මේ ක්‍රියාව සැබෑබව ළයෙහි වමට හුරුව අත තබා එබීමෙන් කාටවුවත් දැනගතහැකි වේ. ඒ බලවත් ව විදෙන ලේ ධාරාව ඇගේ නොයෙක් නහරවල නාඩි ඇල්ලීමෙන් රැළ ආකාරයෙන් දුවනවා දැනගත හැක්කේ ය. හෘදයෙහි මේ ක්‍රියාව මොළය තමා කෙරෙන් එහි පැමිණ තිබෙන මොළනහර මාර්ගයෙන් සිදු කරයි. මොළය මේ හෘදය විසින් තමා කෙරෙන් එහි පැමිණ තිබෙන ලේ නහර මාර්ගයෙන් ලේ යවා පෝෂ්‍යය කරනු ලැබේ.

මොළය බෙදී තිබෙන බොහෝ කොටස් අතුරෙන් එකක් එකක් ම එක එක සංඥා විශේෂාදී චෛතසික ධර්මයන් කෙරෙහි බලය පවත්වන බව කොයි තරම් පිරිසිදු කොට සොයා දැන් තිබේ දැ යි යත හොත්, මෘත ශරීරයක මොළය ගෙණ පරීක්ෂාකොට ඒ මළ අයගේ පැවති මානසික ගති බොහොමයක් කියන්ට පුළුවන් උගත් වෛද (දෙස්තර) වරු බොහෝ සිටිත්. එ හෙයින් මොළය චේතනා වස්තුව කොට සලකන්නට දෙස් නො කිය හැක්කේ ය. එතකුදුවුවත් ඊට ප්‍රත්‍යය දෙන හෘදයත් එහි ම අඞ්ගයක් කොට ගෙණ ඒ දෙදෙනාගේ සාමග්‍රිය යි කිම වඩා යෝග්‍ය වේ. මේ දෙක අන්ධයා පිළා ඔසවා ගෙණ යමින් ද පිළා අන්ධයාට මග කියමින් ද දෙදෙනා ම රැකෙන්නාක් මෙන් මේ අන්ධ පංගු න්‍යායෙන් අන්‍යොන්‍යයාහට උපකාරවන බව නිශ්චිත යි.

එ හෙයින් ම හෘදයට වූ පීඩාවෙන් ද මොළයට වූ පීඩාවෙන් ද යන දෙකින් ම අන්‍යොන්‍යයාහට දෙන ප්‍රත්‍යය සිඳීමෙන් වහා මරණය වේ. එපමණ හදි නුවූවත් පීඩාවෙන් මරණය ගෙණ දෙන වෙතනත් ස්ථාන බොහොමයක් කයෙහි ඇත්තේ ය. මේ මරණයවන්නට හේතුව නම් රූපී භවංගයට ඒකාන්ත වස්තු වූ රූපය නැසීම යි. මෙයින් ඒ වස්තුරූපය මොළය හා හෘදය ප්‍රධාන කොට ද, යථොක්ත මරුතැන් ඉන් අඩු වශයෙන් ප්‍රධානව ද පවතින බව ද, ඒවායින් එකක් නියම කිරීම නුසුදුසු බව ද ඔප්පු වෙයි. ඉතින් මේ රූපය කොතනක සිටී දැ යි සලකන කල මුළු ශරීරයේ ම පිහිටි ලේ නහර හෘදයේ කොටස් වෙති. මුලු ශරීරයේ ම පිහිටි සංඥා භාවාදී නම් ලත් මොළ නහර මොළයේ කොටස් වෙති. (ගස් තිබෙන ස්ථානයෙන් බොහෝ ඈත ගියාවූ ඉතා සිහින් මුල් නරෑ වුවත් එම ගසේ කොටස් වා මෙනි.) ඒ දෙකේ සාමග්‍රිය මුලුශරීරයෙහි ම පවතී.

එසේ හෙයින් කායෙන්ද්‍රිය දිවඅග ඇඟිලි අග බලවත්ව පවතිතත් මුළු කයෙහි ම පවතින්නාක් මෙන් ද භාව රූප දෙක රහස්‍යාදියෙහි බලවත් ව පවතිතත් මුළු කයෙහි ම පවත්නාක් මෙන් ද, ආහාර රූපය රස හරණියෙහි බලවත් ව පවතිතත් මුළු කයෙහිම පවත්නාක් මෙන් ද, ජීවිතෙන්ද්‍රිය

ශෘඞ්ගාටක අධිපති ශංඛාදී සමහර මරුතැනක බලවත් ව පවතිපත් මුළු කායෙහිම පවත්නාක් මෙන් ද මේ හෘදය නමින් ව්‍යවහාර කරන්ට පුරුදු වී ති-බනම තොධාතු මනෝ විඤ්ඤාණ ධාතු න්ගේ වස්තු රූපයත් මොළය හෘදය දෙකෙහි බලවත් ව හෙවත් ඒ දෙක ප්‍රධාන කොට පවතිතත් මුළු කායෙහිම පවතී මැ යි. මේ මතය අභිධර්ම බුඩදේශනාවට වත් සයුක්තික ශාස්ත්‍රයටවත් විරුද්ධ නො වේ.

මේ රූපය බුදුන් විසින් හඳුන්වා දී තිබෙන්නේ "**යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණ ධාතු ච පවත්තන්ති තං රූපං**" (යම් රූපයක් නිසා මනොධාතු ව ද, මනොවිඤ්ඤාණ ධාතුවද පවතිත් ද ඒ රූපය)යි කියා පමණක් මිස හදය රූපය යි කියා වත් නොයි අතික් රූපයකැයි කියාවත් නොවන බව දැනගෙණ, පොත්වල තිබෙන නිසා බුද්ධ වචනයක් වෙන්ට ඇතැයි සිතා යුක්ති පිළිගැණීමට සිතේ උපදින අස්ථාන භය දුරු කර ගත යුතුයි. මේ ගැණ හෘදය පිණ්ඩය ම ය යි කියන පක්ෂය විසින් භයක් වූ කල ලය ගැසීමත්, කණගාටුවෙන් ලය දැවිල්ලත් ඇතිවන බව හෘදය චේතනාස්ථානය බවට සාක්ෂියකැ යි කියනු ලැබේ. ඒ දෙකම මොළය විසින් මොළ නහර මාර්ගයෙන් හෘදයෙහි කාරණ විකාර බව නො දනිති. එලය පමණක් මිස හෙතුව නො දැන සලකන ඔවුන් ගෙන් කණගාටුවට කඳුළු ගැලීමත්, කොපයේදී රැවීම හා දත්මිටි කෑමත්, උසකින් ලිස්සා වැටී මක් දුටුකල තමාගේ කකුල් හිරිවැටීමත්, යන මේ ආදි රහස් නො රහස් බොහෝ කාරණා සිදුවිමට හෙතුව ඒ ඒ තැන චේතනාස්ථානය නිසා දැ යි ඇසිය යුතු.

සාමාන්‍යයෙන් තමාගේ අතින් 18 රියනක් හා හරස් අඟල් 16 ක් දිග ඇති ලැබුනු විටක මැන බලන්ට පුළුවන් බඩවැල 32 රියනකැයි බාහිරක අනාත්මවාදයන්ට අනුව නියම කළ ආචාර්‍ය්‍යවරයන් විසින් කියන ලද උපන් උපන් හිතේ හැටියට හෘදය ලෙයෙහි වර්ණය වෙනස්වීම් ආදිය අදහනු කැමැත්තෙකුට කුමකට හරස්වෙමු ද? වේදවාදීන් ආදීන්ගේ එබඳු මතවල් හා කියමන් බුඩාගම නො වෙනවා පමණක්

නොව එබඳු මිථ්‍යා මත කෙරෙහි ශ්‍රද්ධාව පිහිටුවා පොත්වල ලියා තැබූ එකට බුද්ධාගම පලිවත් තමාගේ තමාගේ ඇස් කන් ආදියෙන් පවා දැන ගත හැකි ඉන්ද්‍රිය සාක්ෂිකා වූ සත්‍යයට පිරිපා. එ බොරු අදහගන්නට ලෝවැස්සා පලිවත් නොවන්නේ ම ය.

17. (රූප) **ජීවිතෙන්ද්‍රිය** නම්:- සත්වයන්ගේ මුලු දෙහය සම්බන්ධ රූපධර්මයන්ගේ දරා සිටීම හෙවත් ආයුෂය යි. මෙය මහනෙල් රක්නා දිය මෙනි. මීට නති ජීවිතින්ද්‍රිය යන නම හොඳට ම හැඟෙන තැනකදී ව්‍යවහාර කරනත් චෛතසික වූ නාම ජීවිතින්ද්‍රියෙන් වෙන්කිරීමට රූපජීවිතින්ද්‍රිය ය යි කීම වඩා යොග්‍ය යි.

18. **ආහාර**; නම්:- සියලු රූපධර්මයන් පොෂ්‍ය කරණ ඔජාව යි. මෙය අල ධාන්‍යාදියෙහි පැලය පොෂ්‍යය කරණ පිටි මෙනි. මෙය ඵස්ස චෙතනා විඤ්ඤාණ යන අරූපී ආහාර යන් ගෙන් වෙනස් කරණ පිණිස කබලිංකාරාහාරය යන නමින් ද කියනු ලැබේ.

19. **පරිච්ඡෙද**; නම්:- සියලු රූපයන්ගේ පරිච්ඡෙද ය වූ ආකාශ ධාතුව යි.

20. **කායවිඤ්ඤත්ති**; නම්:- සිත හෙතු කොටගෙණ කයින් කරණු ලබන යාම් ඊම් ආදී සියලු ක්‍රියා විශෙෂ යි.

21. **වචිවිඤ්ඤත්ති**; නම්:- සිත හෙතු කොටගෙණ කයින් කරණු ලබන කථා හැඬීම් ආදී වූ සියලු ක්‍රියා විශෙෂ යි.

22. (රූපයාගේ) **ලහුතා**; නම්:- දෙහය සම්බන්ධ ක්‍රියාවන් සඳහා බරබවට ප්‍රතිපක්ෂ වූ සැහැල්ලු බව යි. හෙවත් නීරොගිතාව වැනි ගතිය යි.

23. (රූපයාගේ) **මුදුතා**- නම්: දෙහය සම්බන්ධ ක්‍රියාවන් සඳහා දරදඬු වැනි ගතියට ප්‍රතිපක්ෂ වූ මෘදු තාවයි.

24. (රූපයාගේ) **කම්මඤ්ඤතා**- නම්: දෙහය සම්බන්ධ ක්‍රියාවන් සඳහා අනුකූල බව යි.

25. (රූපයාගේ) **උපචය**- නම්: සියලු රූපයන්ගේ ප්‍රථම උත්පාදය යි.

26. (රූපයාගේ) **සන්තති**– නම්: සියලු රූපයන්ගේ උත්පාදය ම මතු මතු නො කඩව පැවැත්ම යි.

මේ උපචය සන්තති වශයෙන් ද්විප්‍රකාරවූයේ ජාති රූප ය යි හෙවත් රූපයාගේ ජාතිය යි.

27. (රූපයාගේ) **ජරතා**– නම්: සියලු රූපයන්ගේ ම දිරීමට පත්වීම යි.

28. (රූපයාගේ) **අනිච්චතා**–නම්: සියලු රූපයන්ගේ ම බිඳීම හෙවත් මරණය යි.

"භූතප්පසාද විසයා භාවෝ හදයමිච්චපි,
ජීවිතාහාර රූපෙහි අට්ඨාරස විධං තථා.

පරිච්ඡෙදො ච විඤ්ඤත්ති විකාරො ලක්ඛණන්ති ච
අනිප්ඵන්නා දසා චෙති අට්ඨවීසවිධං භවෙ."

(භූත 4 ද, ප්‍රසාද 5 ද, ඓාට්ඨබ්බායතන නම් ආපො ධාතුව හැර ඉතුරු භූත තුන ම බැවින් එය හැර ඉතුරු රූපාදී විෂය රූප 4 ද, භාවරූප 2 ද, හෘදය, ජීවිතය, ආහාරය යන රූප 3 ත් සමග වූ **නිෂ්පන්න රූප** 18 කි.

පරිච්ඡේද රූපය ද; විඤ්ඤත්ති රූප 2 ද, විකාර රූප අතුරෙන් ලහුතාදි 3 ද, ලක්ෂණ රූප 4 ද යි යන මේ **අනිෂ්පන්න රූප** 10 ත් සමග මුලුමතින් රූපයෝ 28 ක් වෙති.)

**රූපසමුද්දෙස පාදය යි.**

B. මේ අටවිසිවැදෑරුම් වූ සියලු රූපය ම තමාත් හෙතු නො වෙයි; හෙතු සහිතත් නො වෙයි; හෙතු සමග සම්ප්‍රයොග වන්නේත් නො වෙ යි.; ප්‍රත්‍යය සහිත යි; සඞ්ඛත යි. හෙවත් ප්‍රත්‍යය සමුත්පන්න යි; රූපීය යි; ලෞකික යි; ආශ්‍රව සහිත යි; මතු කියැවෙන සංයොජන, ගන්ථ, ඔඝ, යොගනීවරණ, පරාමාස, උපාදාන, කිලෙස යන මේ ධර්මයන්ට ස්ථාන යි හෙවත් හිත යි; අකුසල කුසල වශයෙන් නියම නොකරණලද හෙයින් අව්‍යාකෘත යි; අරමුණු රහිත යි; චෛත සික නො වෙ යි; චිත්ත නො වෙයි; එක ම සන්තානයෙහි එක විට ඉපදීම නැසීම ඇතත් එකභාජනයෙහි ලූ තෙල් හා දිය

නො ගැලපෙන්නාක් මෙන් සිතින් විප්‍රයුක්ත සි; තමා ද විපාක නොව විපාක දෙන සවභාව ද ඇති නො වෙයි, තමා කිළුටු නොව කිළුටට හිත සි; ඒ ඒ ධ්‍යානාඞ්ග සහිත හෝ සම්ප්‍රයුක්ත නොවෙයි; තමා ද සෝවාන් මාර්ග දර්ශනයෙන් හෝ මතු මාර්ග ඵල භාවනායෙන් හෝ පහකළ යුතු නොහොත් හැකි නො වෙයි; එසේ ම පහ කළ යුතු හෝ හැකි හෙතු ඇත්තේවත් නො වෙයි; සසර ලොකය හෝ කාම් රැස වැඩීම පිණිසවත් ගෙවීම පිණිස වත් නො පවතී; ශෛක්‍ෂවත් අශෛක්‍ෂවත් නො වෙයි; පරිත්ත සි; කාමාවචර සි; රූපාවචර නො වෙයි, අරූපාවචර නො වෙයි; ලොකානතගීත භාවයෙන් පර්‍යා පන්න සි; ලොකොත්තර නො වෙයි; සම්‍යක් භාවයෙහිත් මිථ්‍යා භාවයෙහිත් අනියත සි; අනෛර්‍යාණික සි; උත් පන්න සි; විඥ්ඥාණ පසෙන් දත යුතු හෝ හැකි සි, අනිත්‍ය සි; ජරාභිභූත සි; මෙසේ එක් ප්‍රකාර වෙයි.

නැවත භූත උපාදා, අජ්ඣත්තික බාහිර, වත්‍ථු අවත්‍ථු, ද්වාර අද්වාර, ඉන්ද්‍රිය අනින්ද්‍රිය, ඖලාරික සුඛුම, සන්තිකෙ දූරෙ, සප්පටිඝ අප්පටිඝ, උපාදින්න අනුපාදින්න, සනිදස්සන, ගොචරග්ගාහික අගොචරග්ගාහික, අවිනිබ්භොග විනිබ්භොග, වශයෙන් ද්විප්‍රකාර ද; ඒ ඒ ලක්‍ෂණාදීන්ගේ මිශ්‍රතාවෙන් ත්‍රිප්‍රකාරයෙහි පටන් එකාදශ ප්‍රකාරය දක්වා ද විශෙෂ ඇති කොට ද දක්වා තිබේ. එයින්:-

(1.) **භූත** රූප නම්:- සතර මහා භූතයෝ සි. ඉතිරි සියලු 24 **උපාදා** රූප සි.

(2. 11.) **අජ්ඣත්තික** රූප නම්:- පසාදරූප පස සි. **ගොචරග්ගාහික** රූප යනු ද මීට ම නම් ඉතිරි සියලු 23 **බාහිර** රූපය සි ද, **අගොචරග්ගාහික** රූප ය සි ද නම් වේ. මේ ගොචරග්‍රාහික රූපයන්ගේ න්‍යාය විරොධීභෙදයක් යම් කිසි පරිද්දකින් පොත්වලට එකතුව තිබේ. එයින් කම් කිම් ද?

(3.) **වත්‍ථු** රූප නම්:- ප්‍රසාද හෘදය යන 6සි; ඉතිරි 22ක **අවත්‍ථු** රූප සි.

(4.) ද්වාර රූප නම්:– පසාද විඤ්ඤත්ති යන 7යි. ඉතිරි 21ක අද්වාර රූප යි.

(5.) ඉන්ද්‍රිය රූප නම්:– පසාද භාව ජීවිත යන 8යි. ඉතිරි 20 අනින්ද්‍රිය රූප යි.

(6, 7, 8.) ඔළාරික රූප නම්:– පසාද විසය යන 12යි. සන්තිකෙ රූප සප්පටිඝ රූප නමුදු ඊට ම වෙති. සෙසුවා 16ය සුඛුම රූප, දූරෙ රූප, අප්පටිඝ රූප නම් වෙති.

(9.) උපාදින්න රූප නම් :– හදයරූප ඉන්ද්‍රිය රූප අවිනිබ්භාග රූප ආකාශ යන මතු දක්වන කම්මජ රූප 18යි; මෙම සභාව රූප ය, සලක්ඛණ රූප ය, නිප්ඵන්න රූප ය රූප රූප ය, සම්මසන රූප ය, යන නම් වලිනුදු ව්‍යවහාර වෙති. ඉතිර 10ය අනුපාදින්න රූප, අනිප්ඵන්න රූප යන නම් වෙති.

(10 ) සනිදස්සන රූප නම්:– එක ම රූපායතනය යි. ඉතිරි 27 අනිදස්සන රූප යි.

(12. ) අවිනිබ්භොග රූපය නම්: භූතරූප සතර හා වර්ණ ගන්ධ රස ඕජා යන මේ අට යි. එහි ඕජා යනු ආහාර රූපය යි. සුද්ධට්ඨකය යනු ද ඊට ම නම්. ඉතිරි 20 විනිබ්භොග රූප යි.

මෙකී අවිනිබ්භාගතාව නම්:– ඉන් එකක් වත් අඩුව අතික්වාට පවතින්ට බැරිබව යි; හෙවත් එකකින්වත් තුරන් කිසිද රූපයක් ස්වභාවයෙන් ම නැති බව යි; විනිබ්භොගතාව නම්; සමහර රූප රැසක නැතත් අන් සමහරක ලැබෙන්ට හැකි බව යි.

බුද්ධවචන අටුවා ටීකා සංග්‍රහ ප්‍රකරණවල එක සමානව ම එන මේ කාරණයට, එ නම්: මෙකී රූප අටේ අවිනිබ්භොගතාවයට විරුද්ධව ලියන ලදුව අපරට ප්‍රසිද්ධව තිබෙන "රූපාවචර බ්‍රහ්ම ලොකයෙහි ගන්ධායතන රසායතනයන් හා ඝ්‍රාණේන්ද්‍රිය ජිව්හෙන්ද්‍රියයන් නැති බැවින් එහි රූපකලාපයන්ගේ අංශ වශයෙන් ගන්ධ රසයන් නැතැයි සිතිය යුතු වේ. කාමභව රූපභව දෙක්හි අටකින් හා සයකින් අඩුව රූප

කලාපයන්ගේ පහළ නොවීම ඒ ඒ ලෝකයන්ගේ ස්වභාවය
යි සිතිය යුතු වේ"* යන මහා සාවද්‍ය වචනය කිසිවෙක්
විසින් නො ඇදහිය යුතු යි. මක්නිසා ද? (1.) එහි කියන
හේතුව ද බොරු යි. ඒ මෙසේ යි:- බ්‍රහ්ම ලෝකයෙහි ගන්ධා
යතන රසායතන දෙක නැති බවක් බුද්ධාගමේ නැත්තේය.
ඝ්‍රාණෙන්ද්‍රිය ජිව්හෙන්ද්‍රිය යන දෙක නැතිවා සැබැවුවත් එප–
මණක් නොව කායෙන්ද්‍රියයත් නැත්තේම ය. (2.) එලෙය ද
අයුතු යි. ඒ මෙසේ යි: ඝ්‍රාණ ජිව්හා දෙක නැති නිසා ගන්ධ
රස දෙකත් නැතැ යි කියයුතු නම්, කායෙන්ද්‍රියයත් නැති
නිසා ඵොට්ඨබ්බායතනය, එ නම්: පඨවි තෙජො වායො යන
භූත තුණත් නැති විය යුතු යි. එසේ කල කිසි ද රූපයක්
නොලැබේ මැ යි. ඉතින් මේ අඥාන කීමේ මහත නො පෙ
නේ ද? තවද මේ යුක්තිය, තෙලුම්මලක ඇසවත් නාසයත්
නැති නිසා වර්ණයක් වත් ගන්ධයක් වත් තිබෙන්ට බැරි ය.
බෙරයක කණ නැති නිසා එහි ශබ්දයක් නගන්ට බැරි ය,
සීනිවල දිව නැති නිසා රසයක් තිබෙන්ට බැරිය, අන්ධයන්
ගේ කිසි වර්ණණයක් නැත, බීරන්ට ශබ්දකරන්ට බැරිය යි
තීන්දුකර කියන්ට හැකි තරම් එකකි. (3) ඊට ම විරුද්ධ
ය ද පෙණෙන්ට තිබේ. ඒ මෙසේ යි: චක්ඛුසොතාදිය පවා
නැති අසඤ්ඤසත්ත බ්‍රහ්මලෝකයෙහි ප්‍රතිසන්ධියේ දී ජීවිත
නවක කලාපය ද, ප්‍රවෘත්තියේ දී ශුද්ධට්ඨක ලහුතාදෙකාදස
ක යන කලාප දෙක ද ලැබෙන බව දක්වා තිබේ, ඒ තුණට
ම ගන්ධරසයෝ අවයව වෙති, (4) විරොධ ප්‍රසංගය ද වෙයි:
ඒ මෙසේ යි: අප බුදුන්ගේ ශාසනයෙහි දැනට ප්‍රසිද්ධව තිබෙ
න රූපකලාප 22 ට ඔය කියන සේ බ්‍රහ්මයන්ට ලැබෙන අංග
දෙක දෙකින් අඩුකලාප 15 ත් සමග කලාප 37 ක් දක්වා
තිබෙන්ට ඔහොම නම් යුතු ව තිබුනේ ය. (5` ඔය මතය
මත් පොත්වල ප්‍රතික්ෂෙපකර තිබේ: ඒ මෙසේ යි: "රූප
ලොකෙ ගන්ධාදීනං අභාවවාදී මතම්පි හි තත්ථ තත්ථ ආචරියෙහි
පටික්ඛිත්තමෙව" (රූප ලෝකයෙහි ගන්ධාදීන් නැතැයි කියන්

---

* පඤ්චස්කන්ධ විභාගය නම් පොතේ 67 වෙනි පිටේ 4 වෙනි පෙළ
පටන්-

තන්ගේ මතය ආචාර්‍ය්‍යවරයන් විසින් ඒ ඒ තැනදී අහක දමන ලද්දක් මය) යන විභාවිනී වචනයෙන් අතික් පොත් ගැණත් දත යුතු හරිය පෙණේ. මේ කිසි ම යුක්තියකට නැති පොතපතට විරුද්ධ අධර්ම වචනය ගැණ මෙ පමණ වත් කාලයෙන් හා පොතෙන් වියදම් වුනා පාඩුවකි.

## රූපවිභාග පාදය යි.

C. (a) කර්මය, (b) චිත්තය, (c) ඍතුය, (d) ආහාරය යි කියා රූපසමුට්ඨානයෝ හෙවත් රූපොත්පත්තිහට කාරණා වූ ධර්ම හතරක් වෙති. එසින්:–

a. කාමාවචර ද රූපාවචර ද වූ උද්ධච්ච රහිත අකුසල් හා කුසල් යන කාමීායිසංස්කාර 24 තමන් විසින් උපදවන ලද භවයන්හි ආධ්‍යාත්මික සන්තානයෙහි ප්‍රතිසන්ධි චිත්තක්ෂණයාගේ උත්පාදක්ෂණයෙහි පටන් ම චිත්තක්ෂණයට තුන් වර බැගින් ක්ෂණ පතා ම (චුතිචිත්තක්ෂණයට පූර්වයෙහි 17 වන චිත්තක්ෂණයාගේ උත්පාදක්ෂණය දක්වා)කර්මසමුට්ඨාන රූපය උපදවති. එසින් සමහර රූපයක් මේ මුලුකාලය තුල ද, ගබ්භසෙය්‍යකසත්වයන්ගේ චක්ඛාදිය වැනි සමහර රූපයක් ප්‍රතිසන්ධිය ගෙණ බොහෝ කාලයකට පසු ව පටන් ගෙණ ද, තවත් සමහරක් අතුරතුරකදී අඳ බිහිරි ආදී විකාර යට පැමිණෙන්නන්ගේ වශයෙන් චුතියට බොහෝ මෑත කලක් දක්වා පමණක් ද, තවත් සමහර ලිඞ්ග විපරීතයට පැමිණෙන්නන්ගේ වශයෙන් අතික් රූපයකට මාරුකරමින් ද නො කඩව උපදවමින් යති. අතරකදී විකලවූ නැවත ප්‍රකෘතිමත් වන්නාවූ ඇස් කන් ආදිය සඳහා නො හැසි වැසී අප්‍රකට ව උපදිමින් තිබී නැවත ප්‍රකෘතිමත් වුනාය යි කිය යුතු.

ප්‍රතිසන්ධියෙන් පසු උපදනා වූ ද, විකාරවන්නා වූ ද වළකින්නාවූද රූපයන්ට උද්ධච්ච සහිතයන් සමග කර්ම 25 ම ප්‍රත්‍යය වෙත්.

b අරූපාවචර විපාක ද්විපඤ්ච විඤ්ඤාණ යන 14 ර හැර ඉතිරි සිත් 75 ම ප්‍රතිසන්ධියට අනතුරු ප්‍රථම භවාඞ්ග සිතේ පටන් චුතිචිත්තය දක්වා තුමූ උපදිමින් ම චිත්තසමුට්ඨාන

රූපය උපදවති. එහි:- අභිඥා ජවන ඉරියව් පැවැත්වීම ද කරන්. වොත්ථපන කාමාවචර ජවන අභිඥාවෝ වනාහි විඥප්තිය ද නගත්. ඉනුත් සොම්නස් ජවන 13 ක සිනාව ද උපදවත්.

c. ශීතොෂ්ණ සෘතු ගුණය යි කියන ලද තෙජෝ ධාතුව තමාගේ ඨිතිකාලයට පැමිණ ම ආධ්‍යාත්මිකව හෝ පිටත වෘක්‍ෂලතා ගල් පස් ආදියෙහි හෝ සුදුසු පරිද්දෙන් උතුසමුට්ඨාන රූපය උපදවයි. සත්ත්වෘක්‍ෂාදීන්ගේ මරණින් මතු ශෙෂ වීත ද්‍රව්‍ය ශරීරය මේ කාරණෙන් දත යුතු යි.

d. ඕජා සංඛ්‍යාත වූ ආහාරය කය තුළ යුතු තැනට පැමිණ ම ආහාරසමුට්ඨාන රූපය උපදවයි. මේ යුතු තැන ට පැමිණීම ඛාද්‍ය භොජ්‍යාදී වශයෙන් මුඛද්වාරයෙන් හෝ, වස්තිකර්ම වශයෙන් ගුද මගින් හෝ, මාතෘකුක්ෂිගතයාගේ වශයෙන් නාභි නාඩි මගින් හෝ, බිජුවට තුළ දී අණ්ඩජ සත්ත්වයන්ගේ ද කිරි ඔරුවෙහි ලන ලද විෂමූර්ජිතයන්ගේ ද යනාදීන්ගේ වශයෙන් සියලු කය මතුපිටින් හෝ යන මේ ආදී නොයෙක් මගින් ආහාරය කය තුළට පැමිණීම දත යුතු යි. පෙළෙහි ආ "මුඛාසියං, දන්තවිඛාදනං, ගලජ්ඣො හරණීයං" (මුඛයෙන් අනුභව කට යුතු, දත්වලින් සපාකනු ලබන, උගුරෙන් ගිලිය යුතු) යන වචනය "ඔදන" "කුම්මාස" "සත්තු" (බත් රොටි අත්සුණු) යනාදිය මෙන් ම නිදර්ශන න්‍යායෙන් විදුරණ ලද්දකි.

එහි හදය ඉන්ද්‍රිය රූපයෝ ඒකාන්තයෙන් කර්මජ යි. විඥප්ති දෙක නියමයෙන් ම චිත්තජ යි. ශබ්දය චිත්තජ ද සෘතුජ ද වේ. ලහුතාදී තුන සෘතුජ ද චිත්තජ ද ආහාරජ ද වෙති. අවිනිර්භොග්‍යරූපයද ආකාශය ද යන මොහු කම්මජ ද චිත්තජ ද සෘතුජ ද ආහාරජ ද වෙති. ලක්‍ෂණරූප කිසි සමුට්ඨානයකින් නූපදිති.

"අට්ඨාරස පණ්ණරස තෙරස ද්වාදසාති ච,
කම්මචිත්තොතුකාහාර ජාති හොන්ති යථාක්කමං.
ජායමානාදි රූපානං සභාවත්තා හි කෙවලං,
ලක්ඛණානි න ජායන්ති කෙහිචී ති පකාසිතං."

(උපාදින්න රූප නමින් කී 18 කම්මජයෝ යි. විඤ්ඤත්ති දෙක, ශබ්දය, ලහුතාදී තුණ, අවිනිර්භොග්‍යරූපය, ආකාශය, යන 15 චිත්තජයෝ යි. ඉන් ම විඤ්ඤත්ති දෙක හැර සිටි 13 උතුජයෝ යි. ඉනුත් ශබ්දය හැර ඉතුරු 12 ආහාරජයෝ යි. මෙහි ඉනුත් යන වචනයෙන් එක රූපය ම හෙතු කිපයකින් උපදින බව තේරුම් නො ගත යුතු යි. යළි එක සමාන රූපයෝ වෙන වෙන සමුට්ඨානවලින් උපදින බව දත යුතු. ලක්ෂණ රූප සතර උපදනා වූ ද දිරන්නා වූ ද නසින්නා වූ ද සෙසු රූපයන්ගේ ප්‍රකෘති ස්වභාවයන් මිස අමුතු රූප නො වන්නෙන් කිසි සමුට්ඨානයකින් නූපදිති යි දක්වන ලදහ.)

**රූපසමුට්ඨාන පාදය යි.**

D. එකවිට උපදනා වූ, එකවිට නිරුද්ධවන්නා වූ, එක ම නිශ්‍රය ඇති, එකතු ව පවත්නා වූ රූප ධර්මයන්ගේ සමූහයක් **රූපකලාප** යක් නම් වේ. එබඳු කලාප 22 ක් වෙති. එයින්:-

a. නවයක් **කම්මසමුට්ඨාන කලාපයෝ** යි. එනම්:-

1. ජීවිතය අවිනිර්භොග්‍යරූපය යන නවය චක්ඛුරූපය ත් සමග දශකයක් වූ **චක්ඛුදසක** කලාපය ද;
2. එම නවය සොතය සමග **සොතදසක** ය ද;
3. ඝාණය සමග **ඝාණදසක** ය ද;
4. ජිව්හාව සමග **ජිව්හාදසක** ය ද;
5. කායෙන්ද්‍රිය ය සමග **කායදසක** ය ද;
6. ඉත්ථිභාව රූපය සමග **ඉත්ථිභාවදසක** ය ද;
7. පුරිසභාවරූපය සමග **පුරිසභාවදසක** ය ද;
8. හදයරූපය සමග **වත්ථුදසක** ය ද;
9. එම නවය තනිකර වූ **ජීවිතනවක** ය ද යන මේ යි.

b හතක් **චිත්තසමුට්ඨානකලාපයෝ** යි. එ නම්:-

10. අවිනිර්භොග්‍ය රූපය ම තනිකර වූ **සුද්ධට්ඨක** ය ද,
11. එය ම සද්දය සමග **සද්දනවක** ය ද;*

---

* කෑරීම් තලුගැසීම් ආදියෙහි ලැබෙන මේ චිත්තජ සද්ද නවක කලාපය සමහර ආචාර්‍ය්‍යයෝ කොතැනක් සඳහන් නො කර හරිති. පෙළ අටුවාවල නො ආ ලෙස විකාර රූප පස යොදා අමුතු කලාප යෙදූ ප්‍රකරණකාචාර්‍ය්‍යයන් විසින් ඍතුජ වත් ලැබෙන සද්දලහුතාදි ද්වාදසකය චිත්තජ ව නො ලැබෙන්ට යුතුකම් කියා නැති එක ද, චිත්තජසද්දනවකය අභිමත කරණ පක්ෂය වත් එය ද ලැබේ ය යි නො කී එක ද පුදුම යි.

12. එය ම කායවිඤ්ඤත්තිය සමග **කායවිඤ්ඤත්තිනවක** ය ද;

13. එය ම වචීවිඤ්ඤත්ති සද්ද යන දෙක සමග **වචීවිඤ්ඤත්තිදසක** ය ද;

14. ලහුතාදී තුණ සමග **ලහුතාදෙකාදසක** ය ද;

15. කායවිඤ්ඤත්තිය ලහුතාදී තුණ ය යන සතර සමග **කායවිඤ්ඤත්ති ලහුතාදි ද්වාදසක** ය ද;

16. වචීවිඤ්ඤත්ති සද්දලහුතාදීන් සමග **වචීවිඤ්ඤත්ති සද්දලහුතාදි තෙරසක** ය ද යන මේ ය.

c. හතරක් **උතුසමුට්ඨාන කලාපයෝ** යි. එ නම්:

17. අවිනිර්භෝග්‍ය රූපය වූ **සුද්ධට්ඨක** ය ද;

18. එය ම ශබ්දය සමග **සද්දනවකය** ද;

19. ලහුතාදීන් සමග **ලහුතාදෙකාදසක** ය ද;

20. සද්දලහුතාදීන් සමග **සද්දලහුතාදී ද්වාදසකය** ද යන මේ යි.

d. දෙකක් **ආහාර සමුට්ඨාන කලාපයෝ** යි. එ නම්:-

21. අවිනිර්භෝග්‍යරූපය ම වූ **සුද්ධට්ඨක** ය ද;

22. එය ම ලහුතාදීන් සමග **ලහුතාදෙකාදසකය** ද යන මේ යි.

මෙයින් සුද්ධට්ඨකය සද්දනවකය යන උතුසමුට්ඨාන කලාප දෙක (සත්ත්වයන් සම්බන්ධ) අජ්ඣත්තික සන්තානයෙහි පමණක් නො ව පිටත්හි ද්‍රව්‍යයන් සම්බන්ධවත් ලැබේ. අනික් සියලු විස්සම සත්ත්වයන් කෙරෙහි ම ලැබෙත්.

කම්මචිත්තොතු ආහාර සම්භූතා නව සත්ත ච,
කම්මතො චතුරො හොන්ති කලාපාසුං ද්වීසති.
එකුප්පාද නිරොධත්තා භාවා උපචයාදයො,
කලාපඞ්ගා න වුච්චන්ති ආකාසො චා සනිස්සයො.

කම්මජ චිත්තජ උතුජ ආහාරජ රූපකලාපයෝ ක්‍රම යෙන් 9ක, 7ක, 4,ක 2 කැයි මුළුල්ල 22ක් වෙති.

රූපයන්ගේ ප්‍රථමොත්පත්තියෙහි පමණක් මිස පවත්තිනසින කල්හි උපචය රූපය ද, අනුත්පත්තියෙහි පමණක්

මිස ඉතිරි දෙකල සන්තති රූපයද, පවතින කල්හි මිස උත් පත්ති භංග දෙකෙහි ජරතා රූපය ද, භංගයෙහි පමණක් මිස උත්පත්ති ඨිති දෙක්හි අනිච්චතා රූපය ද, නො ලැබෙන බැවින් එකුප්පාද එකනිරොධ ලක්‍ෂණය නැති හෙයින් ලක්ඛණ රූපයෝ ද; රූපයන්ගේ නිශ්‍රය ම පරිච්ඡේදකාශ යටත් නිශ්‍රය වනු නොව, යම් නිශ්‍රයක උපන් රූපය ම ඊට නිශ්‍රය වන බැවින් එක නිශ්‍රය ලක්‍ෂණය නැති හෙයින් පරිච්-ඡේද රූපය ද කලාපයන්ගේ අංග කොට කියනු නො ලැබෙති.

තිට්ඨානමවිතිබෙහාගං ලහුතෙකාදසම්පි ච,
සද්දාදිනවකාං ද්වට්ඨං සෙසා එකෙකඨානිකා.
නිදූනා චතුරො සත්ත රස ලක්ඛණතො සියුං,
භින්නාවුත්‍යා ච බාවීස තෙවිසති ච අංගතො.

සුද්ධට්ඨකය, චිත්තජ උතුජ ආහාරජ වශයෙන් තුන් තැනක සිටී. ලහුතාදෙකාදසකය ද ඒ තුන් තැන සිටී. සද්ද නවකය චිත්තජ උතුජ වශයෙන් දෙතැනක සිටී. සෙසු කලාප තුදුස එක එක ස්ථානයෙහි සිටිත්.

සමුට්ඨාන වශයෙන් රූප කලාප හතරක් ද, කෘත්‍ය ලක්‍ෂණ වශයෙන් 17ක් ද, වෙන් වෙන් ව පැවතීම් වශයෙන් 22ක් ද වෙති, අංග වශයෙන් ලක්‍ෂණාකාශ රූප පස හැර ඉතිරි 23 වෙති.

රූපකලාප පාදය යි.

---

E. කාම ලොකයෙහි මේ රූප සියල්ල ම ලැබෙති. එහෙත් නො අඩු ව ලැබීම ප්‍රවෘත්තියෙහි දී වේ. එහි දී ත් සම්පූර්ණ නො වූ විකල පුද්ගලයෝ ත් වෙති. ප්‍රතිසන්ධියෙ දී සංසෙදජ ඔපපාතිකයන්ට චක්ඛු සොත ඝාණ ජිව්හා කාය භාව වත්‍ථු යන දශක සත උත්කෘෂ්ට වශයෙන් ලැබෙති. ඔමක වශයෙන් චක්ඛු සොත ඝාණ භාව රූපයෝ නො ලැබී ද යති. එවිට ඒ ඒ කලාප ම අඩු බව දත යුතු යි. අණ්ඩජ ජරායුජය යි කියන ලද ගබ්භසෙය්‍යක සත්ත්වයන්ට ප්‍රතිසන්ධි

යෙහි දී කාය භාව වත්‍ථු දසක තුණ පමණක් ලැබෙත්. එසි තු ත් භාවදසකය සමහර විටක නොලැබේ. ඉන් පසු ප්‍රවෘත්ති කාලයෙහි චක්‍ඛුදශකාදිය පහළ වෙමින් අවිකල සත්‍වයන්ට සම්පූර්ණ වෙති. එහෙත් සාමාන්‍යයෙන් ම ප්‍රතිසන්ධියෙහි දී නො ලත් භාව රූපය නැවත නො ලැබෙන බව ද, භාවරූප කලාප දෙකින් එකක් ප්‍රකෘතිය බව ද, සමහරවිටක උභතො ව්‍යඤ්ජනකයන්ගේ වශයෙන් හා ලිඞ්ගපරිවර්තන වශයෙන් භාව රූප දෙක ම එක භවයෙක්හි ලැබීම විකෘති වශයෙන් වුවත් විය හැකි බව ද, ආදිකල්පිකයන්ගේ භාවය අප්‍රකටව තිබී පසු ව ප්‍රකටවන බව මුත් අමුතුවෙන් පහළ වූණා නො වන බව ද දත යුතු සි.

මෙසේ ප්‍රතිසන්ධිය පටන් කම්මසමුට්ඨාන රූප ද, දෙ වෙනි චිත්තය පටන් චිත්තසමුට්ඨාන රූප ද, ප්‍රතිසන්ධි චිත්තයාගේ ඨිති කාලය පටන් උතුසමුට්ඨාන රූප ද, ඔජා පැතිරීමේ පටන් ආහාර සමුට්ඨාන රූපද සි සතර සමුට්ඨාන රූපකලාප පරම්පරාව කාමලොකයෙහි ප්‍රදීපජාලාවක්මෙන් ද ගඞ්ගාජලශ්‍රොතසක් මෙන් ද දිවිපවත්නා තෙක් නිරොධසමා පත්තියෙනු දු නො සිඳී පවිති.

මරණ කාලයෙහි චුතිසිත පටන් මුලට ගැණගත් 17 වැනි චිත්තොත්පාදයෙහි ස්ථිතික්‍ෂණය පටන් චිත්තජ රූපයන්ගේ උත්පත්තිය වළකී. කලින් ඉපිද පවතින්නාවූ රූපද, ක්‍ෂණයක් පාසා බිඳි බිඳී ගොස් ඒ 17 වැනි චිත්තක්‍ෂණයෙහි උත්පාදක්‍ෂ ණයෙහි උපන් රූපයෝ චුතිචිත්තයාගේ භඞ්ගයට සමකාලව බිඳෙත්. ඉන්පසු චිත්තජ ආහාරජ රූපයොත් සිඳෙත්. එහෙත් සෘතුජ රූප පරම්පරාව පමණක් නාමධර්මයන්ගේ හා කර්මජරූපයන්ගේ වියොවින් බහිර්ධාරූප භාවයට පමුණුවන ලදුව මෘතශරීරය සඳහා පවතිත්.

(මෙහි චුතියෙන් මතු ප්‍රතිසන්ධිය දක්වා ගමන් කරණ කර්මජරූප නැති නිසා අඹරා ගෙණ යන නූලක කෙඳි ඉදිරි යෙහි කෙඳිහා නො පටලැවී ඇඹරුණහරිය වෙන්වුනාක්මෙන් මේ කය දැමීම ත්, ඇඹරීම මතු ත් එලෙස ම කර ගණ ගියාක් මෙන් අමුතු භවයක රූප පැවැත්ම ත්, අඹරණ නාක් දිගට ම

එක තති හෙන්දක් නැතුවාක් මෙන් ආත්මය යන කාරණ යක් නැති බව ත්, අඹරණ නූල දිගට ම පබුළු පෙළකු ත් අවුණමින් අඹරා ගණ යන්නාක් මෙන් රූප පරම්පරාව සමග චිත්තොත්පාද පරම්පරාව ත්, නූල වෙන්වුන තැනක පටන් නූල නැතුව ම එම පබුළු පෙළ එලෙස හෙළ හෙළා ම මතු මතු යන්නාක්මෙන් රූපීභවයකින් චුතව අරූපභවයක ඉපිද පැවැත්ම ත්, මේ නූල ඇඹරීම ත් පබුළු ඇමිණීම ත් දෙක ම නොකර නැවතීමක් මෙන් නිවණ ත්, තේරුම් ගැණීමට නොහොත් ඒ සම්බන්ධ දෘෂ්ටිශුද්ධියට හිත වූ එක්තරා සැලකීමක් ඇතිකර ගැන්මට මේ සුදුසු ප්‍රස්තාවකි.)

මෙ කි ලෙස එක් භවයෙක්හි රූප පැවතී අවසාන ව අතික්භවය රූප පවත්නා ස්ථානයක් වී නම් එහි දී ත් ප්‍රතිසන්ධියෙහි පටන් මෙ ලෙස ම පවතී.

රූපලොකයෙහි ඝාණ ජිව්හා කාය භාව දශකයෝ ද, ආහාරජ කලාප දෙක ද නො ලැබෙත්. එහෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධි කාලයෙහි චක්ඛු සොත වත්‍ථු දසක තුණ හා ජීවිත නවකය දැ යි යන කර්මජ කලාප සතර ද ප්‍රවෘත්තියෙහි දී චිත්තජ උතුජ කලාප 11 ද ලැබෙති.

අසඤ්ඤසත්තයන්ට චක්ඛු සොත වත්‍ථු සද්ද රූපයෝ ද චිත්තජරූප මුළුල්ල ද පවා නො ලැබෙන හෙයින් ඔවුන්ගේ ප්‍රතිසන්ධියෙහි දී කම්මජ ජීවිත නවකය ද, ප්‍රවෘත්තියෙ දී ඍතුජ වූ සුද්ධට්ඨක ලහුතාදෙකා දසක යන දෙක පමණක් එම ජීවිත නවකයට අතිරෙක ව ද ලැබෙත්.

මෙ සේ කාම රූප අසඤ්ඤී යන භව තුණෙහි ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති වශයෙන් දෙපරිද්දකින් රූප පැවැත්ම දත යුතු සී.

"අට්ඨවීසති කාමෙසු හොන්ති තෙවීස රූපිසු,
සත්තරසෙවාසඤ්ඤීනං–ආරුප්පෙ නත්‍ථි කිඤ්චි පි."

(කාම භවයෙහි රූප 28ම ද, රූපාවචර ලොකවල සාමාන්‍යයෙන් ඝ්‍රාණාදිත්‍රය හා භාව දෙක හැර සෙසු 23ද, අසඤ්ඤීන්ට පසාද සද්ද භාව හදය විඤ්ඤත්ති යන 14 හැර සෙසු 17 පමණක් ද ලැබෙති; අරූපයෙහි කිසිවකුත් නැත්තේ ය.)

"සද්දෙ විකාරො ජරතා මරණඤ්චොපපත්තියං,
න ලබ්භන්ති පවත්තෙ තු න කිඤ්චිපි න ලබ්භති."

(ප්‍රතිසන්ධියෙහි දී සද්දය, විකාරරූපය, ජරතා අනිච්චතා දෙක ය, යන මේ රූපයෝ කිසිවෙකුටත් නො ලැබෙති; ප්‍රවෘත්තියෙහි දී යම්කිසිවෙකුට නො ලැබෙන කිසි රූපය කුත් නැත්තේ යි.)

කාමෙ කලාපා බාවීස රූපෙ පණ්ණරසෙව ච,
තයො එව අසඤ්ඤීසු න කොචි පි අරූපිසු.

කාමාවචරයෙහි කලාපයෝ 22ක් ද, රූපීභවයෙහි 15ක් ද, අසඤ්ඤීභවයෙහි 3ක් පමණක් ද ලැබෙති. අරූපයෙහි කිසිවක් නැත්තේ ය.

**රූපප්‍රවෘත්තික්‍රම පාදය යි.**

**සවැනි වූ රූපකාණ්ඩය යි.**

---

**IV.** මේ සත් වන පරිච්ඡේදයෙන් අන්තිම වූ සතර වැනි පරමාර්ථය වූ **නිර්වාණය** වර්ණනා කරනු ලැබේ. ඒ සම්බන්ධ ව (1.) නිර්වාණලක්ෂණය, (2.) ද්විප්‍රකාර නිර්වෘතිය, (3.) ත්‍රිවිධ ප්‍රාප්තිය, (4.) ත්‍රිවිධදෘෂ්ටිය, (3.) නිර්වාණ සුඛ තත්වය, (6.) ත්‍රිවිධ සිද්ධිය යන කාරණා තෙළෙසක් දත යුතු යි. එහි:-

**නිර්වාණ ලක්ෂණය** නම්:-

එය වනාහි ප්‍රඥව බැස්වීමෙන් පතුලක් නො දත හැකි බැවින් **ගම්භීර** වූ, යම්තම් නුවණැසකින් තොව දූතසේ ඇති කර ගත් සතර මාර්ග එලයන්ට ඇතුළත් වූ නුවණැසින් ම දක්ක යුතු හෙයින් **දුර්දශී** වූ, එ සේ දූතගත් උතුමෙකු විසින් අනිකෙක්හට දක්වන්ට දුෂ්කර හෙයින් **දුරනුබොධ** වූ, සියලු විකෂපයන්ගේ ශූන්‍යතාවෙන් **ශාන්ත**වූ;කාරණානුසාරයෙන් තර්ක කොට දූත පැමිණ ගත නො හැකි හෙයින් **අතර්කාවචර** වූ; තුනුවණට තබා ඖදාරික නුවණට වත් නො වැට හෙන හෙයින් **නිපුණ** වූ; හෙවත් **සූක්ෂම** වූ; බුදු පසේබුදු ආදී පණ්ඩිතයන් විසින් ම මුත් සෙසු බහුල ජනතාව විසින් නො දතහැකි බැවින් **පණ්ඩිතවෙදනීය** වූ; කිසි කලක විනා ශයට හෝ විකාරයකට නො පැමිණෙන හෙයින් **නිත්‍ය** වූ;

ලෝකසම්මත වූ දුක්ඛ දෝමනස්ස සංඛ්‍යාත දුක ද එහි විස්තර ය වූ ජාතිජරාමරණ සෝකාදි දුක පමණක් නො ව ආර්‍ය සත්‍ය දුක්ඛය වූ ත්‍රෛභූමික වෘත්තය ම නිරුද්ධ කරණ ලද හෙයින් සුඛ වූ; තීර්ථකායන් විසින් පරිකල්පිත පරිදි ආත්ම ස්වභාවක් නැති ධර්ම මාත්‍ර හෙයින් අනාත්ම වූ; තමා සාක්ෂාත් කර ගන්නවුන්ට සෙත් පිණිස මඞ්ගල පිණිස පවත්නා හෙයින් ශුභ වූ; කුශල ය යි කියා වත් අකුශල ය යි කියා වත් නියම කොට නො වදාරණ ලද හෙයින් අව්‍යාකෘත වූ; තමා ද විපාක නොව කුශලාකුශලයන් මෙන් විපාක උපදවන ස්වභාව ද නැත්තා වූ; සෝවාන් මගින් හෝ සෙසු තුන් මගින් හෝ පහ කළ යුතු නොවන හෙයින් නෙව දස්සනෙන න භාවනාය පහාතබ්බ නම්වූ; තෘෂ්ණාදිය මෙන් සසර වැඩීම පිණිස ද ක්‍රියාවත් නො වන හෙයින් නෙව ආචයගාමී නො අපචයගාමි නම් වූ, සෝවාන් ආදී සතර මග හා තුන් ඵලය මෙන් හික්මෙමින් සිටින්නක් ද නො වී රහත් ඵලය මෙන් හික්මීම නිම කළ එකක් ද නො වන හෙයින් නෙවසෙඛ නාසෙඛ නම් වූ; පමණ කළ හැකි නො වන හෙයින් අප්පමාණ වූ; සියලු ධර්මයන්ට ම වඩා මනොඥ හෙයින් ප්‍රණීත වූ; මිථ්‍යා ස්වභාවයෙහි ආනන්තරිය පාපයන් හා නියත මිථ්‍යාදෘෂ්ටිය මෙන් භවානන්තරික වශයෙන් හෝ, සම්‍යක් භාවයෙහි සතරමග මෙන් අකාලික වශයෙන් හෝ ඵල දීමෙහි නියත නො වන හෙයින්, හෙවත් යට අවිපාක ධම්ම ධම්ම ය යි කී නියායෙන් තමාගේ විපාක අවස්ථාවක් නැති හෙයින් අනියත වූ; සත්වසන්තානයට අන්තර්ගත නො වන හෙයින් බහිද්ධා නම්වූ; හෙවත් පිටත් හි වූ; ඇසින් දක්ක යුතු ද නො වන පඤ්චේන්ද්‍රිය පඤ්චාලම්බනයන් මෙන් ගැටීම ද නැති හෙයින් අනිදස්සන අප්පටිඝ වූ, තමා ද හෙතු නො වූ; හෙතු සහිත නො වන හෙයින් අහෙතුක වූ; හෙතූන් සමග එකොත්පාදදිය නැති හෙයින් හෙතුවිප්පයුත්ත වූ; තමහට කිසි ප්‍රත්‍යයක් නැති හෙයින් අප්‍රත්‍යය වූ; තමා සම්බන්ධ රූපයක් නැති හෙයින් නො හොත් ශීතාදී ඖදාරික රූපපණයෙන් චිත්තචෛතසිකයන් මෙන්වත් පෙළීමක් නැති හෙයින් අත්‍යන්තයෙන් ම "අරූපී" වූ

උපාදානස්කන්ධ ලෝකයෙන් එතර ව හෝ මතු ව සිටි හෙයින් **ලෝකෝත්තර** වූ; මතු කියනු ලබන **ආසව, ඕඝ, යෝග, ග්‍රන්ථ, උපාදාන, නීවරණ, අනුශය, සංයෝජන, ක්ලේශාදි, ධර්මයන්ට ඇතුලත් ද නො** වූ; ඒ ධර්මයන්ට **සිත හෝ සම්බන්ධ ද නො** වූ; අරමුණු නො ගන්නා හෙයින් **අනාරම්මණ** වූ; **විපාක නො** වූ; **චෛතසික නො** වූ; **සිත හා නො යෙදෙන්නා** වූ; **සිත හා සංසර්ගී නො** වූ; **සිත හේතු කොට නො ගෙණ නූපදනා** වූ; **සිත සමග නූපදනා** වූ; **චිත්තයාගේ පෙරටුම් අනුව නො පෙරලෙන්නා** වූ; **සිත හා සංසර්ගී** වූ **ධර්මයන් හේතු කොට නූපදනා** වූ; සිත හා සංසර්ගී වූ; **ධර්මයන් හේතු කොට උපදනා ධර්මයන්ගේ පෙරළිමට අනුව නො පෙරලෙන්නා** වූ; චක්ඛාදී අජ්ඣත්තිකායතන සයින් පිටත් හෙයින් හෙවත් ධම්මායතනයට ඇතුලත් හෙයින් **බාහිර** වූ; සතරමහා භූතයන් නිසා නොපවත්නා හෙයින් **උපාදා නො** වූ; කර්මජ නො වන හෙයින් **අනුපාදින්න** වූ; යටකී **දර්ශන** භාවනා **දෙකින් පහකල යුතු හේතු ද නැත්තා** වූ; උපාදානස්කන්ධ සඞ්ඛ්‍යාත ලෝකයට අන්තර්ගත නො වන හෙයින් **"අපරියාපන්න"** වූ; ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය මෙන් සත්ත්වයා සසරින් නික්මවා ගෙණයාමෙහි ක්‍රියාවත් නො වන හෙයින් **අනිය්‍යාණික** වූ; තමහට වඩා උත්කෘෂ්ට ධර්මයක් නැති හෙයින් **අනුත්තර** වූ; රාගද්වේෂාදී රණධර්මයන් ගෙන් තොර හෙයින් **අරණ** වූ; සවිතක්ක සවිචාරාදී වශයෙන් ද, උප්පන්නානුප්පන්නාදී වශයෙන් ද, අතීතානාගතපච්චුප්පන්නාදී වශයෙන් ද **නො කිය යුතු** වූ; එක ම **විමුක්තිරසය ඇත්තා** වූ; **සියලු සංස්කාරයන්ගේ සංසිඳවීම** වූ; **කාමාදී සියලු උපධීන්ගේ දුරගැසීම** වූ; **තෘෂ්ණාවගේ ක්‍ෂය කිරීම** වූ; **උපාදානස්කන්ධ සංඛ්‍යාත සත්කායයාගේ නිරුද්ධ කිරීම** වූ; **ආර්‍ය්‍ය මාර්ග ඥානයෙන් සාක්ෂාත් කළ යුතු** වූ; **මාර්ග ඵලයන්ට අරමුණු** වූ; ප්‍රත්‍යයන්ගෙන් නො උපදවන ලදින් **අසංඛත** වූ **එක** ම ධාතුව යි.

එය **සත්ත්වයන්** ගොතන අර්ථයෙන් වාණය යි කියන ලද තෘෂ්ණාව කෙරෙන් නික්මුණු අර්ථයෙන් ද, එය පිහිට කොට

ගෙණ දුඃඛ ය යි කියන ලද ත්‍රෛභූමික වෘත්තය නිර් යන අර්ථයෙන් ද, අභාව වශයෙන් නිර්‍වාණ ය යි කියනු ලැබේ.

මෙහි කී සාක්‍ෂාත් කිරිමේ ප්‍රභෙද භගවත සෙත්පුර උපමාව මේ ප්‍රකරණයේ අග පරිච්ඡෙදයේ අගදීම තේරුම් ගැණිීම පහසු නිසා එහිදී ම දක්වන්නෙමු.

"මොක්ඛො, නිරොධො, නිබ්බාණං, දීපො, තණ්හක්ඛයො,
පරං,
තාණං,ලෙණ,ම'රූපං, (ච) සන්තං සච්ච,ම'නාලයං,

අසංඛතං, සිව, ම'මතං, සුදුද්දසං,
පරායනං, සරණ,ම' නීතිකං, (තථා)
අනාසවං, ධුව,ම'නිදස්සනා,' කතා,
'පලොකිතං, නිපුණ,ම'නන්ත,ම'ක්ඛරං

දුක්ඛක්ඛයො,'ව්‍යාපජ්ඣං,(ච)විවට්ටං,ඛෙම, කෙවලං,
අපවග්ගො, විරාගො, (ච) පණීතං, අච්චුතං, පදං,
යොගක්ඛෙමො,පාර,(ම'පි)මුත්ති, සන්තිවිසුද්ධි,(යො)
විමුත්‍ය, 'සංඛතාධාතු, සුද්ධි, නිබ්බුති, (යො සියුං)"

යන මේ නම් 46 ය ඒ ඒ අර්ථගෙණ අන්වර්ථව නිර්‍වාණය හගවන නිසණ්ඩුගත පර්‍ය්‍යාය ශබ්දයෝ වෙති.

## ල ක්‍ෂ ණ පා ද ය යි.

**2 ද්විප්‍රකාරනිර්වෘතිය** නම්:–මේ නිර්‍වාණය සවභාව හෙයින් ප්‍රභෙද නැතත් කාරණපර්‍ය්‍යායෙන් **සඋපාදිසෙස නිබ්බාණ ධාතු** ය, **අනුපාදිසෙස නිබ්බාණ ධාතු** ය යි කියා දෙවැදෑරුම් වන බව යි.

දිවිහිම් කොට සිරගෙට පත් ව වසන්නෙකු විසින් කළ යම් කිසි රාජප්‍රසාදක ක්‍රියාවක් හෙතු කොටගෙණ අසවල් දින පටන් ක්‍ෂමාව දෙමි යි රජ විසින් එවන ලද හස්න ලැබ ඒ දින පැමිණෙන තුරු සිරගෙයි එලෙස ම වසමින් මත් ලබාසිටින්නේ ය යි කිය යුතු නිදහස සඋපාදිසෙස නිබ්බාණ ධාතුවට උපමා කළ හැක්කේ ය. ඒ දින පැමිණ සිර ගෙයින් බැහැර කරණ ලදුව භුක්ති විඳින නිදහස අනුපාදිසෙස නිබ්බාණ ධාතුවට උපමා වේ. එහි රජහු සිත් ගැන්ම මාර්‍ගාධි

ගමනයට ද, හිරගෙයි විසීම සසර දුකට ද උපමා කොට දත යුතු යි. මේ දෙතැන දී ම එක ම නිදහස්වා මෙන් දෙතැන දී ම එක නිවණ බවත් පැහැදිලි යි.

**නි ර්වා ණ පා ද ශ යි.**

**3 ත්‍රිවිධප්‍රාප්තිය** නම්. මේ එකම නිර්වාණය සාරා පැමිණීම හෙවත් අධිගමනය කරණ ප්‍රකාර තුණ යි.

එ නම් සියලු ධර්මයන් ශූන්‍ය වශයෙන් හෙවත් අනාත්ම වශයෙන් වඩා නිවණ ප්‍රත්‍යක්ෂ කිරීම ද; සියලු සංස්කාරයන් අනිමිත්ත වසයෙන් හෙවත් අනිත්‍ය වශයෙන් වඩා නිවණ ප්‍රත්‍යක්ෂ කිරීමද සියලු සංස්කාරයන් අප්පණිහිත වශයෙන් හෙවත් දුක්ඛ වසයෙන් වඩා නිවණ ප්‍රත්‍යක්ෂ කිරීමද, යන මේ යි. මෙ සේ පැමිණි තුන්දෙනාට වෙන වෙන ම ප්‍රත්‍යක්ෂ හැටියෙන් නිවණ ද සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිත නමින් ත්‍රිවිධකොට පණවනු ලැබේ. එතකුදුවුවත් (රාගාදීන් ශූන්‍ය හෙයින් ද, රාගාදී නිමිති රහිත හෙයින් ද රාගාදී ප්‍රණිධි රහිත හෙයින් ද, ඒ තුන් ප්‍රකාර ලක්‍ෂණය නිවණෙහි එක විට ම ඇත්තේ ය.

එක් අතකින් පර්වතයක් ද, එක් අතකින් ප්‍රපාතයක් ද එක් අතකින් වනයක් ද ඇති විලක් වන්නේ ද, ඊට කන්ද උඩින් පැමිණ සනානය කොට පැන් බී සුවපත් වූ දුඃඛිතයෙකු විසින් කන්ද පාමුල විලෙන් සුවපත්වීමි යි ද ප්‍රපාතය දෙසින් නැගීවිත් සුවපත් වූවෙකු විසින් ප්‍රපාතය මුදුනේ විලින් සැනහුනෙමි යි ද, වනය දෙසින් විත් සෙත් ලැබූවෙකු විසින් වනයේ කෙළවර විලින් සුවපත්වීමි යි ද කියයුතු වන්නේ යම් සේ ද එ මෙන් ඒ ත්‍රිලක්‍ෂණ මගින් පැමිණියන් විසින් නිවණ ත්‍රිවිධ කොට පැණවීම දත යුතු යි. එහෙත් එම විල කන්ද පාමුල බව ද, ප්‍රපාතය මුදුනේ බව ද, වනය කෙළවර බවද එකවිට සැබැවා මෙන් නිවණෙහි ද එකවිට ම සුඤ්ඤතාදී ත්‍රිවිධ ලක්‍ෂණය සවභාවයෙන් ම ඇත්තේ ය. (මතු අන්තිම පරිච්ඡේදයේ විමොක්ඛ නාමයන් විෂය කොට විස්තර කරණු ලබන සියල්ලත් මීට සම්බන්ධ යි.)

**ප්‍රා ප් ති පා ද ශ යි.**

4 **ත්‍රිවිධ දෘෂ්ටිය නම්** (A) ශාශ්වත දෘෂ්ටිය, (B) උච්ඡේද දෘෂ්ටිය (C) සම්‍යක් දෘෂ්ටිය යන මේ යි. එහි:—

A. **ශාශ්වත දෘෂ්ටිය** නම්, බුද්ධශාසනයෙහි ව්‍යවහාරය පිණිස පමණක් සත්ත්වයා ය පුද්ගලයා ය යනාදි වශයෙන් කියනු ලබන ස්කන්ධ ධාතු රාශිය කෙරෙහි සදාකාලික වූ ආත්මයක් ඇත; පෘථිව්‍යාදී ධාතූන්ගෙන් අන්‍ය වූ ඊට ම සත්ත්වයා ය පුද්ගලයා ය යනාදී නම් වෙත් ය; එය කිසිකලක නොනසී ය; එය භවයෙන් භවයට පැන පැන යමින් හෝ නොනසිත භවයක් ලැබ ගෙණ හෝ ඒ ඒ අන්දමින් නිත්‍ය ය යි යන මේ ආදී වශයෙන් අදහන ඇදහිල්ල යි.

මේ දෘෂ්ටිය අප්‍රමාණ දික් නූලක පුළුන් කෙඳි වල සම්බන්ධය නො සලකා මුළුදිගට ම තනි කෙන්දකුත් ඇතැ යි හෝ ප්‍රමාණවත් නූලක ඒ ප්‍රමාණයත් ඉක්මවා තවත් අප්‍රමාණ ව පවත්නා දිග කෙන්දකුත් ඇත, නැත් නම් එකක් මෙන් කෙ සේ පෙණේදැ යි අඥානකමින් සිතන සිතීමක් මෙනි.

B **උච්ඡේද දෘෂ්ටිය** නම්:– අනතුරු ව කී ලෙස ආත්මයක් සත්ත්වයෙක් පුද්ගලයෙක් ඇත; ඔහු කාය සම්බන්ධ මරණයෙන් හෝ මක්ඛලිගොසාලවාදය මෙන් ඉබේ ම සසර ගෙවියා මෙන් හෝ තපස් පිළිවෙතින් හෝ විනාශ වන්නේ ය–නැති වන්නේ ය යි (“සතො සත්තස්ස විනාසං විභවං පඤ්ඤපෙති” යි වදාළ සේ) ඇති ව සිටි සත්ත්වයාගේ විනාශය පතවමින් ඇදහිල්ල යි.

මේ දෘෂ්ටිය ප්‍රමාණවත් දික්නූලක පෙර කී සේ ම මුලු දිගට තනි කෙන්දක් ඇත. ඒ නූල කෙළවර වනතුරු ඒ කෙන්දද නිම නො වෙයි කියා නුනුවණින් සැලකීමක් මෙනි.

C. **සම්‍යක් දෘෂ්ටිය** නම්:– මේ දෙකෙළවරට ම නො පැමිණ මධ්‍යයෙහි සිට ආත්මයක්, සත්ත්වයෙක්, පුද්ගලයෙක් මුළුමනින් ම නැත; ඇත්තේ නම් ප්‍රත්‍යය වූ පරිද්දෙන් පවත්නා ධාතු මාත්‍රය ම ය; මේ ප්‍රත්‍යය ද ප්‍රත්‍යය සමුත්පන්නය ද යන දෙක ම අනිත්‍ය ය; එ හෙයින් ප්‍රත්‍යය නැති කිරීමෙන් ප්‍රත්‍යය සමුත්පන්නයත් නැති වෙයි; පළමු ප්‍රත්‍යයෙන් ඉපදී

පවත්නා ප්‍රත්‍යය සමුත්පන්නය ද කාලාතික්‍රමණයෙන් නාමා ම නැති වෙයි; මේ යථොක්ත නිර්වාණ හෙවත් මොක්ෂය වේ ය යි දැන ඇදහීම යි.

මේ සම්‍යක්දෘෂ්ටිය වූ කල් අරණි තූලනම් ලුහුඹු වූ පුලුන් දුවටීමෙන් පෙණී සිටින ආකාරයක්; එහි මූළඳිගට තනි කෙන්දක් නැත; ප්‍රත්‍යය බලයෙන් ඒ ආකාරයෙන් පෙණී සිටියි; අමුතු පුලුන් කෙඳි එහි නො දමටන ලද නම් එයින් ම තූලත් නිමවත්නේ ය යි තත්වූපරිද්දෙන් දැනගැන්මක් මෙනි.

මේ දෘෂ්ටි තුණෙන් ශාස්වත උච්ඡේද යන දෙක මිථ්‍යා දෘෂ්ටිහු වෙති. ඔවුන්ගේ භෙද 62 ක බ්‍රහමජාල සූත්‍රයෙහි ආ ක්‍රමයෙන් ද, ඉතා බොහෝවූ අනුභෙදයන් අනතතාලකඛණ සූතන, සබබධමම මූලපරියාය සූතතාදියෙහි ආ ක්‍රමයෙන් ද දත යුතු.

සම්‍යක් දෘෂ්ටියේ භෙද නොහොත් අවස්ථා පසක් වේ. එ නම්:–(a) කමමසසකාත සමමාදිටඨි, (b) ඣාන සමමාදිටඨි, (c) විපසසනා සමමාදිටඨි, (d) මගගසමමාදිටඨි, (e) ඵලසමමාදිටඨි යන මේ යි. එහි:–

a. **කමමසසකාත සමමාදිටඨිය** නම්, වර්තමාන පැවැත්ම පූර්වකර්මානුරූප ව වෙයි; මතු පැවැත්ම ද පූර්ව හෝ වර්තමාන කර්මානුරූප ව වන්නේ ය; එහෙයින් යම් යහපත් හෝ අයහපත් හෝ කර්මයක් කෙරෙම් ද ඊට දායාද වන්නෙමි යි යන දෘෂ්ටි ය යි. මෙය ("අහෙතු අපපචචයා"යි) අහෙතු අප්‍රත්‍යයෙන් සත්වයන්ගේ පැවැත්ම වෙයි යන දෘෂ්ටිය ද, ("ඉසසර නිමමාණ හෙතු"යි) දෙවියන්ගේ මැවිල්ල හෙතු කොට ගෙණ සත්වයන්ගේ පැවැත්ම වෙයි යන දෘෂ්ටිය ද, යන දෙකින් ඉවත් ව පටිචචසමුපපාදය දෙසට නැමීම යි. තිත්ථායතන සූත්‍රයෙහි වදාල "පුබෙබ කත හෙතුවාදය" අසාධ්‍ය මිථ්‍යා දෘෂ්ටියක් කොට දක්වන ලද්දේ සත්වයන් විසින් කරණ කර්මය නුත් සඳහා උපදවන ලද හෙයිනි. එනම් සත්වයා මෙලොව කර්ම කරන්නේ ත් පූර්වකර්මයෙනැ යි යනු ඒ දෘෂ්ටිය වේ. මෙය වූකලී විපාක සඳහා වෙයි.

b. ඣාන සම්මාදිට්ඨිය නම්; ලෞකික ධ්‍යානලාභියා කෙරෙහි පවතින කම්මස්සකත ඤාණය පිට ගොඩ නගන ලද සීලවිසුද්ධි චිත්තවිසුද්ධි දෙකේ විශෙෂ ඵල ඇදහිල්ල යි.

c විපස්සනානම්මාදිට්ඨිය නම් කම්මස්සකත ඤාණය ද සීලවිසුද්ධිය ද චිත්තවිසුද්ධිය ද යන තුණ පිට නගන ලද (මතු විදර්ශනා විස්තරයෙහි දක්වනු ලබන සේ) දිට්ඨි විසුද්ධි ආදි වූ පටිපදාඤාණදස්සන විසුද්ධිය අන්ත කොට ඇති පිළිවෙත සම්බන්ධ සච්චානුලොමික ඤාණය නම් සම්‍යක්දෘෂ්ටිය යි.

d. මග්ගසම්මාදිට්ඨිය නම්; මේ දැක්වූ ඤාණ තුණ පිට නගන ලද ඤාණදස්සන විසුද්ධිනමින් මාර්ගචිත්ත සම්බන්ධ සම්‍යක් දෘෂ්ටිය නම් මාර්ගාඞගය වූ චතුසච්ච ඤාණය යි.

e. ඵලසම්මාදිට්ඨිය නම් මේ දැක්වූ සතර ක්‍රමයෙන් පැවති පසු ඇයි වන ඵලසිත සම්බන්ධ එ බඳු ම ඤාණය යි.

ඒ සත්‍ය සතරේ ලක්‍ෂණ අනතුරු කාණ්ඩයෙහි ප්‍රකාශ වෙයි. එ හෙයින් මෙහි දී දැක්විය යුතු වුවත් උපෙක්‍ෂා වෙමු.

දෘෂ්ටි පාදය යි.

5. ත්‍රිවිධසිද්ධිය නම (A) අනුමාන, (B) ආගම, (C) ප්‍රත්‍යක්‍ෂ යන නිර්වාණය ගැණ දැන ගත හැකි උපාය තුණ යි. එයින්:-

A අනුමාන සිද්ධිය නම්:-

"යථා පි දුක්ඛෙ විජ්ජන්තෙ සුඛං නාමපි විජ්ජති,
එවං භවෙ විජ්ජමානෙ විභවොපි ඉච්ඡිතබ්බකො."

(යම් සේ දුක ඇති කල්හි සැප නම් කාරණයකුත් ඇද්ද? එමෙන් භවය ඇති කල්හි විභව සංඛ්‍යාත නිවණත් ඇතැයි දත යුත්තේ ය.) යනාදී වූ සුමෙධ තාපසයන් මෙන් නිවන් ඇති බව කාරණානුසාරයෙන් දැනගැන්ම යි. අතර්කාවචර බව නිවණෙහි ලක්‍ෂණයක් කොට යට කියන ලද්දේ එ සේ තර්ක කිරීමෙන් නිවණ ගැණ යම් බඳු දැනීමක් ඇති කර ගනු මිස නිවණ ම දැනගත නො හැකි බැවිනි. නිවණ දැන ගැණීම

නම් ඊට පැමිණීම යි පිරිමියෙකුට පවා දරුවන් වැදීමෙහි දුක ගැණ තර්ක කොට යම් කිසි දැනීමක් ලබා ගත හැකි වුවත් ඒ දුකම දැනගන්ට නො හැක්කේ ය. ලඳුරියෙකුට ඒ අවස්ථාවෙහි දී ද එ සේ ම යි. නුමුත් ඇය වදන අවස්ථාවට පැමිණ දැන ගන්නාක් මෙන් ආර්යයෝ සාක්ෂාත් කිරීමෙන් ම නිවණ දැන ගණිත්. එ හෙයින් ඒ අනුමාන සිද්ධියෙහි ද අතර්කාවචර භාවයෙහි ද කිසි පරස්පර විරොධයක් නැත්තේ ය. මේ අනුමාන සිද්ධියට "න්‍යාය සිද්ධිය"යි නමකු දු වේ.

B. **ආගමසිද්ධිය** නම්; ත්‍රිපිටක බුද්ධ වචනය දැනීමෙන් නිවණ ගැණ පෘථග්ජන ගොචරතාත් පිරිසිදු දැනීම ඇති කර ගැන්ම යි. එය පිරිමියෙකු පවා ආයුර්වේදය ඉගණීමෙන් ප්‍රසව දුඃඛය ගැණ විස්තර දැන ගැණීම මෙනි.

C. **ප්‍රත්‍යක්ෂසිද්ධිය** නම්; අෂ්ටාර්ය පුද්ගලයන් විසින් ඊට පැමිණීම හා පැමිණී බව යන දෙයාකාරයෙන් ඉන්ද්‍රිය සාක්ෂි කොට දැනීම යි. එය ප්‍රසූත කරමින් සිටිනා වූ ද ප්‍රසූත කළා වූ ද අඟනන් විසින් එහි දුක දැනීමක් මෙනි.

තවත් ලෝකසිද්ධිය නම් කාරණයක් ඇතත් එය පාදක කොට තර්ක කරනු මිස එයින් නිවණ ගැණ කිසිත් දැනීමක් නැති හෙයින් මෙහි නො කියන ලදී. එය නම් සාමාන්‍ය ලොකයාගේ පිළිගැණීම යි. වෙදයෙහි ප්‍රසිද්ධ කාරණය මිථ්‍යා දෘෂ්ටිහු ආගම සිද්ධ වශයෙන් ගණිතත් බෞද්ධයන් විසින් ලොකසිද්ධයට ම ඇතුලත් කරණු ලැබේ.

**සි ඩි පා ද ය යි.**

6. **නිර්වාණ සුඛතාඛ්‍යය** නම්:- නිවණ සැප බව යුක්ති සහිත ව දක්වීම හෝ දැනගැන්ම යි. මෙහි යුක්ති නම් සිද්ධ්‍යාදිය යි. ඒ මෙ සේ යි:-

A දද කුෂ්ට රොගයකින් පීඩිතවූවෙක් නිතර ගස් ගල් වල ඇඟ අත පය උලමින් පහුරුගා ගණිමින් එයින් සිරී ගොස් දැවිල්ල ගත් තැන්වලට පිඹිමින් පවන් සලා ගණිමින් පැසවා ගිය තැන්වලට මෘදු මොලොක් දේ වසා බඳිමින් සුව පත්වූවෙකු විසින් නො ලැබිය හැකි සැප වෙදනාව හා දුක් වේදනාව විඳිමින් වසන්නේ ද; ඔහු පහුරුගා ගැණීම් ආදි

යෙන් එ පමණ බලවත් සැප වේදනාවකුත් විඳිමින් වසන්නේ වී නමුත් දුකින් පෙළෙන්නේ ය යි කියා ද, ඒ සැප වේදනාවත් දුකට හේතු බැවින් දුකෙහි කොටසක් යයි ද, ලොකසිද්ධයි මෙය දුකැයි කියන්ට බුදුකෙනෙක් ම ඕනෑ නො කරයි. යලි ක්‍රිස්තුස් මහමත් ආදී කාගෙන් ඇසුවත් දුකැ යි කියනවා ම ඇති. තවද යම් බෙහෙතකින් ඒ රෝගය සුවවූ කල අරකී සැප රාශිය සම්පූර්ණයෙන් ම නැති වන්නේ වී නමුත් ඔහුට වූයේ සැපයෙක සෙතකැ යි කියා ද එසේ ම කවුරුත් කියනවා ඇති. හෙවත් ලොකසිද්ධයි. එමෙන් උපාදානස්-කන්ධ පස දුකට හෙතු බැවින් රොගයෙකි. පෘථග් ජන සියල්ල පැලඹෙන්නා වූ සැප සොම්නස් වේදනාව, අර කුෂ්ටරෝගියා නියගැමෙන් ලබන සැප වෙදනාව මෙන් ම ඒ රොගයෙහි අවයවකි. හෙවත් උපාදානස්කන්ධයන් ගෙන් එකක් වන්නේ ය. එහෙයින් ඒ වෙදනාවත් ඇතුළත් උපාදානස්කන්ධ පස ම දුකැ යි යනු ද, උපාදානස්කන්ධයන්ගේ හේතු නැසීමෙන් ඔවුන්ගේ මතු උත්පත්තිය වැළැක්වීම යයි කියන ලද නිර්වාණ අර නිරොගිතාව ය මෙන් සැපයැ යි යනු ද, න්‍යාය සිද්ධ හෙවත් අනුමාන සිද්ධද, ආගම සිද්ධ හෙවත් බුද්ධවචනයෙන් ප්‍රකාශ ද වෙයි.

B බඩගිනි ඇති කල්හි ම භොජනය ද, පිපාසය ඇති කල්හි ම පැන් ද, සීතල ඇති කල්හි ම ගිනිතැපීම ද, උෂ්ණය ඇති කල්හි ම සීතල ද සැප වන්නේ ය. නුමුත් බඩගිනි පිපාසා ශීතොෂ්ණ නැති කල, ඒ ආහාර පැන් ගිනිතැපිලි සිහිල් යන යථොක්ත සැප වස්තුහු දුක් බව ලොකසිද්ධ යි. හෙවත් බුදුකෙනෙක් ම නො කීවාට ලොව කවුරුත් පිළිගෙණ තිබෙන සත්‍යයකි. මේ සියල්ලෙහි නියත වූ සැප බවක් නැති ව තිබිය දී සැප වෙශයෙන් එලඹවන ලද්දේ හෙවත් සැප ආකාරයෙන් පෙන්නා දෙන ලද්දේ එය ප්‍රයොජන ගන්නහුතුළ තිබෙන උවමනාව විසින් බව පැහැදිලි යි. මෙකී සැප බව නිතර පවත්නේ නැති බව සමහරවිටක දුක් වශයෙන් දවතින නිසා බව ප්‍රකට යි. එබඳු අනිත්‍ය දෙය නියතයෙන් දුක් බව බුද්ධවචන යි. එපමණක් නො ව සියලු සැප සොම්නස් වෙදනාවෝ ම සැප වශයෙන් සලකනු ලබන්නේ

එකී උවමනාව, පැතීම, හෙවත් තෘෂ්ණාව නිසා ම යි. තෘෂ්ණාව නැති කිරීමෙන් මුළු වේදනූපාදනක්ඛන්ධය ම ත් දුක් ගොඩට ගැණී එපාවන කල සැපය යි කියන්ට ඉතිරිව ඕනෑ වන උපාදනක්ඛන්ධයක් නැත්තේ ය. මෙ සේ සැප නම් ඒ දුක නැති කිරීම් සංඛ්‍යාත නිවණ පමණ ය යනු න්‍යායාගම සිද්ධයි.

C අතිකක උපකාරයෙන් ඇතිවන සියල්ල නැති වන ස්වභාව ඇත්තෝ හෙවත් අනිත්‍යයෝ වෙති. කලනම්, මවු පියන්, විඥාන, ඍතු, ආහාර යන බොහෝ උපකාරයන් ගෙන් හෙවත් ප්‍රත්‍යයන් ගෙන් ඇතිවන මේ කාය උප්පාදයෙන් ඇති ව මරණයෙන් නැති වන්නාක් මෙනි.

අසඞ්ඛත ධාතු හෙවත් අතිකක උපකාරයෙන් නූපන් ධර්මය නම් වූ නිවණ හැර අනික් සියල් ල ම සංසකාරයෝ බව අසවල් නම් දේට, කාරණයට, නොහොත් ධර්මයට අතිකක ප්‍රත්‍යයක් හෙවත් උපකාරයක් නැතැ යි පෙන්වන්ට නො හැකි හෙයින් ලෝක සිද්ධයි. සංසකාරවා සැබෑ නම් අනිත්‍ය ද වන බව න්‍යායාගම සිද්ධයි. එහෙයින් ම ආයර්‍ය සත්‍යයකි. සංඛතය හෙවත් සංසකාරය මෙ සේ දුක් නම් වන කල අසංඛත ධාතුවෙහි අඥනයන් විසින් කෙල ගලින සැපවෙදනා නම් සංඛත දුක නැති හෙයින් ම අවිද්‍යා වශයෙන් හා අර්ථ වශයෙන් සැප නම් වන්නේ ය. යනුද න්‍යායාගම සිද්ධයි.

D කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන නීවරණ ධර්මයන් ගෙන් හරිනව පවත්නා සත්වයා එයින් මිදී ප්‍රථම ධ්‍යානයෙන් සමාහිත වූ කල ද, එම ප්‍රථමධ්‍යාන විපාකයෙන් බ්‍රහ්ම භවය ලත් කල ද වැඩි ශ්‍රෙෂ්ඨ භාවයකට පැමිණෙනු පමණක් නො ව අර්ථ වශයෙන් වැඩි සැප ඇත්තේ ද වෙයි. මතු විතර්ක විචාර ප්‍රීති සුඛ යන ධ්‍යානාඞ්ගයන් ගෙන් වැඩි වැඩි බරපතල වූ මූල මූල එක හැර දමමින් ද්විතීයාදි ධ්‍යානයන් උපදවා වසන කල ද, ඉන් ඉන් භවය ලත් කල ද මතු මතුත් වඩ වඩා ශ්‍රෙෂ්ඨ වෙමින් වඩ වඩා සැප ඇති වෙමින් ගොස් බරපතල වූ කසිනාදී

ප්‍රඥප්තීන් ද සූක්ෂම වූ ආකාශ ප්‍රඥප්තිය ද, සූක්ෂමතර වූ විඥානය ද, පරම සූක්ෂම වූ අභාවප්‍රඥප්තිය ද, අරමුණු නො කර හැර දමමින් අරූපාවචරයන් ඉපද වූ කල ද, ඉන් භවය ලත් කල ද තව තවත් ශ්‍රෙෂ්ඨ වෙමින් තව තවත් වැඩි සැප ඇතිවන්නේ ය යනු ලෝකසිද්ධයි.

එ හෙයින් ම වේදනා සැපය හැර දමා වැඩි වැඩි දුර යාම වැඩි වැඩි සැපය යි ලෞකික මහාත්මයන්ටත් අභිමත බව මෙයින් පෙණේ. ඉතින් මෙසේ භුක්තිය අඩුකර කර යාම වඩ වඩා උතුම් බවට ද, වඩ වඩා අඩු හෙයින් වූ සැප යට ද කාරණා වන කල අභුක්තිය හෙවත් නිවණ පරම සැපය බව න්‍යායසිද්ධද ආගම සිද්ධ ද වේ.

මෙ සේ මේ පර්‍ය්‍යාය සතරෙන් ද තවත් බොහෝ පර්‍ය්‍යාය වලින් ද ලොකසිද්ධ කාරණයෙන් න්‍යායසිද්ධ හෙවත් අනුමාන සිද්ධවන නිර්වාණ සුඛ තත්ත්වයාගේ ආගම සිද්ධිය ශාන්ත ප්‍රඥ ශ්‍රද්ධාවන් ගෙන් දැන අදහා සතරමග සතරඵලයන්ට පැමිණීමෙන් ප්‍රත්‍යක්ෂ වශයෙන් සිද්ධකටයුත්තේ ය.

## සු ඛ ත ත්ව පා ද ය යි.

"ඉති චිත්තං චෙතසිකං රූපං නිබ්බාණමිච්චපි,
පරමත්ථං පකාසෙන්ති චතුද්ධාව තථාගතා"

(මෙ සේ චිත්තය චෛතසිකය රූපය නිර්වාණය යි කියා සතරපරිද්දකින් ම තථාගතවරයෝ පරමාර්ථය ප්‍රකාශ කෙරෙත්.)

## සත්වැනි වූ නිර්වාණවර්ණනා කාණ්ඩය නිමි.

මෙ තෙකින් පරමාර්ථ සතර සම්බන්ධව සවකිය ලක්ෂණ වශයෙන් සමභෙද නොවී සිටිනා වූ විඥානය ය, දෙපණස් චෛතසිකයෝ ය, අටළොස් නිෂ්පන්න රූපයෝ ය, නිර්වාණ ය යි යන වස්තුධර්ම දෙසැත්තෑව දක්වා නිමකර ණ ලද්දහුය ඉක්බිති ඔවුන්ගේ ඒ ඒ පර්‍ය්‍යාය දේශනා මාර්ගයන්හි නානා ප්‍රකාරව රාශි වශයෙන් විභාග කොට වදාළ ඒ ඒ රැස් මේ අට වැනි පරිච්ඡෙදයෙහි දක්වනු ලැබෙත්.

ඒ මේ **සමුච්චය** විභාගය වනාහි (A.) අකුසල සමුච්චය විභාගය, (B.) **මිස්සක** සමුච්චය විභාගය, (C.) බොධපක්ඛිය සමුච්චය විභාගය, (D.) සබ්බසමුච්චය විභාගය යි සතර පරිදි වේ. එහි:–

A. **අකුසලසමුච්චය** නවයක් වෙති. එ නම්:–

1. කාමාසව, භවාසව, දිට්ඨාසව, අවිජ්ජාසවය යි සතර **ආසව** යන්ගේ ද;

2. කාමෞඝය, භවෞඝය, දිට්ඨෞඝය, අවිද්‍යෞඝය යන සතර **ඕඝයන්ගේ** ද;

3. කාමයොගය, භවයොගය, දිට්ඨියොගය, අවිජ්ජායොගය යන සතර **යොග**යන්ගේ ද;

4. අභිජ්ඣාකාය ගන්ථය, ව්‍යාපාදකාය ගන්ථය, සීලබ්බත පරාමාසකායගන්ථය, ඉදංසච්චාභිනිවෙස කායගන්ථය යන සතර **ග්‍රන්ථ**යන්ගේ ද;

5. කාමූපාදානය, දිට්ඨුපාදානය, සීලබ්බතුපාදානය, අත්තවාදුපාදානය යන සතර **උපාදාන**යන්ගේ ද;

6. කාමච්ඡන්ද නීවරණය, ව්‍යාපාද නීවරණය, ථිනමිද්ධ නීවරණය, උද්ධච්ච කුක්කුච්ච නීවරණය, විචිකිච්ඡා නීවරණය, අවිජ්ජා නීවරණය යන සවැදෑරුම් **නීවරණ**යන්ගේ ද;

7. කාමරාගානුසය, භවරාගානුසය, පටිඝානුසය, මානානුසය, දිට්ඨානුසය, විචිකිච්ඡානුසය, අවිජ්ජානුසය යන සත් **අනුසය**යන්ගේ ද;

8. a. කාමරාග සංයොජනය, රූපරාග සංයොජනය, අරූපරාග සංයොජනය, පටිඝ සංයොජනය, මාන සංයොජනය, දිට්ඨිසංයොජනය, සීලබ්බත පරාමාස සංයොජනය, විචිකිච්ඡා සංයොජනය, උද්ධච්ච සංයොජනය, අවිජ්ජා සංයොජනය යන සූත්‍රාන්තික දස **සංයොජන**යන්ගේද; නොහොත්

b. කාමරාග, භවරාග, පටිඝ, මාන, දිට්ඨි, සීලබ්බත පරාමාස, විචිකිච්ඡා, ඉස්සා, මච්ඡරිය, අවිජ්ජා යන අභිධර්මනයෙහි වදාළ අන්‍ය දශ සංයොජනයන්ගේ;ද

9. ලොභ, දෙස, මොහ, මාන, දිඨි, විචිකිච්ඡා, ථිනා උඬච්ච, අහිරික, අනොත්තප්ප යන කිලෙස යන්ගේද යන අකුසල ධර්මයන්ගේ වෙන වෙන රාශි නවයයි. එයින්:-

1. ආශ්‍රවයෝ නම්: හාත්පසින් වැගිරෙන්නාක් මෙන් ද, බොහෝ කලක් පිලුනුවූවාක් මෙන් ද සැලකිය යුතු පාපධර්ම කොටඨාසයයි.

2. ඕඝයෝ නම්: සත්වයන් සංසාර වෘත්තයෙහි ගිල්වන ගඞ්ගාගෙණ යන මහ ගංවතුරු මෙන් සැලකිය යුතු අකුශල ධර්මයෝයි.

3. යොගයෝ නම්: සත්වයන් ගැලක නගුලක මෙන් සංසාර වෘත්තයෙහි යොදන්නාවූ බිඳින්නාවූ විය රුහැන් වැනිකොට සැලකිය යුතු අකුශල ධර්මයෝයි.

4. ගන්ථයෝ නම්: කණුවක සොරෙකු බැඳ ගැටලන්නාක් මෙන්ද, දමක මලක් තබා ගොතන්නාක් මෙන්ද, සංසාරවෘත්තයෙහි සත්වයන් ගැටලන ගැට වැනි කොටද, ගෙන තන ගෙතුම් වැනි කොටද සැලකිය යුතු අකුශලධර්මයෝයි.

5. උපාදානයෝ නම්: කිඹුලෙකුගේ ඇල්ලීමක් මෙන් දැඩිකොට අල්වාගැණීම් වශයෙන් පවත්නා අකුශල ධර්මයෝයි.

6. නිවරණයෝ නම්: පටලයකින් ඇසමෙන්ද, අලු වෙන් ගිනිඅඟුරක් මෙන්ද සිත මුවහකරන්නාවූ යහපත් සමථ විදර්ශනා දෙමගටම බාධකවූ අකුශල ධර්මයෝයි.

7. අනුසයයෝ නම්: සත්වයන් කෙරෙහි අත්නොහැර බැඳී සිටගෙණ ප්‍රත්‍යය ලත්ලත්කල ඉදිරියට පැමිණෙන්නා වූ පාපධර්මයෝයි.

8. සංයොජනයෝ නම්: ගවයන් දිගවෙලිකරන්නාක් (ගස්ලන්නාක්) මෙන් සත්වයන් ඒ ඒ භවයෙහි බැඳතබන කඹවැනි කොට සැලකිය යුතු පාපධර්මයි.

9. කිලෙසයෝ නම්:- වස්ත්‍ර කෙලෙසන්නාවූ මල මූත්‍ර කුණු මඩ ධූලි තෙල් ලේ සැරව ආදිය මෙන් සත්වයන් නොහොත් සිත කෙලෙසන්නාවූ පාපධර්මයි.

10. **පරාමාස නම්:**– මාතෘකාවකින් දිට්ඨිචෛතසිකය මේ **සමුච්චයධර්මයන්** සමග අභිධර්මයෙහි දක්වා තිබේ. එහෙත් එය දේශනානය වශයෙනුත් වස්තු ධර්මවශයෙනුත් එකක්ම බැවින් සමුච්චයකාණ්ඩයට නොගැලපෙතත්, ඔවුන් හා සභාගතාවය නිසාද අන් දක්විය යුතු තැනක් නැති නිසා යට වීයන්ට හැරිය යුතු නොවන බැවින්ද මෙහිම දක්වමු. එනම්: එකම දිඨි පරාමාස නම්වූ විරුඩාකාරයෙන් නොහොත් අන්‍යාකාරයන්ගෙන් ආමර්ශණය හෙවත් ඇල්ලිම කරණ ධර්මයයි.

ඒ එසේමයි: මිථ්‍යාදෘෂ්ටියෙන් වූකලී අනිත්‍යවූ කාරණය නිත්‍ය හෙවත් ශාස්වත වශයෙන්ද, දුක්ඛවූ කාරණය සුඛවශයෙන්ද, අනාත්මවූ කාරණය ආත්මවශයෙන්ද, ආමර්ශණය හෙවත් ඇල්ලීම කෙරෙත් මැ යි. යට කී ශාස්වත උච්ඡේද යන දෘෂ්ටි දෙක මේ පරාමාසයාගේ ප්‍රභෙද යි.

මෙකී ආසව ඔඝ යොගාදී සමුච්චයන් අතුරෙහි කාම, භව යන නම් දෙකින් කාමය භවය යන දෙක වස්තු කොට ඇති තෘෂ්ණාව ද; එ සේ ම ගන්ථ උපාදාන සංයොජනයන් අතුරෙහි සීලබ්බතපරමාස, ඉදං සච්චාභිනිවෙස, අත්තවාද යන නම් වලින් ඒ ඒ ලක්ෂණයෙන් පැවැත්තාවූ ද පරාමාස නාමයෙන් සාමාන්‍ය වූ ද දිට්ඨිගතය ම අදහස් කරණ ලදී. එ හෙයින්: පරමාර්ථ වශයෙන් හෙවත් වස්තු ධර්මයන් අතුරෙන්:–

(1-4) **ආසව ඔඝ යොග** යන මේ ධර්මයෝ තණ්හා දිට්ඨි අවිජ්ජා වශයෙන් ද, **ගන්ථයෝ** ලොභ දෙස දිට්ඨි වශයෙන් ද තුණ තුණ වෙති.

(5) **උපාදානයෝ** ලොභ දිට්ඨි වශයෙන් දෙදෙනෙකි.

(6) **නිවරණයෝ** ථින මිද්ධ දෙක දෙකක් හැටියටද උද්ධච්ච කුක්කුච්ච දෙක දෙකක් හැටියට ද ගණින් ගෙණ අටක් වෙති.

(7) **අනුසයයෝ** කාමරාග භවරාග දෙක තණ්හාවය යි ගණින් ගෙණ සයක් වෙති.

(8) **සංයොජනයෝ** සූත්‍රාන්ත නයෙහි ලොභ දෙස මාන දිට්ඨි විචිකිච්ඡා උද්ධච්ච අවිජ්ජාය යි සතක් ද, අභිධර්ම නයෙ

ති එයින් උද්ධච්චය හැර ඉස්සා මච්ඡරිය දෙක දැමීමෙන් අටක් ද; දෙ තය මිශ්‍ර කිරීමෙන් හැර දැමූ උද්ධච්චයත් දැමූ කල නවයක් ද වෙති

(9) ක්ලේශයෝ උද්දෙශ කළ දශය ම වෙති.

(10) පරාමාසය දිට්ඨිපරාමාස වශයෙන් එකක් ම වේ. මේ අර්ථය ගාථාවන්ගෙනුදු:-

"ආසවොඝා ච යොගා ච තයො ගන්ථා ච වත්තුතො,
උපාදානා දුවෙ වුත්තා අට්ඨ නීවරණා සියුං.
ඡලෙ වානුසයා හොන්ති නව සංයොජනා මතා,
කිලෙසා දස වුත්තොයං නවධා පාපසංගහො."

පරාමාසයත් සමග එය ම සංඛ්‍යා පිළිවෙළින්:-

එකො ඉධ පරාමාසො ද්වොපාදානා ච වත්තුතො
ගන්ථා යොගාසවොඝා ච තයො ඡානුසයා සියුං.
අට්ඨනීවරණාවිධා නව සංයොජනා දස
කිලෙසාති පවුත්තෙන තෙ දස පාප සමුච්චයා.

අකුසල සමුච්චය විභාග පාදය යි.

B. මිස්සකසමුච්චය හතක් වෙති. එ නම්:-

1. ලොභය, දෙසය, මොහය, අලොභය, අදෙසය, අමොහ ය යන හෙතු සයගේ ද;

2 විතක්ක, විචාර, පීති, එකග්ගතා, සොමනස්ස, දෙමනස්ස, උපෙක්ඛා යන ධ්‍යානාංග සතෝ ද;

3. සම්මාදිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි, මිච්ඡා දිට්ඨි, මිච්ඡා සඞ්කප්ප, මිච්ඡා වායාම, මිච්ඡා සමාධි යන මග්ගඞ්ග දෙළසේ ද;

4. චක්ඛුන්ද්‍රිය, සොතින්ද්‍රිය, ඝාණින්ද්‍රිය, ජිව්හින්ද්‍රිය, කායින්ද්‍රිය, ඉත්ථින්ද්‍රිය, පුරිසින්ද්‍රිය, ජීවිතින්ද්‍රිය, මනින්ද්‍රිය, සුඛින්ද්‍රිය, දුක්ඛින්ද්‍රිය, සොමනස්සින්ද්‍රිය, දෙමනස්සින්ද්‍රිය, උපෙක්ඛින්ද්‍රිය, සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය, අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය, අඤ්ඤින්ද්‍රිය, අඤ්ඤාතාවින්ද්‍රිය, යන ඉන්ද්‍රිය විසිදෙකෝ ද;

5. සද්ධා බල, විරිය බල, සති බල, සමාධි බල, පඤ්ඤා බල, හිරි බල, ඔත්තප්ප බල, අහිරික බල, අනොත්තප්ප බල යන බල නවයේ ද;

6. ඡන්දාධිපති, චිත්තාධිපති, විරියාධිපති, විමංසාධිපති යන අධිපති සතරේ ද;

7. කබලිංකාරාහාර, ඵස්සාහාර, මනොසංචෙතනාහාර, විඤ්ඤාණාහාර යන ආහාර සතරේ ද, යන මේ කුශලාකුශල අව්‍යාකෘත ධර්මයන්ගෙන් මිශ්‍ර වූ ධර්මයන්ගේ වේත වෙත රාශි සතයි. එසින්:–

1. හෙතූහු නම් රුකක් සපිරව සිටීමට උපකාරවන්නා වූ මුල් මෙන් ද, වස්ත්‍රයක සායමක් සපිර වීමට උපකාර වූ කසටයක් මෙන් ද, කුශලාදී යම් බඳු වූ චිත්තචෛතසික ධර්ම යක් සපිර ව පිහිටීමට උපකාර වූ ධර්මයෝ යි.

ධ්‍යානාඞ්ගයෝ නම්:– එකඟ කොට අවික්ෂෙප වශයෙන් සංසිඳුවන ලද ධ්‍යාන චිත්තයාගේ දළ සියුම් අවස්ථාවන් ගේ ලක්ෂණ වූ චෛතසික ම වූ අවයම ධර්මයෝ යි. ඔව්හු අස්වූ ශස්‍යඵලය සම්බන්ධ ගොයම, නොපෙළු විය, පෙළු විය, තිඹුඩු සාල, පෑසි සාල යන අවස්ථාවන්ට ලකුණු වූ පිදුරු, බොල්, දහවියා, වීකුඩු, හාල් යන එකට සම්බන්ධ ව තිබී ක්‍රම යෙන් වෙන් කරණු ලබන අවයව වැනි වෙති.

3. මග්ගාංගයෝ නම්: යහපත් අයහපත් ප්‍රතිපත්ති මාර්ග යන්ගේ අවයව වූ ධර්මයෝ යි.

4. ඉන්ද්‍රියයෝ නම්: ගින්නෙහි උෂ්ණය, සීනිවල රසය ස්නාදිය මෙන් එක් ව පවත්නා බොහෝ ධර්මයන් අතුරෙහි ප්‍රධාන ව වැටහෙන ධර්මයෝ යි.

5. බල නම්: ක්‍රූරකර්මවලට බලදෙන සුරාවක් මෙන් අකුශල කුශලාදි ඒ ඒ චිත්තචෛතසික ධර්මයන්ට ඒ ඒ පරිද් දෙන් ඉපදීමට බලදෙන ධර්මයෝ යි.

6. අධිපතිහු නම්: සේනාව කෙරෙහි සෙනෙවියෙක් මෙන් තමා හා එක්ව උපදනා ධර්මයන් කෙරෙහි අධිපතිකම් කරණ හෙවත් ඔවුන් ඒ ඒ අන්දමට යොදාගැණීමෙහි මූලික වන ධර්මයෝ යි.

7. **ආහාරයෝ** නම්: උෂ්ණත්වාලෝකාදියෙන් යුක්ත වූ පහන් දැල්ල පෝෂ්‍ය කරණ තෙලක් මෙන් රූපාරූපධර්මයන් පෝෂ්‍ය කරණ ධර්මයෝ යි.

මෙහි ඉන්ද්‍රියයන් අතුරෙහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රිය යනු සෝතාපත්ති මග්ග ඤාණයට ද, අඤ්ඤාතාවින්ද්‍රිය යනු අරහත්තමග්ග ඤාණයටද, අඤ්ඤින්ද්‍රිය යනු ඉතිරි ලෝකෝත්තර ඤාණ සයට ද නම් වෙති. එක ම රූපජීවිතින්ද්‍රිය අරූපජීවිතින්ද්‍රිය වශයෙන් දෙකකට ගණන් ගැණේ. ද්විපඤ්චවිඤ්ඤාණ සිත්වල විතක්ක විචාරාදී ධ්‍යානාඞ්ගයෝ ද; විරිය චේතසිකය නො යෙදෙන සිත්වල (ලැබෙන ඒකාග්‍රතාව පවා දුර්වල බැවින් සමාධි බල වශයෙන් වත් නො ගැණෙන හෙයින්) බලධර්මයෝ ද; අහේතුක සිත්වල (ලැබෙන විතක්ක විරිය එකග්ගතාවෝ පවා හේතුවියෝගයෙහි සම්මාසංකප්ප සම්මාවායාම සම්මාසමාධි වශයෙන් වත් නො ගැණෙන බැවින්) මාර්ගාඞ්ගයෝ ද නො ලැබෙති. එසේ ම විචිකිච්ඡා සහගත සිතේ ඒකාග්‍රතාව යම්තම්කට තිබෙනවා පමණක් මිස, (සම්මා සමාධි සමාධින්ද්‍රිය සමාධිබල වශයෙන්) මග්ග ඉන්ද්‍රිය බල භාවයට පැමිණෙන තරම් ශක්තිමත් නො වේ. ද්විහේතුක තිහේතුක ජවන්සිත්වල පමණක් මිස සෙසු චිත්තෝත්පාදවල ලැබෙන ඡන්ද චිත්ත විරිය පඤ්ඤා යන සතර අධිපති භාවයට නො පැමිණෙනු පමණක් නො ව ඒ සතර එකට ලැබෙන සිතක වත් එකක් අධිපති වන කල ඉතිරිවාට අධිපති භාවය නො ලැබෙන බවද දත යුතු යි. එසේ කල වස්තුධර්ම වශයෙන්:–

(1) **හේතුසයක් ම** වෙති. එහි **අමෝහය** නම් ප්‍රඥාව යි.

(2) **ධ්‍යානාඞ්ග** සත. සෝමනස්ස දෝමනස්ස උපෙක්ඛා යන තුණ එක ම වේදනාව වීමෙන් පසක් වේ.

(3) **මාර්ගාඞ්ග** දෙළස සංකප්ප වායාම සමාධි යන තුණ සම්මාමිච්ඡා වශයෙන් දෙක දෙක ව සයක් වුවත් විතක්ක විරිය එකග්ගතා වශයෙන් තුණ පමණක් ම බැවින් ඉතිරි පඤ්ඤා සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව සති දිට්ඨි යන සයත් සමග නවයක් වෙති. එහි **සම්මාදිට්ඨි** නම් පඤ්ඤාව යි.

(4) **ඉන්ද්‍රිය** දෙවිස්ස වනාහි ජීවිතින්ද්‍රිය දෙකක් වීමෙන්ද සුඛින්ද්‍රියාදී පස එක ම වෙදනාව වීමෙන් ද, පඤ්ඤින්ද්‍රියාදී සතර එක ම පඤ්ඤාව වීමෙන් ද සොළසක් වෙති.

(5) **බල** නවය එ ලෙස ම නවයක් වෙති.

(6) **අධිපති** සතර එසේ ම සතරක් වෙති. එහි **ඡන්‍දය** නම් විඤ්ඤාණය යි. **විමංසා** නම් පඤ්ඤාව යි.

(7) **ආහාර** සතරත් එ සේ ම සතරක් වෙති. එහි **මනොසංචෙතනා** යනු චෙතනාව යි.

මෙම අර්ථය ගාථා දෙකකිනුත්.

"ඡහෙතු පංච ඣානඞ්ග මග්ගඞ්ග නව වත්‍ථුතො,
සොළසින්ද්‍රිය ධම්මාච බලධම්මා නවෙරිතා.

චත්තාරොධිපතී වුත්තා–තථාහාරාති සත්තධා,
කුසලාදිසමාකිණ්ණො වුත්තොමිස්සකසංගහො."

**මිස්සක සමුච්චය විභාග පාදය යි.**

c. **බොධිපක්ඛිය සමුච්චය** හතක් වෙති. එනම්:–

1. කායානුපස්සනා සතිපට්ඨානය, වෙදනානු පස්සනා සතිපට්ඨානය, චිත්තානුපස්සනා සතිපට්ඨානය, ධම්මානු පස්සනා සතිපට්ඨානය යන **සතිපට්ඨාන** සතරේ ද;

2. උපන් පාපධර්මයන්ගේ පහකිරීමට උත්සාහය, නූපන් පාපධර්මයන්ගේ නොඉපදවීමට උත්සාහය, නූපන්කුශලධර්මයන්ගේ ඉපදවීමට උත්සාහය, උපන් කුශලධර්මයන්ගේ වැඩි දියුණුවට උත්සාහය යන **සම්මප්පධාන** සතරේ ද;

3. ඡන්දිද්ධිපාද, චිත්තිද්ධිපාද, විරියිද්ධිපාද, වීමංසිද්ධිපාද යන **ඉද්ධිපාද** සතරේ ද;

4. සද්ධින්ද්‍රිය, විරියින්ද්‍රිය, සතින්ද්‍රිය, සමාධින්ද්‍රිය, පඤ්ඤින්ද්‍රිය යන **ඉන්ද්‍රිය** පසේ ද;

5. සද්ධා බල, විරිය බල, සති බල, සමාධි බල, පඤ්ඤා බල යන බල පසේ ද;

6. සති සම්බොජ්ඣඞ්ග, ධම්මවිචය සම්බොජ්ඣඞ්ග විරිය සම්බොජ්ඣඞ්ග, පීති සම්බොජ්ඣඞ්ග, පස්සද්ධි සම්බොජ්ඣඞ්ග, සමාධි සම්බොජ්ඣඞ්ග, උපෙක්ඛා සම්බොජ්ඣඞ්ග යන **බොජ්ඣඞ්ග** සතේ ද;

7. සම්මාදිට්ඨි, සම්මාවාචා, සම්මා කම්මන්ත, සම්මාආජීව සම්මාවායාම,සම්මාසති,සම්මාසමාධි යන **මග්ගඞ්ග** අටේ ද යන සත්තිස්බොධිපාක්ෂික ධර්මයන්ගේ වෙන වෙන රාශි සතයි. එසින්:-

1. **සතිපට්ඨානයෝ** නම්. අනභිමතයක අරමුණු කරා සිතට යන්ට නො දී, කායාදී අභිමතයක ඒ ඒ අරමුණු කෙරෙහි සිහිය පිහිටුවා ගැණීමෙන් සිත රැකගන්න උපායයෝ යි.

2. **සම්මප්පධානයෝ** නම්: යහපත සිද්ධකර ගැණීම පිණිස උත්සාහ දැරිය යුතු ආකාරයෝ යි.

3 **ඉද්ධිපාද** යෝ නම්: සමෘද්ධියේ පාදයෝ යි. (**පාද** යනු සතරින් කොටසට, කකුලට හෝ අඩිතාලමට නම්). සමර්ථවෛද්‍ය ද යහපත් ඖෂධ ද දක්‍ෂපිරිස ද ධනය ද යන සතර ලෙඩෙකුගේ සමෘද්ධියෙහි පාදසතරය යි වෛද්‍ය ශාස්ත්‍රයෙහි කියාතිබෙන්නාක් මෙන් මේ ඡන්දාදී ධර්මයෝ පුද්ගලයෙකුගේ ගුණ සමෘද්ධියෙහි පාද බැවින් එ ලෙස නම් කරණ ලද්දාහු ය. යට අධිපති වශයෙන් කියන ලද නාම යොත් මේවා ම වුවත් එහි සොභන අසොභන දෙකට සාධාරණ බවත් මෙහි ඒකාන්තයෙන් සොභන බවත් වෙනස බව දත යුතු යි.

4. **ඉන්ද්‍රිය**යෝ යට කියන ලද පරිදි ම යි.

5. **බල** ද යට කියන ලද පරිදි ම යි.

6. **බොජ්ඣඞ්ගයෝ** නම්,බොධි නම් ලත් අර්හත්වයේ අවයව වශයෙන් පවත්නා ධර්මයෝ යි.

7. **මග්ගඞ්ගයෝ** නම්, සොවාන් ආදී මාර්ගවල අවයවවූ ධර්මයෝ යි. මාර්ගසිතේ ම ත් මේ ධර්ම අට පමණක් මාර්ග නම්. ඒ සමග පවත්නා ශ්‍රද්ධාදී සෙසු සොභන ධර්මයෝ **පවා** මග්ග සම්පයුත්ත නම් වා මිස මග්ග නම් නො වෙත් මැ යි.

මෙහි සතිපට්ඨාන සතර ම සම්මා සති නමින් ද ගැණෙන එක ම සති චෛතසිකය යි. සම්මප්පධාන සතර ම සම්මා වායාම නමිනුත් ගැණෙන එකම විරිය චෛතසිකය යි වීමංසා යනු ද ධම්මවිචය යනුද පඤ්ඤාවට නම්. එවිට වස්තුධර්ම වශයෙන්:–

(1) **සතිපට්ඨාන** සතර සති නම් වූ එකක් ම වෙයි.

(2) **සම්මප්පධාන** සතර විරිය නම් වූ එකක් ම වේ.

(3) **ඉද්ධිපාද** සතර සතරක් ම වෙති. එහි චිත්ත වීමංසා යන දෙක යට කී සේ මැ යි.

(4) **ඉන්ද්‍රිය** පස පසක් ම වෙති.

(5) **බල** පස ද පසක් ම වෙති.

(6) **බොජ්ඣඞ්ග** සත වනාහි පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය කායපස්සද්ධි චිත්තපස්සද්ධි වශයෙන් (වස්තුධර්ම දෙකක් වීමෙන් අටක් වෙති. මෙහි **ධම්මවිචය** නම් පඤ්ඤාව යි. **උපෙක්ඛා** නම් තත්‍රමජ්ඣත්තතාව යි. වේදනාව නො වේ.

(1) **මග්ගඞ්ග** අට අටක් ම වෙති.

එ සේ හෙයින් සති, විරිය, ඡන්ද, විඤ්ඤාණ, පඤ්ඤා, සද්ධා, එකග්ගතා, පීති, කායපස්සද්ධි, තත්‍රමජ්ඣත්තතා, විතක්ක, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මා ආජීව යන මේ වස්තු ධර්ම පසළොස සතිපට්ඨානාදීන්ගේ උද්දේශ ක්‍රමයෙන් යොදන ලද්දාහු සමුච්චය සතක් වෙති.

මෙහි කී පස්සද්ධි සම්බොජ්ඣඞ්ගය, කාය පස්සද්ධි චිත්ත පස්සද්ධි වශයෙන් වස්තු ධර්ම දෙකක් බව අනුරුද්ධ ස්වාමිපාද යන්ට යම්කිසි පමාවකින් නො සැල කී මේ ධර්ම සත්තිස වස්තු ධර්ම 15සකට නො ව තුදුසකට ගෙණ යොදන ලද ගාථා දෙකක් නම්:–

"ඡන්දො චිත්තමුපෙක්ඛා ච සද්ධා පස්සද්ධි පීතියො,
සම්මාදිට්ඨි ච සංකප්පො වායාමො විරතිත්තයං.
සම්මා සති සමාධීති චුද්දසෙ තෙ සභාවතො,
සත්තතිංසප්පභෙදෙන සත්තධා තත්‍ථ සංගහො."

යනු යි.

එය ම ශුද්ධකොට අපි මෙ සේ යොදමු:-

ඡන්දො චිත්තමුපෙක්ඛා ච සද්ධා පස්සද්ධියො දුවෙ
සම්මා වායාම සංකප්ප සමාධි සති දිට්ඨියො.
විරතිත්තයපීතීති චතුද්දසපච තෙ,
සත්තතිංසප්පභෙදෙන සංගහීයන්ති සත්තධා.

මේ වස්තු ධර්ම-පසළොසෙන් සංකප්පය, (කාය චිත්ත වශයෙන් ද්විප්‍රකාර වුවත් නමින් එක ම වූ) පස්සද්ධිය, පීතිය, උපෙක්ඛාව, ඡන්දය, චිත්තය, සම්මාවාචාය, සම්මාකම්මන්තය, සම්මාආජීවය, යන නවය පද සත්තිස අතුරෙන් එක එක ද; විරියය වනාහි සම්මප්පධාන සතරය, විරියිද්ධිපාදය, විරියින්ද්‍රියය, විරියබලය, විරිය සම්බොජ්ඣඞ්ගය, සම්මාවායාමය යන නව පදයක් ද; සතිය වනාහි සතිපට්ඨාන සතරය, සතින්ද්‍රියය, සතිබලය, සතිසම්බොජ්ඣඞ්ගය, සම්මාසතිය යන අටපදයක් ද; සමාධිය වූ කලී සමාධින්ද්‍රිය, සමාධි බලය, සමාධි සම්බොජ්ඣඞ්ගය, සම්මා සමාධිය යන සතර පදයක් ද; පඤ්ඤා තොම, වීමංසිද්ධිපාදය, පඤ්ඤින්ද්‍රිය, පඤ්ඤාබලය, ධම්මවිචය සම්බොජ්ඣඞ්ගය, සම්මාදිට්ඨිය යන පස් පදයක් ද; සද්ධා තොම, සද්ධින්ද්‍රිය, සද්ධාබලය යන දෙපදයක් ද භජනය කරත්. එම අර්ථය ස පදගාථාවකින්:-

"සංකප්ප පස්සද්ධි ච පීතුපෙක්ඛා-
ඡන්දො ච චිත්තං විරතිත්තයඤ්ච,
නවෙකට්ඨානා විරියං නවට්ඨ-
සතී සමාධි චතුපඤ්ච පඤ්ඤා
සද්ධාදුට්ඨානුත්තම සත්ත තිංස-
ධම්මානමෙසො පවරො විභාගො."

මේ සියලු ම සත්තිස ලොකොත්තර සිත්වල යෙදෙති. එනම් ප්‍රථමධ්‍යාන ලොකොත්තර සිත් අටේ පමණ යි. දුතිය තතියජ්ඣාන ලොකොත්තර සොළ සේ සම්මාසංකප්පය හැර ඉතිරි 36ද; චතුත්ථජ්ඣාන, පඤ්චමජ්ඣාන ලොකොත්තර සිත් සොළසේ සම්මා සංකප්ප, පීතිසම්බොජ්ඣඞ්ග යන දෙක හැර ඉතිරි 35ද ලැබෙත්. මොක්ෂ මාර්ගීය මාර්ගීය සම්බන්ධ පූර්වභාග

ප්‍රතිපදාව වූ සීලවිසුද්ධ්‍යාදී විසුද්ධි හය පවතින කල්හි ලෞකික සිත්වල ද, යට චෛතසික සම්ප්‍රයොගයෙහි කී පරිද්දෙන් සුදුසු සේ ලැබෙත්. මේ අර්ථය ගාථාව කී තැත්:–

"සබ්බෙ ලොකුත්තරෙ හොන්ති නවා සංඛාපපීතියො,
ලොකියෙපි යථායොගං ඡබ්බිසුද්ධිපවත්තියං"

**බොධ්‍යපක්ෂ්‍ය සමුච්චය විභාග පාදය යි.**

D. **සබ්බසමුච්චය** හයක් වෙති–එසින්:–

1. නාමය රූපය යන **නාමරූපයාගේ** ද;

2. රූපක්ඛන්ධ, වේදනාක්ඛන්ධ, සඤ්ඤාක්ඛන්ධ, සංඛාරක්ඛන්ධ, විඤ්ඤාණක්ඛන්ධ යන **ස්කන්ධපසගේ** ද;

3. රූපූපාදානක්ඛන්ධ, වේදනූපාදානක්ඛන්ධ, සංඤ්ඤූපාදානක්ඛන්ධ, සංඛාරූපාදානක්ඛන්ධ, විඤ්ඤාණූපාදානක්ඛන්ධ යන **උපාදානස්කන්ධ** පසගේ ද;

4. චක්ඛායතන, සොතායතන, ඝාණායතන, ජිව්හායතන, කායායතන, මනායතන, රූපායතන, සද්දායතන, රසායතන, ඵොට්ඨබ්බායතන, ධම්මායතන යන **ආයතන** දොළසගේ ද;

5. චක්ඛුධාතු, සොතධාතු, ඝාණධාතු, ජිව්හාධාතු, කායධාතු, මනොධාතු, රූපධාතු, සද්දධාතු, ගන්ධධාතු, රසධාතු, ඵොට්ඨබ්බ ධාතු, ධම්මධාතු, චක්ඛුවිඤ්ඤාණධාතු, සොත, විඤ්ඤාණධාතු, ඝාණවිඤ්ඤාණධාතු, ජිව්හාවිඤ්ඤාණධාතු, මනොවිඤ්ඤාණධාතු යන **ධාතු** අටළොසගේ ද;

6. දුඃඛාර්‍ය්‍යසත්‍යය, දුඃඛසමුදයාර්‍ය්‍යසත්‍යය, දුංඛ නිරොධාර්‍ය්‍යසත්‍යය, දුඃඛනිරොධගාමිනීප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යය යන **ආර්‍ය්‍යසත්‍ය** සතරේ ද වෙන වෙන රාශි පහයි. එහි:–

1. **නාමරූපය** නම්:–සූක්ෂ්මව වැටහෙන අරූප ය යි නම් ලත් චිත්ත චෛතසික නිර්වාණ යන නාමය හා, දළව වැටහෙන අටවිසි රූපය යන දෙක යි. මෙහි නාමය උෂ්ණය මෙන් ද, රූපය ගිනිගොඩ මෙන් ද සැලකිය යුතු. පටිච්ච සමුප්පාද නයෙහි මතු කියන නාමරූපයට නිර්වාණය ඇතුළත්

තො වේ. පටඨානයෙහිවූ කලී ඇතුළත් වේ. මේ දෙක පූර්‍වාපරව ගෙණ රූපාරූපයයි ද සමහර තැනක ව්‍යවහාර යි.

2. ස්කන්ධයෝ නම්:-එක මූලින් සෑදුන පදූරක වෙන වෙන කඳන් වැනිය යන අර්ථයෙන් ද, ගොඩවල් වැනිය යන අර්ථයෙන් ද එසේ නම් කරණ ලද ඒ ඒ ධර්මයෝ යි. එහි රූපය නම් අටවිසිරූපයෝ යි. සංඛාරයෝ නම් වේදනා සඤ්ඤා දෙක හැර ඉතුරු චෛතසික 50ද, තෙපණස්හෙදවූ ම සභාග නාම ධර්මයන්ගේ ජාති ජරා මරණ යන තුණදූයි මේ 53 වෙති.

3. උපාදානස්කන්ධයෝ නම්-මතු විදර්ශනා විස්තරයේ දී දක්වනලෙස විදර්ශනාවට අරමුණුවශයෙන් ගණුලබන්නාවූ සංසාරපක්ෂයට අයිති වූ කාම රූපාරූප යන භූමි ත්‍රය සම්බන්ධ ලෞකික ස්කන්ධයෝ ම යි.

ශුද්ධවූ ස්කන්ධනාමයෙන් අසංඛතවූ නිර්වාණය පමණක් හැර සියලුම සංඛත ධර්මයන් ද, උපාදාන ස්කන්ධනාමයෙන් නවලොකොත්තරයම හැර ඉතිරි සියලු සංඛත ධර්මයන් ද ගැණෙන බව ඒ ම් දෙකේ වෙනස යි.

4. ආයතනයෝ නම්:-විඤ්ඤාණයට උත්පත්ති ස්ථානය යන අර්ථයෙන් එ නම් වූ ධර්මයෝ යි. මෙහි මනායතනය තෙම සියලු ම සිත් 89 එක්සෝ 121කේ ඇති විඥත ධර්ම යි. ධම්මායතනය සියලුම චෛතසිකයෝ ද සුඛුමරූප 16ද නිවණ ද යන 69 වෙයි. ඉතිරි ආයතන ඒ ඒ රූප ම යි

5. ධාතුහු නම්:-අනිකක් හා සමෙහද නැති සවකීය ලක්ෂණය දරා සිටින අර්ථයෙන් එ නම් වූ ධර්මයෝ යි. මෙහි අනතුරු ව මනායතන නමින් කී සසම්ප්‍රයුක්ත සිත් වලින් මනො ධාතුත්‍රිකය මනොධාතුවට ද, ද්විපඤ්ච විඤ්ඤාණයෙන් ඒ ඒ දෙක ඒ ඒ චක්ඛුවිඤ්ඤාණ ධාතු ආදි පසට ද, ඉතුරු 76 එක්සෝ 108 ම නො විඤ්ඤාණ ධාතු සත වෙති. මෙහි යටකී තෙතිස්වැදෑරුම් සංග්‍රහය දැනීමෙන් ඒ ඒ සිතේ යෙදෙන චෛතසික ගණන් දැන ඊට විඤ්ඤාණය එක් කොට වස්තුධර්ම ගණන දත යුතු යි. සෙසු ධාතු ඒ ඒ ආයතන වශයෙන් කී ලෙස ම යි.

6. ආර්‍යසත්‍යයෝ නම් බුද්ධාදී ආර්‍යයන් විසින් දක්නා ලද ද දක්වනලද්දද වූ සැබෑ ධර්මයෝ ය යන අර්ථයෙන්

එ නම් වූ ධර්මයෝ යි. මෙහි "දුක්ඛං තෙ භූමමකං වට්ටං" යනාදී මතු කියැවෙන ගාථාර්ථය සැලකිය යුතු. එවිට වස්තු ධර්ම වශයෙන්:-

(1) **නාමරූප** දෙක අනිෂ්පන්නරූප දහයත් නිෂ්පන්න රූපයන් කෙරෙහි ම ඇතුළත් ධර්මයන් කොට සලකා ඇති තාක් 72 වෙති.

(2) **ස්කන්ධපස** නිර්වාණය හැර ඉතිරි 71 වෙති.

(3) **උපාදනස්කන්ධ** පස ද එම 71 වෙති. නුමුත් ලෝ-කෝත්තරසිත් අට සම්බන්ධ විඥානයත් සමග එස්සාදී සති සය යන සත්තිස ඇර යි.

(4) **ආයතන** දොළස ඇතිතාක් 72 වෙති.

(5) **ධාතු** අටළොස ද ඇතිතාක් 72 වෙති.

(6) **ආර්යසත්‍ය** සතර වනාහි මාර්ග සිත්වල මාර්ගාඞ්ග අට ඇර ඉතුරුධර්ම 29 ද ඵල සිත්වල සියලුම ධර්ම 37 ද හැර අනික් සියලු පරිච්ඡෙදන් පැවති ඇතිතාක් වස්තුධර්ම 72 වෙති.

මේ සමුච්චය සය සම්බන්ධව කී සමහර කාරණයන් ගාථා පසකින් ද මෙ සේ දක්වා තිබෙත්:-

"රූපඤ්චවෙදනා සඤ්ඤා සෙසා චෙතසිකා තථා,
විඤ්ඤාණමිති පඤ්චෙතෙ පඤ්චක්ඛන්ධාති භාසිතා"

(රූපය ද වේදනාව ද සඤ්ඤාව ද සෙසුචෛතසිකයෝ ද විඥානය ද යන මේ පස ස්කන්ධපසය යි කියන ලද්දා හු ය.)

"පඤ්චුපාදනක්ඛන්ධාති තථා තෙභූමකා මතා,
භෙදාභාවෙන නිබ්බාණං ඛන්ධසංගහ නිස්සටං"

(උපාදනස්කන්ධපස ය යි එ සේ ම ත්‍රෛභූමික වූ ධර්මයෝ දන්නාලද්දාහ. බිඳීමක් හෝ ප්‍රභෙදයක් නැති නිසා ස්කන්ධ සංග්‍රහයෙන් නිර්වාණය බැහැර වූයේ ය.)

"ද්වාරාලම්බන භෙදෙන භවන්තා යතනානි ච,
ද්වාරාලම්බ තදුප්පන්න පරියායෙන ධාතුයො"

(ද්වාරය ආලම්බනය යන භෙදයෙන් ආයතනයෝ වෙති. ද්වාරය ආලම්බනය ඒ දෙදෙන හේතු කොට ගෙණ උපන් ධර්මය යන පර්‍ය්‍යායයෙන් ධාතුහු වෙති.)

"දුක්ඛං තෙභූමමකං වට්ටං තණ්හා සමුදයො භවෙ,
නිරොධො නාම නිබ්බාණං මග්ගො අට්ඨඞ්ගිකො මතො

(දුක්ඛය නම් ත්‍රෛභූමික වෘත්තය යි. සමුදය නම් තෘෂ්ණාව යි. නිරොධය නම් නිවණ යි. අෂ්ටාඞ්ගික මාර්ගය මාර්ගය යි.)

"මග්ගයුත්තා ඵලං චෙව චතුසච්ච විනිස්සටා,
ඉතිපඤ්චප්පභෙදෙන පවුත්තො සබ්බ සංගහො"

(මාර්ගය හා සම්ප්‍රයුක්තධර්මයෝ ද, මුලු ඵල සිත් ද, සත්‍ය සතරින් බැහැර වූවෝ වෙති. මෙ සේ පස් ප්‍රභෙදයකින් සබ්බ සඞ්ගහය කියන ලද්දේ ය.)

මෙ සේ ආයතන ධාතු සමුච්චය දෙක ද, කිසි විටක නාමරූප සමුච්චය ද, විද්‍යමාන තාක් සියලු ධර්මයන් සංග්‍රහ කරණ හෙයින් ද; ඉතිරි සමුච්චය තුණ සියලු ධර්මයක් ම වාගේ හෙවත් ඉතා සවල්පයක් හැර වැඩි කොටස සංග්‍රහ කාරණ හෙයින්ද; "සබ්බසමුච්චයෝ" යයි කියනු ලැබෙති.

**සබ්බසමුච්චය විභාග පාදය යි.**

**අටවැනි වූ සමුච්චය විභාග කාණ්ඩය නිමි.**

අනොන්‍ය සංකර නුවූ, සවලක්‍ෂණයෙන් විද්‍යමාන වූ වස්තුධර්මයන්ට අතිරෙක ව ආණා සම්මුති දෙසනාවෙහිත් ලොකයෙහිත් ප්‍රකෘතියෙන් ම ද, පරමාර්ථ ධර්මයන්ගේ නිරුක්තියෙහි හෙවත් වචනාරූඪ කිරීමෙහි උපාය වසයෙන් ද, ව්‍යවහාරයට පැමිණ පරමාර්ථ ධර්මයන් සමග ම නිර්දේශ කරණ ලද්දා වූ **පඤ්ඤත්තිය** මෙතැන්හි දී විභාග කරණු ලැබේ.

ඒය වනාහි (A.) පඤ්ඤපියත්තා පඤ්ඤත්ති (B.) පඤ්ඤපනතො පඤ්ඤත්ති ය යි දෙවැදෑරුම් වේ. ඉන්:-

(A.) **පඤ්ඤපියතතා පඤ්ඤත්ති නම්**:- පරමාර්ථ වශයෙන් විද්‍යමාන ධර්මයන් අහක තිබිය දී, අවිද්‍යමාන වුවත් ඔවුන් මෙන් ම චිත්තොත්පාදයන්ට අරමුණු වන්නාවූ යම් යම් නිමිත්තකින් වෙනස් වෙනස් වශයෙන් සලකන * (පරිකල්පනා කරණ (ලද්දා වූ **සම්මුති සත්‍යය** යි.) හෙය ඊට උදා

* මේ අර්ථ ප්‍රඥප්තිය සඳහා 'පැණවීම' යනු වෙනුවට "සැලකීම" යනු බොහෝ විට යොදනු ලැබේ.

හරණ සි. එය වනාහි පරමාර්ථ හෙයින් විද්‍යමාන ධර්මයක් නො වේ. එහෙත් එය ලී මැටි ගල් හුණු ආදී උපකරණයන් පිහිටුවන ලද ඒ (ගෘහ ආකාරය නිමිති කර ගණී රිය ගැල් ආදීන්ගෙන් වෙනස් වූ විද්‍යමාන වස්තුවක් මෙන් සලකන ලදි. 'ගෙය' ය යි කි කල අසන්නාගේ ද, කියන කල කියන්නාගේ ද චිත්තොත්පාදයන්ට එහි ආකාරය අරමුණු වේ. ඉන් අන්‍යාකාර වූ පදාර්ථයෝ ගෙය නොවෙති. මේ පරමාර්ථ නො වූ ධර්මයන් වෙනස් වෙනස් පදාර්ථයන් කොට පැණවිල්ල, පැණවිය යුතු අර්ථයෙන් නොහොත් පණවනු ලබන අර්ථයෙන් පඤ්ඤත්ති නම් වේ. පඤ්ඤපියතතා පඤ්ඤත්ති යන් නෙහි පදාර්ථය මේ සි. අර්ථපඤ්ඤත්ති යනු ද මීට නමකි.

මෙකී නිමිත්ත ද සලකන ලද්ද ද යන දෙකෝ නා නා ප්‍රකාරතාවය නිසා පැණවිලි ද නා නා ප්‍රකාර වෙති. ඒ මෙසේ සි:–

A. **උපාදාය පඤ්ඤත්ති**:– නිමිත්ත නිසා සලකන ලද්ද. මෙය බොහෝ හෙද ඇත්තේ වේ. එනම්:–

1. **ඛන්ධෙ**...—ස්කන්ධයන් නිසා සලකන ලද්ද. උදා – සත්වයා, පුද්ගලයා, ජනයා, කෙනෙක්.

2. **අංගෙ**...—සම්භාරයන්, අවයවයන් නිසා සලකන ලද්ද. උදා:–ගෙය, රථය, ගැල, ඇඳ, පුටුව.

3. **රූපරසාදිකං**...—සටහණ, සෘත්‍යය, යන්ාදියක් නිසා සලකන ලද්ද. උදා:–කලය, හැලිය, කෑත්ත.

**චන්‍ද්‍රසූරියා වත්තනාදිකං**—චන්ද්‍ර සූර්‍යාදීන්ගේ දෘශ්‍ය ගති විශෙෂය නිසා සලකන ලද්ද. උදා:–නැගෙණහිර, බටහිර, උතුර, දකුණ, දවාල, රාත්‍රිය, උදය, හවස, ඉරමුදුන, හැන්දෑව, සතිය, මාසය.

5. **සමාධි නිමිත්ත භාවනානිසංසාදිකං** —සමාධි නිමිති භාවනානිසංසාදියක් නිසා සලකන ලද්ද, උදා:=කසිණය, උග්ගහ නිමිත්ත, පටිභාග නිමිත්ත, උපචාර සමාධිය, අපිණා සමාධි ය.

6. **භූතපරිනාමාකාරං**...—මහා භූතයන් පිරිනැමෙන ආකාරයන් නිසා සලකන ලද්ද, උදා:–දෙනිය, හෙල, පර්වතය, තැන්න, ගඟ, මුහුද, පවන කුණාටුව; උණුසුම, ගිනි දළුව.

**අසම්ඵුට්ඨාකාරං**...—භූතයන් විසින් ස්පර්ශ නො කරණ ලද ආකාරය නිසා පණවන ලද්ද. උදා:-බිලය, පැල්ම, වල, සිදුර, නළය, තව්ව, ලිඳ, ලෙන, ගුහාව යන මේ ආදිය යි-

B **උපනිධාය පඤ්ඤත්ති**- නිමිත්ත ලඟ තබා හෝ, ඒ හා සංසන්දනය කොට හෝ, එක් කොට ගෙණ හෝ (සඳහා) සල කන ලද්ද. මෙය ද බොහෝ භෙද ඇත්තේ වේ. එ නම්:-

1. **තදඤ්ඤාපෙක්ඛූපනිධා**-ඉන්*අනිකක් අපෙක්ෂාකිරීම් වශයෙන් සඳහා සැලකීම. උදා:-දෙවෙනි තුන්වැනි, දික්, ලුහුඬු, දුර, තුදුරු.

2. **හත්ථගතූපනිධාඃ**- කෙරෙහි ඇති දෙයක් සඳහා සැලකිම. උදා:-කුඩ කාරයා, † කොඩි කාරයා, කඩු කාරයා.

3. **සම්පයුත්තූපනිධාඃ**-පලඳින ලද දෙයක්,හෝ එහි යෙදී තිබෙන දෙයක් හෝ සඳහා සැලකීම. උදා:-මුදුකාරයා, හවඩි කාරයා, ගැබිණිය, රුවුලා.

4. **සමාරොපිතූපනිධාඃ**- එහි නගන ලද දෙයක් සඳහා සැලකිම. උදා:-ධාන්‍ය ගැල, ගිතෙල් කලය, වතුර කෝප්පය, බත්පිහාන.

5. **අවිදූරගතූපනිධාඃ**- එයින් නුදුරු තැන තිබෙන දෙයක් සඳහා සැලකිම. උදා:-ඉන්ද්‍රසාලගුහාව, සත්තපණ්ණි ගුහාව, ගංගාරාමය, තිඹිරිවැව, නිකවැව, සැමලුව, ගහරණ, දෙල ලියැද්ද.

6. **පටිභාගූපනිධාඃ**- ඊට සමාන දෙයක් සඳහා සැලකීම. උදා:-උඳුපියලී, හිඟුරුපියලී, උපුල්කොල, හිඟුරල, කොටිකන් වවුලා, මැඩහඟු, දත්කැටියා.

7. **තබ්බහුලූපනිධාඃ**- එහි බහුල ව ඇති දෙයක් සඳහා සැලකීම. උදා:-බමුණුගම, තෙලුම්විල, සඳුන් වනය, කහ-මිරිස්කඩය.

---

* මෙබඳු තැන්වල පාලි "ත" ශබ්දය වෙනුවට යොදන "ඒ" ශබ්දය ඒ සලකන ලද්ද සඳහා ම වේ. ඉන් අනිකක් යනු සලකන ලද්ද කෙරෙන් අනිකකි.

† මෙබඳු තැන්වල "කාර" යනු 'ධාරී' යන්නට සමානාර්ථව යොදන තද්ධිත ප්‍රත්‍යයක් මෙන් ව්‍යවහාර භාෂාවෙ පෙණේ.

8. **තබ්බහුලෙඩ්ඩාපනිධාः**- එහි විශෙෂව හෝ ප්‍රධානව සිටි දෙයක් සඳහා සැලකීම. උදාः-මැණික්වලල්ල, රතුකැට කුර, දියමන්තිමුද්ද, දුනුපිහියේ.

9. **තදත්ථූපනිධාः**-එයින් ප්‍රයොජන ලබන දෙයක් සඳහා සැලකීම. උදාः-ගිරා කුඩුව, අස්හල, බොජුන් හල, කඩු, කොපුව, පැදුරු ආත, පාපුටුව.

10. **තදුප්පාදකෝපනිධාः**-එයින් උපදනා දෙයක් සඟාඳ සැලකීම. උදාः-මැණික්පතලය, සලුගම, ගොදුරුගම, වීකුඹුර, මල්වත්ත.

11. **තජ්ජනකෝපනිධාः**- එය උපදවන්නෙකු සඳහා සැලකීම. උදාः-එලකිරි, කපුපුලුන්, වැහිවතුර, මුදු මස්, යන මේ ආදිය සිः-

C. **සමොධානපඤ්ඤත්ති**ः-වෙන් වෙන් ව අනෙකවසිටි නිමිත්ත එකක් කොට සලකනලද්ද. උදාः-ධාන්‍ය රාශිය, දඬුගොඩ, භික්ෂුසංඝයා, ඇත්රළ, හරක්වටය, එලුරංචුව.

D. **උපනික්ඛිත්තපඤ්ඤත්ති**ः- නිමිත්ත පිට ම හෙලන ලද්දක් කොට සලකනලද්ද. උදාः-දෙක, තුණ, හතර, පහ.

E. (**තජ්ජාපඤ්ඤත්ති**-පරමාර්ථ වශයෙන් විද්‍යමාන වූ සවභාවධර්මයන්ට තබන ලද නම. උදාः-රූපය, ඵස්සය, වේද නාව, ලොභය, සද්ධාව.)

F. **සන්තතිපඤ්ඤත්ති**ः-නිමිත්ත සම්බන්ධ නො සිදී පැවතිපරම්පරාව එකක් කොට සලකන ලද්ද උදාः-තුන්මැසි, සත් වැසි, සොළසැවිරිදි, සැටවස් පිරි, සියවස් ගිය.

මෙකී තජ්ජාපඤ්ඤත්තිය හැර ඉතුරු සියල්ල ම සැල කීමේ වෙනස් වෙනස් ආකාරයෝ වෙති. එහෙයින් උදාහරණ වශයෙන් දක්වන ලද ශබ්දයන්ගේ ද අර්ථය මිස ශබ්දරූපය මෙහි දී අදහස් නො වේ. තජ්ජාපඤ්ඤත්තිය වනාහී අර්ථකථා මූලටීකාආචාර්යවාදයෙහි වූ ඒ ෂට්කයෙහි පස්වැනි තැනට නිර්දේශ කරණ ලද හෙයින් ඒ ක්‍රමය රැකීම පිණිස මෙහි ද දක්වූයෙමු. නුමුත් එය මීලඟ පාදයට සම්බන්ධ යි.

තවත් ආචාර්‍ය්‍ය ක්‍රමයකින් අනික් ප්‍රඥප්ති සයක් ද වෙති. එ නම්:-

A. **කිච්චපඤ්ඤත්ති**:- කෘත්‍යය සඳහා සැලකීම. (මෙය උපනිධාය පඤ්ඤත්තියෙහි ඇතුලත් වේ.) උදා:-අර්ථභාන කයා, ධර්මදෙශකයා, පොත් ලියන්නා, ගී කියන්නා.

B. **සණ්ඨානපඤ්ඤත්ති**:- සටහණ සඳහා සැලකීම. (මෙය ද උපනිධාය පඤ්ඤත්තියෙහි ඇතුලත් වේ.) උදා- කෘශයා, ස්ථූලයා, වටකුරු, සතරැස්, මිට්ටා, උහල්ලා, මණ්ඩලය, චක්‍රය, උළු, මොටය, පැතලි.

C. **ලිඞ්ගපඤ්ඤත්ති**:-ලිංගයෙන් නිසා සැලකීම:- (මෙය උපාදාය පඤ්ඤත්තියෙහි ඇතුලත් වේ) උදා:-, ස්ත්‍රී පුරුෂයා, කුමරා, කුමරි.

D. **භූමිපඤ්ඤත්ති**:-භූමිය සඳහා සැලකීම:-(මෙයද උපනිධාය පඤ්ඤත්තියෙහි ඇතුලත්වේ) උදා:-කාමාවචර, රූපාවචර, කොසලක, මාගධික.

E. **පච්චත්තපඤ්ඤත්ති**:- සකන්ධ සමූහයන් නිසා සැලකීම-(මෙයද උපාදායපඤ්ඤත්තියෙහි ඇතුලත් වේ.)උදා:-තිස්ස ඵුස්ස, උපාලි, විජය, විසාඛා, දපුලු.

F. **අසංඛතපඤ්ඤත්ති**:-ප්‍රත්‍යසමුත්පන්න නුවූ ධර්මයට තබන ලද නම) මෙය නජ්ජාපඤ්ඤත්තියට ඇතුලත් වේ.) උදා:- නිර්වාණ, මොක්ෂය, අපවර්ගය, මුක්තිය, විරාගය, නිරෝධය.)

මෙහි ද මූල පස සැලකීමේ ආකාර භෙදයෝ වෙති. මේ සවැනි ව පැමිණි අසංඛත පඤ්ඤත්තිය ගැණ ද නජ්ජාපඤ්ඤත්තිය ගැණ කී ලෙස ම දත යුතු.

අර්ථපඤ්ඤත්ති විභාග පාදය යි.

B. **පඤ්ඤාපනතොපඤ්ඤත්තිය** නම්:-පරමාර්ථ සත්‍යය හෙවත් විද්‍යමාන ධර්මයන් කෙරෙහි ද; අනතුරුව කී අර්ථ ප්‍රඥප්තිමය වූ සම්මුති සත්‍යය හෙවත් පරිකල්පිත පදාර්ථයන් කෙරෙහි ද ආරොපණය කරණ ලද අක්ෂරමය වූ ශබ්දයෝ යි.

එය ඒ පදාර්ථයන්ගේ තත්‍වයේ හැටියට (1) විජ්ජමාන පඤ්ඤත්ති,(2)අවිජ්ජමාන පඤ්ඤත්ති (3)විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤපති, (4) අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති

(5)විජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති, (6.) අවිජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්තියයි සයවැදෑරුම්. එසින්:—

1. **විජ්ජමානපඤ්ඤත්ති** නම්:–පරමාර්ථ වශයෙන් විද්‍යමාන වූ ඒ ඒ වස්තුධර්මයන් හෝ, නාමරූප ස්කන්ධායතන ධාතු ආදී ඒ ඒ වස්තු ධර්ම රාශීන් හෝ හඟවන නාමයෝ යි. එ නම්:– ඵස්ස, චිත්තක්ක,සද්ධා,මොහ, පඨවිධාතු, චක්ඛු යනාදී ශබ්ද යි.

2. **අවිජ්ජමාන පඤ්ඤත්ති** නම්:–අර්ථ ප්‍රඥප්තියෙන් පණවන ලද්දවූ පදාර්ථයන්ගේ නාමයෝ යි. එ නම්:–ආත්ම, පුද්ගල, දෙව්, මිනිස්, ගව, මහිෂ, වෘක්ෂ, ලතා, අඹදඹ, ගෘහ, රථ, ඡත්‍ර, චාමර, උලු, ගඩොල් යනාදී ශබ්දයෝ යි.

3–**විජ්ජමානෙන අවිජ්ජමාන පඤ්ඤත්ති** නම්:–පරමාර්ථ හෙයින් විද්‍යමාන වූ යම් කිසි ධර්මයක උපකාරයෙන්, නිමිත්තෙන් හෝ, හේතුවෙන් අවිද්‍යමාන පදාර්ථයක් හැඟවීමට යොදනු ලබන නාමයෝ යි. එ නම්:– රූපී=රූපඇත්තා), සඤ්ඤී=සඤ්ඤ ඇත්තා), චක්ඛුමා=(ඇස් ඇත්තා), වේදකො, (=වේදනා විඳින්නා), තක්කිකො (=විතර්ක කරන්නා) විරියවා (=වීර්ය ඇත්තා) සද්ධො (ශ්‍රද්ධාව ඇත්තා), සතිමා (=සිහි ඇත්තා), හිරිමා (=ලජ්ජා ඇත්තා) ඔත්තාපී (භය ඇත්තා), පස්සද්ධකායො (=චෛතසික කාය සංසිඳවූ පුද්ගලයා), ලොභී (=ලොභඇත්තා), කොධනො (=ක්‍රොධකරන්නා), මූල්හො (=මොහය ඇත්තා), මිච්ඡා දිඨිකො (=මිසදිටු ඇත්තා), මානී (=මාන්නය ඇත්තා), ඉස්සුකී (=ඊර්ෂ්‍යාව ඇත්තා). මච්ඡරී (=මාත්සර්‍ය්‍ය ඇත්තා), කුක්කුච්චකො (=කුකුස ඇත්තා), පඤ්ඤවා (=ප්‍රඥව ඇත්තා), සම්මාදිඨිකො (සම්‍යක් දෘෂ්ටිය ඇත්තා), මග්ගඨො (=මාර්ගයෙහි සිටින පුද්ගලයා), ඵලඨො (=ඵලයෙහි සිටින පුද්ගලයා), ඡලභිඤ්ඤො (අභිඥ සය ඇත්තා), තෙවිජ්ජො (=විද්‍යා තුණ ඇත්තා) යනාදියයි.

4. **අවිජ්ජමානෙන විජ්ජමාන පඤ්ඤත්ති** නම්:—පරමාර්ථ හෙයින් අවිද්‍යමාන වූ, එ හෙයින් ම ප්‍රඥප්ති මාත්‍ර වූ, පදාර්ථයක උපකාරයෙන් නිමිත්තෙන් හෝ හේතුවෙන්; විද්‍යමාන වූ, එ හෙයින් ම පරමාර්ථ වූ, ධර්මයක් හැඟවීම ට යො

දනු ලබන නාමයෝ යි. එ නම්:--චිත්‍රරූපය, ස්ත්‍රී ශබ්දය, කුණුගඳ, ලුනුරස, ධූලිස්පර්ශය, ආපත්ති සඤ්ඤාව, හොරහිත, යනාදිය යි.

5. විජ්ජමානෙන විජ්ජමානපඤ්ඤත්ති නම්:— පරමාර්ථ හෙයින් විද්‍යමාන ධර්මයක උපකාරයෙන් නිමිත්තෙන් හෝ හෙතුවෙන්; එ බඳු විද්‍යමාන ධර්මයක් හැඟවීමට යොදනු ලබන නාමයෝ යි. එ නම්;—චක්ඛුසම්පස්සය, රූපසඤ්ඤාවය, සද්දතණ්හාවය, ගන්ධවිතක්කය, රසගෙධය, ඵොට්ඨබ්බවිචාරය, ධම්මසචෙතනාවය, සවිතක්කසමාධිය, සවිචාරඣානය, සප්පීතිකචිත්තය යනාදිය යි.

6. අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්ති නම්:- පරමාර්ථ හෙයින් අවිද්‍යමාන වූ, යම් කිසි පදාර්ථයක උපකාරයෙන් නිමිත්තෙන් හෝ හේතුවෙන්, එ සේ ම අවිද්‍යමාන වූ පදාර්ථයක් හැඟවීමට යොදනු ලබන නාමයෝ යි එ නම්: ජම්බුද්වීපය, වින්ධ්‍ය පර්වතය, අඹ ගෙඩිය, සපුමල, රාජපුත්‍රයා, රන් වලල්ල, බෙහෙත් ගුළිය, කුඹමිට, හරක් වස්සා, හාල් නැළිය, මැටිවළඳ, රෙදි කෑඩි, විජය රජ, ගෞතම බුදුන් යනාදිය යි.

මේ සය කොටසට ඇතුළත් නො වන කිසි ම අර්ථයක් වත් ශබ්දයක් වත් කිසි ම භාෂාවක නැත්තේ ය. එ සේ ම මේ සය කොටසින් නො පැණ විය හැකි කිසි ම ධර්මයක් හෝ කිසි ම පරිකල්පිත පදාර්ථයක් හෝ කිසි කලක කොතනක වුවත් නැත්තේ ය. මේ පඤ්ඤපනතො පඤ්ඤත්තියට හෙවත් පණවන, එ නම්-පැණවීමට කරණ වන අර්ථයෙන් පඤ්ඤත්ති නම් වූ පදාර්ථයට නාමපඤ්ඤත්තිය යි අන් නම කුත් වේ.

අනතුරු පාදයෙහි කී සියලු ප්‍රභෙදගත ප්‍රඥප්ති ෂට්කදෙක සම්බන්ධව ද සලකන ලද සියල්ලට වෙන වෙන නම් යෙදීමත් මේ නාම පඤ්ඤත්ති විෂයෙහි ම මේ සය ආකාරයට ඇතුළත් වේ. ඒ මෙ සේ යි:—

ප්‍රථම සයෙන්:—තජ්ජාපඤ්ඤත්තිය විජ්ජමාන පඤ්ඤත්තියෙහි ද, ඉතිරි පස අවිජ්ජමාන පඤ්ඤත්තියෙහි සහ අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්තියෙහි ද;

දෙවැනි සයෙන්:-අසංඛත පඤ්ඤත්තිය හා සමහර භූමි පඤ්ඤත්තියක් විජ්ජමාන පඤ්ඤත්තියෙහි ද, කිච්ච පඤ්ඤත්ති ය අවිජ්ජමානෙන අවිජ්ජමානපඤ්ඤත්තියෙහි ද, අවසෙස සියල්ල අවිජ්ජමානපඤ්ඤත්තියෙහි ද වැටේ..

**නාමපඤ්ඤත්ති විභාග පාදය සි.**

මේ දෙයාකාරවූ ම පඤ්ඤත්තියට සාධාරණ පර්‍යායවූ **සඞ්ඛා, සමඤ්ඤා, පඤ්ඤත්ති, වොහාර, සම්මුති,** යන නම් ද; පඤ්ඤපියතතා පඤ්ඤත්තියට විසෙසවූ **අත්ථපඤ්ඤත්ති, පරිකප්පිත** යන නම් ද; පඤ්ඤපනතො පඤ්ඤත්තියට විසෙස වූ **නාම, නාමකම්ම, නාමධෙය්‍ය, නිරුත්ති, බ්‍යඤ්ජන, අභිලාප, අධිවචන, ආඛ්‍යා, අව්හා, අභිධාන, අව්හය,** යන නම් ද දත යුතු.

"වචීඝොසානුසාරෙන, සොතවිඤ්ඤාණවීථියා,
පවත්තානන්තරුප්පන්නා මනොද්වාරස්සගොචරා;

අත්ථා යස්සානුසාරෙන, විඤ්ඤායන්ති තතොපරං,
සායං පඤ්ඤත්ති විඤ්ඤෙය්‍යා, ලොකසඞ්කෙතනිම්මිතා."

(වචන ශබ්ද අරමුණෙන් සොත විඤ්ඤාණ වීථිය පැවැත්තාට අනතුරුව උපන්නාවූ මනොද්වාරයට, එ නම්, මනොද්වාර වීථියට අරමුණු වන්නා වූ අර්ථයෝ, යමක අනුසාරයෙන් ඉන් පසුව උපදින වීථියකින් අරමුණු කොට ගන්නා ලැබෙත් ද, ලොකයාගේ ලකුණු තැබීමෙන් උපදවන ලද ඒ කාරණය ප්‍රඥප්ති ය සි දත යුතු සි.)

මගුල්බෙර, ඉලව්බෙර, විදුලිපනිවුඩ ආදියෙහි වාග්ඝොෂාවෙන් අන්‍ය ශබ්දයන් සොත විඤ්ඤාණ වීථි මගින් ද; ලෙඛණ, හස්තමුද්‍රා, කේතු සංඥාදිය චක්ඛුවිඤ්ඤාණ වීථිමගින් ද ප්‍රඥප්ති විෂය බව ප්‍රසිද්ධයි. ගන්ධාදී සෙසු (අරමුණු) පවා ඝාණවිඤ්ඤාණාදී සෙසු වීථි මගින් ද එ සේ කොට ගත හැකි වන්නේ ම ය. එ බැවින් එකී වාග්ඝොෂාව බහුල වෘත්තියෙන් දක්වන ලදී.

**නව වැනි වූ පඤ්ඤත්ති විභාග කාණ්ඩය නිමි.**

**1** යම් යම් ප්‍රත්‍යය ධර්ම කෙනෙක් (2) යම් යම් ප්‍රත්‍යයොත්පන්න හෙවත් සඞ්ඛතධර්ම කෙනෙකුන් ගේ උත්පත්තියට හෝ පැවැත්මට (3) යම් යම් පරිද්දකින් හෙවත් ආකාරයකින් ප්‍රත්‍යය වෙත් ද, ඒ අසවල් ධර්මයට අසවල් පරිද්දෙන් ප්‍රත්‍යය වෙයි යන විභාගය මේ ප්‍රත්‍යය විභාග කාණ්ඩයෙහි දක්වනු ලැබේ. එහි:-

**1.** ප්‍රත්‍යය ධර්මයෝ නම්:-චිත්ත චෛතසික රූප නිබ්බාණ පඤ්ඤත්ති යන සියලු විද්‍යමාන පරිකල්පිත පදාර්ථයෝ යි.

**2.** **ප්‍රත්‍යයොත්පන්න ධර්මයෝ** නම්:-චිත්ත චෛතසික රූප යන ධර්මයෝ පමණකි.

**3.** **ප්‍රත්‍යයාකාරයෝ** හෙවත් ප්‍රත්‍යය වන පරිදි නම්:- හේතුපච්චය, ආරම්මණපච්චය, අධිපතිපච්චය, අනන්තර පච්චය, සමනන්තරපච්චය, අඤ්ඤමඤ්ඤපච්චය, නිස්සය පච්චය, උපනිස්සයපච්චය, පුරෙජාතපච්චය, පච්ඡාජාත පච්චය, ආසෙවනපච්චය, කම්මපච්චය, විපාකපච්චය, ආහාරපච්චය, ඉන්ද්‍රියපච්චය, ඣානපච්චය, මග්ගපච්චය, සම්පයුත්තපච්චය, විප්පයුත්ත පච්චය, අධිපතී පච්චය, අත්ථිපච්චය, නත්ථි පච්චය, විගත පච්චය, අවිගත පච්චය යන 24 යි. එහි (A.) ඒ ඒ ප්‍රත්‍යය ධර්මයන්ගේ ඇති වීමෙන් ඒ ඒ ප්‍රත්‍යයොත්පන්න ස්වභාවයෙන් ඇති වන ධර්මයන්ගේ ඒ වන්නා වූ ආකාර මාත්‍රයෙන් යුක්ත කොට වදාරණ ලද්දේ-හෙවත් ප්‍රත්‍යය විශෙෂය සඳහන් නො කොට ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්නය යන දෙපක්ෂයාගේ පමණක් සම්බන්ධය දක්වීම් මුඛයෙන් වට්ට විවට්ට දෙක දක්වීම **පටිච්චසමුප්පාද** ක්‍රමය යි. (B.) ප්‍රත්‍යය විශෙෂ වශයෙන් සිටීම හෙවත් ඒ ඒ ප්‍රත්‍ය ධර්මය ඒ ඒ ප්‍රත්‍යයොත්පන්න ධර්මයට ප්‍රත්‍යය වන ඒ ඒ ශක්ති ආකාරය දක්වීම **පට්ඨාන** ක්‍රමය වේ. එහි:-

A. **පටිච්චසමුප්පාද** ක්‍රමය නම්:-අවිජ්ජා පච්චයා සංඛාරා යනාදී පෙළවූ පරිද්දෙන්-- "අවිද්‍යාවගේ ප්‍රත්‍යයෙන් සංස්කාරයෝ ද; සංස්කාරයන්ගේ ප්‍රත්‍යයෙන් විඥානය ද; විඥානයාගේ ප්‍රත්‍යයෙන් නාම රූපය ද; නාමරූපයාගේ ප්‍රත්‍යයෙන් ෂළායතනය ද; ෂළායතනයාගේ ප්‍රත්‍යයෙන්

ඵස්සය ද; ඵස්සයාගේ ප්‍රත්‍යයෙන් වෙදනාව ද; වේදනාවගේ ප්‍රත්‍යයෙන් තණ්හාව ද; තණ්හාවගේ ප්‍රත්‍යයෙන් උපාදනය ද; උපාදනයාගේ ප්‍රත්‍යයෙන් භවය ද; භවයාගේ ප්‍රත්‍යයෙන් ජාතිය ද; ජාතියගේ ප්‍රත්‍යයෙන් ජරා මරණ සොක පරිදෙව දුක්ඛ දොම්නස්ස උපායාසයෝ ද අට ගැණෙත්. මෙ සේ මේ මුලු දුඃඛස්කන්ධයාගේ උත්පත්තිය වෙයි. අවිද්‍යාවගේ ම නිශ්ශෙෂ වූ විරාග නිරොධය (වැලැක්ම) හෙතු කොට ගෙණ සංස්කාරයන්ගේ නිරොධය වෙයි. සංස්කාරයන්ගේ නිරොධය හෙතු කොට ගෙණ විඥ්ඥාණයාගේ ද යන මේ ආදී යථොක්ත ක්‍රමයෙන් ජරාමරණාදීන්ගේ නිරොධය වෙයි. මෙ සේ මේ මුලු දුඃඛස්කන්ධයාගේ වැලැක්ම වෙයි. ආශ්‍රවයන්ගේ උප්පාදයෙන් අවිද්‍යාව උපදී. ආශ්‍රවයන්ගේ ම නිරුද්ධ කිරීමෙන් අවිද්‍යාව ද නිරුද්ධ වෙයි.''යනුයි මෙහි කී:-

**අවිජ්ජාව** නම්–මොහය යි:

**සංස්කාරයෝ** නම්–ත්‍රෛභූමික සියලු කුශලාකුශල කර්‍මයෝ හෙවත් චෙතනා 29 ය යි.

**විඥ්ඥාණය** නම්–උපෙක්ඛා සන්තීරණ, මහා විපාක, මහද්ගත විපාක යන එකුන් විසි ප්‍රතිසන්ධි විඥ්ඥාණයෝ යි.

**සළායතනය** නම්:-චක්ඛුසොතාදී මනස සවැනි කොට ඇති අජ්ඣත්තිකායතන සය යි.

**භවය** නම්:–සංඛාර නාමයෙන් කී.කම්මභවය ද, අසඥ්ඥසත්තයන්ගේ පටිසන්ධි රූපය අනුලොම් කොට ඇති විඥ්ඥාණ නාමරූප සළායතන යන නම් වලින් කී උපපත්තිභවය ද යන දෙයාකාර වූ ධර්‍මයෝ යි.

**ජාතිය** නම්:–චිත්ත චෛතසිකයන්ගේ උත්පාදය වූ නාම ජාතිය ද, අනිෂ්පන්න රූපයන් අතුරෙහි උපචය සන්තති නමින් කී රූප ජාතිය ද යන දෙක යි.

**ජරාමරණය** නම්:–චිත්ත චෛතසිකයන්ගේ ජරාභංග යන නාම ජරාමරණයෝ ද; අනිෂ්පන්න රූපයන් අතුරෙහි ම ජරතා අනිච්චතා නමින් කී රූප ජරාමරණයෝ ද යන දෙයාකාර ධර්‍මයෝ යි.

**ඉතිරි නාමරූප, ඵස්ස, වේදනා, තණ්හා, උපාදාන** යන ධර්මයෝ නම් යට ඒ ඒ තැන ඒ ඒ නම් වලින් දක්වූවෝ ම වෙති.

මේ ප්‍රධාන අඞ්ග දොළසට වැඩිමනත් නිස්සන්දඵල වූ **ශෝක, පරිදේව, උපායාස** යන තුණ වනාහි ඒ ඒ ආකාර යෙන් වන වේදනා භේදවූ **දුක්ඛ දෝමනස්ස** දෙක ප්‍රධාන කොට ඇති ද්වෙස සහගත සිත් පෙළෙහි කුක්කුච්චාදී අකුශල චෛතසිකයෝ වෙති.

මේ පටිච්ච සමුප්පාදය සම්බන්ධව (1) කාලතුණක් ද, (2) අඞ්ග දොළසක් ද, (3) ආකාර විස්සක් ද, (4) සන්ධි තුණ ක් ද, (5) සංක්ෂේප සතරක් ද, (6) වෘත්ත තුණක් ද, (7) මූල් දෙකක් ද දත යුතු සි. එහි:–

1 **කාලතුණ** නම්:–අවිජ්ජා සංඛාර යන දෙකක් වූ අතීතකාලය, විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා තණ්හා උපාදාන භව යන අටක් වූ වර්තමාන කාලය, ජාතිය ද ජරාමරණය ද යන දෙකක් වූ අනාගත කාලය ද යන තුණ සි.

2. **අඞ්ගදොළස** නම්:–අවිජ්ජාව, සංඛාරයෝ, විඤ්ඤාණ ය, නාමරූපය, සළායතනය, ඵස්සය, වේදනාව, තණ්හාව, උපාදානය, භවය, ජාතිය, ජරාමරණය, යන දොළස සි.

3. **ආකාර විස්ස** නම්:– අවිජ්ජා සංඛාරයන්ගේ ගැනීමෙන් ඒ සමග ම පවත්නා තණ්හා උපාදාන භව යන තුණත් ගැණෙන හෙයින්, ඒ අතීත හේතු පස ද; ජාති ජරාමරණ වශයෙන් පවත්නා විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේ දනා යන වර්තමාන ඵලපස ද; තණ්හා උපාදාන භවයන්ගේ ගැණීමෙන් ඒ සමග පවත්නා අවිජ්ජා සංඛාර යන දෙකත් ගැණෙන නිසා ඒ වර්තමාන හේතු පස ද; ජාති ජරාමරණ යන්ගේ ගැණීමෙන් එබඳු ලක්ෂණයන් ගෙන් යුත් අවස්ථා වශයෙන් විද්‍යමාන වන්නා වූ විඤ්ඤාණ නාමරූප සළායතන ඵස්ස වේදනා යන ධර්ම පස ම ගැණෙන නිසා ඒ අනාගත ඵල පස ද යන විස්ස සි.

4. **සන්ධිතුණ** නම්: එම කී විසි ආකාරය සම්බන්ධ වූ අතීත හෙතු පස වර්තමාන ඵල පස හා සන්ධි වන සංඛාර විඤ්ඤාණ දෙකේ අතර ද, වර්තමාන ඵල පස වර්තමාන හෙතු පස හා සන්ධි වන වෙදනා තණ්හා දෙකේ අතර ද, වර්තමාන හෙතු පස අනාගත ඵල පස හා සන්ධි වන භව ජාති දෙකේ අතර ද යන අතර වල් තුණ සි.

5. **සංක්ෂේප සතර** නම්:– එම කී අතීත හෙතු, වර්තමාන ඵල, වර්තමාන හෙතු අනාගත ඵල සතර සි.

6. **වෘත්තතුණ** නම්:–අවිජ්ජා, තණ්හා, උපාදාන යන ක්ලේශ වෘත්තය ද; (භවය බෙදූ කී) කම්මභවය, සංඛාරයෝ ය, යන කර්මවෘත්තය ද; (භවය බෙදූ කී) උපපත්තිභව ය, විඤ්ඤාණාදී පසය, ජාති ජරාමරණය, යන විපාකවෘත්තය ද යන චක්‍ර තුණ සි.

7. **මූල් දෙක** නම්:–වර්තමානය සඳහා පැවති අතීත හෙතුන්ගෙන් මූල් කොට දැක්වූ අවිජ්ජාව ද, අනාගතය සඳහා පවත්නා වර්තමාන හෙතුන්ගෙන් මූල් කොට දැක්වූ තණ්හාව ද යන දෙක සි.

බොහෝ ක්‍රම වලින් මේ මූල් සාරා ම බැස ගැන්ම ද; එයින් චක්‍රනමන සිදුවන සැටි ද; එක ම සිතක මුලු පටිච්ච සමුප්පාදය ලැබෙන අන්දම ද; සමහර සිතක අවිජ්ජාවගේ ස්ථානයෙහි කුසල මූල අව්‍යාකෘත මූලයන් ද, නාමරූපයාගේ ස්ථානයෙහි තනි නාමය ද, සළායතනයාගේ ස්ථානයෙහි තනි ඡට්ඨායතන (මනායතන)ය ද, තණ්හාවගේ ස්ථානයෙහි ද්වේෂ විචිකිච්ඡා උද්ධච්ච පසාද (සද්ධා) යන මොවුන් ගෙන් යමක් ද, උපාදානයාගේ ස්ථානයෙහි අධිමොක්ඛයාගේ ලැබී ම හෝ කිසිත් නො ලැබීම ද, යන මෙතෙක් විපර්යාසයන් සහිත ව සියලු සිත් කෙරෙහි ලැබෙන ලැබෙන සේ විස්තරය ද; මේ ප්‍රත්‍යය හෙතු වශයෙන් සම්ප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යය ප්‍රත්‍යයොත්පන්න දෙදෙනා අතර අන්‍යොන්‍ය වශයෙන් වන පරිදි ද; සංඛාරාදී එකී එකී අංගයාගේ ප්‍රත්‍යයෙන් අවිද්‍යාව ප්‍රත්‍යයොත්පන්න වන පරිදි ද යන බොහෝ ක්‍රම ඇති මේ ආශ්චර්ය ධර්මය විස්තර කිරීම මේ පොත සුලුකිරීමේ උවමනා ව නිසා මෙහි අදහස් නො කරණ ලදී.

මේ මුල් තිබෙන තුරු ම මේ චක්‍රය මෙ ලෙස ම පෙරළෙමින් පවතී. ඒවා වැනසූ කල මේ මුලු වෘත්තය ම සිඳීය යි.

මෙහි විසි ආකාරය ද සන්ධිත්‍රය ද සංක්ෂෙප සතර ද දැනගැන්මට උපාය වශයෙන් යොදන ලද දැරිය යුතු ගාථාවක් නම්:–

"අතීතෙ හෙතවො පඤ්ච – ඉදානි ඵලපඤ්චකං,
ඉදානි හෙතවො පඤ්ච – ආයතිං ඵලපඤ්චකං" යනුයි.

**පටිච්චසමුප්පාද ක්‍රමය යි.**

B. **පට්ඨාන** ක්‍රමය නම්:–ප්‍රත්‍යය ධර්මයන්ගේ ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්ට වන හෙතු පච්චයො ආරම්මණ පච්චයො යනාදී ශක්ති ආකාර සූවිස්ස අතුරෙන්:–

"ඡධා නාමනතු නාමස්ස පඤ්චධා නාම රූපිනං,
එකධා පුන රූපස්ස රූපං නාමස්ස චෙකධා,
පඤ්ඤත්ති නාම රූපානි නාමස්ස දුවිධාද්වයං,
ද්වයස්ස නවධා චෙති–ඡබ්බිධා පච්චයා කථං"

යන ගාථා දෙකින් දක්වා තිබෙන සේ (a.) නාමය නාමයට සය පරිද්දකින් ද, (b.) නාමය නාමරූපයන්ට පස් පරිද්දකින් ද, (c.) නාමය රූපයට එක් පරිද්දකින් ද, (d) රූපය නාමයටත් එක් පරිද්දකින් ද, (e) පඤ්ඤත්ති නාම රූපයෝ නාමයට දෙ පරිද්දකින් ද, (f) නාමරූපයෝ නාමරූපයන්ට 9 පරිද්දකින් ද යි මෙ සේ ෂට් ප්‍රකාරයකින් ප්‍රත්‍යය වීම යි එ නම්:–

a. **නාමය නාමයට**:–(1) අනන්තර, (2) සමනන්තර, (3) නත්ථි, (4) විගත, (5) ආසෙවන, (6) සම්පයුත්ත, යන සය ආකාරයෙන් ද;

b. **නාමය නාම රූපයන්ට**:–(7) හෙතු, (8) ඣාන, (9) මග්ග (10) කම්ම, (11) විපාක යන පස් ආකාරයෙන් ද;

c. **නාමය රූපයට**:–(12) පච්ඡාජාත යන එ කම ආකාරයෙන් ද;

d. **රූපය නාමයට**:–(13) පුරෙජාත යන එක ම ආකාරයෙන් ද;

e. **නාමරූප, ප්‍රඥප්තිහු නාමයට**:-(14) ආලම්බන, (15) උපනිස්සය යන **දෙ** ආකාරයෙන් ද;

f. **නාමරූප දෙක නාමරූප දෙකට**:-(16) අධිපති, (17) සහජාත, (18) අඤ්ඤමඤ්ඤ, (19) නිස්සය, (20) ආහාර (21) ඉන්ද්‍රිය, (22` විප්පයුත්ත, (23) අත්ථි, (24) අවිගත යන නව ආකාරයෙන්ද ප්‍රත්‍යය වෙති. ඒ මෙ සේයි:-

a. 1. අනතුරු ව නිරුද්ධ වූ චිත්ත චෛතසික ධර්මයෝ වර්තමාන චිත්ත චෛතසික ධර්මයන්ට **අනන්තර** ප්‍රත්‍යය වේ.

2. **සමනන්තර** ප්‍රත්‍යය ද වේ.

3. **නත්ථි** ප්‍රත්‍යය ද වේ.

4. **විගත** ප්‍රත්‍යය ද වේ.

5. වීථියෙහි මුලින් මුලින් සිටි ලෞකික ජවනයෝ පසු පසු ජවනයන්ට **ආසෙවන** ප්‍රත්‍යය වේ.

6. සහජාත (එක් ව උපන්) චිත්ත චෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට **සම්ප්‍රයුක්ත** ප්‍රත්‍යය වේ.

මෙසේ ප්‍රත්‍යය නාමය ප්‍රත්‍යයොත්පන්න නාමයට මේ සය ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

b. 7. හෙතු සය සහජාත නාමරූපයන්ට **හෙතු** ප්‍රත්‍යය වේ.

8. ධ්‍යානාඞ්ග සත සහජාත නාම රූපයන්ට **ඣාන** ප්‍රත්‍යය වේ.

9. මග්ගංග දොළස සහජාත නාම රූපයන්ට **මග්ග** ප්‍රත්‍යය වේ.

10. සහජාත චෙතනාව සහජාත නාම රූප යන්ට ද, නානාක්ඛණික චෙතනාව (එ නම් කර්මය කරණ අවස්ථාවෙහි උපන් චෙතනාව) කර්මය විසින් උපදවන ලද (හෙවත් විපාක අවස්ථාවෙහි ඇති වන) නාම රූපයන්ට ද යි දෙ පරිද්දකින් **කර්ම** ප්‍රත්‍යය වේ. එ නම් **සහජාත කම්ම** පච්චය **නානාක්ඛණික කම්ම**පච්චය යන දෙක යි.

11. විපාකස්කන්ධයෝ (එ නම් විපාක සිත්වල වෙදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන ධර්මයෝ අන්‍යොන්‍යයන්ට හා

ඒ ඒ සමග උපන් රූපයන්ට දුයි යන නාම රූපයට **විපාක** ප්‍රත්‍යය වේ.

මෙ සේ ප්‍රත්‍යය නාමය ප්‍රත්‍යයොත්පන්න නාමරූපයට මේ පස් ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

c. 12. පසු ව උපන් චිත්ත චෛතසික ධර්මයෝ පූර්වයෙහි උපන් (එ නම් කලින් ඉපද ආයු වැඩි බැවින් පැවතී එන) මේ කයට හෙවත් රූපයන්ගේ පැවැත්මට **පශ්චාජ්ජාත** ප්‍රත්‍යය වේ. (ඒ මෙසේ යිː–රූපයන්ට බොහෝ සෙයින් චිත්තක්ෂණ ප්‍රමාණයෙන් දහසතක් ආයු වේ. එයින් රූපය හා එකවිට උපන් චිත්තොත්පාදය රූපයට පශ්චාජාත ප්‍රත්‍යය නො වේ. නුමුත් ඒ චිත්තොත්පාදය බිඳුනාට පසුවත් තව චිත්තොත් පාද දහසයක් උපදින තුරු ඒ රූපය ම දරා සිටී. එවිට කලින් ඉපදී සිටි නිසා පුරෙජාත නම් ද වේ. මෙ ලෙස පුරෙජාත වූ ඒ රූපයට ඒ චිත්තොත්පාද දහසය ම පශ්චාජාත වශයෙන් ප්‍රත්‍යය වේ). මෙ සේ නාමය රූපයට මේ එක ම ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

d. 13. ප්‍රවෘත්තියෙහි දී වස්තු රූප සය විඥාන ධාතු සතට ද; රූපාදී අරමුණු පස විඥාන වීථි පසට ද; (අනතුරු ව කී සේ කලින් ඉපිද සිටියෝ පසු ව උපදින්නන්ට) **පුරෙජාත** ප්‍රත්‍යය වේ. යට දී යටත් පිරිසෙයින් එක චිත්ත ක්ෂණයක් වත් අතීත වෙලා ම පස් අරමුණ වැලඳ ගන්නා බව කී වේ මේ නිසා ම යි. මෙ සේ රූපය නාමයට මේ එකම ආකාර යෙන් ප්‍රත්‍යය වේ.

e, 14. නාමය රූපය ප්‍රඥප්තිය යන මොහු නාමයට පමණක් **ආලම්බන** ප්‍රත්‍යය වේ. (මෙහි අරමුණ රූපාදී සය වැදූරුම්. එයින් රූපස්කන්ධයට අයත් අරමුණක් සම්භරවිට කා ද, නාම අරමුණක් අන් විටක ද, පඤ්ඤත්ති අරමුණක් අන්විටක ද අරමුණු වෙතත් එක් කොට ගැණීමෙන් ඒ තුන් වර්ගය අරමුණු වෙන බව කියන ලදී.)

15. ඔව්හු ම ඊට **උපනිශ්‍රය** ප්‍රත්‍යය ද වේ. (මෙහි ආලම්බනූපනිස්සය, අනන්තරූපනිස්සය පකතූපනිස්සයයි උපනිස්සය තුන් වැදූරුම්. එයින් **ආලම්බනූපනිස්සය** නම් ගරු කරණ ලද අරමුණ **ම** යි. **අනන්තරූපනිස්සය** නම් අනතුරු ව

නිරුද්ධවූ චිත්තචෛතසික ධර්මයෝ සි. **පකතූපනිස්සය** නම් ආධ්‍යාත්මිකවූ ශ්‍රද්ධාදී රාගාදී ධර්මයෝ ද සුඛ දුඃඛයෝ ද, පිටත්හි වූ පුද්ගල භෝජන සෘතු සේනාසනාදීහු ද යන මේ ආදීහු කුසලාදී ධර්මයන්ට ද, කර්මය විපාකයන්ට ද යන මෙබඳු බොහෝ ප්‍රකාර ඇති බලවත් ආධාරය සි. මේ ආරම්මණූපනිස්සයෙහි සමෝධානයෙන් නාමරූප පඤ්ඤත්ති වශයෙන් ද, අනන්තරූපනිස්සයෙහි නාම වශයෙන් පමණක් ම ද, පකතූපනිස්සයෙහිත් ආරම්මණූපනිස්සයෙහි මෙන් ද සිටි නමුත් තුන් ප්‍රභේදය නැවත එකතු කොට නාමරූප පඤ්ඤත්තීන් ලත් බැවි ද; මේ සියලු තන්හි ප්‍රත්‍යයොත්පන්නය නාමය බැව් ද සැලකිය යුතු සි.)

මෙ සේ ප්‍රඥප්ති නාමරූපයෝ නාමයට මේ දෙ ආකාරයෙන් ප්‍රත්‍යය වෙති.

f. 16. නාමරූප දෙක නාම රූප දෙකට **අධිපති** ප්‍රත්‍යය වේ. (එහි අධිපති ධර්මය ආරම්මණාධිපතිය සහජාතාධිපතිය යි දෙවැදෑරුම්. එයින් ගරු කොටගත් අරමුණ **ආරම්මණාධිපති** වශයෙන් නාමයට ද, සහජාත වූ යට කී ඡන්දාදී අධිපති සතර **සහජාතාධිපති** වශයෙන් ඒ සමග උපන් නාම රූපයන්ට ද ප්‍රත්‍යය වන හෙයින්, එහි ප්‍රත්‍යය ධර්මයන් වෙන ම ද ප්‍රත්‍යයොත්පන්න ධර්මයන් වෙන ම ද එකතු කොට බැලූ කල නාමරූප ධර්මයන් නාම රූප දෙකට ප්‍රත්‍යය වන බව පෙණේ. එහි ද අරමුණට පඤ්ඤත්තියත් සමග ම නාම රූප දෙක ඇතුලත් බව සැලකිය යුතු සි. මතුද පුඩුකර බැලීම මෙලෙස ම සි.)

17. නාමරූප දෙක නාමරූප දෙකට **සහජාත** ප්‍රත්‍යය ද වේ. (එය තුන් පරිදි සි. එහි චිත්තචෛතසිකයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ටත් **චිත්තචෛතසික සහජාත** වශයෙන් ද; සතර මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදා රූපයන්ටත් **මහාභූත සහජාත** වශයෙන් ද; ප්‍රතිසන්ධික්ෂණයෙහි වස්තුරූපය විපාකස්කන්ධයෝ ය යන මොහු ඔවුනොවුන්ට **වස්තු විපාක සහජාත** වශයෙන් ද වේ.)

18. නාමරූප දෙක නාමරූප දෙකට අඤ්ඤමඤ්ඤපච්චය ද වේ. (එය ද තුන් ප්‍රකාර සි. එනම්: චිත්ත චෛතසිකයෝ

ඔවුනොවුන්ට **චිත්තචෙතසික අඤ්ඤමඤ්ඤ** වශයෙන් ද, මහභූත සතර ඔවුනොවුන්ට **මහාභූත අඤ්ඤමඤ්ඤ** වශයෙන් ද, ප්‍රතිසන්ධික්ෂණයෙහි වස්තුවිපාක දෙක ඔවුනොවුන්ට **වත්ථුවිපාක අඤ්ඤමඤ්ඤ** වශයෙන් ද වේ).

19. නාමරූප දෙක නාමරූප දෙකට **නිස්සය පච්චය ද** වේ. (එය ද තුන්ප්‍රකාර යි. එනම්: චිත්තචෛතසික ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ටත් **චිත්ත චෛතසික නිස්සය** වශයෙන්ද, මහාභූතයෝ ඔවුනොවුන්ට හා උපාදා රූප යන්ටත් **මහාභූත නිස්සය** වශයෙන් ද, චක්ඛාදී වස්තු සය විඤ්ඤාණ ධාතු සතට **වත්ථු නිස්සය** වශයෙන්ද වේ).

20. නාමරූප දෙක නාමරූප දෙකට **ආහාර පච්චය ද** වේ. (එය දෙවැදෑරුම්. එ නම්:– **කබලිංකාරාහාරය** මේ කයට හෙවත් රූපයන්ට ඒ වශයෙන් ද; ඵස්සාදී ඉතිරි ආහාර තුණ සහජාත නාමරූපයන්ට **අරූපී ආහාර** වශයෙන් ද වේ).

21. නාමරූපදෙක නාමරූප දෙකට **ඉන්ද්‍රිය** පච්ච ද වේ. (එය ද තුන් ප්‍රකාර යි. එ නම්: චක්ඛුන්ද්‍රියාදී පස පස් විඤ්ඤාණයන්ට **පසාදින්ද්‍රිය** වශයෙන් ද, **රූප ජීවිතින්ද්‍රිය** උපාදින්න රූපයන්ට ඒ වශයෙන් ද, **අරූපී ඉන්ද්‍රියයෝ සහජාත** නාම රූපයන්ට ඒ වශයෙන් ද වේ).

22. නාමරූපදෙක නාමරූප දෙකට **විප්පයුත්ත** පච්චය ය ද වේ. (එය ද තුන් ප්‍රකාර වේ. එ නම්:– ප්‍රතිසන්ධික්ෂණ යෙහි වස්තුරූපය විපාකස්කන්ධයන්ට ද, චිත්තචෛතසිකයෝ සහජාත රූපයන්ට ද යි දෙපරිද්දෙකින් **සහජාත විප්ප යුත්ත** වශයෙන් ද; පසුව උපන් චිත්ත චෛතසික ධර්මයෝ (යට කී සේ) පුරෙජාත වූ මේ කයට **පච්ඡාජාත විප්පයුත්ත** වශයෙන් ද; වස්තු සය ප්‍රවෘත්තියෙහිදී විඤ්ඤාණ ධාතුසතට **පුරෙජාත විප්පයුත්ත** වශයෙන් ද වේ).

23. නාමරූප දෙක නාමරූපදෙකට **අත්ථි** පච්චය ද වේ. (එය ද පස් ප්‍රකාර යි. එනම්: යට කී තුන් ප්‍රකාර **සහජාත** ප්‍රත්‍යය **සහජාතත්ථි** වශයෙන් ද, ද්විප්‍රකාර පුරෙජාත පච්චය **පුරෙජාතත්ථි** වශයෙන් ද, එක් ප්‍රකාර පච්ඡාජාත පච්චය **පච්ඡාජාතත්ථි** වශයෙන් ද, ආහාර ප්‍රත්‍යයෙහි හෙද දෙකින්

සහජාත වශයෙන් නො ගැණෙන කබලිංකාරාහාර භෙදය **කබලිංකාරාහාරත්‍ථි** වශයෙන් ද, ඉන්‍ද්‍රිය ප්‍රත්‍යයෙහි භෙද තුණින් සහජාත පුරෙජාත වශයෙන් නො ගැණෙන රූප ජීවිතින්‍ද්‍රිය භෙදය **රූපජීවිතින්ද්‍රියත්‍ථි** වශයෙන් ද වේ).

24. නාමරූප දෙක නාමරූපදෙකට **අවිගත** ප්‍රත්‍යය ද වේ. එය හැම අතින් ම අත්‍ථිපච්චයට සමාන වේ.

මෙ සේ ප්‍රත්‍යය නාමරූපය ප්‍රත්‍යයොත්පන්න නාමරූප යට මේ නව ආකාරයෙන් ප්‍රත්‍යය වේ.

මෙම සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් ආලම්බන උපනිස්සය කම්ම අත්‍ථි යන සතර කෙරෙහි ඉතිරි විස්සත් ඇතුලත් වන බැව් විසිතුරකි.

මේ නොයෙක් තැන **සහජාතරූපය** යි කියන ලද්දේ ප්‍රවෘත්තියෙහි චිත්ත සමුට්ඨාන රූපයන් සඳහා ද, ප්‍රතිසන්‍ධියෙහි කර්මජ රූපයන් සඳහා ද වේ. එ හෙයින් එය දෙවැදෑරුම් බව සැලකිය යුතු.

> "ඉති තෙ කාලිකා ධම්මා කාලමුත්තා ච සම්භවා,
> අජ්ඣත්තං ච බහිද්ධා ච සංඛතාසංඛතා තථා.
>
> පඤ්ඤත්ති නාමරූපානං වසෙන තිවිධා ඨිතා,
> පච්චයා නාම පට්ඨානෙ චතුවීසති සබ්බථා."

(මෙ සේ තුන්කාලය සම්බන්‍ධ වූ ද, කාලභෙදයෙන් නො සැලකිය යුතු වූ ද, ආධ්‍යාත්මික වූ ද, සත්‍ව සන්තානයෙන් පිටත්හි වූ ද, සංඛත වූ ද, අසංඛත වූ ද, ධර්මයෝ ප්‍රඥප්තිය නාමය රූපය යි. තුන් පරිද්දකින් සිටියාහු පට්ඨානක්‍රම යෙහි ලා සර් ප්‍රකාරයෙන් ප්‍රත්‍යයෝ සූවිස්සක් වෙති.)

**ප ට්ඨා න ක්‍ර ම පා ද ය යි.**

**දශ වැනි වූ ප්‍රත්‍යය විභාග කාණ්ඩය නිමි.**

(A.) **සමථ** (B.) **විදර්‍ශනා** වශයෙන් දෙයාකාර වූ භාවනාව මෙතැන් පටන් දක්වනු ලැබේ. එසි:–

A. **සමථභාවනාවගේ** දැනීම සඳහා (a.) කර්ම ස්ථාන 40 ක් ද, (b) චරිත 6 ක් ද, (c) භාවනා 3 ක් ද, (d) නිමිති 3 ක් ද, (e) ධ්‍යාන 5 ක් ද, (f) පීථි 3 ක් ද, (g) වසිතා 5 ක් ද, (h) අභිඥා 5 ක් ද, දත යුතු යි. එහි:–

a. 1. **කම්ස්ථාන** 40 ස නම්:–පඨවි, ආපො, තෙජො. වායො, නීල, පීත, ලොහිත, ඔදාත, ආලොක, ආකාස යන **කසිණ** 10 ය ද;

2. උද්ධමාතක, විනීලක, විපුබ්බක, විච්ඡිද්දක, වික්ඛායිතක, වික්ඛිත්තක, හත වික්ඛිත්තක, ලොහිතක, පුලවක. අට්ඨික, යන **අසුභ** 10 ය ද;

3. බුද්ධ ධම්ම සඞ්ඝ සීල චාග දෙවතා උපසම මරණ කාය ආනාපාන යන මොවුන් සම්බන්ධ **අනුස්සති** දසය ද;

4. මෙත්තා කරුණා මුදිතා උපෙක්ඛා යන **අප්පමඤ්ඤා** හෙවත් **බ්‍රහ්මවිහරණ** සතර ද;

5. ආහාරයෙහි පිළිකුල් සංඥ වශයෙන් **සංඥා** එකක් ද;

6. සතර ධාතූන් ව්‍යවස්ථා කිරීම් වශයෙන් **ව්‍යවස්ථා** එකක් ද;

7. ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන වශයෙන් **ආරුප්ප** සතරක් ද යි යන මේ 40 සයි.

a. 1. මෙහි **කසිණ**යෝ නම් නීලාදී ඒ ඒ භාවය ක්‍රම යෙන් මුලුලොව පතුරා සිතන අරමුණ යි. කසිණ යන ශබ්දාර්ථය නම් සියල්ල යනු යි.

2. **අශුභයෝ** නම්:– පිළිකුල් වසයෙන්, අයහපත් වශයෙන් වහා වැටහෙණ අරමුණ යි.

3. **අනුස්සති** නම්: නැවත නැවත සිහි කරණ අරමුණ යි

4. **අප්පමඤ්ඤා** නම් අප්‍රමාණ සත්වයන් කෙරෙහි පතුරුවා වඩන යහපත් අදහසු යි අප්පමඤ්ඤා යන වචනාර්ථය නම් :–අප්‍රමාණ (සත්ව)යන් කෙරෙහි පවත්වන ලද්ද යනු යි. **බ්‍රහ්මවිහරණ** යනු ද බ්‍රහ්මයා සත්වයන් කෙරෙහි අදහස් කරමින් වසන පරිදි ය යනු යි.

5. **සඤ්ඤා** නම්; හැඟීමයි. හෙවත් හිතා ගැණීම යි .

6. **වවත්ථාන** නම්; වෙන් වෙන් කොට සැලකීම යි.

7. **ආරුප්පයෝ** නම්; පඨව්‍යාදි නීලාදී දල අරමුණු ඉක්මවා ලබන ආකාශ, විඤ්ඤාණ, නත්ථිභාව, සුබුම සඤ්ඤා යන සූක්ෂම අරූප අරමුණු වැඩීම යි.

b. **චරිතා සය** නම් (1) රාගචරිතා, (2) දෙසචරිතා, (3) මොහචරිතා, (4) සද්ධාචරිතා, (5) බුද්ධිචරිතා, (6) විතක්ක චරිතා යන ඒ ඒ සත්‍වයන්ට උත්පත්තියෙන් ම අයිතිව තිබෙන ඒ ඒ ධර්මයට හුරු ගති සය යි.

c. **භාවනා තුණ** නම් (1) පරිකම්ම භාවනා, (2) උපචාර භාවනා, (3) අප්පණා භාවනා, යන ගත් අරමුණ වැඩීමෙහි අවස්ථා තුණ යි.

d. **නිමිති තුණ** නම් (1) පරිකම්ම නිමිත්ත (2) උග්ගහ නිමිත්ත (3) පටිභාග නිමිත්ත යන ගත් අරමුණ පුහුණු වී මෙහි අවස්ථා-තුණට වැටහෙන පරිදි තුණ යි.

e. **ධ්‍යාන** පස නම් යට දක්වූ පඨමජ්ඣානාදී පස ම යි.

f. **වීථි තුණ** නම්; මහග්ගත සිත් ප්‍රථම වරට ඉපදවීමෙහි ද, නැවත නැවත ඉපදවීමෙහි ද, ඒ සම්බන්ධ ධර්මයන් අරමුණු කිරීමෙහි ද උපදින (1) ආදිකම්මික වීථි, (2) සමාපත්ති වීථි, (3) පච්චවෙක්ඛණ වීථි, යන වෙනස් වෙනස් වූ චිත්ත වීථි තුණ යි.

g. **වසිතා** පස නම් (1) ආවජ්ජන, (2) සමාපජ්ජන, (3) අධිට්ඨාන, (4) වුට්ඨාන, (5) පච්චවෙක්ඛණ යන උපදවා ගත් අර්පණ සිත තම හට හුරුකර ගන්නා ආකාර පස යි. නො හොත් ඒ විෂය යෙහි ඇති කර ගන්නා සමර්ථ බැව් පස යි.

h. **අභිඥා** පස නම් (1) ඉද්ධිවිධ ඥාණය, (2) දිබ්බ සොත ඥාණය, (4) පරචිත්ත විජානන ඥාණය, (4) පුබ්බෙ නිවාසානුස්සති ඥාණය, (5) දිබ්බ චක්ඛු ඥාණය, යන විශිෂ්ට දැනුම් පස යි.

**උද්දෙශ පාදය යි.**

ත්‍රිහෙතුක පුද්ගලයා මෙසින් තම චරිතාවට සත්ප්‍රාය වූ කර්මස්ථානයක් ගෙණ විවෙක ව භාවනා තුණෙන් නිමිති තුණ වඩා ඒ ඒ ප්‍රථම වීථි උපදවා ගෙණ ඉතිරි වීථි කෙරෙහි වසිතාවන් ඇති කොට ක්‍රමයෙන් සියලු රූපාරූපසමාධියෙහි කෙළ පැමිණ අභිඥාවන් ලැබ ආනුභාව සම්පත්තියට ද පැමිණේ. ඒ ඒ අවස්ථාවන්හි සිටියේ ඒ ඒ භවසම්පත්තිය ගෙණ දෙන කර්මයන් ද රැස් කෙරේ. දිට්ඨධම්ම සුඛ විහරණ

ශාන්ත විහාරයන් ගෙන් උපලක්ෂිත ව තිදුක් ව ද කල් යවයි. මතු මොක්ෂ මාර්ගික වූ විදර්ශනාවට පාදක වූ ඒ ඒ චිත්ත විසුද්ධිය හෙතු කොට ගෙණ ඒ ඒ සෙසු මාර්ගඵලයන් පමණක් නො ව අර්හත්ඵලය පවා ලැබ අනුපාදිසෙස නිර්වාණ ධාතුවෙන් පිරිනිවීම ද කරයි. ඒ මෙ සේ යි:–

ත්‍රිහෙතුක පුද්ගලයා ලොවුතුරා බුදුන් පටන් පෘථග් ජන බහුශ්‍රැතයා දක්වා වෙත පැමිණ ගත හැකි වූ වැඩි උතුම් කල්‍යාණ මිත්‍රයෙකු අතින් තම චරිතාවට සප්පාය වූ කර්මස්ථානයක් ලබා ගණී. එහි සප්පාය බව නම්:–

a. 1 **රාගචරිතයාහට** රාගය මැඩපැවැත්වීමට උපකාර වන්නා වූ අසුභ දසය කායගතාසතිය යන කර්මස්ථාන එකොළොස ද;

2. **ද්වේෂචරිතයාට** ද්වේෂය මැඩපැවැත්වීමට උපකාර වන බ්‍රහ්මවිහරණ සතරය නීලාදී වර්ණ කසිණ සතරය යන අට ද;

3. 6. **මොහචරිතයාට** මූලා නො වීම පිණිස ද **විතර්කචරිතයාට** නානා කල්පනාවල් නූපදින පිණිස ද සිත නාසාග්‍රයෙහි රඳවන ආනාපාන සතිය ද;

4. **ශ්‍රද්ධාචරිතයාහට** ශ්‍රද්ධාවෙන් ම ඇති කර ගත යුතු බුද්ධානුස්සති ආදී අනුස්සති සය ද;

5. **බුද්ධිචරිතයාහට** ප්‍රඥාවට ම ගොචර වූ මරණානුස්සති උපසමානුස්සති ආහාරයෙහි පටික්කූලසඤ්ඤා ධාතුව්‍යවස්ථා යන සතර ද, විශෙෂ වශයෙන් සප්පාය (පථ්‍ය) වෙති.

b. සියල්ලම ම සාධාරණ වශයෙන් පඨවි ආදී භූත කසින සතර ය, ආලොක ආකාශ කසිණ දෙක ය, සුදුසු අවස්ථාවේ දී ආරූප්‍ය සතර ය යන දස ය සප්පාය වෙති.

6. එයිනුත් කසිණ සය සම්බන්ධ මණ්ඩලය කුඩා වී නම් පිටත ආකාශය කෙරෙහි උද්ධච්ච විචිකිච්ඡා කිරීම් වශයෙන් මුළාවන්නට පහසු බැවින් **මොහ චරිතයාටහට** පළල් බව ද, පළල් වී නම් එහි තුල කොටස් බෙදීම් ආදී වශයෙන් නානා විතර්ක උපදවන්ට හැකි බැවින් **විතර්කචරිතයාහට** කුඩා බව ද සප්පාය වේ.

**චරිතා සන්ප්‍රාය භෙද පාදය යි.**

ඒ ලබා ගත් කර්මස්ථානය කෙරෙහි භාවනා තුණින් නිමිති තුණ වඩ යි.

c. 1. එහි භාවනා අතුරෙන් **පරිකර්ම භාවනාව** නම්:– කාය පොෂණය කිරීම් ආදිය සම්බන්ධ කාලය හැර අවශෙෂ කාලවල ඒ අරමුණ බොහෝ සෙයින් ඇසිනුත් බලා ගෙණ, අනන්‍ය විහිත වූ සිතිනුත් මෙනෙහි කරමින්, පඨවී, පඨවී, ආපො, ආපො යනාදී වශයෙන් ඒ ඒ කසිණය ද, උද්ධුමාතකං, උද්ධුමාතකං, යනාදී වශයෙන් ඒ ඒ අසුභය ද සි මෙසේ වචනයෙනුත් කියමින් පටන් ගත් භාවනාවෙහි ප්‍රථම අවස්ථාව සි. මෙය වැ පොරෝවලින් ලී සකස්කිරීමක් වැනි වෙයි. මෙය කමටහන් සතළිසේ ම ලැබේ.

2. **උපචාරභාවනාව** නම්:–පරිකර්ම භාවනාව මුකුරුවා මතු කියැවෙන පටිභාගනිමිත්ත උපන් තැන් පටන් වූ දියුණුවට පැමිණ ගත් කාමාවචර ස්වභාව ඉක්ම නො සිටි භාවනාව යි. මීට **කාමාවචර සමාධි** ය යි ද නමක් වේ. එය කැට යම් කැපීම් ඔප් නැගීම් සඳහා යතුකැටයෙන් ලී සකස් කිරීමක් මෙනි. මෙය ද කමටහන් සතළිසේ ම ලැබේ.

3. **අර්පණාභාවනාව** නම්:–උපචාරභාවනාව කොටිප්‍රාප්ත දියුණුවට පමුණුවා කාමච්ඡන්දාදී නීවරණ ධර්මයන් සම්පූර්ණයෙන් ම මැඩපවත්වා විතර්කාදී ධ්‍යානාඞ්ගයන් සුප්‍රතිෂ්ඨිත ව පිහිටවීම් වශයෙන් කාමාවචර ස්වභාව ඉක්මවා මහද්ගත (ආදී) භාවයට පමුණුවා ගණ වැඩීම යි. එය බුද්ධානුස්සති ආදී අටය සඤ්ඤාවය වවත්ථානය යන කමටහන් දසයෙහි, ඔවුන්ගේ ගැඹුරු ස්වභාව නිසා ද, අන්‍ය අන්‍ය බුද්ධගුණාදිය මෙනෙහි කිරීමෙහි විතර්ක බහුලතාව නිසා ඒකාග්‍රතාව දුර්වල බැවින් ද නො ලැබේ. ඉතිරි තිසෙහි ලැබේ. ඉනුත් අසුභ දසය, කායගතානුස්සතිය යන එකොළසෙහි ප්‍රථමධ්‍යානය පමණක් ද, කසිණ දසය ආනාපානානුස්සතිය යන එකොළසෙහි ප්‍රථමාදී ධ්‍යාන පස ම ද, මෙත්තා කරුණා මුදිතා යන තුණෙහි ප්‍රථමාදී ධ්‍යාන සතර පමණක් ද, උපෙක්ඛාවෙහි පඤ්චමධ්‍යානය පමණක් ද ලැබෙති. මෙහි කර්මස්ථාන විසි හය රූපාවචර ධ්‍යානයන් පමණක්ගෙණ දෙන හෙයින් **රූපා**

**වචර ජ්ඣානිකා** නම් වෙති. ආරුප්ප කමටහන් සතර එසේ ම **ආරුප්පජ්ඣානිකා** යි. කසිණුග්ඝාටි වශයෙන් ගත් ආකාශය මෙහි **පඨමාරුප්පජ්ඣානිකා** වේ. අන් පරිච්ඡේදකින් ගත් කල ආකාශකසින නමින් **රූපාවචරජ්ඣානිකා** වේ. මේ අපිණ්ණභාවණාව සහස් කල ලීයෙහි කැටයම් කැපීමක් ඔප්ලීමක් වැනි යි.

### භාවනාභෙද පාදශ යි.

d. I. ඒ වඩන නිමිති අතුරෙන් **පරිකම්මනිමිත්ත** නම්:- භාවනාවගේ ආරම්භයට ගණු ලබන නිමිත්තයි. එය කසිණයන්ට බහුල වශයෙන් ම සාදගත් උපකරණයක් වශයෙන් ද, අසුභයන්ට සොහොන් ආදියෙහි දක්නට ලැබෙන ඒ ඒ මළසිරුරු වශයෙන් ද, **අනුස්සති** සඤ්ඤා වවත්ථාන ආරුප්පයන්ට සිහියෙන් ඉදිරියට පමුණුවාගන්නා ලද ඒ ඒ බුද්ධාදී පුද්ගල ධම්ම වස්තු වශයෙන් ද, අප්පමඤ්ඤාවන්ට දකින සිහි කරණ සත්වයන් වශයෙන් ද ගන්නා ලැබේ.

එකී උපකරණය නම්:- **කසිණයන්** අතුරෙන් **පඨවි නිල පීත ලොහිත ඔදාත** කසිනයන්ට ක්‍රමයෙන් පැමැටියෙන් නිලින් කසා වර්ණයෙන් රතින් සුදින් වර්ණවත් කරණ ලද එක් වියත් සතරඟුලක් පුළුල් වූ සමවක්‍රාකාර රූපයකි. එය සංහාරික අසංහාරික වශයෙන් දෙ වැදෑරුම්. ඉන්:-සංහාරිකය නම්;වස්ත්‍රාදියක එ සේ සිතියම් කොට භාවනා කාලයෙහි දිගහැර ගැණීමට හා ඉතිරි කාලයෙහි හකුලා තැබීමට හැකිවන සේ සාද ගන්නා ලද්දකි. අසංහාරිකය නම් තෙලුම් මල් කෙමියක් නොහොත් කුඩා කතප්පුවක් සේ එක්වියත් සතරඟුලක් උසට හා පළලට ලී ආදී යමකින් සාද සායම් කොට බිම සිටුවා එලෙස ම තිබෙන්ට අරින උපකරණය යි. **ආපො** කසිණයට වතුර පාත්‍රයක් ද, **තෙජො** කසිණයට පෝරු පැළලි පැදුරු ආදියක එක් වියත් සතරඟුලක් පමණ පුළුල් වූ කවසිදුරක් කපා එය තිරය මෙන් බැඳ ඉන් ඔබ්බෙහි ගිනි ගොඩක් දල්වා ඒ සිදුරෙන් පෙණෙන ගිනිමඩුල්ල ද; **වායො** කසිණයට එ බඳු ම සිදුරකින් පෙණෙන්නාවූ වාතයෙන් කම්පා වන අතුඅගක් ද; **ආලොක** කසිණයට කළුගෙඩි ආදියක් තුළ පහණක් දල්වා ඒකේ කට බිත්තියක්

දෙසට හරවා ඒ බිත්තියේ එක්වියත් සතරඟුල් පමණ එලිය කවයක් වැටෙන ලෙස ඇත් කොට එලාගත් ඒ ආලෝක කවය ද; **ආකාශ** කසිණයට එකී ප්‍රමාණ සිදුරක් ද වේ. (මෙහි තව තවත් සුලු විශේෂ ඇතත් මේ සුලු පොතට මේ පමණි.

අසුභයන් අතුරෙහි:–**උද්ධුමාතකය** නම් ඉදිමුන මළකුණ යි. **විනීලකය** නම් කුණු වීමෙන් නොයෙක් නිලාදී පාට වැටුනා වූ ද; **විපුබ්බකය** නම් කුණු වී නො යෙක් තැනින් සැරව වැහෙන්නා වූ ද; **විච්ඡිද්දකය** නම් කුණුවී නොයෙක් තැනින් සිදුරු වූ ද; **වික්ඛායිතකය** නම් නරි බලු උකුසු ගිජුලිහිණි කබර ගොයි ආදීන් විසින් නොයෙක් තැනින් කා තුවාල කරණ ලද්දවූ ද; **වික්ඛිත්තකය** නම් කුණුවීමෙන් ම හෝ සතුන් විසින් ඇද දමන ලදුව හෝ විසිරී ගිය ඇට ඇත්තා වූ ද; **හතවික්ඛිත්තකය** නම් කරණ ලද අපරාධය නිසා. රාජාඥයෙන් හෝ සොරුන් සතුරන් විසින් හෝ නසන ලදුව විසුරුවා දමන ලද කැබලි ඇත්තා වූ ද; **ලෝහිතකය** නම් එසේම රාජාඥදියෙන් ආයුධාදියෙන් නසනලදුව ලෙයින් තැවරුණා වූ ද; **පුළුවකය** නම් කුණු වී පණුවන් විසින් රුස්කා ලෙලදෙමින් කනු ලබන්නා වූ ද; **අට්ඨිකය** නම් ලේ මස් ක්ෂයව ගොස් ඇට පමණක් ඉතිරිබවට පැමිණියා වූ ද මළකුණ යි.

**අනුස්සතීන්ට** ක්‍රමයෙන්, **සර්වඥයන්** වහන්සේ, නව ලෝකොත්තර **ශ්‍රීසද්ධර්මය**, අෂ්ටාර්යපුද්ගල **සංඝයා** තමාගේ **ත්‍යාගය**, තමාගේ විද්‍යමාන ගුණයන්ගේ උතුම්කමට සාක්ෂි වශයෙන් **දෙවතාවෝ**, තමාගේ පාපධර්මයන් **සන්සිඳවීම**, **මරණය**, කයෙහි **කුණප** කොටස්, අදින හෙලන **හුස්ම** යන මේ පුද්ගලාදීහු ද;

**අප්‍රාමාණ්‍යයන්ට සත්වයෝ ද;**

**සඤ්ඤාවට ආහාරය ද;**

**ව්වත්ථානයට** පෘථිව්‍යාදී **ධාතූහු ද;**

**ආරූප්‍යයන්ට** ඔ 7. යන්තෙන් යථොක්ත **සතර ද පරිකර්ම නිමිති වෙත්.**

2. **උග්ගහනිමිත්ත** නම්:–ඇසින් බලමින් භාවනා කරණ කසිණ අසුභාදිය හොඳින් ප්‍රගුණ වූ කල ඇස පියා ගත භාවනා කරණ කලත් ඇසට පෙණෙන්නාක් මෙන් ප්‍රකට ව වැටහේ ද, සිහි කිරීම් ආදී වශයෙන් ඉදිරියට පමුණුවා ගත යුතු බුද්ධාදී අරමුණු සවභාවයෙන් ම වෙත පැමිණ සිටින්නාක් මෙන් ප්‍රකට ව වැටහේ ද, මෙ සේ පොත් බලමින් පාඩම් කරණ ගාථාවක් පාඩම් හිටි කල පොත නො බලාත් කියන්නට පුළුවන් වන ලෙස ප්‍රකට වන්නාක් මෙන් පාඩම් හිටියේ ය යි කිය යුතු අරමුණ යි. මෙය ලත් තැන් පටන් ඒ භාවනාවට **සමාධි** නම ලැබේ.

(මේ නිමිති දෙක පරිකර්ම භාවනාවට අරමුණු යි.)

3. **පටිභාගනිමිත්ත** නම්:–ඒ පරිකම්ම උග්ගහ නිමිති ගත වූ පඨව්‍යාදි උද්ධුමාතකාදී බුද්ධාදී සියලු භේද වශයෙන් පැවති ධර්මයන් ඉක්මවා ඒ ඒ භාවයන් හෙවත් පඨවි භාවාදිය උද්ධුමාතක භාවාදිය පුබ්බභාවාදිය යි කියන ලද ඒ ඒ ඤාණ ශබ්දයන්ගේ පැවැත්මට සීමා ය යි හේතු ය යි පරිකල්පිත වූ, ඒ ඒ ධර්මයට ප්‍රතිභාග වූ පරමාර්ථ වශයෙන් දක්විය යුත්තක් නැත්තා වූ, ප්‍රඥපති ධර්මය වැටහීම් වශයෙන් පැවති නිමිත්ත යි.

(මෙය උපචාර අර්පණා භාවනා හෙවත් සමාධි දෙකට අරමුණ යි.)

**නිමිත්තභේද පාදය යි.**

මෙ සේ පරිකර්ම භාවනාවෙන් පරිකර්ම නිමිත්ත ද, එය ම සිතින් උගත් කල උග්ගහ නිමිත්ත ද වඩා එයින් උපන් උපචාර භාවනාවෙන් පරිභාග නිමිත්ත වඩන කල අප්පණා භාවනාව සම්පාදනය වෙයි.

එහි ද පළමු වැනි ව ප්‍රථම ධ්‍යානය පළමු වැනි වරට උපදී. එ සේ පළමු වැනි වරට යම් කිසි ධ්‍යානයක් ඉපදීමෙහි ඇති වන චිත්තොත්පාද පිළිවෙළ **ආදිකම්මිකවීථි** නම් වේ. එය යට 21 වැනි 22 වැනි වින්‍යාස වලින් ද්විප්‍රකාර ව දත යුතු යි. එම ධ්‍යානය දිට්ඨ ධම්මසුඛ විහරණය පිණිස හෝ වසීතාවන් පිණිස හෝ නැවත නැවත උපදවන කල **සමාපත්තිවීථිය** ලැබේ. එය ද යට 23 වැනි 24 වැනි වින්‍යාස

වලින් ද්විප්‍රකාර ව දත යුතු යි. ඒ වසීතා ආදිය පිණිස එම ධ්‍යානයෙහි අවයව වූ ධ්‍යානාඞ්ගයන් ආවර්ජනා කරණ කල **ආවජ්ජනවීථි** නමින් හෝ ප්‍රත්‍යවේක්‍ෂා කරණ කල **පච්චවෙක්ඛණවීථි** නමින් හෝ එහි පිහිට වියයුතු කාලාදිය අධිට්ඨාන කරණ කල **අධිට්ඨාන වීථි** නමින් හෝ උපදින වීථියෙහි නො දියුණු අවස්ථාවන් 20 වැනි 33 වැනි වින්‍යාස අනුසාරයෙන් දතයුතු යි. එහි ජවන අඩුකම දියුණු වේ ලක්‍ෂණයකි.

මේ පළමු වැනි දෙවෙනි වීථි දෙක **මහග්ගත** නමින් අප්පණාවීථි ද, තුන්වැන්න පරිත්ත ජවන වීථි ද වෙති.

ඒ ආදිකම්මික වීථි වශයෙන් උපන් ප්‍රථමධ්‍යානය ආවජ්ජන සමාපජ්ජන අධිට්ඨාන පච්චවෙක්ඛණ වීථින් කෙරෙහිපුරුදු කිරීමෙන් වසිතාවන් ඇති කර ගණී. එහි:-

g 1. **ආවජ්ජනවසිතාව** නම්:-සමවදින්නට යන ධ්‍යානයෙහි ඇති කරගතයුතු එක එක ධ්‍යානාඞ්ගය වෙන වෙන ම හෝ පිඩු වශයෙන් හෝ ආවජ්ජනාකර ඒ ඒ ප්‍රස්ථාවානුකූලව ඒ ඒ ධ්‍යානය තිය ම කර ගැන්මට ද, වීථියෙහි ජවන සතින් දෙකක් හෝ තුණක් ම හෝ අඩුකර වීථි ලුහුඬුකිරීමට ද, සමර්ථබව යි. මෙහි පරම වසීප්‍රාප්ත භාග්‍යවතුන් වහන්සේට ජවන සතරක් වෙතැයි ආචාර්‍යවරයෝ කියත්.

2. **සමාපජ්ජන වසිතාව** නම්:-ධ්‍යානාඞ්ගාවර්ජන වීථියටත් සමාපත්තිවීථියටත් අතර භාවාංග තුණකට හෝ දෙකකට හෝ වැඩි නො වන සේ ලුහුඬු කොට සමවදින්ට සමර්ථබව යි. මේය භාග්‍යවතුන් වහන්සේට භවාංගචලන භවාඞ්ගෝපච්ඡේදක යන දෙකින් පමණක් වන්නේය.

3. **අධිට්ඨානවසිතාව** නම්:-භවාඞ්ග සන්තතියට විරුද්ධව ඉතා සුලුකලක් හෝ වැඩි කලක් හෝ කැමති සේ සමාපත්ති වීථියෙහි ධ්‍යාන සිත් පිහිටුවන්ට පොහොසත් බවයි:-හෙවත් මැනදී, භාවාඞ්ගයට වැටෙන්ට නොදී රැක ගන්නා සමර්ථ බව යි.

4. **වුට්ඨානවසිතාව** නම්:-භවාඞ්ගයට විරුද්ධව ගෙණ යන බලය ඇතත් ව්‍යවස්ථා කරණ ලද කාලයෙන් ඔබ්බට යා නො දී එහි දී ම නැගී සිටින්ට හැකි වන සමර්ථ බව යි.

5. **පච්චවෙක්ඛණ වශිතාව** නම්:– වකී ආවජ්ජන, සමාපජ්ජන වීථිවල අතර භවාඞ්ග ගණන මෙන් සමාපජ්ජන පච්චවෙක්ඛණ වීථිවල අතර භවාංග ගණන ද ආවජ්ජන වීථිවල ජවනගණනමෙන් පච්චවෙක්ඛණ වීථිවල ජවනගණන ද සැහැල්ලුකරන්ට පොහොසත් බව යි.

මෙහි සමවදින්ට යන ධ්‍යානයෙහි ඉපදවිය යුතු අනාගත ධ්‍යානාංගයෝ ආවජ්ජනවීථියට ද, ඒ ධ්‍යානාංග ගණතින් යුක්ත වූ චිත්තක්ෂණ පරිච්ඡේදය අධිෂ්ඨාන වීථියට ද සමවන්ධ්‍යානයේ පැවති අතීත ධ්‍යානාංගයෝ පච්චවෙක්ඛණ වීථියට ද, අරමුණු වෙත බව ද සමාපත්තියට මුලින් අගින් සිටින බව ද යන මෙ පමණක් මේ වීථිතුණේ වෙනස වේ. එහෙයින් ම මනොද්වාරාවජ්ජන වොට්ඨපන යන දෙනමින්, කිසිවක් විසින් නො ගන්නා ලද්දවූ ද පඤ්චද්වාරිකසිත් විසින් ගන්නා ලද්ද වූ ද යන දෙයාකාර අරමුණු ගන්නා වූ ද වීථියේ මුල මැද සිටිනා එක ම සිත මෙන් මේ තුන් නමින් සිටින වීථිය එකක් කොට ගෙණ මෙහි දක්වන ලදී.

එ සේ ප්‍රථමධ්‍යානයෙහි වශීප්‍රාප්ත ව එහි දළව වැට ගෙණ විතර්කාඞ්ගය හැර විචාරාදි සියුම්අඞ්ගයන් ඉපදවීමට පරිකර්ම කොට **ද්විතීයධ්‍යානය** ද, එහි දළ වූ විචාරාඞ්ගය හැරීමට පිරියම් කොට **තෘතීයධ්‍යානය** ද, එහින් ප්‍රීති අඞ්ගය හරිණට පිරියම් කොට **චතුර්ථධ්‍යානය** ද, එහින් එ සේ ම සුඛාඞ්ගය හරණට පිරියම් කොට **පඤ්චමධ්‍යානය** ද උපදවයි. මේ එකක් එකක් පාසා වශීප්‍රාප්තවීම කී ලෙස ම යි.

මේ ගෙණ යන කර්මස්ථානයන් අතුරෙන් පරිකර්ම භාවනාවට ගන්නා ලද්දේ බුද්ධානුස්සති ආදී අභිඥා රහිත වූවන් දශයෙන් එකක් නම්, එයින් දියුණුවට පත් ශ්‍රද්ධාදි ඉන්ද්‍රියයන් ඇතිව උපචාර භාවනාවට පැමිණී අවස්ථාවේදී අනික් කර්මස්ථානයක් ගෙණ අභිඥාවට පැමිණිය යුතු යි. පඨමජ්ඣානිකයක් ගන්නා ලද නම් එයින් ප්‍රථමධ්‍යානය ද, චතුක්කජ්ඣානිකයක් ගන්නා ලද නම් චතුර්ථධ්‍යානය ද ලැබ එතන දී අන් කමටහණක් ගෙණ මතු මතු යා යුතු යි. පඤ්චමධ්‍යානයට පැමිණියහු විසින් එතනදි ආනාපානසති උපෙක්ඛා කමටහන් ගෙණ ආවුන් විසින් පචා–ධ්‍යානයට සම වැද, එයින්

නැගී ඒ පටිභාග නිමිත්ත ඉවත් කොට සිතා, ඒ කසිණය විසින් පැතිර විෂය කර ගෙණ සිටි (කසිණුග්ඝාටි) ආකාශය පරිකර්ම නිමිත්ත කොට ගෙණ භාවනා කිරීමෙන් එයින් උපන් පටිභාග නිමිත්තෙහි **පඨමාරුප්පසිත** අභිඤා වේ. ඒ පඨමාරුප්පසිත නිමිත්ත කොට ගෙණ එසේ ම වඩා **දුතියාරුප්පය ද** ද්විතියාරුප්පය උපන්කල පඨමාරුප්ප සිතෝ නැතිබව නිමිත්ත කොට **තතියාරුප්පය ද**; ඒ තෘතියාරුප්පසිත නිමිත්ත කොට **ගෙණ චතුත්ථාරුප්පසිත ද** අභිඤා වේ. මේ සතරෙහි ත් වශී ප්‍රාප්තවීම කිලෙස ම යි.

සූත්‍රාන්තික නයින් මේ ද්විතියධ්‍යානය අව්‍යවහාරිකය යි හැර **අෂ්ටසමාපත්තිය** යි කියන ලද මේ සමාපත්ති නවය උපදවා ගත් පසු එ සේ කර්මණ්‍ය භාවයට පැමිණි පඤ්චම ධ්‍යාන සිත **අභිඤා** වශයෙන් පරිකර්ම කොට රූපාදී අරමුණු කෙරෙහි සුදුසු පරිද්දෙන් අර්පිත වේ.

**අභිඤාභෙද පාදය යි.**

h. 1. **එකි අභිඤා** අතුරෙන් **ඉද්ධිවිධ ඤාණය** නම්:— තනි තමා බොහෝ දෙනෙක් මෙන් ද, බොහෝ ව පෙණී සිට තනි කෙණෙක් මෙන් ද පෙණීම, දිය පිට ගොඩ මෙන් යාම, පෘථිවියෙහි දියෙහි මෙන් ගැලීම, මතු වීම, අහසේ ගමන් කිරීම, කැමති තැනක පෙණී සිටීම, සිටවීම, අන්තර්ධානවීම, කිරීම, කුඩා වී මහත් වී පෙණීම, එ සේ කොට පෙන්වීම, වණී වෙනස් වී පෙණීම, එ සේ කොට පෙන්වීම, නොයෙක් වෙසින් පෙණීම, එසේ කොට පෙන්වීම, යනාදී නානා ප්‍රකාර සෘද්ධි විකුර්වණදක්නා ඤාණය යි.

2. **දිබ්බසොත ඤාණය** නම්:–තමා සිටිතැනම සිට ලඟ දුර පැවති දෙව්මිනිසුන්ගේ නොයෙක් ශබ්දයන් කථාවන් අසන ඤාණය යි.

3. **පරචිත්ත විජානන ඤාණය** නම්:—දෙව්මිනිස් ආදී අන්සත්ත්වයන්ගේ සිත තමාගේ සිතින් අරමුණු කොට, රාග ද්වෙෂ මොහාදිය ද, සද්ධා බුද්ධි ආදිය ද, ඇති නැති බව දැන ගන්නා හෙවත් මෙනම් කාරණයක් මෙ සේ සිතා යි කියා දැන ගන්නා ඤාණය යි.

4. පුබ්බෙනිවාසානුස්සති ඥාණය නම්:—මම අසවල් තැනින් චුත ව මෙහි උපන්නෙමි; එතනට අසවල් තැනින් ද චුත ව ඇවිත් ඉපිද සිටියෙමි; ඒ ඒ තැන අසවල් නමින්, අසවල් ගෝත්‍රයෙන්, අසවල් වර්ණයෙන්, අසවල් පරදි ආහාර යෙන්, මෙ බඳු මෙ බඳු සුව දුකින්, මෙ බඳු ආයුෂයෙන්, යන මේ ආදී කාරණයන් ගෙන් යුක්ත ව සිට මෙ බඳු මරණය කින් චුත වූයෙමි යි නොයෙක් ආත්ම ගණන් කල්ප ගණන් තමා ගැණ ද; එ සේ ම අනුන් ගැණ ද පෙර විසූ ස්කන්ධ පිළිවෙළ දන්නා ඥාණය යි.

5. දිබ්බචක්ඛු ඥාණය නම්; ස්වර්ගලොක අපායයන් කෙ රෙන් චුත වන්නා වූ ද, එහි උපදනා වූ ද, හීණප්‍රණීත, ශොභන අශොභනවර්ණ ඇති, සුගත දුර්ගත සත්‍වයන් කර්ම වූ පරිද්දෙන් මිය පරලොව යන්නවුන් දක්නා වූ ද; ඉතා දුර පවා සිටි ඉතා සූක්ෂම වූ ද සම්මුඛ නො වූ වස්තූන්, පුද්ගල යන් මසැසින් බලන්නාක් මෙන් දිවැසින් දක්නා වූ ද ඥාණ ය යි. ඔවුන්ගේ පරිකර්මාදිය සම්බන්ධ ව 47 වැනි 48 වැනි වින්‍යාසවලින් බලා ගත යුතු යි.

### 47 වැනි වින්‍යාසය

(එකි එකි අභිඥාවක් සම්බන්ධ වීථි පරම්පරාව.)

භ. 20 භ. 20 භ. 24. භ. 20. භ. 20. භ. 20. භ. 24 +
i ii iii iv v vi vii

\+ භ. 22. භ. 20. භ.
viii iv

### 48 වැනි වින්‍යාසය

(යමක ප්‍රාතිහාර්‍ය්‍යාදිය සම්බන්ධ අභිඥා පරම්පරාව.)

47. 47. 47. 47. 47. 47. 47. 47. 47. 47. 47. 47. —පෙ—

47 වැන්නෙහි i, පාදකාධිට්ඨාන වීථිය ii, පාදකාවජ්ජන වීථිය iii, පාදක සමාපත්ති වීථිය iv, අභිඥාධිට්ඨාන වීථිය v, නැවත පාදකාධිට්ඨාන වීථිය. vi, නැවත පාදකාවජ්ජන වීථිය. vii, නැවත පාදක සමාපත්ති වීථිය. viii, අභිඥා වීථිය. (එහි ඒ ඒ අභිඥා වීථියට ඒ ඒ අභිඥාවන් කට යුතු කෘත්‍යයට සම්බන්ධ වන දෙය අරමුණු වේ. ඉද්ධිවිධා-භිඥාවෙන් ගිනි මැවීමට මැවිය යුතු ගිනි ද, දිය මැවීමට

මැවිය යුතු දිය ද, දිබ්බසෝතාභිඤ්ඤාවෙන් දිව්‍ය ශබ්දයන් ඇසීමට ඇසිය යුතු ඒ ශබ්දය ද, යනාදී වශයෙනි.) ix අභිඤ්ඤා පච්චවෙක්ඛණ වීථිය. පාදක නමින් ව්‍යවහාර වන්නේ වශිප්‍රාප්ත රූපාවචර පඤ්චමධ්‍යානය යි.

48 වැන්නෙහි "47"න් හඟවන ඒ ඒ වීථි පරම්පරාව ගිනි මැවීම, දිය යැවීම, අහසේ ගමන, සිටීම, හිඳීම, ශයනය, බොහෝවීම, එකාවීම, අනුන්ගේ සිත්බැලීම, නො පෙණීම, අනභි මුඛයන්ට පෙණීම, දිය පිට යාම, බිම කිමිදීම, පර්වත විනිවිද යාම, නානා වර්ණ දැක්වීම, නා නා වෙස් දැක්වීම, ආදි කෘත්‍යයෙන් හා ඊට සම්බන්ධ වන අරමුණෙන් ද, වෙනස් වන අභිඥා වීථියේ හා ඊට සුදුසු කසිණාදිය අරමුණු කොට ඇති පාදකයේ ද ගතියෙන් වෙනස් වනු මිස පිහිටීමෙන් කිසි වෙනසක් නැති බැවින් සමාන ව දක්වන ලදී. ඒ ඒ උවමනාවේ හැටියට කැමති කෘත්‍යාලම්බන ඇත්තකට අනතුරු ව අන් කැමති එ බඳු එකක් යෙදිය හැකි බැවින් දැක් විය යුතු අනුක්‍රමයක් නැත්තේ ය.

"අභිඤ්ඤා තු,

ඉද්ධිවිධං දිබ්බසෝතං පරචිත්ත විජානනං,
පුබ්බෙනිවාසා නුස්සති දිබ්බචක්ඛූති පඤ්චධා."

මේ සේ පඤ්චාභිඥා අෂ්ට(නව)සමාපත්තියෙහි වශිප්‍රාප්ත වූ අනාර්‍ය්‍ය ශ්‍රාවකයා මෙ පමණකින් තෘප්තියට පැමිණ භව සම්පත්තියට පැමිණෙන්නේ ය. ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ වූකලී සමහරෙක් ප්‍රමාද හෙතුවෙන් භව සම්පත් ලබත්. සමහරෙක් මෙය පාදක කොට විදර්ශනා වඩා සෝවාන් ආදී ත්‍රිවිධ මාර්ග ඵලයන් උපදවා ගෙණ සසර කොට කර ගණිමිනුත් අතිරේක ව භවසම්පත්තියත් ලබත්. අන් සමහරෙක් ආශ්‍රවක්ෂය කර ඥාන නම් වූ සවෙනි අභිඥාව හෙවත් අර්හත්වය උපදවා ගෙණ පිරිනිවන් පා වදාරත් මැ යි.

අභිඥාභෙද පාදය යි.

**එකොළොස් වැනි සමථ කම්මට්ඨාන කාණ්ඩය නිමි.**

B. මේ අන්තිම පරිච්ඡේදයෙන් එම කී **විපස්සනා** භාව නාව විස්තර කරණු ලැබේ. එහි:-

**විපස්සනා** යනු අනිච්චදුක්ඛාදී නා නා ප්‍රකාරයෙන් හෝ, සාමාන්‍ය නුවණින් මෙන් නො ව විශෙෂාකාරයෙන් හෝ, සාමාන්‍ය ජනයා විසින් මෙන් සසරට අනුකූල පරිද්දෙන් නොව විරුද්ධාකාරයෙන් හෝ නුවණින් බැලීම ය යනඅර්ථ යි.

ඒ සම්බන්ධ ව (a) විසුද්ධි සතක් ද; (b) ලක්ඛණ තුණක් ද, (c) අනුපස්සනා තුණක් ද, (d) විපස්සනා ඤාණ දසයක් ද; (e) විපස්සනූපක්කිලෙස නවයක් ද; (f) විමොක්ඛ මුඛ තුණක් ද; (g) විමොක්ඛ තුණක් ද; (h) ලොකොත්තර නවයක් ද; (i) පුද්ගලයෝ නව දෙනෙක් ද, (j) සමාපත්ති දෙකක් ද, (k) වීථි සතරක් ද දත යුතු යි. ඉන්:-

a. **විසුද්ධිසත** නම්:- (1) සීලවිසුද්ධි, (2) චිත්තවිසුද්ධි; (3) දිට්ඨිවිසුද්ධි, (4) කංඛාවිතරණ විසුද්ධි, (5) මග්ගාමග්ග ඤාණ දස්සනවිසුද්ධි, (6) පටිපදාඤාණ දස්සන විසුද්ධි, (7) ඤාණදස්සන විසුද්ධි, යන ආරම්භයෙහි පටන් අවසානය දක්වා ඒ ඒ ප්‍රතිපක්ෂ ධර්මයන් ගෙන් නිදහස් වේගණ යන අවස්ථා සත යි එහි:-

1. **සීලවිසුද්ධිය** නම්:-**පාතිමොක්ඛ සංවර** නම් වූ වරද සහිත ක්‍රියා වචනයන් හැර නිවැරදි වූ ක්‍රියා වචනයන්ගෙන් යුක්ත වන සීලය ද; **ඉන්ද්‍රිය සංවර** නම් ඇස්කන් ආදී සිත සවැනි කොට ඇති ඉන්ද්‍රියයන් ගෙන් පාපධර්මයන් වැද්ද නො දී වළකන සීලය ද; **ආජීවපාරිසුද්ධිසීල** නම් වරද සහිත ජීවිකාවෙන් වැළකී නිවැරදි ලෙස ජීවිකාව කරණ සීලය ද; **පච්චයසන්නිස්සිතසීල** නම් යම් යම් නිවැරදි ප්‍රයොජනයක් පිණිස සිව් පසය අනුදන්නා ලද්දේ ද ඒ ඒ මෙ නම් ප්‍රයොජනය පිණිස ය. මෙ නම් විපරීත ප්‍රයොජනය පිණිස නො වේ ය යි නුවණින් සලකා සිව් පසය ප්‍රයොජන ගන්නා සීල ය, යන මේ සංවරසීල සතරින් යුක්ත වීම් වශයෙන් දුශ්ශීල්‍ය දුරාචාර, දුරාජීවාදියෙන් ශුද්ධවීම යි.

2. **චිත්තවිසුද්ධිය** නම්:--අනතුරු පරිච්ඡේදයෙහි දක්වූ උපචාර සමාධි අර්පණ සමාධි යන දෙකින් සමාධි සම්පන්න ව නීවරණ ධර්මයන් ගෙන් ශුද්ධවීම යි.

3. **දිට්ඨිවිසුද්ධිය** නම්:-සියලු ත්‍රෛභූමික නාම රූප ධර්මයන්ගේ ස්වභාවය වූ **ලක්ඛණය**, කෘත්‍යය වූ **රසය**, එළඹ සිටින ආකාරය ද ගෙණ දෙන ඵලය ද වූ **පච්චුපට්ඨානය** යන තුන්පරිද්දෙන් පිරිසිඳ, මෙය දුක්ඛය යි කියා ආර්‍යයන්ගේ දක්ම සැබව එය මෙ පමණවය යි නිශ්චය කිරීම් වශයෙන් පැවති ඤාණය ලැබීමෙන් ආත්මදෘෂ්ටියෙන් ශුද්ධ වීම යි.

4. **කඞ්ඛාවිතරණ විසුද්ධිය** නම්:-ඒ ඒ ලක්‍ෂණාදී වශයෙන් අල්වා ගත් නාමරූප ධර්මයන්ගේ ඇතිවීමට-මීට මේ දෙය ප්‍රත්‍ය ය යි කියා, උපකාර වන ප්‍රත්‍යයන් පිරිසිඳ දැනීම, හෙවත් මේ දුඃඛය සමුදයකින් අටගන්නේ ය යි ආර්‍යයන්ගේ දර්ශනය සැබව එය මේ ය යි නිශ්චය කිරීම් වශයෙන් පැවති ඤාණය ලැබීමෙන් විචිකිච්ඡාව කෙරෙන්-හෙවත් මම අතීතකාලයෙහි සිටියෙම් ද? නො සිටියෙම් ද? කුමක් ව සිටියෙම් ද? කෙලෙස සිටියෙම් ද? කුමක් ව කුමක් උනෙම් ද? අනාගත කාලයෙහි මට හිටින්නට වේ ද? නොසිටින්ට වේ ද? කුමක් ව හිටින්ට වේ ද? කෙලෙස ව සිටින්ට වේ ද? වර්තමාන කාලයෙහි දැන් මම විද්‍යමාන ද? අවිද්‍යමාන ද? කුමක් ව ඉඳිම් ද? කෙ සේ ඉඳිම් ද? මේ මම ය යි කියන සත්වයා කොයින් ආයේ ද? කොයි යාවි ද? යන සොළොස් ආකාර වූ ද, බුදුන් බුදුවා සැබෑ ද නැද්ද? යනාදී වශයෙන් බුද්ධාදී අට තැන කරන්නා වූ ද කාඞ්ක්‍ෂාවල් කෙරෙන් ශුද්ධවීම යි.

5. **මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය** නම් – එ සේ ලක්ඛණ රස පච්චුපට්ඨාන ව්‍යවස්ථාවෙන් දුක්ඛසත්‍ය වශයෙන් ද, ප්‍රත්‍යය ව්‍යවස්ථාවෙන් සමුදය සත්‍ය සහිත වශයෙන් ද ව්‍යවස්ථා කිරීම් සංඛ්‍යාත පරිග්‍රහයෙන් පිරිසිඳ දන්නා ලද ප්‍රත්‍යයන්හුත් සමග වූ අතීත වූ ද, අනාගත වූ ද, වර්තමාන වූ ද, ආත්ම භාවය කෙරෙහි වූ ද, පිටත්හි වූ ද, දළ වූ ද, සියුම් වූ ද, හීන වූ ද, ප්‍රණීත වූ ද, දුරෙහි පැවැත්තා වූ ද, සමීපයෙහි පැවැත්තා වූ ද, ත්‍රෛභූමික වූ-හෙවත් ලොකොත්තරය හැර ඉතිරි කාම රූපාරූප යන භූමිත්‍රයයෙහි පැවති සංස්කාරයන් කෙරෙහි ස්කන්ධ පසය, අජ්ඣත්තිකායතන සය ය, විඤ්ඤාණ සය ය, ඵස්ස සය ය, යනාදී කලාප වශයෙන්

සංක්ෂෙප කොට ගෙණ, ක්‍ෂය වන අර්ථයෙන් අනිත්‍යය, භය කොට ඇති අර්ථයෙන් දුක්ඛය, සාර රහිතාර්ථයෙන් අනාත්ම ය යි, මෙ සේ තුන් කල් වශයෙන්, රූප අරූප පරම්පරා වශයෙන් හෝ, ක්‍ෂණ වශයෙන් හෝ පැවති (මතු කියැවෙන) සම්මසන ඤාණයෙන් පිරිමදින අවස්ථාවෙහි තමා කෙරෙහි පහළ වන ඔභාසා දී ධර්ම නවය කෙරෙහි රැවටෙමින් ද දශ වැන්න උපදවමින් ද මග වරදවා නො ගෙණ, 'මොහු නව දෙන වනාහි විදර්ශනාවෙහි ප්‍රයොජනශ වූ මාර්ග ඵලයෝ ද නො වෙති, ඔවුන් ඇතිවූ බවට ලකුණු ද නො වෙති, යලි සවභාවයෙන් ම ප්‍රසංග වශයෙන් ලැබෙන ධර්මයෝ ම ය, ඔවුහු ම මග නො දන රැවටෙන්නාට අමාර්ගයෝ ද විදර්ශනා මගට උවදුරු ද වෙති, නිකාන්තිය ප්‍රකෘතියෙන් ම අන්තරාය කර වෙයි, නිසි මග වනාහි මතු වැඩිය යුතු උදයව්‍යය සන්මර්ශනාදී පිළිවෙත ය යි' මෙ සේ ,මග නොමග දැන මගට යොමුවීමෙන් අමාර්ග ප්‍රතිපත්තිය කෙරෙන් ශුද්ධවීම යි.

6. **පටිපදාඤාණදස්සන විසුද්ධිය** නම්:-එ සේ නොමගින් මිදී ත්‍රිලක්‍ෂණ විදර්ශනා පරම්පරාව ගෙණ යන්නහුගේ (මතු විස්තර කරණු ලබන) උදයව්‍යය භංග භය ආදීනවාදී ක්‍රමයෙන් පැවති ඉතිරි විදර්ශනා ඤාණ නවයෙන් ඊට ප්‍රතිපක්‍ෂ ධර්මයන් කෙරෙන් ශුද්ධවීම යි.

7. **ඤාණදස්සනවිසුද්ධිය** නම්:-එසේ පිළිපැදීමෙන් විදර්ශනාව මුකුරුවා මාර්ග වීථිය ලැබීම් වශයෙන් උපදින **සොතාපත්තිමග්ග** චිත්තයෙන් සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස ය යි. තුන් පරිද්දකින් එලඹ සිටිනා දිට්ඨි විචිකිච්ඡා දෙකින් ද; නැවතත් සම්මසන ඤාණයෙහි පටන් ම විදර්ශනාව ආරම්භ කොට ගොස් එ සේ ම උපදවන **සකදාගාමිමග්ග**යෙන් ඔළාරික කාමරාග ව්‍යාපාදයන්ගෙන් ද; නැවතත් එ සේ ම ගොස් උපදවන **අනාගාමිමග්ග**යෙන් අනුසහගතව සිටි එම දෙකින් ද; නව වරකුත් එ සේ ම ගොස් අන්තිමට උපදවන **අරහත්තමග්ග**යෙන් තවත් ඉතිරි ව සිටි රූපරාග, අරූපරාග, මාන, උද්ධච්ච, අවිජ්ජා යන සියලු අකුසලයන්ගෙන් ද, සියලු කුසලයන්ගෙන් ද; අන් භවයක විපාක දිය යුතු සියලු විපාකයන් ගෙන් ද; එසේ ම අන් භවයක ලැබිය

යුතු සියලු රූපයන් ගෙන් ද ශුද්ධවීම යි. ඤාණදස්සන විසුද්ධි යනු සාමාන්‍යයෙන් ම ලොවුතුරා සතරමගට නමකි.

විසුද්ධිභෙදය යි.

b. **ලක්ඛණ** තුන නම්:–සියලු සංස්කාර ධර්මයන්ගේ සාමාන්‍ය වූ (1) අනිච්චලක්ඛණය, (2) දුක්ඛලක්ඛණය, අසංඛත ධාතු ය යි කියන ලද නිර්වාණය ත් සමග සියලු ධර්මයන්ගේ (3) අනත්තලක්ඛණය යන ස්වභාවයෝ යි. එහි:–

1. **අනිච්චලක්ඛණය** නම්:–සංස්කාරයන්ගේ ඇතිව නැති වන, නො හොත් එක් ආකාරයකින් සිටියහුගේ අන් පරිද්දක්වීම යි. උදාහරණ:–උපන් සැප වේදනාව නැතිවී යයි. යකඩය මලකඩ වී යයි. මලකඩින් නැවත යකඩ ම හෝ, අන් යමක් හෝ උපදිමින් ඒ මලකඩමත් අනිත්‍ය වේ.

2. **දුක්ඛලක්ඛණය** නම්:–අනිත්‍ය හෙයින් ම සියලු සංස්කාරයන්ගේ පීඩා කරණ, හෙවත් දුකට හෙතුවන බව යි. උදා:–උපන් සැපවේදනාව නැතිවියාම නිසා දුක් දොම්නස් උපදවයි. ධාන්‍යයක් පිරිහුණු කාල ද, රෙද්දක් ඉරුණු කල ද එසේ ම යි.

3. **අනත්තලක්ඛණය** නම්:–නිර්වාණයත් ඇතුලත් සියලු ධර්මයන්ගේ ම ඒ ඒ ධර්ම මාත්‍රබව මුත් පුද්ගලයෙක්, සත්ත්වයෙක්, විඳින්නෙක්, දැනගන්නෙක්, පුරුෂයෙක්, ද්‍රව්‍යයක්, ප්‍රකෘතියක් යන මෙ බඳුවූ ආත්ම (සාර)යක් නැති බව යි. උදා:–රෙද්ද යනු නූල් ගෙතිල්ලකි. නූලෙහි රෙද්දක් නො වේ. එ සේ රෙද්ද ය යි නො කියයුතු නූල් ඉවත් කොට බැලූ කල ඉතුරු වන රෙද්දක් නම් නැත්තේ ය: නූල ද පුලුන් කෙඳි රැසකි. ඉන් එක එක කෙන්ද ඉවත් කොට බැලූ කල ඉතුරු වන නූලක් නම් නො ලැබිය හැකි. පුළුන් කෙන්දක් ද පඨවි ආදී අවිනිර්භෝග්‍ය රූප අටේ රැසකි. ඉනුදු එක එක ඉවත් කොට සිතූ කල පුළුන් කෙන්දක් ද ශෙෂ නො වේ. සත්ත්වයා ය යි කියනු ලබන්නේ ස්කන්ධ පසේ සමූහය යි. ඒ බව ප්‍රත්‍යක්ෂ වූ එක එක ස්කන්ධය ඉවත් කොට සිතා පස ම නිම වූ කාලු වෙන කිසිවක් ඉතුරු නො වේ ය යි දැන තේරුම් ගතයුතු.

ලක්ඛණ භෙදය යි

c. **අනුපස්සනා තුන** නම්:-සත්පුරුෂ සේවන සද්ධර්ම ශ්‍රවණයන්ගෙන් උපලක්‍ෂිත වූ කල්‍යාණ පෘථග්ජනයා සෝති සෝමනස්සාර වශයෙන් සංස්කාරයන් දෙස බලන (1) සුඤ්ඤතානුපස්සනා, (2) අනිමිත්තානුපස්සනා, (3) අප්පණි හිතානුපස්සනා යන ආකාර තුන යි. ඉන්:-

1. **සුඤ්ඤතානුපස්සනාව** නම්:-ති අනාත්ම ලක්‍ෂණය මෙනෙහි කිරීම යි.

2. **අනිමිත්තානුපස්සනාව** නම්:-අනිත්‍ය ලක්‍ෂණය මෙනෙහි කිරීම යි.

3. **අප්පණිහිතානුපස්සනාව** නම්:-දුඃඛ ලක්‍ෂණය මෙනෙහි කිරීම යි.

අනුපස්සනා භෙදය යි.

d. **විපස්සනාඤාණ දශය** නම්:-සත්පුරුෂ සෙවනාදි මූල් සම්පත් තුන ඇති සුගත ශ්‍රාවකයාගේ යට කී සප්ත විසුද්ධි සඞ්ඛ්‍යාත ධර්මානුධර්ම ප්‍රතිපත්තියෙහි දී ඇතිවන (1) සම්මසන ඤාණය, (2) උදයබ්බය ඤාණය, (3) භංග ඤාණය 4. භය ඤාණය, (5) ආදීනව ඤාණය, (6) නිබ්බිදා ඤාණය; 7. මුඤ්චිතුකම්‍යතා ඤාණය, (8) පටිසංඛාන ඤාණය, (9) සංඛාරුපෙක්ඛාඤාණය, (10) අනුලොම ඤාණය, යන මාර්ග ධර්මප්‍රතිපත්තියට පමුණුවා දෙන පූර්වභාග පතිපත්තියට සම්බන්ධවන ඤාණ දශය යි. ඉන්:-

1. **සම්මසන ඤාණය නම්**: වෙදෙකු විසින් එබීමෙන්, මිරිකීමෙන්, තට්ටු කිරීමෙන්, විඩවී කිරීමෙන්, කුරු ගෑසීමෙන්, ලකුණු බැලීමෙන් වණයක ඔඩු සොයන්නාවූ ද, ඇණ සැඟවී ගත් උලක් සොයන්නාවූ ද, සෙවීමක් මෙන් ඒ ඒ සංස්කාරයන් නොයෙක් පරිද්දෙන් පරීක්‍ෂා කොට ත්‍රිලක්‍ෂණ දැනගැණීම යි.

2. **උදයබ්බය ඤාණය නම්**:-දියකඩක ගැඹුර සොයන්නාට මතුපිට හා පතුල ද, පළල සොයන්නාට දෙගොඩ ද වැටහෙන්නා සේ, යට කී අතීතාදී ප්‍රභෙදගත වූ මූලු සංස්කාර ලොකයෙහි තත්වය පරීක්‍ෂා කරණ කල උත්පත්ති මරණ දෙක පමණක් වැටහෙණ ඤාණය යි.

3. **භංග ඤාණය නම්**:-උදයව්‍යය පුරුදුවූවාහට තමා අල්ලා ගණ බිඳ කාණ කොටියෙකුගේ සෙසු අවයව තිබිය දී

මූඛය ම ද, තමහට පෙළන අභියටියකා මූතම ද වැටහෙන්ණා සේ සියලු සංසකාරයන්ගේ දුකට ඉතා ආසන්න කාරණය වූ. හඞගය වැටහෙන්නාවූ හෙවත් මූලු සංස්කාර ලොකය මරණ මය වූවාක් (මරණ නම් වූ ද්‍රව්‍යයෙන් ම සෑදී තිබෙන්නාක්)සේ වැටහෙණ ඥාණය යි.

4. **භය ඥාණය** නම්:–ලැව්ගින්නකට අසුවූවන් දූවි දූවී විනාශවනු පෙණෙන කල ඒ ගින්න භයක් කොට, එයින් භය විය යුතු කොට හගින්නාසේ භංගය වැටහුණු යොගාවචරයාහට සියලු සංස්කාරයන් භයක් කොට, ඉන් භය විය යුතු කොට වැටහෙණ ඥාණය යි.

5. **ආදීනව ඥාණය** නම්:–භය වශයෙන් දුටු ලැව් ගින්නෙන් දූවීම, වේදනාව, පොළනැගීම, අබ්බාගාතවීම, මරණය, යනාදී මෙනම් මෙනම් අනතුරු ඇතැයි සලකන්නා සේ, භය වශයෙන් දුටු සංස්කාරයන්ගෙන් ජාතිජරාමරණ සෝක පරිදෙව දුක් දොම්නස් ආදී මෙ නම් මෙ නම් ආදීනව ඇතැයි දන්නා නුවණ යි.

6. **නිබ්බිද ඥාණය** නම්:–දුටු ආදීනව ඇති ලැව්ගිනි ගත් ප්‍රදෙශයෙහි සිත නො අලවන්නාක්, එහි කලකිරුණු උකටලි වූ සිත් ඇතිවන්නාක් සේ, දුටු ආදීනව ඇති සියලු සංස්කාරයන් කෙරෙහි සිත නො අලවන ආලය නො කරණ කල කිරුණා වූ සිත් ඇතිවන ඥාණය යි.

7. **මුඤ්චිතු කාම්‍යතා ඥාණය** නම්:–කලකිරුණු ලැව් ගිනිගත් වනය කෙරෙන් පැන නිරාදීනවස්ථානයකට යනු කැමතිවන්නා සේ, සංස්කාරයන් කෙරෙන් මිදී අසංඛත ධර්මය කෙරෙහි පිහිටන්නෙම් නම් යෙහෙකැයි මෙ සේ කැමති වීම් ආකාරයෙන් උපදනා ඥාණය යි.

8. **පටිසංඛාන ඥාණය** නම්; ගිනිගත් වනයෙන් පැන යනු කැමැත්තා, මගක් සෙවීමට ඒ වනය ම නැවත පරීක්ෂා කරන්නාක් මෙන්ද; දෙස් දූක ඉවත් කරණු කැමති කටු අන්තක් ඉවත දූමීමට නැවත අතට ගන්නාක් මෙන් ද, මිදී යනු කැමති වූ සංසකාරයන්, ඒ මිදීමට මග සොයනු පිණිස මෙන් නැවතත් ත්‍රිලක්ෂණ විදර්ශනාවෙන් පරීක්ෂා කරන්නා ඥාණය යි.

9. **සඞ්ඛාරුපෙක්ඛා ඤාණය** නම්:-දෙස් දක හැර දමූ භාය්‍යාව සැබොලුන් සමග නටන කල්හිත් ආලය වෛරය නැතිවම මධ්‍යස්ථ පැවැත්මෙන් බලා ඉන්නාක් මෙන්, දෙස් දක ආලය හැරී සංස්කාරයන් කෙරෙහි මධ්‍යස්ථ වන ඤාණය යි.

10. **අනුලෝම ඤාණය** නම්;නැවින් එතර වනු කැමැත් තාගේ නැවට නැගීමක් මෙන් සංඛාරුපෙක්ඛා ඤාණය දියුණු වට පැමිණ සංස්කාරයන් හැරීම් වශයෙන් උපදනාවූ මාර්ගීය සම්බන්ධ වීථියෙහි පූර්වභාගයවූ; තමන්ට පසුව උපදින මාර්ගයට ද, මේ ගෙණා විදර්ශනා පරම්පරාවට ද එකඟ භාවයෙන් පරිකර්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ වශයෙන් පවත්නා වූ ආවර්ජනානන්තර කාමාවචර ජවන සිත් සම්බන්ධ ඤාණය යි.- හෙවත් මාර්ගයට අනන්තර පූර්ව වූ ජවන සිත් තුනෙහි හෝ සතරෙහි වූ ඤාණය යි. මේ අන්තිම විපස්සනාඤාණයට විදර්ශනාවෙහි කෙළ පැමිණි බැවින් **සිඛාප්පත්තවිපස්සනා** යයි කියා ද, අනුලෝම චිත්තෝත්පාදයෙන් යුක්ත හෙයින්, **සානුලෝම විපස්සනා** යයි කියා ද; සංඛාරුපෙක්ඛාඤාණයෙන් උපන් හෙයින් **සංඛාරුපෙක්ඛාවිපස්සනා** යයි කියා ද, දුක කෙරෙන්,සංස්කාරයන් කෙරෙන්,පෘථග්ජනභාවය කෙරෙන් නගා සිටුවනා මාර්ග චිත්තය කරා ගමන් කිරීම් ලක්‍ෂණයෙන් උපදනා හෙයින් **උට්ඨානගාමිනී විපස්සනා** යයි කියා ද තවත් නම් සතරක් වෙති.

මෙහි සම්මසනඤාණය කඞ්ඛාවිතරණ විසුද්ධියෙහි පටන් මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධිය දක්වා වෙයි. සෙසු නවය පටිපදා ඤාණ දස්සන විසුද්ධියෙහි අවයව යෝ වෙති.

විපස්සනාඤාණ භෙදය යි.

**විපස්සනායන පාදය යි.**

e. **විපස්සනූපක්කිලෙස** දසය නම්:- කංඛාවිතරණ විසුද්ධියෙන් මතු සම්මසන ඤාණයෙන් ත්‍රිලක්‍ෂණ විදර්ශනාව ආරම්භ කොට වඩන යෝගාවචරයාහට ඒ විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත ව හෝ ඉන් අන්‍ය ව හෝ ලැබෙන්නා වූ, මේ මාර්ගයවෙන්ට ඇත, ඵලය වෙන්ට ඇත, මේ ඔවුන් ඇති වූ කිවම් ලක්‍ෂණවෙන්ට ඇතැයි රුචි විදර්ශනා මග හැර නොමග යාමට හේතු විය හැකි වූ,

"ඕභාසො පීති පස්සද්ධි අධිමොක්ඛො ච පග්ගහො,
සුඛං ඤාණමුපට්ඨාන මුපෙක්ඛා ච නිකන්ති ච."

යනුවෙන් දක්වන ලද (1) ඕභාසය, (2) පීතිය, (3) පස්සද්ධිය, (4) අධිමොක්ඛය, (5) පග්ගහය, (6) සුඛය, (7) ඤාණය, (8) උපට්ඨානං, (9) උපෙක්ඛාය, (10) නිකන්තිය යන මොහු යි. එයින්:-

1. **ඕභාසය** නම්:- විදර්ශනා චිත්තජරූප කලාපයන්ගේ පැහැදීමෙන් එහි පැවති වර්ණායතනය පැතිර පැවතීම් වශයෙන් කයින් නික්මෙන ආලෝකය යි.

2. **පීතිය** නම්:- බුද්ධාදී වූ පස්වණක්ප්‍රීතිය යි.

3 **පස්සද්ධිය** නම්:- කායපස්සද්ධි චිත්තපස්සද්ධිය යි දෙ ප්‍රකාරවූ සන්සුන් බව යි.

4. **අධිමොක්ඛය** නම්:- බලවත් ශ්‍රද්ධෙන්ද්‍රිය යි.

5. **පග්ගහය** නම්:- සම්‍යක් ප්‍රධාන කෘත්‍යය සිද්ධ කරණ වීර්‍ය්‍ය යි.

6. **සුඛය** නම්:- සොම්නස් වෙදනාව යි.

7. **ඤාණය** නම්:- ප්‍රඥාව යි.

8. **උපට්ඨානය** නම්:- සතිය යි.

9. **උපෙක්ඛාව** නම්:- බොධ්‍යංග වූ තත්‍රමධ්‍යස්ථතාව යි.

10. **නිකන්තිය** නම්:- සමපාදනය විගණ යන මේ සොළස ධර්මයන් කෙරෙහි ආලය කිරීම් වශයෙන් අත්‍යල්ප වල ඇතිවන ලොභය යි.

මොවුන් අතුරෙන්: නිකන්තිය තමාම විදර්ශනොපක්ලෙශ රූපයෙන් ම පහළ වේ. සෙසු නවයගේ ඉපදීම උපක්ලෙශ නො වේ. යලි උපන්නවුන් කෙරෙහි රුචි නිකන්තිය ද උපදවමින් තොමගට බැසගන්නාහට ම ඊට ප්‍රත්‍ය වන කල පමණක් උපක්ලෙශයෝ යි. උපදනා කල වනාහි සුඛය බොධපක්ඛිය ධර්මයන් හා සම්ප්‍රයුක්තාදී වශයෙන් ද, ඕභාසය සහජාත වශයෙන් ද, සෙසු සියල්ල බොධපක්ඛිය වශයෙන් ම ද වෙති.

මෙහි, ආදියෙහි පටන් ම, ශීලවිශුද්ධියට ප්‍රතිපක්ෂ වූ දුශ්ශීල්‍ය දුරාචාර දුරජීවයෝ ද, චිත්තවිශුද්ධියට ප්‍රතිපක්ෂ වූ නිවරණ පස ද යන මේ ආදී ඒ ඒ ධර්මයම ප්‍රතිපක්ෂධර්ම නියතයෙන් ම විදර්ශනොපක්ලෙශ වුවත්, එ සේ බැව්හි සැක

යක් නූපදනා බැවින් එය විස්තර නො කොට, සැකයට හේතුවන යථොක්ත කොටස පමණක් විස්තර කරණ ලදී.

විපස්සනූපක්කිලෙස පාදය යි.

f. විමොක්ඛ මුඛ තුණ නම්:– කැමති දෙසකින් වෙන පැමිණියවුන් විසින් නගරයට ඇතුල් වන දොරටු තුණක් මෙන්, අනුරූප ප්‍රතිපත්තියෙන් සමීපයට පැමිණි යොගාවචරයන් විසින් නිවණ ප්‍රත්‍යක්ෂකරණ (1) සුඤ්ඤතානුපස්සනා (2) අනිමිත්තානුපස්සනා (3) අප්පණිහිතානුපස්සනා යන උට්ඨාන ගාමිනී විපස්සනා චිත්තයන් විසින් සංස්කාරයන් කෙරෙහි පිළිපදින ආකාර තුණ යි. එක මාර්ගාධිගමයකට මින් එකක් ම වෙයි. එහි:–

1. සුඤ්ඤතානුපස්සනාව නම්:– ආත්ම වශයෙන් දැකීකොට ගැන්ම මුදන අනත්තානුපස්සනාව ම ද.

2. අනිමිත්තානුපස්සනාව නම්:– විපල්ලාස නිමිත්ත හෙවත් විපරීත වූ නිත්‍ය සේ වැටහීම මුදන අනිච්චානුපස්සනාව ම ද.

3. අප්පණිහිතානුපස්සනාව නම්:– තණ්හාපණිධිය හෙවත් ආලයෙන් පැතීම මුදන දුක්ඛානු පස්සනාවම ද වෙයි.

එහෙත් අනුපස්සනා නමින් කි අනිච්චාදී තුණ සම්මසන ඤාණයෙහි පටන් මේ අනුලොම ඤාණයට එතතුරු ගෙණෙන, සියල්ලට සාධාරණ වූ, එකට ගණුලබන්නා වූ ඒ අඞ්ග තුණෙන් යුත් එක ම ප්‍රතිපත්තිය යි. මේ විමොක්ඛමුඛ නාමයෙන් කියනු ලබන තුණ එක එක නමට එක එක විශෙෂ වූ, එකක් ම මිය තුණ තබා දෙකක්වත් එකට ගණු නො ලබන්නාවූ වෙන වෙන ප්‍රතිපත්ති තුණකි. මේ දෙවගීය වෙන් වන තැන නම් මගවීථියෙහි ආවජ්ජනය යි.

මෙහි තවත් උපමාවක් නම්:– යම් මහා ගඞ්ගාවක් අතු තුණකට බෙදී මුහුදට වැටේ ද; එහි ඒ අතු තුණින් ම මුහුදට වැටෙන ජලය මහගඟේ එකට ම ආයේ වෙයි ද; එසේ ම එකට එකලෙස ආ මත්ස්‍යයෝ ද ඒ අතු තුණෙන් වෙන වෙන ම මුහුදට වදිත් ද, එමෙන් එක ම අනුපස්සනා ත්‍රිලක්ෂණ විදර්ශනා පරම්පරාව විමොක්ඛමුඛ වශයෙන් තුණ බෙදී

නිවණට පැමිණේ. එහි එන විදර්ශකයෝ සාධාරණ ප්‍රතිපත් තියෙන් ආචාහු නමුත් විමොක්ඛ මුඛ තුනෙන් වෙන වෙනම අධිගමනය කරත්.

එසේ හෙයින් අනුපස්සනා දක්වා නැවත විමොක්ඛමුඛ දක්වීම පුනරුක්තියක් නො වේ -යලි, අවශ්‍යයෙන් ම විශෙෂ කොට කියයුත්තකි. යට සත්වන පරච්ඡෙදයේ ත්‍රිවිධ ප්‍රාප්ති නමින් කී සියල්ලත් මෙ තනදී නැවත නැවත බැලිය යුතු. මේ තුණ පටිපදා ඤාණ දස්සනවිසුද්ධියෙහි භෙදයෝ යි.

විමොක්ඛමුඛ භෙදය යි.

g. **විමොක්ඛ** තුණ නම්:- යට සත්වන පරිච්ඡෙදයෙහි ත්‍රිවිධ ප්‍රාප්තිය යන නමින්කළ විස්තරයෙහි නිවණ සඳහා දක් වූ ලෙස ඒ ඒ විමොක්ඛ මුඛයෙන් පැමිණෙන්නහුගේ නිම්ත් තෙන් මාර්ගයට ද, ඒ අනුසාරයෙන් මාර්ගවීථියෙහි ඵලයන්ට ද නම් වශයෙන් පණවනු ලබන (1) සුඤ්ඤත විමොක්ඛය, (2) අනිමිත්ත විමොක්ඛය, (3) අප්පණිහිත විමොක්ඛය යන තුණ යි.

එම කී ස්ථානය ද මේ අනතුරුව කී විමොක්ඛමුඛ කාණ්ඩය ද බැලීමෙන් මෙහි විස්තර මනා කොට දත හැකි වෙයි. මේ තුණ ඤාණදස්සන විසුද්ධියෙහි පරිකල්පිත ප්‍රභෙද යි.

විමොක්ඛ භෙදය යි.

h. **ලොකොත්තර ධර්ම නවය** නම්:–යට බොහෝ ආකාර වලින් විස්තර කරණු ලැබූ (1) සොතාපත්තිමග්ග (2) සොතා පත්තිඵල (3) සකදාගාමි මග්ග (4) සකදාගාමි ඵල (5) අනා ගාමි මග්ග (6) අනාගාමි ඵල (7) අරහත්ත මග්ග (8) අර හත්ත ඵල (9) නිබ්බාණ ය යන ධර්ම නව ය යි. ඒ සියල්ල ම උපාදානස්කන්ධ සංඛ්‍යාත ලොකයට අන්තර්ගත නො වන බැවින් ඉන් එතරව මතුව සිටි හෙයින් **ලොකොත්තර** නම් වෙති. එයින් මුල අට මුලපටන් ම මේ තාක් දක්වූ සියලු කාරණාවලින් පැහැදිලියි. නිර්වාණය සත්වන පරිච්ඡෙද යෙන් වෙන ම වර්ණනාකරණ ලදී. එහි:–

1. 3. 5. 7. **මාර්ග** සතර ඤාණදස්සන විසුද්ධිය යි.

2. 4. 6. 8. **ඵල** සතර ද ඊට ම අනුලොම් වෙති.

9. නිවණ ඒ අවට අරමුණු වන්නාවූ, මුඤ්චිතුකම්‍යතා ඤාණයෙන් අපෙක්ෂා කරණ ලද ධර්මය යි.

සට නිර්වාණ වර්ණනාවෙහි කිය යුතු ව පැමිණ ද, වඩා යෝග්‍ය වූ මෙතැනට කල්තැබූ මේ සෙත්පුර උපමාවෙන් මාර්ගඥාන සතරින් එක ම නිර්වාණය සාක්ෂාත් කිරීමේ විශෙෂය දත යුතුයි. එ නම්:–

යම් සේ ප්‍රාකාර වළලු සතරකින් සුරක්ෂිත වූ නගරයක් වන්නේ ද; එහි පිටත සොරා සතුරු ව්‍යාළ අමනුෂ්‍යාදි නා නා භයින් ආකූල වන්නේ ද; ඇතුලත ක්ෂෙම නිර්භය වන්නේ ද; ඊට එක එක ප්‍රාකාරයට හිණින් (ඉණිමගින්) නැගී පැන යා යුතු මංකඩුලු තුණක් මිස අන් කිසි ඇතුල් වන මගක් නැත්තේ ද; පිටනුවර ඇතිව තිබුනු සියලු භයින් තැති ගත් පුරුෂයෙක් එහි පැමිණ පෙති නවයක් ඇති හිණින් නැගී එක් මංකඩුල්ලකින් පළමු වැනි ප්‍රාකාරය පනිමින් ප්‍රථම වරට ඒ ක්ෂෙම නගරය දැක, යථොක්ත සියල්ලෙන් ඖදාරික භය කොටස ඉක්මවා මැසි මදුරු කටු කණු ගෝරු මඩ රළු බොරළු ආදියෙන් පෙළෙමින් ඒ ප්‍රථම ප්‍රාකාරය තුළ සිට නැවත එම හිණින් නැගී එක්තරා මංකඩුල්ලකින් දෙවෙනි ප්‍රාකාරය ද පනිමින් දෙවෙනි වරට පළමු දුටුවාට වඩා ප්‍රකට ව ඒ ක්ෂෙම නගරය දැක, කටු කණු ආදියෙන් ද නිදහස් වුවත් මැසි මදුරු රළු බොරළු තෙත් මඩ ආදියෙන් පෙළෙමින් දෙවෙනි පවුර තුළ සිට නැවතත් එම හිණින් නැගී මංකඩුල්ලකින් තුන් වැනිවූ ප්‍රාකාරය ද පනිමින් දෙවැනි වරටත් වඩා ප්‍රකට ව තුන් වැනි වරට සෙත් පුරය දැක රළු බොරළු වෙතුත් නිදහස් වුවත් මැසි මදුරුවන්ගෙන් හා තෙත් බිමෙනුත් පෙළෙමින් තුන්වැනි පවුර තුළ සිට සතර වැනිවත් එම හිණිමන් නැගී එක්තරා මංකඩුල්ලකින් අන්තිම පවුර පනිමින් මැසි මදුරු වන්ගෙන් පෙළෙන භූමියද ඉක්මවා අතිශයින් ප්‍රකටව සෙත්පුරය දැක, නිරායාසයෙන් ම සතර වැනි ප්‍රාකාරොපචාර තෙත් බිම ද ගෙවා ගොස් නිදුක් වන්නේ ද; එ මෙන් සතර අපායාදී නා නා ප්‍රකාර කුදුමහත් භයින් භයපත් යොගාවචරයා නව විදර්ශනා හිණින් විමොක්ෂ මුඛ මංකඩුල්ලකින් දිට්ඨි විචිකිච්ඡා සීලබ්බ

ත පරාමාස ප්‍රාකාරය සොවාන් මාර්ග වශයෙන් පැන අපාය භය ඉක්මවන කල තමා බොහෝ උස්තැන සිටි හෙයින් පෘථග්ජනයන්ට කිසි සේත් නො පෙණෙන තිජාණය ප්‍රථම වරට දකී. එ සේ සොවාන් ඵලයෙහි පිහිටි, ඉතිරි සංයෝජනයන් ගෙන් හා අපාය රහිත කාමරූපාරූප භව භයින් ද පෙළෙන පුද්ගලයා එ්සේ ම නැගී ඖදාරික කාමරාග ව්‍යාපාද පවුර සකෘදගාමී මාර්ග වශයෙන් පැණ යථොක්ත භවදුකින් තව කොට සක් ඉක්මවන කල වඩා ආසන්නවීම නිසා වඩා ප්‍රකට ව දෙවෙනි වරට තිවණ දකී. එ සේ පැනයන ඉතිරි සංයොජනයන් ගෙන් හා භව දුඃඛයන් ගෙන් පෙළෙන සකෘදගාමි ඵලසථයා අනු සහගත කාමරාග ව්‍යාපාදප්‍රාකාරය ද අනාගාමි මාර්ග වශයෙන් පනිමින් එයිනුත් තවත් බව දුක් කොටසක් ඉක්මවමින් තුන් වැනි වරට තවදුරට ප්‍රකට ව දකී. එ සේ පැන ගත් අනාගාමි ඵලස්ථයා නැවතත් එ සේ ම නැගී උද්ධම්භාගීය සංයොජන ප්‍රාකාරයත් එ සේ ම රහත් මග වශයෙන් පනිමින් සෙසු බවදුක් සියල්ල ද ඉක්මවමින් පරම පිරිසිදුව සතර වැනි වරට ද තිවණ දකී. ඒ දුටු අර්හත් ඵලස්ථයා අව්‍යාකෘතමය වූ සෙසු උපාදි සංඛ්‍යාත නෙත් උපචාර භූමිය ඉක්මවා ඒ තිවන් සෙත් බිම පිහිට කොට යන්නේ ය. මෙ සේ උපමාව උපමෙයය හා ගලපා මතා කොට තේරුම් ගත යුතු යි.

ඒ ඒ වස්තූන් ඒ ඒ ධර්මයන්ට උපමා කිරීමේ යුක්තිය ද පහසුවෙන් වැටහේම ය.

මෙහි දී, අයථිසත්‍ය විස්තරයෙහි මාර්ග වශයෙන් පඤ්ඤදී චෛතසික අට පමණක් සැලකූ පරිද්දෙන් නො ව, චිත්ත කාණ්ඩයෙහි දක්වූ සේ මාර්ග වශයෙන් ද ඵල වශයෙන් ද මුලු සසම්ප්‍රයුක්ත චිත්තයන් හෙවත් චිත්තොත්පාදයන් ම සල කතබව සිහි නැති නො කටයුතු යි.

ලොකොත්තර භෙදය යි.

**විපස්සනා භමිද්ධිපාදය යි.**

i. **පුද්ගලයෝ** නවදෙන නම්:-විදර්ශනා භාවනාවට සම්බන්ධ වන (1) කල්‍යාණපුථුජ්ජනයාය, (2) සොතාපත්තිමග්ග

ට්ඨායා, (3) සොතාපත්ති ඵලට්ඨායා, (4) සකදාගාමිමග්ග ට්ඨායා, (5) සකදාගාමිඵලට්ඨායා, (6) අනාගාමිමග්ගට්ඨායා, (7) අනාගාමිඵලට්ඨායා; (8) අරහත්තමග්ගට්ඨායා; (9) අර හත්තඵලට්ඨායා යන නවදෙන යි. ඉන්:-

1 **කල්‍යාණපුථුජ්ජනයා** නම්:-ත්‍රිහෙතුක ප්‍රතිසන්ධියෙන් උත්පත්තිය ලැබීම් වශයෙන් විපාකාවරණයෙන් තුරන් වූ; ආනන්තරිය පාපකර්මයන් නොකළ බැවින් කර්මාවරණයෙන් ද, නියත මිථ්‍යාදෘෂ්ටීන් භජනය නො කිරීම් වශයෙන් ක්ලෙස වරණයෙන් ද මිදුනා වූ; මනුෂ්‍යාත්මයෙහි ද, පියංකර මා තාව වැනි සමහර ත්‍රිහෙතුක පිශාචාත්ම භාවයෙක්හි ද චාතුර්මහාරාජිකාදී සදිව්‍යලොකයෙහිද, අසඤ්ඤසත්ත අරූ පාවචර ලොකයන් හැර ඉතිරි බ්‍රහ්ම ලොකයන්හි ද පැවති නිවන් මගට පිළිවෙත් පිරීමට අභව්‍ය නොවන සම්‍යක් දෘෂ්ටි කා වූ පෘථග්ජනයා යි. මනුෂ්‍යලොක දිව්‍යලොකවල ක්ලෙසා වරණ රහිත, ද්විහෙතුක පුද්ගලයා ද පදපරම භාවය හෙවත් මතු ආත්මයක නිවන් දැකීමට මෙහි දී හේතුව ඇතිකර ගන්ට හැකි වන බැවින් මීට ම අනුලොම් වෙයි.

2 **සොතාපත්ති මග්ගට්ඨයා** නම්:-සක්කාය දිට්ඨි විචිකි ච්ඡා සීලබ්බත පරාමාස ය යි සංයොජන වශයෙන් තුණක් කොට දක්වන ලද දිට්ඨි විචිකිච්ඡා යන අකුසලදෙක සමුච්ඡෙද වශයෙන් නසමින් අනවරාග්‍ර සංසාරය අන්තිම වැඩිගණනින් සත්භවයකට මාසිම් තබමින් උපදනා සොතාපත්ති මග්ග චිත්තයෙන් උපලක්ෂිත ව පවත්නා චිත්ත ක්ෂණමාත්‍රායුෂ්කවූ පුද්ගලයා වෙයි.

3 **සොතාපත්ති ඵලට්ඨයා** නම්:-එම මාර්ග චිත්තයාගේ භංගක්ෂණයෙන් මතු ඒ ඒ භවයෙහි හෝ අන් භවයක හෝ සකදාගාමි මග්ග චිත්තයාගේ උප්පාද ක්ෂණය දක්වා පැවති සතර අපායෙන් මිදුනාවූ **සොතාපන්න** නම්නුදු ව්‍යවහාර වූ පුද්ගලයා යි.

4 **සකදාගාමි මග්ගට්ඨයා** නම්:-සොතාපන්න භාවය ඉක් මවා කාමරාග ව්‍යාපාදයන් තුනීකරන්නා වූ යථොක්ත මාර්ග ස්ථයා මෙන් ම චිත්ත ක්ෂණ මාත්‍රායුෂ්කවූ පුද්ගලයා වෙයි.

5• **සකදාගාමි ඵලට්ඨයා** නම්:-ඒ ඒ මාර්ග චිත්තයාගේ භංගක්ෂණයෙන් මතු ඒ භවයෙහි හෝ අන් භවයක හෝ මතු

මාර්ගය දක්වා පැවති, එක්වරකට වඩා කාමභවොත්පත්තිය නො ලබන්නාවූ පුද්ගලයා වෙයි. තනි **සකෘදාගාමි** නම්තුදු ඔහු ම කිය වේ.

6 **අනාගාමිමග්ගට්ඨයා** නම්:-සකෘදාගාමි භාවය ඉක්මවා කාමරාග ව්‍යාපාද වශයෙන් කියන ලද වුවත් කාම විෂයයෙහි ලොභය ද, දෝස ඉස්සා මච්ඡරිය කුක්කුච්චයන් මුලුල් ල ද යන අකුශල ධර්මයන් සමුච්ඡේද වශයෙන් නසමින් උපදනා අනාගාමි මාර්ග සිතින් උපලක්ෂිත වූ චිත්තක්ෂණ මාත්‍රායුක්ත පුද්ගලයා වෙයි.

7 **අනාගාමි ඵලට්ඨයා** නම්:-අනාගාමි මාර්ග චිත්තය පටන් ඒ භවයෙහි හෝ අන් භවයක හෝ අරහත්තමග්ග චිත්තය ලැබෙන තුරු පැවැත්නා වූ, කාමාවචර ප්‍රතිසන්ධියක් නො ලබන්නා වූ, පඤ්චමධ්‍යානය උපදවා ගත්තේ නම් සුද්ධාවාස බ්‍රහ්ම ලොකයන්හි ඉපදිය හැක්කා වූ, නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවා ගත්තේ නම් නිරොධ සමාපත්තියට ද සමවදින්ට හැකි වූ පුද්ගලයා යි. තනි **අනාගාමි** යන නාම ද ඔහුට ම වේ.

8 **අරහත්තමග්ගට්ඨයා** නම්:-අනාගාමි භාවය ඉක්මවා රූපරාග අරූපරාග මාන උද්ධච්ච අවිජ්ජා යන සංයොජන වශයෙන් පසක් ම කියන ලද උවත්, මොහ අහිරික අනොත්තප්ප උද්ධච්ච (සෙසු) ලොභ මාන ථින මිද්ධ යන අවශෙෂ සියලු අකුශලයන් සමුච්ඡේද කරමින් නුදුන් ප්‍රතිසන්ධි ඇති සියලු ම කුශලාකුශල කර්මයන් ක්ෂයකිරීමෙන් නැවත භවොත්පත්තිය සම්පූර්ණයෙන් ම නැති කරමින් උපදනා අරහත්ත මග්ග චිත්තයෙන් උපලක්ෂිත වූ චිත්ත ක්ෂණ මාත්‍රායුක්ත පුද්ගලයා වෙයි. (වරක් දුන් ප්‍රතිසන්ධිය ඇති කර්මයාගේ ප්‍රවෘත්ති ඵලය ක්ෂය කිරීම විඳීමෙන් හෝ පිරිණිවීමෙන් පමණකි.)

9 **අරහත්තඵලට්ඨයා** නම්:- මෙ කී මාර්ග චිත්තයාගේ භංගයෙහි පටන් ඒ ආත්මයෙහි කෙළවර අනුපාදිසෙස නිබ්බාණ ධාතුවෙන් පිරිනිවන්පාන තුරු පැවැත්තා වූ, සතර ආරූප්පය උපදවන ලද්දේ නම් නිරොධ සමාපත්තියට සමවදින්ට සමර්ථ වූ, තමා සම්බන්ධ ව ඇතිවන තාක් සියලු ම ධර්මයන් අව්‍යාකෘතම වූ, සියලු කාම රූපාරූප ක්‍රියා චිත්තයන්

උපදවන්නා වූ, ලෝකයෙහි අග්‍ර දක්ෂිණාර්හ වූ, සම්මාසම්බුදුන් පසේ බුදුන් නිදර්ශන කොට ඇති පුද්ගලයා වෙයි. අරහා අරහං යනාදී නම්වලින් ද මොහු ම කියැවේ.

මෙ කී කල්‍යාණ පෘථග්ජනයා හැර ඉතිරි අට දෙන ම ලෝකෝත්තර පුද්ගලයෝ යයි ද, ආර්‍යයෝ යයි ද කියනු ලැබෙත්. ඵලස්ථයෝ ද, මාර්ගස්ථයන් මෙන් ම, ඒ ඒ ඵල චිත්තෝත්පාදයන්ගෙන් සමංගීවූ කලම මුඛ්‍ය වචනයෙන් ඒ ඒ ඵලස්ථ නම් වෙති. සෙසු කල ප්‍රතිසන්ධියට අනුරූප නම ඇති පුද්ගලයෝ ම ය. මෙහි කී මාර්ගයකින් මතු මතු මාර්ගය හෝ නිවණ දක්වා ඒ ඒ නම කී ම උපචාර වශයෙනැයි දත යුතු.

පුද්ගල භෙදය යි.

සමාපත්ති දෙක නම්:–යථොක්ත ඵලස්ථායීයන් විසින් නැවත නැවත ඵල තිර්වාණ යන ලොකොත්තර ධර්මයන්ට පැමිණීි වසන (1) ඵල සමාපත්ති (2) නිරොධ සමාපත්ති යන ආකාර දෙකයි. ඉන්:–

1. **ඵලසමාපත්තිය** නම්:–මාර්ග වීථියෙන් අනතුරුව ඉහාත්මයෙහි සුඛවිහරණය පිණිස ඒ ඒ පුද්ගලයා තමා ලබා ගත්තා වූ ලොවුතුරා ඵල සංඛ්‍යාත ඒ අමෘතාහාරය නැවත නැවත අනුභව කරන්නාක් මෙන් නැවත නැවත ඒ නිවන් අරමුණු කොට ඇති ඵලචිත්තයෙන් යුක්තව විසීම යි. එය ඵල සතරේ වශයෙන් සන්තානයෙහි ඇති උපධි විවෙකයෙහි ප්‍රමාණයෙන් මිස, අන් සියලු අතින් සමාන වූ ප්‍රභෙද සතරක් ඇත්තේ වේ.

උපාදාන සකන්ධ පර්‍යාපන්න බැවින් දුක් වශයෙන් විදර්ශනා කල ලෞකික සිතින් හැකි තරම් තුරන් ව විසීම සැප වශයෙන් දක්නා ආර්‍යයෝ දෙහ පටිජග්ගන ධම්ම සවණ පරානුකම්පන, සංඝකම්, බුද්ධොපස්ථානාදියෙන් තොර වූ විවෙක කාලයන් බහුල වශයෙන් මේ ඵලසමාපත්තියෙන් ගත කෙරෙත්.

මීට සමවැදීම හා එයින් නැගී සිටීමත් මහද්ගත සමාපත්තිගැණ කිවාක් මෙනි.

2 **නිරොධසමාපත්තිය** නම්:—සමථයානික වූ අනාගාමි අරහත්තඵලටැ දෙදෙනා විසින් පමණක් තමන්ගේ පිරිනිවී

මෙන්මතු යම් සේ චිත්ත චෛතසිකයන් නිපදවීම් ලක්ෂණයෙන් නිරොධය (නිර්වාණ) ස්පර්ශ කෙරේ ද, එ මෙන් ඉහාත්මයෙහි ම වරකට සත්දිනකට වැඩි නොවන කලක් තුළ චිත්ත චෛතසිකයන් නිපදවීම් ලක්ෂණයෙන් ම නිර්වාණ ස්පර්ශකොට විසීම යි. මෙහි විසීම ය යනු මතු නැගී සිටින ස්වභාව හෙයින් කියන ලදී. සියලු සංස්කාරයන්ගෙන් තුරන්වීම සැප වශයෙන් දුටු මේ ආර්යයෝ සංසාරයෙන් ඉතුරු කොටසිතුත් හැකි පමණ කොටසක් ඔවුන්ගෙන් තුරන්ව වසන පිණිස මේ සමාපත්තියට සම වදිත්.

මීට සමවදින පරිදි මෙ සේ යි:– පළමු කොට සත්දවසක් පමණ කලක් අප්‍රසිද්ධව විසීමට සුදුසු ස්ථානයක් සොයා ගෙණ වස්සාවාසාධිට්ඨාන, උපොසථ, පවාරණ, ඉවසු නිමන්ත්‍රණ, ප්‍රතිඥ කළ කෘත්‍ය, ඒ ඒ සීමායෙහි කරණු ලබන සංඝකර්ම, අනුදූත භාවාදි සංඝමෙහෙවර යන මෙ බඳු පිටත්හි නියුක්ත බැව් සංසිඳවා ගෙණ බහුල වශයෙන් බද්ධපර්යඞ්කයෙන් හිඳගණ ප්‍රථමධ්‍යානයට සමවැද එයින් නැගී එහි ඇතිව තුබූ සංස්කාරයන් යථොක්ත පරිද්දෙන් විදර්ශනා කරයි. නැවත ද්විතියධ්‍යානයට සමවැද නැගී සිටද විදර්ශනා කරයි.. මෙසේ පිළිවෙළින් ආකිඤ්චඤ්ඤායතනය දක්වා සමවැද නැගීසිටිමින් විදර්ශනා කරමින් ගොස් එතනදී පූර්වකෘත්‍ය සතරක් කරයි. එ නම් ඒ සතිය තුළ තමකය, කය පිළිබඳ දෙය පවා විපත්තියට නො පැමිණේවයි අධිට්ඨානයද, ඒ කාලපරිච්ඡේදය තුළ සංඝකර්මාදිය පිණිස එවන ලද සංඝ දූතයාගේ කැඳවීමට පූර්වයෙන් නැගී සිටින්නෙමි යන ආභොගය ද, එසේ ම ශාස්තෘන් වහන්සේගේ වචනයෙන් කැඳවීමට පූර්වයෙන් නැගීසිටින්නෙමි යන ආභොගය ද, මේ සතිය තුළ ආයුසංස්කාරය පවතී ද නැත්ද යි ආවර්ජනා කිරීම ද, යන සතර යි. ආයුෂය ඒ සතියට අඩුනම් සම නො වදී. එ සේ නැතහොත් ඉන් පසු නෛවසඤ්ඤානාසඤ්ඤායතනයට සම වදියි. එහි අර්පණාජවන දෙකක් ඉපිද ඉන් මතු චිත්තසන්තානය සිඳෙයි හෙවත් සිත් නොඉපදී ඇරෙත්. පරිච්ඡේද කළ මුළුකාලය තුළ බුද්ධාමන්ත්‍රණාදියක් නො වී නම් එ ලෙස ම නිරොධය පවතී. ඒ ආමන්ත්‍රණාදියකින් හෝ කාලය ඉක්මීමෙන් හෝ නැගී සිටින කල සුදුසු සේ අනාගාමි ඵලය හෝ රහත් ඵලය

හෝ එක් වරක් ඉපිද නිරුද්ධවූනාට පසු භවාඞ්ග පෙළ නැවතත් පටන් ගණී. ඉන් පසු ප්‍රත්‍යවෙක්ෂාඥනයන් ඇති කෙරේ.

(50 වෙනි 34 වෙනි වින්‍යාස බැලිය යුතු සි.)

සමාපත්ති භෙදය සි.

**k**. වීථි සතර නම්:– (1) මග්ගවීථි, (2) ඵලසමාපත්තිවීථි (3) නිරොධ සමාපත්තිවීථි, (4) පච්චවෙක්ඛණ වීථි. යන විදර්ශනාමාර්ගයෙහි එකිනෙකට වෙනස් ව ලැබෙන සිත් පරම්පරා සතරයි. මේවා යට දක්වූ 25 වැනි, 30 වැනි, 34 වැනි, 20 වැනි, 33 වැනි, වින්‍යාසවලින් බලා ගත යුතු සි.

යට කී විස්තරවල අනුසාරයෙන් මේවා ගැණ ද හොඳින් තේරුම් ගත හැක්කේම ය. එතකුදු වුවත් සවල්ප විස්තර යක් කරන්නෙමු. එසින්:–

1. **මග්ගවීථිය** නම්:– සොතාපත්ත්‍යාදී භාවසතරට ප්‍රථම වරට පැමිණෙන ප්‍රඥාව සතරේදී සිත් පහළවන ක්‍රමය සි. එය යට 25 වැනි, 26 වැනි, 27 වැනි, 28 වැනි, වින්‍යාස වලින් දත ගන්නා කල "ග්ග" යන්නෙන් ඒ ඒ නියම මාර්ග සිතත්, "ඵ" යන්නෙන් ඒ ඒ නියම ඵල සිතත්, පරිකම්ම සිත ලැබෙන මන්ද පඤ්ඤ පුග්ගල වීථියෙහි ඵල සිත් දෙකක් පමණක් ද, එය නො ලැබෙන තික්ඛපඤ්ඤපුග්ගල වීථියෙහි තවත් එකක් සමග තුණක් ද ලැබෙන බවත්, ඒ සතරමාර්ග යන් සම්බන්ධ වීථි සතර මන්දපඤ්ඤ තික්ඛ පඤ්ඤභෙදයෙන් අටක් වන බවත් සැලකිය යුතු සි.

2. **ඵලසමාපත්තිවීථිය** නම්:–මාර්ග වීථීන්ගෙන් පැමිණි සොවාන් ආදී ඵලස්ථයන් විසින් ඒ ඒ ඵලයට නැවත සමවදින ප්‍රඥාවයන්හී පහළ වන සිත් පරම්පරාව සි. එය යට 29 වැනි, 30 වැනි, වින්‍යාසවලින් මාර්ගවීථිය මෙන් ම සුදුසු සේ අටවැදූරුම් කොට සැලකිය යුතු සි.

3. **නිරොධසමාපත්ති වීථිය** නම්:– නිරොධ සමාපත්ති යට සමවදින කල ද නැගී සිටින කල ද පහළ වන නිරොධ යට මූලින් අගින් සිටි චිත්තොත්පාද ක්‍රමය සි. එය 34 වැනි වින්‍යාසයෙන් බලා ගත යුතුසි. එහිත් මන්දපඤ්ඤදී පුග්ගල

භෙදයෙන් දෙයාකාර බව ද, ඵලසිත පුද්ගලයා අනාගාමී හෝ රහත් හෝ වීමෙන් ද්විප්‍රකාර බව ද, එකාටයිෂ්ණු කාල සතර හෙද බැව් ද වේ.

4. **පච්චවෙක්ඛණවීථිය** නම්:–යට ධ්‍යානාඞ්ගප්‍රත්‍යවෙක්ෂාවෙහි දක්වූ වීථියට ආරම්මණ වශයෙන්:– එ නම් මග්ගචිත්ත මග්ගාඞ්ගාදී වශයෙන් මාර්ගය ද, ඵල චිත්ත තත් සම්ප්‍රයුක්ත වශයෙන් ධර්ම වශයෙන් ඵලය ද, නිර්වාණය ද නියත වශයෙන් අරමුණු කිරීමෙන් ද, ප්‍රහීණකෙලශ අවශෙෂ කෙලශයන් අනියත වශයෙන් අරමුණු කිරීමෙන්ද වෙනස් වන්නා වූ; මුල් ඵල තුණේ සිටියන්ට කුසලජවනයන් හා රහත් ඵලයෙහි සිටියන්ට ක්‍රියා ජවනයන් ලැබීමෙන් ද, චිත්තොත්පාද වශයෙන්ද, සමානවන්නාවූ වීථිය සි. එනම්:– මනොද්වාරික විභූතාරම්මණ වීථියම සි. එය මග්ග වීථිඵලසමාපත්ති වීථි නිරොධසමාපත්තිවීථි සියල්ලට ම අනතුරු ව ද, ඒවාට මුලින් ආවජ්ජන අධිට්ඨාන යන අනික් කෘත්‍යවලින් ඒ ඒ නම්වලින් ද පවති. යට 20 වැනි, 33 වැනි, වින්‍යාස වලින් දක්වූ සේ එවුන්ගේ රූප සාමාන්‍යයෙන් එකතු කොට එක ම පච්චවෙක්ඛණ නාමයෙන් මෙහි දක්වන ලදී.

මේ සියලු වීථිවල ම ලෞකිකජවනයෝ නො රහතුන්ට කුසල් ද රහත්හට ක්‍රියා ද වෙති.

වීථිභෙදය සි.

**විපස්සනාඵලානිසංස පාදය සි.**

මෙ සේ කල්‍යාණ පෘථග්ජනයා සීලවිසුද්ධියෙන් චිත්ත විසුද්ධියට ද, කල්‍යාණමිත්‍ර-සංසර්ග සද්ධර්මශ්‍රවණ යොනිසොමනසකාරයන් අනුව ගිය ඒ දෙකින් දිට්ඨිවිසුද්ධියට ද, එයින් කංඛාවිතරණවිසුද්ධියට ද පැමිණ ත්‍රිලක්ෂණය සම්බන්ධ අනුපස්සනා වශයෙන් සම්මසණඤාණය ලැබ, විපස්සනුපක්කිලෙසයන් පිරිසිඳ දත මග්ගාමග්ග ඤාණ දස්සන විසුද්ධියට ද, එයින් උදයව්‍යයාදී විදර්ශනා ඥාන නවයෙන් ඒ සම්බන්ධ පටිපදා ඤාණදස්සන විසුද්ධියටද, ඒ හෙතුවෙන් විමොක්ෂ මුඛතුණෙන් එක්තරා එකකින් එ නම් විමොක්ෂ නාමයෙන් යුක්ත වූ නව වැනි ලොකොත්තරයෙහි එල්බ සිටිනා ඤාණ දස්සන විසුද්ධියට පැමිණෙමින් ක්‍රමයෙන් සෙසු ලොකොත්

තර ධර්මයන් ලැබීම් මුඛයෙන් ඒ ඒ ආය්‍යීපුද්ගල භාවයට පෙරලෙමින් මාර්ගවීථි ලැබ ඒ ඒ අතර ම සමාපත්තිපච්චවෙක්ඛණ වීථියෙන් ඉහාත්මයෙහි ම පය්‍යාය වශයෙන් ද අනුපාදිසෙස නිබ්බාණ ධාතුවෙන් නිෂ්පය්‍යාය වශයෙන් ද එකාන්ත සැපයට පැමිණෙයි. (49–50 වෙනි වින්‍යාස බැලිය යුතු යි.)

## 49 වෙනි වින්‍යාසය

### සාමාන්‍ය පරිනිබ්බාණාසන්න වීථි නිදර්ශනයක්.

සංඛාරාරම්මණ.




මෙහි "හෙ"–සකන්ධ භෙදය යි. චුති යන නමින් යට දැක්වූ සියලු තැනම අන් භවයක ප්‍රතිසන්ධිය පිණිස සිටි භවයෙන් ගිලිහීම අදහස් කළ නිසා මෙහිදී පිරිණිවීම සඳහා ඒ 'චු"යන්නට වඩා මෙය යොග්‍යය යි සිතා යෙදුවෙමු. "~"– අනාදිමත් සසර මෙයින් කෙළවරවූ බව යි.

## 50 වෙනි වින්‍යාසය

### භාග්‍යවතුන් වහන්සේගේ පරිනිබ්බාණාසන්න නවානුපූර්වසමාපත්ති වීථි පරම්පරාව.

අ. ආ. 24. ප. අ. ආ. 24. ප. අ. ආ. 24. ප. අ. ආ. 24.. ප.
i ii iii iv

අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ,24.ප. අ.ආ.24.ප. ආ.ආ.34.ප.
iv 1. iv 2. iv 3. iv 4.

අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප.
iv 4. iv 4. iv 3. iv 1. iv

අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප. අ.ආ.24.ප.
iii ii i ii iii

අ.ආ.24.ප.
iv



මෙහි "අ. ආ. 24. ප." යනු පිළිවෙළින් ඒ ඒ ධ්‍යානයාගේ අධිෂ්ඨාන, ආවජ්ජන, සමාපත්ති, පච්චවෙක්ඛණ වීථිනු වෙති. රෝම ඉලක්කම් හතර සූත්‍ර ක්‍රමයෙන් ප්‍රථමාදී වූ ධ්‍යාන සතර යි. iv 1 යනු ආදි සතර ආරූප්‍ය සතරයි. "හෙ—"–යට කි ලෙස ම ස්කන්ධපරිනිර්වාණයෙන් සසර නිමාවයි.

මෙ සේ සත්වපුද්ගලාදී ප්‍රඥප්තිය ඉක්මුනා වෙයි.

මම ද එසේ වෙම් වා.

සියල්ලෝ ද එසේ වෙත් වා.

දෙලොස් වැනි විදර්ශනා පරිච්ඡේදය නිමි.

---

## සිද්ධි රස්තු.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු